

නිකොලායි ඔස්ත්‍රොව්ස්කි

වාහේ පහන්නරය

පැවූ හැටි I

RUSSIAN
CLASSICS



නිකොලායි ඔස්ත්‍රොවිස්කි
1904-1936

නිකොලායි ඔස්ත්‍රොව්ස්කි

වාතේ පහන්නරය ලැබූ හැටි

I

නිකොලායි ඔස්ත්‍රොව්ස්කි
ගිනේ එන්නාරය ලැබූ හැටි I

අනුවාදය
දූදිගම වී. රැද්රිගු

ISBN 978-624-5937-17-2

පරිගණක අකුරු සකැසුම
නිරූපමා සෙනරත්

මුද්‍රණය සහ ප්‍රකාශනය

KANOL

සී/ස. කැනොල් පබ්ලිෂිං හවුස් (පුද්.) සමාගම

2023
ශ්‍රී ලංකාවේ මුද්‍රණය කරන ලදි

ප්‍රස්තාවනා

කතුවරයා සහ නවකතාවේ වීරයන් ගැන

ජීවිත වික්‍රමයන් සහ වික්‍රමාන්විත ජීවිත ද ඇත. සුප්‍රසිද්ධ සෝවියට් ගත්කරු නිකොලයි අලෙක්සේයෙවිච් ඔස්ත්‍රොව්ස්කිගේ (1904-1936) ජීවිතය ද එබඳුම වික්‍රමයකි. මේ නවකතාවේ කතුවරයා ද ඔහු ය. ඔහු ජීවත් වූයේ කෙටි කාලයකි. අවුරුදු දෙතිසක් පමණකි. දොළොස් අවුරුද්දක් ඔහු ගත කළේ බරපතළ රෝගියෙකු මෙනි. ඉන් අවසාන අට අවුරුද්ද ඔහු අන්ධයෙකු සේ ගත කළේය. එහෙත්, ඔහු තබා ගිය පා සටහන් ගැඹුරුය. 'වානේ පන්නරය ලැබූ හැටි' නමැති ඔහුගේ නවකතාව සැබැවින්ම පරම්පරා කීපයකම අත්පොත බවට පත් විය. පිටපත් කෝටි ගණනකින් මුද්‍රණය වූ මේ නවකතාව ලෝක ප්‍රසිද්ධය.

1937 දී ඔස්ත්‍රොව්ස්කිගේ නවකතාව ඉංග්‍රීසි බසට පෙරළා 'මාටින් සේකර සහ වාබර්ග්' පොත් සමාගම විසින් ප්‍රකාශ කරන ලදි. ඒ ගැන ටයිම්ස් පුවත් පත මෙසේ ලියුවේය:

"ප්‍රධාන වශයෙන් සිය ජීවන චරිතය පදනම් කොට ගෙන මේ නවකතාව කළ තරුණ කතුවරයා, එය ලිවීමට පටන් ගත් කාලයේදීම ඔත්පළව ඇඳට වූ අතර, ඔහුගේ ඇස් අන්ධ විය. ඔහු මිය ගියේ මීට සති කීපයකට උඩදීය. මේ නවකතාවේ පිටුවලින් අසමාන ලෙස පණ ලබන ඔහුගේ මරණය නිසා විශේෂ සංවේගයක් පළ වේ. 1914-1918 ලෝක මහා යුද්ධය, සිවිල් යුද්ධය, ඉනික්බිති සෝවියට් සංගමයේ ආර්ථිකය යළි ගොඩ නැඟීම, පසුතලය කරගනිමින් කතුවරයා නව රුසියාවේ තරුණ වීරයා වන පාවෙල් කොර්චාගින්ගේ සේයාරුව මැනවින් සිත්තම් කරයි. එය අතිශයින්ම යාථාර්ථවාදීය. චරිතය උපරිමය ලෙස පැහැදිලිය. ඉමහත් ශක්තියකින් යුතුව ඔහු සැබෑ ජීවිතයෙන් කොටසක් මනහර ලෙස සහ චමත්කාර ජනක හැඟීමකින් යුතුව ඉදිරිපත් කරයි'.

ඔස්ත්‍රොව්ස්කිගේ නවකතාව විදේශ පාඨකයන් තුළ විශාල හැඟීමක් ඇති කළේය. මේ නවකතාව හෙළ බසින් පළ වීම නිසා අලුත් පාඨකයන්ගේ හිතවත් බව එයට ලැබෙනු ඇත. අපේ ආයාචනය ඔවුන් වෙත ඉදිරිපත් කරන්නේ එබැවිනි.

''නිර්භයත්වය සටන් තුළින් උපත ලබයි. එය පරීක්ෂණයෙන් පසක් කර ගනී'' ඔස්ත්‍රොව්ස්කි පැවසීය.

ඔහුගේ ජීවිතය, ළමා කාලය, ගැටවර කාලය සහ තරුණ කාලය සටන්වලින් හා පරීක්ෂණවලින් පිරී පැවැතිණි...

රුසියාවේ ඔක්තෝබර් විප්ලවය ජයගන්නා විට ඔහුගේ වයස අවුරුදු දහතුනක් විය. එහෙත්, ඔහු ශ්‍රමය හා අගඟිගය කුමක්දැයි දැන සිටියේය. දවසකට පැය 12 -14 ක් ඔහු දුම්රිය ස්ථානයෙහි අවන්හලෙහි වැඩ කළේය. සමොවාර් නමින් හැඳින්වෙන අතිවිශාල කේතල විශේෂයක් ඔහු උසැති පටු ඉණිමඟක් ඔස්සේ ඉහළ ගෙන ගියේය. ගිනි උදුන්කරුවෙකුගේ විදුලි කාර්මිකයෙකුගේ අත් උදවු කරුවෙකු හැටියට සේවය කළේය.

පහළොස් හැවිරිදි වයසේදී සිවිල් යුද්ධයට සහභාගි විය. අනතුරුව කීයෙව් දුම්රිය වැඩපොළ යළි සෑදීමට හේ සහභාගි විය. පසුව පටු දුම්රිය මග සෑදීමෙහි නියුක්ත විය. දූවදඬු කපන ස්ථානයක වැඩ කළේය. ඔහු තමාට හුරු පුරුදු ආස්වාදයකින් හා උනන්දුවකින් යුතුව උක්රයිනයේ කොම්සොමොල් සංවිධානයේ වැඩවල යෙදුණු අතර, ඕනෑම කාර්යයකට සිය යෞවන ධෛර්යය යෙදවීය.

වානේ පන්නරය ලබන්නේ ගිනි රත් කොට වහාම දැඩි ශීතට හසු කිරීමෙනි. සිවිල් යුද්ධයේ ගින්නෙන් සහ සාමකාමී ඉදිකිරීමේ වැඩවලින් ඔහුගේ පරපුර පන්නරය ලැබීය.

1924 අවසාන කාලයේදී ඔස්ත්‍රොව්ස්කි බරපතළ ලෙස රෝගාතුර විය. ඔහුගේ පිටකොන්දේ ආබාධය උග්‍ර විය. අගහිඟකම, ළමා කාලයේදී ඔහු මූණ පෑ අමාරුකම්, යුද පෙරමුණේදී තුවාල ලැබීම, නිදි රහිතව බරපතළ වැඩ කිරීම ආදිය නිසා රෝගය වඩාත් උත්සන්න විය.

නව ජීවිතය ගොඩනැඟීමේදී සහ සටනේදී ක්‍රියාශීලී කොටසක් ඉටු කිරීමට පුරුදුව සිටි ඔහුට පෙරමුණෙන් ඈත් වී 'ඈත පිටුපසට' යාමට සිදු විය. මුළු මහත් රටම නැඟෙනහිර සිට බටහිර දක්වා යෝධමය නිර්මාණාත්මක ක්‍රියා සන්නතියකට හසු විය. ඉදිකිරීම් ඉතිහාසයේ, මින් පෙර නොඇසූ විරූ පරිදි, ඔස්ත්‍රොව්ස්කිගේ සමවයස්තරුණ පරපුර වෙහෙස නොබලා වැඩ කළේය.

තම ක්‍රියා විරහිත බව ඔස්ත්‍රොව්ස්කි ඉතා වේදනා සහගත ලෙස පිළිගත්තේ එබැවිනි.

සෝවියට් දේශයේ හාර්කොව්, එව්පතෝරියා, ස්ලාව්යාන්ස්ක්, මොස්කව්, සෝචී... ආදී නගරවල පිහිටි ඉතාම හොඳ රෝහල් හා සුඛාගාරවල ඔස්ත්‍රොව්ස්කි ප්‍රතිකාර

ලැබීය. එහෙත්, ඔහුට සුවය ලබා දීමට මහ වෙදුන් ගත් තැත නිෂ්ඵල විය. ඔහුට අත් පා සෙලවිය නොහැකි විය. දෙනෙත් අන්ධ විය. ''යහන් ගබඩාව නමැති මිනීවළ'' ඔහුගේ නිත්‍ය වාසභූමිය බවට පත්විය. ඔහු ක්‍රියාශීලී ජීවිතයෙන් සඳහටම ඈත් විය.

කළ යුත්තේ කුමක්ද? ඉදිරියට ජීවත් වන්නේ කොහොමද? ජීවත්වීමට පවා පුළුවන්ද?

තම නවකතාවේ වීරයා වන පාවෙල් කෝර්චාගින් ඉදිරියේ බෙදවාචක තියුණු බවකින් යුතුව පැන නැඟි එම ප්‍රශ්න නිකොලායි ඔස්ත්‍රොව්ස්කිද කැලැඹවීය. ඔහු හදවතට දුක් දෙමින් එම ප්‍රශ්නවලට පිළිතුරු සෙවීය.

''අතිශයින්ම වැදගත් වස්තුව වන සටන් කිරීමට ඇති හැකියාව නැතිව ගිය පසු ජීවත් වන්නේ කුමක් සඳහාද? සොම්නස රහිත අනාගතයේදී හා වර්තමානයේදීත් ජීවිතය සනාථ කරන්නේ කෙසේද? කා, බී ආශ්වාස ප්‍රශ්වාස කිරීමෙන් පමණක්ද? සිය සගයන් සටන් තුළින් ඉදිරියට යන විට, පැත්තකට වී නිකම් බලා සිටින සාක්ෂ්‍යකරුවෙකු වී සිටිය හැකිද?''

සියලු උවදුරුවලින් බේරී යාමේ සිය පණ හානි කරගැනීම පිළිබඳ අදහස පැන නැඟිණි. එහෙත්, අවසාන පැයේදී ඔහු තීරණාත්මක ලෙස එය ප්‍රතික්ෂේප කළේය. ''ජීවිතය විඳ දරාගත නොහැකි තත්ත්වයකට වැටුණු විටදී පවා ජීවත්වීමට පුළුවන් විය යුතුය. එවැනි ජීවිතයක් පවා ප්‍රයෝජනවත් කර ගත යුතුය.''

ඔහුගේ ජීවිතය 'ගැට්ට ළඟටම' පැමිණි විටදී, ක්‍රියා විරහිතබවට, ඇස් අන්ධ වීමද එකතු විය. අවසානය ළං වූවාක් මෙන් හැඟිණි. 1930 සැප්තැම්බර් 11 දා ඔස්ත්‍රාව්ස්කි සෝචිවලින් සිය සගයා වන ප්‍යොත්ර නෝචිකොට්ට මෙසේ ලියුවේය:

''ජීවත්වීම සනාථ කිරීම සඳහා අවශ්‍ය හරයකින් ජීවිතය පුරවාලීම අරමුණු කරගත් සැලැස්මක් මා ළඟ ඇත. එම සැලැස්ම ඉතා අමාරුය. ඉතා අසීරුය. එය ක්‍රියාවේ යෙදවීමට හැකි වූවොත් අප පසුව ඒ ගැන කතා කර ගනිමු...

...දැන් මා ඇඳට සීමා වී ඔත්පළවී සිටියද, මා රෝගියෙකු යැයි ඉන් අදහස් නොකෙරේ. එය ප්‍රලාපයකි, බොරුවකි. මම නිරෝගී තරුණයෙක්මි. මගේ දෙපා පණ නැති වී ඇතැයි කීමත් දෙනෙත් අන්ධ වී ඇතැයි කීමත් සම්පූර්ණයෙන්ම වැරැදි වැටහීමකි''

ලොමු දහැගැන්වෙන අදිටන් බලයකින් යුත් ලිපියකි! මරණය නමැති රකුසා ජය පැන් බීමට සූදානම් වී සිටි මොහොතේදී ඔහුට එදිරිව කළ අභීතමය අභියෝගයකි, එම ලිපියෙන් කියැවෙන්නේ. රෝගය ඉදිරියේ වෙද්දු බෙලහීන වූහ. සිරුර තුළ හටගත් දිරාපත් වීමේ ක්‍රියා සන්තතිය නවතාලීමට ඔවුහු අපොහොසත් වූහ. ඔහුට නැවත දිනෙක නැඟිට සිටීමට බැරි වනු ඇත. නැවත කිසි දිනෙක දෙනෙතින් බැලීමට බැරි වනු ඇත. දෙපා බිම ගසා ඇවිදීමට බැරි වනු ඇත. එසේ වුවද කම් නැත.

මගක් ඇත. ඔහු තම නවකතා මඟින් නැවත ජීවිතයට පා තබයි.

පැරණි පරපුර වෙනුවට ඉදිරියට එන තරුණ පරපුරට දිය යුතු පණිවිඩය කුමක්දැයි ඔහු බොහෝ කල් සිටම දැන සිටියේ ය. කෙතරම් පරීක්ෂණයකින් වුවද, පසුබැස්සවීමට නොහැකි විප්ලවවාදී යුද්ධය පිළිබඳ එය පාපෝච්චාරණයකි. ඔහු එය සිය නවකතාවෙන් කියයි.

මුලදී ඔහුට ආධාරකරුවන් නොසිටියේය. උදෑසන වැඩට යන ඔහුගේ බිරිඳ හවස ගෙදර එන්නේ විඩාපත් වෙලාය. ඉතා අමාරුවෙන් තම අණට කීකරු වන ඇඟිලිවලින් ඔහු පැන්සල තද කර එකිනෙක අකුරු ලීවේ ඒවා අත ගා බලමිනි. නොයෙක් වර අකුරු පේළියට උඩින් තවත් අකුරු පේළියක් ලිවීම නිසා ඒවා විනාශ විය.

අනතුරුව වෙනත් ක්‍රමයක් සොයා ගත්තේය.

මෙය රුසියන් බසින් ට්‍රාන්ස්පරාන්ට් යනුවෙන් හැඳින්වෙයි. සාමාන්‍ය කාඩ්බෝඩයක කෙළින් දිග අතට කැපූ සිදුරු ඇත. ඒ දිගැති සිදුරුවල පළල මිලිමීටර අටකි. කාඩ්බෝඩ් කවරයට ලියන කඩදාසිය තැබූ විට දිගැති සිදුරු ඔස්සේ අකුරු පේළි ලිවිය හැකිය.

බිරිඳ හා පවුලේ උදවිය හැමදාම හවස කාඩ්බෝඩ් කවරයට යටින් කඩදාසි 25ක් - 30ක් තබා, උල් කළ පැන්සල් කීපයක්ද සහිත එය ඔස්ත්‍රොව්ස්කිට දෙති.

ඔස්ත්‍රොව්ස්කි වැඩි වශයෙන්ම ලියූවේ ගෙදර උදවිය නිදා සිටින විටදීය, රාත්‍රී කාලයේදීය.

''මගේ ජීවිතය මේ නවකතාව ලිවීම'' යැයි ඔස්ත්‍රෝව්ස්කි මිතුරෙකුට ලියුවේය.'' දැන් මම 'රෑ වැඩ කොට' උදේ වන විට නිදා ගනිමි. රාත්‍රිය නිසලය. ශබ්ද රහිතය. චිත්‍රපටියක් මෙන් මා මනැස ඉදිරියේ චරිත මැවෙයි, ජවනිකා දිස් වෙයි...''

රැයක් තුළදී ඔහු තමාට දෙන කඩදාසි සියල්ලම ලියා පුරවයි. ඉනික්බිති ඔහු ලියූ දෙය පැහැදිලි කිරීම හා යළි පිටපත් කිරීම නෑයන් හා මිතුරන් විසින් කරන ලදි.

ඔස්ත්‍රොව්ස්කිට හැමදා ආවේණික වූ ආධ්‍යාත්මික උතුම් ලක්ෂණ වූ වීර්යය, අධිෂ්ඨාන ශක්තිය සහ උත්සාහය මේ අවුරුදුවලදී පැහැදිලි ලෙස කැපී පෙනෙන්නට විය.

1914 දී නිකොලායි ඔස්ත්‍රොව්ස්කිගේ නවකතාව බහු ජනතාව සඳහා දයාදය බවට පත්විය.

1935 දෙසැම්බර් මාසය... ඔස්ත්‍රොව්ස්කි තවමත් ජීවතුන් අතරය. ඔහුගේ නවකතාව 'වානේ පන්නරය ලැබූ හැටි' පළ කළේය. සිය නිර්මාණාත්මක ජයග්‍රහණය නිසා ඔස්ත්‍රොව්ස්කිට ලෙනින් සම්මානය පිරිනැමීය. ඔහු සෝචි සිට මොස්කව් පැමිණියේ 'කුණාටුවෙන් උපත ලද්දෝ' නමැති සිය අලුත් නවකතාව ලිවීම පටන් ගැනීමටය. ඔහු පදිංචිව සිටි ගෝර්කි වීදියේ අංක 40 නිවසට ඔබ යතියි සිතන්න. කැලඹුණු සිතින් යුතු ඔබ එහි පළල් පිය ගැට පෙළ ඔස්සේ පා නගමින් දෙවැනි මාලයට ගියහයි සිතන්න. කොරිඩෝරය දිගේ ගොස් සීනුව හඬ නගා ඔහුගේ නිවසේ කාමරයට ඇතුළු වුණයි සිතන්න.

ඔබ ඉදිරියේ ඇති ඇඳක ඔස්ත්‍රොව්ස්කි වැතිර සිටී. ඔහුගේ සිරුර සළුවකින් පොරවලාය, ඔහු දිගය, කෙට්ටුය, තියුණු මුහුණ ආත්ම ශක්තියෙන් පිරිලාය. මනැස එක් කරගෙන බොහෝ ගැඹුරු කල්පනාවෙක යෙදී සිටින මිනිසුන්ගේ මුහුණුවල පෙනුම එසේය. ඔහුගේ විශාල නළල ඉදිරියට නෙරා සිටී. ඔහුගේ දකුණු ඇස්බැමට ඉහළින් පැරණි තුවාලයක කැළලකි. පතුලට කිඳා ඇති දෙනෙත් විවරව පවතී. ඒවා පියවි නෙත් බව ඔබට සිතෙනු ඇත. ඔහුගේ උඩුකය සෙබළ කමිසයකින් වැසී ඇත. පපුව මත ලෙනින් පදක්කමකි.

...කාමරය තුළ අඩ ඇඳිරියකි. මහ පාරේ ප්‍රවාහනවල හඬ යටපත් කරන ඝනැති තිරයකින් විශාල කවුළුව වසා ඇත.

ඇඳ තබා ඇති වම් පස බිත්තියේ වී. අයි ලෙනින්ගේ ඡායාරූපයකි. දකුණු පස මුල්ලක ලියන මේසයකි. හමින් කළ කවරයක් සහිත සෝපාවකි. පියානෝවකි. පොත් රාක්කයකි. අන්රී බර්බියූස්ගේ උඩුකය රූපයකි.

කාමරයේ ඇති මේ දේ බැලීමට ඔබට වේලාවක් නැත. ඔබ කාමරයට ඇතුළු වූ විගස එහි ස්වාමියාගේ තරුණ කටහඬ ඔබ අමතන බැවිනි. ඔබේ පැමිණීම ගැන ඔහුට කලින් දන්වා

ඇත. ඔබට ඔහු අසලින් වාඩි වන ලෙස කියන ඔහු, ඔහුගේ වම් අත දිගු කරයි. ඔහුගේ අණට කීකරු වූයේ දැත්වල අත්ල පමණකි. ඒවාට දුබල ජංගමශීලී බවක් තිබිණි. ඔහු ඔබගේ අත අල්ලා ගෙන සිටී. හමුවීමේ අවසානය දක්වාම එය අතනොහරී.

ඔබගේ අත ඔහු තදින් අල්ලාගෙන සිටින සැටි සහ එය මිරිකන සැටියෙනුත්, ඔහුගේ අභ්‍යන්තර දර්ශනය ඔබ වෙත ළඟාවන සැටියක් ඔබට හැඟෙයි. ඔබ හැඳින ගැනීමට එය ඔහුට ආධාර කරයි.

ඔබ ඔහු සමඟ කතාබහ කරන තරමට, ඔබ ඉදිරියේ වැතිර සිටින මිනිසා බලවත් සේ ඔත්පළ වී සිටින බව ඔබට අමතක වෙයි.

ඔහුගේ කටහඬ අසන ඔබට, ඔහුගේ ජීවමාන බුද්ධිමත් අදහස් දුනුදියෙන් මුදා හැරිය හීයක් සේ යන සැටි දකින ඔබට, රෝගියෙකුගේ ඇඳ සමීපයෙහි සිටින බව අමතක වෙයි. ''මා දෙනෙත් වසා ගන්නා විට....'' ඔහු ඔබට කියනු ඇත. ඔහුගේ දෙනෙත් අවුරුදු බොහෝ ගණනක් තිස්සේ වැසී ඇති බව ඔබ කල්පනා නොකරනු ඇත. ඔහුට " කාලකණ්ණි හෙම්බිරිස්සාවක් හැදිලා" යැයි ඔහු කියන විට, ඔහුට හිරිහැර කරන්නේ එය පමණක් බව ඔබට සිතෙනු ඇත. "මම කියවනවා" "මා ලියනවා" "මම ගමනක් යාමට ලැහැස්ති වෙනවා" "මම ලේඛනාගාරවලට ගොස් පොත් අවුස්සනවා" "සම්මේලනය අමතා කතා කිරීමට මා සූදානම් වෙනවා" මෙවැනි දේ ඔබට ඔහු කියනු ඇත. ඔහු කොතරම් විශාල ප්‍රමාණයක් බලය හා උණුසුම විසුරුවා හරින්නේද යත්, ඔබට ඔහු ගැන කනගාටු වීමට නොව, ඔහු නිසා ඔබ තුළ ඉමහත් උදාර හැඟීමක් පහළ වනු ඇත.

නවකතාවේ කතුවරයා එහි වීරයාගෙන් ඈත් කිරීම සාමාන්‍ය සිරිතකි. එහෙත්, මෙහිදී මේ දෙදෙනා එක් කිරීමට හැම පදනමක්ම ඇත. ඔවුන් දෙදෙනා එකම ජීවිතයක් ගත කළහ. එකම වර්ගයක චරිතවලට අයත් වූහ.

ඔස්ත්‍රොව්ස්කි සිය නවකතාවෙන් පෙන්වන කාලය හා සිද්ධීන් අතීතයට අයත්ය. එහෙත්, පාවෙල් කොර්චාගින් අපේ සමකාලීනයෙකු ලෙස අප සමඟ සිටී.

අන් හැමටම වඩා ඔහු වෙත අපේ සිත් ඇදී යන්නේ කුමන කරුණක් නිසාද?

ප්‍රංශ මහා ගත්කරු **රොමේන් රොලාන්** සිය තරුණ මිතුරා වන සෙර්ගේයි කුදාෂෝව්ට ලියූ ලියුම්වල සඳහන් කළ ජීවිතයේ 'වංකගිරිය' ඔස්සේ පාවෙල් යාමට දක්වන සහජ සමත්කම නිසා අන් හැමටම වඩා ඔහු අපේ සිත් ඇද ගනී. අසීරුකම්වලට දක්වන ආකල්පය ගැන මෙහිදී සඳහන් විය. ''මා නුඹේ වයසේදී, බලාපොරොත්තු වූවාට වඩා වැඩි ප්‍රමාණයක් අමාරුකම්වලට මට මූණ පෑමට සිදු විය. ඒවා පැන නඟින විට මෙසේ කියන්නඃ (මා ඒවා අවබෝධ කරගත්තේ ජීවිත අත්දැකීමෙන් පසුවය.) ඒවා හරියට ජීවිතයේදී මුණ ගැසෙන වංකගිරි මෙනි. ඒවා ඔස්සේ අප යා යුතුය. එහෙත්, ඒවා අතරින් යාම අවශ්‍යය. ඒවා ඔස්සේ ගිය පසු හැමදාම දීප්තිමත් ආලෝකයක් හා පිරිසිදු වාතයක් සහිත පරිසරයකට පැමිණෙන බැවිනි... ප්‍රධාන දෙය ඉදිරියට ගමන් කිරීමය.''

අප හැම කෙනෙකුටම එවැනි 'වංකගිරි' ඇත. ඈත අතීතයේදී ඒවා තිබිණි. වර්තමානයේදීත් ඒවා තිබේ, අනාගතයේදීත් ඒවා තිබෙනු ඇත. ඒවා ඔස්සේ යාමට අප තුළ ධෛර්යයක් තිබිය යුතුය. ඔස්ත්‍රොව්ස්කි - කොර්චාගින් අපට මිත්‍රත්වයේ හස්තය දිගු කරයි.

නිකොලායි ඔස්ත්‍රොව්ස්කි වටාද ඔහුගේ වීරයා වන පාවෙල් කොර්චාගින් වටා මෙන් ප්‍රභා මණ්ඩලයක් නැත. ඔවුන්ට ගැඹුරුතම මිනිස් ගුණයන් පොදුය.

පාවෙල් කොර්චාගින් කළුවන් ඇස් ඇති ගැටවරයෙකි. ඔහු ෂෙපෙතෝව්කාවෙනි. බලාපොරොත්තු කඩ වීමේ දැඩි කටුක බව ඔහු දැන සිටියේය. බලාපොරොත්තු සුන් වූ තත්ත්වයන්ට ඔහු ඇද වැටිණි. අසාර්ථක වූ කාර්යයන් කීපයකම කතුවරයා විය. ''මෝඩකම නිසා හා තරුණකම නිසාද, හැමටම වැඩියෙන් නොදත්කම නිසාද වැරැදි බොහොමයක් කළෙමි.'' කොර්චාගින් එලෙස තමා ගැන සිතයි.

ඔහු තම ජීවිතය විවේචනාත්මක ලෙස පිරික්සා බලයි. එහි විවිධ අඩුපාඩුකම් දකී. ඔහු තම ජීවිතයේ තේජාන්විත හා පොහොසත් ගුණය වෙන් කර ගනී, එය සැබැවින්ම ඔහුගේ ප්‍රෞඪභාවය සනාථ කළේය. ''ප්‍රධාන දෙය සිද්ධීන් ගහන දවස්වලදී නිකම් නොසිටීමය. පාලනය සඳහා කළ අයෝමය සටනේදී නිසි තැන ගැනීමය. විප්ලවයේ රතු ධජයේ ඔහුගේ ලේ පැල්ලම්ද ඇත.

කොර්චාගින් චරිතයේ ශක්තිය, ඔහු ආස්වාදය ලැබූ අදහස්වල ශක්තියය.

'ජීවමාන කොර්චාගින්' හමු වී ඔහු සමඟ සාකච්ඡා කිරීමට මට කීපවරක්ම අවස්ථාව ලැබිණි. වරක් ඔහු මට මෙසේ කීය.

"ස්වාර්ථකාමියා අන් හැමටම පෙර මිය යයි. ඔහු මෙලොව ජීවත් වන්නේ තමා සඳහා පමණකි. ඔහුගේ 'මමත්වය' පෑගූ කෙනෙහිම ඔහුට ජීවත්වීමට කිසිවක් නැත්තේය. එහෙත්, මිනිහෙක් සමාජයේ වුවමනාවන් සමඟ ජීවත් වන විට, ඔහු සමාජය සමඟ එකට වෙළෙන විට, ඔහු විනාශ කර දැමීම අසීරුය... යුද භූමියේදී සටන්කාමියෙකු මිය යන විට, සිය සගයන්ගේ ජයග්‍රාහී හඬ ඔහුට ඇසෙත් නම්, ඔහුට අවසානයේදී උසස්තම සතුටක් ලැබේ."

සිය මරණයට ටික කලකට පෙර 1936 ශරත් සමයේදී, ඔස්ත්‍රොව්ස්කි ලන්ඩන් 'නිව්ස් ක්‍රොනිකල්' පුවත්පතේ වාර්තාකරු පිළිගෙන ඔහු සමඟ සාකච්ඡා කළේය. පැසිස්ට්වාදය, යුද්ධය, අනාගත ජයග්‍රහණය ගැන ඔවුහු බොහෝ වේලා සාකච්ඡා කළහ. තමා බොහෝ දේශපාලන නායකයන් හමු වී සාකච්ඡා කළ නමුදු, තමාට බොහෝ පාඩම් උගැන්වූ මේ සාකච්ඡා අමතක නොවන බව වාර්තාකරුවා පැවසීය.

"ඔබ නිර්භීත මිනිහෙකි. කොමියුනිස්ට්වාදී පරමාර්ථවලට කැප වීමට ඔබට හැකි වූයේ නිර්භීතකම නිසාද?"

"ඔව්"

ඔස්ත්‍රොව්ස්කි මොහොතකුදු පමා නොවී පිළිතුරු දුන්නේය.

ඔහුගේ රෝගය අසාධ්‍ය වූවද, අත් පා සෙලවිය නොහැකි වුවද, දෙනෙත් අන්ධ වුවද, දිවා රෑ නොතකා ශාරීරික වශයෙන් පීඩා වින්දද ඔහු ඉතා ප්‍රීතියෙන් පසු වන බව වාර්තාකරුට පැවසීය.

මිනිසා පරිශ්‍රමය දරන සුන්දර අරමුණ නිසා පමණක් ඔහු වඩාත් අලංකාර වන්නේය යන සත්‍යය තම ජීවිතයෙන් කොර්චාගින්ට ඒත්තු යන පරිදි ඔප්පු කරයි.

කොර්චාගින් අනුගමනය කළ ඒ ශ්‍රේෂ්ඨ සත්‍ය විසින් සාමාන්‍ය කම්කරු ගැටවරයෙකු වූ ඔහු සැබෑ ශ්‍රේෂ්ඨ සහ අලංකාර මිනිසෙකු කරන ලදී.

ඔස්ත්‍රොව්ස්කි සිදු විය හැකි දෙයක් ගැන නොව, සිදු වූ දේ ගැන ලියුවේය. එය ඔහු අත්දුටු දේ ගැන ලියූ නවකතාවකි.

නොකළ හැකි දෙයක් කළ හැකි දෙයක් ලෙස පෙනී ගියේ නම් එය එසේ වූයේ කතුවරයාගේ මනස් දෘෂ්ටිය නිසා නොව, දක්ෂ මිනිසුන් ජනිත කරන ලද ජීවිතය විසිනි. එවැනි නවකතාවක් නොලියා නොසිටිය හැකි අවස්ථාවකදී, තම ජීවිතය සනාථ කිරීමේ එකම මඟ හැටියට එය පැන නැඟි අවස්ථාවේදී අතිශයින්ම අවශ්‍යය යන හැඟීමකින් යුතුව ඔහු එය ලියුවේය. 'වානේ පන්නරය ලැබූ හැටි' යන මේ නවකතාව හුදු සත්‍යයෙන් සමන්විත බව එයින් අපට ඔප්පු වේ.

නිකොලායි ඔස්ත්‍රොව්ස්කි නිසා ආස්වාදය ලැබූ රොමේන් රොලාන්, ඔහු ''ක්‍රියාශීලීත්වයේ දීප්තිමත් ආලෝකය'' හැටියට හැඳින්වීය. විප්ලවවාදී යුගයේ ශ්‍රේෂ්ඨතම කලාත්මක නිර්මාණය එය විසින් බිහි කරන ලද මිනිසුන්ය. නිකොලායි ඔස්ත්‍රොව්ස්කි ඔවුන්ගෙන් කෙනෙකි.''

-සාහිත්‍ය කලාවේදී සෙම්යොන් ත්‍රෙගුබ්

I
කොටස

I

"උත්සවයට ඉස්සෙල්ලා දවසේ පාඩම් දීමට මගේ ගෙදරට ආපු එවුන් කවුද, නැඟිටපල්ලා!"

මෙසේ කී තරබාරු පුද්ගලයා හැඳ සිටියේ ලෝගුවකි. ඔහුගේ කරෙහි ලොකු කුරුසියක් සහිත මාලයකි. තර්ජනාත්මක ලෙස ඔහු සිසුන් දෙස බැලීය.

බංකුවෙන් නැඟී සිටගත් සිසුන් හයදෙනා දෙස ඔහු හෙළුවේ තියුණු බැල්මකි. කොල්ලන් හතර දෙනා සහ කෙල්ලන් දෙදෙනා ලෝගුව ඇඳ සිටි මිනිහා දෙස බියෙන් නෙත් යොමු කළහ.

"නුඹලා වාඩිවෙයල්ලා!" යි අතක් වැනූ ඔහු කෙල්ලන්ට කීය.

හණික වාඩි වුණු දැරියන් දෙදෙනා සැහැල්ලු සුසුමක් හෙළුහ.

වසීලි පූජක තැනගේ නෙත්, අනතුරුව කොල්ලන් සතරදෙනා වෙත යොමු වීය.

"මෙහෙ වරෙල්ලා, කොල්ලනේ!"

එකට ගුළි ගැසී ඉදිරියට එන සතර දෙනා පිළිගනු වස් වසීලි පූජක තැන නැඟිට සිට පුටුව මෑත් කොට, ඔවුනට ළං විය..

"නුඹලා තක්කඩි අතරින් සිගරැට් බොන්නෙ කවුද?"

"පියතුමනි, අපි සිගරැට් බොන්නෙ නැහැ" යි සතර දෙනා පහත් හඬින් පිළිතුරු දුන්හ.

පූජකයාගේ මුහුණ ලේ පැහැ ගති.

"සිගරැට් බොන්නෙ නැහැ. නීචයෝ පාන් පිටිවලට දුම් කොළ කුඩු කවුද බොල දැම්මේ? දුම් බොන්නේ නැතිද? හොඳයි අපි දැන් හොයල බලමු! සාක්කු පෙන්නාපියව්! ඉක්මනට! මා නුඹලාට මොනවද බොලව් කීවේ? සාක්කු එළියට ඇදපියව්!"

තිදෙනෙක් තම සතු දේ සාක්කුවලින් එළියට ගෙන මේසය මත තබන්නට වූහ.

ඉතිරි වූ දුම් කුඩු තිබේ දැයි සාක්කු අහුමුලු හා මැහුම් පොටවල් පිරික්සා බැලූ පූජක තැනට කිසිවක් සොයා ගත නොහැකි වූයෙන් අළු පැහැති කමිසයක් සහ දණහිස්වලට අණ්ඩ දමා මැසූ නිල් පැහැති කලිසමක් හැඳ සිටි කළු පැහැති ඇස් ඇති සතරවැනියා පිරික්සීමට ඔහු ඉදිරිපත් විය.

"නුඹ ගල් රූපයක් වගේ හිටගෙන ඉන්නෙ මොකද?"

ගුප්තමය කෝපයකින් යුතුව තම කළු පැහැති දෙනෙතින් පූජකයා දෙස බැලූ කොල්ලා, බොල් හඬකින් පිළිතුරු දුන්නේය.

"මගේ කලිසමේ සාක්කු නැහැ." ඔහු මැහුම් දිගේ දැත් යැවීය.

"ආ සාක්කු නැහැ! නුඹ හිතනවද පාන් පිටි නරක් කිරීම වැනි නීච වැඩක් කළ එකා කවුදැයි මා නොදන්නව කියලා? තව දුරටත් මේ පාසලේ ඉගෙනගන්ට ඉඩ ලැබෙයි කියලා නුඹ හිතනවද? නැහැ: ඔය වැඩේට නුඹට සමාව ලබෙන්නේ නැහැ. පසුගිය වතාවේ නුඹේ අම්මා කන්නලව් කළ හින්දා නුඹව නවත්වා ගත්තා. ඉතින් ඉවරයි. පන්තියෙන් එළියට බැහැපිය!" මෙසේ කී පූජකයා කොල්ලාගේ කනින් ඇද ඔහු පන්තියෙන් පිටතට තල්ලු කොට දොර වැසීය. කොල්ලා දුන් පාසල් මිදුලේය.

පන්තිය නිහඬ විය. සිසුහු බිය වූහ. පව්කා[1] කොර්චාගින් පාසලින් පන්නා දැමුවේ කවර හේතුවක් නිසාදැයි කිසිවෙකුට වටහා ගැනීමට බැරි විය. නියම වේලාවට ආගමික පාඩම නොදීම නිසා පාස්කු උත්සවයට පෙර දින පූජක තැන සිසුන් තම නිවසේ කුස්සියට කැඳවීය. එහිදී පාව්කා පිටිවලට දුම්කොළ කුඩු මිශ්‍ර කළ සැටි දුටුවේ ඔහුගේ මිතුරා වූ සිරියෝෂා බ්‍රුෂ්ෂාක් පමණකි. ඔවුනට පූජක නිවසේදී පාඩම් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සිදු විය.

පාසලින් පන්නා දැමූ පාව්කා ඉස්තෝප්පුවේ අවසාන පඩිය මත වාඩි වී සිටී. බදු පරීක්ෂකගේ ගෙදර කුස්සි අම්මා හැටියට උදේ සිට මැදියම් රැය දක්වා වැඩ කරන, තමාට ඉතා හොඳින් සලකන මවුට කුමක් කිව යුතුද, ගෙදර ගොස් ඇයට මුහුණ දෙන්නේ කොහොමද ආදිය ගැන ඔහු කල්පනා කරයි.

පව්කාගේ දෙනෙත් කඳුළින් පිරිණි.

"දැන් ඉතින් මොනවා කරන්නද? මේ හැම දෙයක්ම අර

1. පාව්ක - පාවෙල් හැඳින්වෙන කෙටි නමකි. ළමයින් එකිනෙකා අමතන විට නම්වල අගට 'කා' යොදති. මෙය බාලයා යන තේරුම දෙයි.

කාලකණ්ණි පූජකයා නිසයි. ඔහුගේ පිටිවලට මම දුම්කොළ කුඩු දැම්මේ මොන හේතුවක් නිසාද? සිරියෝෂා තමා මාව පෙලඹෙව්වේ. 'ඔය පූජක නපුරු ගැරඬියාට දුම් කුඩු ඉහිමු'යි. කිව්වේ ඔහු තමා. ඔන්න ඉතින් දුම්කොළ කුඩු දැම්මා. සිරියෝෂා බේරුණා. මාව පාසලින් පැන්නුවා."

වසීලි පූජක තැන පවිකාට හතුරුකම් කිරීමට පටන් ගත්තේ මීට බොහෝ කලකට පෙර සිටය. දවසක් දා පවිකා, මිෂ්කා ලෙව්වුකෝ සමඟ කලහයක් ඇති කර ගත්තේ ය. එදින ඔහුට දවල් බත නැති විය. වරදකරු වූ පාවිකා කෑම පැයේදී සිසුන් නැති හිස් පන්ති කාමරයෙහි මුරණ්ඩුකම් කරතියි සිතූ ගුරවරයා ඔහු දෙවැනි පන්තියට යැවීය. වැඩිමහලු ළමයින්ගේ පන්තියට ඇතුළු වූ ඔහු බංකුවේ අවසාන පෙළෙහි වාඩි විය.

වියළි සිරුරකින් හෙබි ගුරුවරයා මහ පොළොව හා විශ්වය ගැන කියන්නට විය. ඔහු කළු කබායක් හැඳ සිටියේය. පෘථිවිය අවුරුදු කෝටි ගණනක් තිස්සේ පවතින බවත් අහසේ තරු මහ පොළොව වැනි වස්තු බවත් පවසන ගුරවරයාගේ කතාවට පාවිකා සවන් දුන්නේ විමතියෙනි. ඒ නිසාම ඔහුගේ කටද මඳක් ඇරිණි. ඔහු කොතරම් මවිත වීද යත්, නැඟිට සිට ගුරුවරයාට මෙසේ කීමට පවා සිත් විණිඃ "ශුද්ධ වූ දේව වාක්‍යයෙහි එහෙම ලියලා නැහැ." එහෙත්, තමාට පහර වදිතියි බිය වූ පාවිකා නිහඬ විය.

දේව වාක්‍ය පිළිබඳ පාඩම්වලදී පූජක තැනගේ උසස්ම ලකුණු ලැබෙන්නේ පාවිකාටය. දේව අණපනත්, සුළුපදේශය වැනි දේ පාවිකාට කපු කෑම වැනි ලෙහෙසි දේය. සතියේ දවස් හයේදී දෙවියන් විසින් මවනු ලැබූ දේ මේ යැයි ඔහු අකුරටම දැන සිටියේය. පාවිකා වසීලි පූජක තැනගෙන් මහ පොළොව සහ තරු ගැන අසා දැන ගැනීමට තීරණය කළේ ය. දේව වාක්‍ය පිළිබඳ පාඩම පටන් ගැනීමට පැමිණි පූජකයා අසුනෙහි වාඩි වුණු විගසම, පාවිකා අතක් එසවූයෙන්, ඔහුට අවසර ලැබිණි. ඔහු නැඟිට සිටියේය.

"පියතුමනි, මහ පොළොව අවුරුදු කෝටි ගණනක් තිස්සේ පවතින බව දෙවැනි පන්තියේ ගුරුතුමා කියන්නෙ ඇයි? ශුද්ධ වූ බයිබලය අනුව ලෝකය මවා අවුරුදු පන්දාහයි..." ඔහු මෙසේ කියත්ම වසීලි පියතුමාගේ කෑ ගැසීම නිසා ඔහු මවිත විය.

"තක්කඩියා තෝ කීවේ මොනවාද? ඔන්න බොල තෝ දේව වාක්‍ය පාඩම් කරන හැටි!"

පාවිකාට හුස්ම ගැනීමට පවා ඉඩක් නොතබා, ඔහුගේ දෙකන් වැරෙන් අල්ලා ගත් පූජකයා හිස බිත්තියට ගසන්නට වීය. පහර කෑ හා බිය ගැන්වූ පාවිකා විනාඩියකින් පාසල් මිදුලට වීසි විය.

එදින ඔහුට මවුගෙන්ද ලැබුණේ සෑහෙන දඬුවමකි.

පසු දින අම්මා පාසලට විත්, පුතා නැවත ඇතුළු කරගන්නා ලෙස වසීලි පූජක තැනගෙන් බැගෑපත් ලෙස ඉල්ලා සිටියාය. එදා සිට පාවිකාද පූජකයාට වෛර කළේ මුළු සිතිනි. වෛර කළද, හේ ඔහුට බිය විය. තමා අමනාපයට පත් කළ කිසිවෙකුට පාවිකාගෙන් සමාව නොලැබිණි. පූජකයා අසාධරණ ලෙස ඔහුට දඬුවම් දීම නිසා හේ ඔහුට මුළු සිතින්ම වෛර කළේය. එමෙන්ම, ඔහු සිය වෛරය යටි සිතෙහි සඟවා ගත්තේය.

වසීලි පූජක තැන නිසා කොල්ලාගේ සිත නොයෙක් වර පැරිණි. නිතර ඔහු පන්තියෙන් නෙරපිණි. ඉතා සුළු දේවලට පවා ඔහුට දඬුවම් දී මුල්ලක සිටුවීය. ඔහුගෙන් පාඩම් නොඇසිණි. මේ හේතුව නිසා පාස්කු උත්සවයට පෙර දින පාඩම් දීම පිණිස පූජක නිවසට යාමට ඔහුට සිදුවිය. පූජක නිවසේ කුස්සියේදී පාන් පිටිවලට දුම්කොළ කුඩු ඉසීම පාවිකා අතින් කෙරිණි.

කිසිවෙකු නොදුටුවද, ඒ වැඩේ කළ තැනැත්තා සොයා ගැනීමට පූජකයා සමත් විය.

පාඩම අවසන් වූ විගස ළමයි දුවැවිත් පාවිකා වට කර ගත්හ. එහෙත්, ඔහු නිහඬව සිටියේය. සිය සඟයාට උදව් කිරීමට බැරි නිසා වරදක් කළ එකකු සේ කනගාටු වූ සිරියෝෂා බ්‍රැෂ්ෂාක් පමණක් පිටත නොගොස් පන්ති කාමරය තුළට වී සිටියේය.

පාසලේ මුල් ගුරු යේප්රේම් වසීලෙවිච් ගුරු කාමරයේ කවුළුව හැර ගොරෝසු හඬින් කෑ ගසත්ම පාවිකා බොහෝ සේ තිගැස්සුණේය.

"පාවෙල් කොර්චාගින්ට මෙහෙ එන්ට කියාපන්." මුල් ගුරුවරයා කෑ ගැසීය.

ගැහෙන හදවතකින් යුතුව පාවිකා ගුරු කාමරයට ඇතුළු විය.

★ ★ ★

දුම්රියපොළෙහි පිහිටි අවන්හලෙහි අයිතිකරු මැදිවියෙහි පසුවන සුදුමැලි මිනිහෙකි. වර්ණ රහිත කම්මැළි නෙත්වලින් ඔහු පාච්කා දෙස මෙහොතක් බලා ඇසීය.

"කොල්ලාගේ වයස කීයද?"

"අවුරුදු දොළහයි" අම්මා පිළිතුරු දුන්නාය.

"කමක් නැහැ. අද සිට වැඩ කළාවෙ. කොන්දේසි මෙහෙමයි, පඩි මසකට රුබල් අටයි. වැඩ කරන දවසට කෑම නොමිලේ. පැය විසි හතරක් වැඩ. පැය විසි හතරක නිවාඩු. හොරකම් කිරීම තහනම්."

"අනේ නැහැ. ඔහු කිසි දවසක හොරකම් කරන්නේ නැහැ. මම පොරොන්දු වෙන්නම්." බිය වූ අම්මා පැවසුවාය.

"අද ඉඳලා වැඩ පටන් ගන්නවා."යි අයිතිකරු අණ කළේ ය. තමා අසල සිටි වෙළෙන්දිය වෙත හැරුණු අයිතිකරු ඇය ඇමතීය. "සීනා මේ කොල්ලාව පිඟන් හෝදන තැනට ගෙනියපන්, ග්‍රීෂ්කා වෙනුවට මොහුට වැඩ බාරදෙන්ටයි කියලා ප්‍රොසින්කාට කියපන්."

ලුණු උෆරු මස් කපමින් සිටි ඈ පිහිය ඉවත දමා පාච්කා දෙස බලා හිස වනා ශාලාව මැදින් ගොස් පසෙක වූ දොරක් වෙත ගියාය. ඒ පිඟන් සෝදන තැනය. පාච්කා ඇය පිටුපසින් ගියේය. ඔහුගේ මවු ද ඉක්මනින් පා නඟමින්, කනට කොඳුරා යමක් කීවාය.

"දැන් ඉතින් පව්ලූෂ්කා උත්සාහ කරපන්. නින්දා වෙන වැඩ කරන්නට එපා."

පුතුට දුක්මුසු බැල්මකින් සංග්‍රහ කළ අම්මා අවන්හලින් පිට වූවාය.

පිඟන් සෝදන තැන ලභි ලභියේ වැඩ කෙරේ. පිඟන්, ගෑරුප්පු හා පිහි ගොඩ කන්දක් තරම් උසය. ඒවා මේසයක් මත තබා ඇත. තුවා උරුහිසින් ගත් ගැහැනු කීප දෙනෙක් සේදූ පිඟන් ආදිය පිස දමති.

පාච්කාට වඩා යම්තමින් වැඩිමහලු කොල්ලෙක් විශාල සමොවාර දෙකක් සූදානම් කරමින් සිටී. තැනින් තැන ගුළි ගැසී ඇති ඔහුගේ හිසකෙස් රත් පැහැතිය.

පිඟන් සෝදන වතුර ටැංකියේ ඇති උණු දියෙන් පැන නැඟි වාෂ්ප නිසා එතැන වැඩ කරන ගැහැන්ගේ මුහුණ පාච්කාට නොපෙනෙන තරම්ය. කළ යුත්තේ කුමක්දැයි නොදත් ඔහු සිටගෙන සිටියේය.

සීනා, පිඟන් සෝදමින් උන් එක් ගැහැනියකට ළං වී ඇගේ උරහිසට අතක් තබා මෙසේ කීවාය:

"ප්‍රෝසින්කා, ග්‍රීෂ්කා වෙනුවට මෙන්න වෙනින් කොල්ලෙක්. කළ යුතු වැඩ ගැන ඔහුට කියා දීපන්."

ප්‍රෝසින්කා නමින් හැඳින්වුණු ගැහැනිය පෙන්වූ සීනා පාවෙල් දෙසට හැරුණාය.

"මෙතැන ලොක්කී එයා තමා, එයා කියන හැම වැඩක්ම කරන්ට ඕන." මෙසේ කී සීනා අවන්හලට ගියාය.

"හොඳා" පාවිකා සෙමින් පිළිතුරු දී තමා ඉදිරිපිට සිටින ප්‍රෝස්යා දෙස බැලුවේ ප්‍රශ්නයක් අසන ලීලාවෙනි. ගැහැනිය නළලේ ඩහදිය පිසදා ගත්තී, ඔහුගේ තරම මනින්නාක් මෙන් හිස සිට දෙපා දක්වා විමැසුම් බැල්මක් හෙළා, ඇසූවන් මන පිනවන පසන් හඬකින් කතා කළාය.

"කොල්ලා, නුඹේ වැඩේ එතරම් ලොකු නැහැ. උදේට මෙන්න මේ ටැංකියේ වතුර නටන තුරු උණු කරන්නට ඕන. නිතරම උතුරන වතුර තියෙන්ට ඕන. දර පළන්නට ඕන. සමොවාර ලෑස්ති කිරීමත් නුඹට අයිති වැඩක්. ඊට පස්සේ ඕන වුණොත් හැඳි ගෑරුප්පු සුද්ද කරන්නට වේවි. ඉඳුල් වතුර විසි කරන්ටත් ඕන. වැඩ ඕන තරම් ඉලන්දාරියා." ඕ කස්ත්‍රොමා පෙදෙසේ බස් උසුරුව අනුව 'ආ' ශබ්දය ඇද පැද කියන්නට වූවාය. ඇගේ කතාව හා මුහුණේ පැහැය නිසාද, දෙහි ගැටයක් වැනි නහය නිසාද පාවිකාගේ සිතෙහි සතුටක් ඇති විය.

"නැන්දා, එතරම් නරක නැහැ." තමාටම කියා ගත් පාවිකා ප්‍රෝස්යා ඇමතීය.

"නැන්දේ, දැන් කළ යුතු වැඩේ මොකක්ද?"

ඔහුගේ පැනයේ අග කොටස යටපත් කරමින් නැඟී ආ කටහඬ නිසා ඉබේටම ඔහුගේ කට වැසිණි.

"හා, හා, හා! .... මෙන්න ප්‍රෝසින්කාට බෑනා කෙනෙක් හම්බ වෙලා" පිඟන් සෝදමින් උන් ගැහැනු හඬලමින් සිනාසුණහ.

"හා, හා!" හැමටම වඩා වැඩියෙන් සිනාසුණේ ප්‍රෝස්යා ය.

වාෂ්ප නිසා පාවිකාට ඇගේ මුහුණ හරි හැටි නොපෙනුණේ ය. ඒ නිසා ප්‍රොස්යාගේ වයස අවුරුදු දහ අටක් පමණක් බව ඔහු නොදත්තේ ය.

හොඳටම ලජ්ජා වුණු පාවිකා ළඟ සිටි කොල්ලාගෙන් මෙසේ ඇසුවේය.

"දැන් කළ යුත්තේ මොනවාද?

පිළිතුරු වෙනුවට කොල්ලා හඬ නඟා සිනාසුණේය.

"නුඹ, නුඹේ නැන්දාගෙන් අහපන්. ඈ නුඹට කියා දේවි. මම තාවකාලික වැඩකාරයෙක්." ඔහු දොරක් හැර කුස්සියට ඇතුළු විය.

"මෙහෙ වරෙන්. ගෑරුප්පු පිහදාන්ට උදව් වෙයන්." තරුණ විය පසු කළ ගැහැනියක් අණ කරන සැටි පාවෙල්ට ඇසිණි. "මොකද නුඹලා ඔය හැටි කෙකර ගාන්නෙ? මේ කොල්ලා අමුතු දෙයක් කීවාද? මෙන්න මේක ගනින්." ගැහැනිය පාච්කාට තුවායක් දුන්නාය. "තුවායේ කොනක් දැතින් අල්ලා ගනින්, අනික් කොන අතකින් ගෙන, ගෑරුප්පුවේ දිග දැති තුවාය අතරින් යවාපන්, එහාට මෙහාට. දැති අස්සේ කුඩා ආහාර කැලි නොතිබෙන්ට වග බලා ගනින්. මෙහි ගෑරුප්පු හොඳට හොයා බලනවා. කෑම කන්නට එන මහත්වරු ගෑරප්පු හොඳට බලනවා. අපිරිසිදුව එහෙම තිබුණොත් වැඩ වරදීවි. අයිතිකාරිය නුඹව එළවා දමාවි."

"අයිතිකාරියක් කොයින්ද?" පුදුමයට පත් පාච්කාට නොතේරිණි. "මාව වැඩට ගත්තේ මේකේ අයිතිකාර මහත්තයා නොවැ."

"පුතේ අයිතිකාරයා හරියට ඇඳ, පුටු අල්මාරි වගේ; මිනිහා පිඳුරු දමාපු මේට්ටයක්. හැමදේටම ලොක්කී තමා අයිතිකාරි. එයා අද මෙහෙ නැහැ. ටිකක් වැඩ කරන කොට නුඹ එයාව දකීවි."

පිඟන් හෝදන කාමරයේ දොර හැරි වේටරයෝ තිදෙනෙක් ඇතුළු වූහ. ඔවුන'ත ඉඳුල් පිඟන් ගොඩක් බැගින් විය.

පුළුල් උරතල සහ වපරැස් ඇති වේටරයෙක් කතා කළේය. ඔහුගේ මුහුණ හතරැස් කොටුවකට සමානය.

"ඉක්මනින් වැඩ කරපල්ලා. දැන් දොළහේ රේල්ලුව ඒවි. නුඹලා නිදි කිරනවා."

පාවෙල් දුටු හේ ප්‍රශ්න කළේය.

"මේ කවුද?"

"අලුතෙන් ආ කොල්ලා." ප්‍රෝස්යා කීවාය.

"ඒයි, අලුත් කොල්ලා." යැයි පාච්කා ඇමතූ වේටරයා දැවැන්තමය අතක් ඔහුගේ උරැහිස මත තබා සමොවාර දෙසට ඔහු තල්ලු කළේය. "මේ සමොවාර හැම තිස්සෙම ලැස්ති කරලා තියාපන්. පේනවද එකක් නිවිලා, අනික දුම් ගහනවා. අද නුඹට සමාව දෙනවා. හෙට මේ විදිහට තිබුණොත් නුඹේ

හොම්බ පොඩි කරනවා. තේරුණාද?"

වචනයකුදු කතා නොකළ පාව්කා සමොවාර පිළියෙල කිරීමට පටන් ගත්තේය.

එලෙස ඔහුගේ ශ්‍රම ජීවිතය ඇරැඹිණි. වැඩ කිරීම පටන් ගත් පළමුවැනි දවසේ තරම් ඔහු අන් කිසි දිනෙක උනන්දුවක් නොදැක්වීය. "අම්මාට අකීකරු වී හිතු දෙයක් කරන ගෙදර වැනි තැනක් නොවේය මෙතැන." යන්න පාව්කාට වැටහිණි. වැඩේ හරි හැටි නොකළොත් හොම්බ පොඩි කරන බව වපර වේටරයා පැහැදිලි ලෙසම කියා ඇත.

වතුර බාල්දි හතරක් බැගින් පිරවිය හැකි විශාල ලෝහ සමොවාරවල අඟුරු කැට රත් පැහැ ගති. දණහිස දක්වා උසැති සපොග් නමැති සපත්තුවක් ගලවා එය සමොවාරයේ බටයට සවි කොට මයිනහමක් සේ අදිමින් සමොවාරයේ ලිප්වල ගිනි මෙළවීමට පාව්කා සමත් විය. ඉඳුල් වතුර බාල්දි ගෙන ගොස් වළට දමා ඒවා පිරිසිදු කිරීමද, වතුර ටැංකියට දර දමා වතුර උණු කිරීමද, උතුරන වතුර සහිත සමොවාරවල බඳයට තබා තෙත් වූ තුවා වේළා ගැනීමද, කී හැටියේම ඕනෑම වැඩක් කර දීමද ඔහු විසින් කරන ලදි. රෑ බෝ වූ පසු පාව්කා කුස්සිය දෙසට ගියේය. ඔහු මුළුතැන්ගෙට ඇතුළු වනවාත් සමඟම පිඟන් සෝදන්නියක වූ අනීසියා මෙසේ පැවසුවාය:

"උෆ් නම් අපූරු කොල්ලා. පිස්සෙක් වගේ දුව, දුව වැඩ කරනව. අතමිට හිඟ නිසා වෙන්ට ඕන කොල්ලා මෙහාට වැඩට එව්වේ."

"ඔව්, ඉලන්දාරියා වැඩට කම්මැළි නැහැ. කියන තුරු බලාගෙන ඉන්නෙ නැහැ." යි ප්‍රොස්යා තෙපලා ය.

"ඉක්මනින්ම මහන්සි වේවි." ඇගේ කතාවට විරුද්ධ වූ ලූෂා කීවාය. "පටන් ගන්න කොට නම් කවුරුත් ඔහොම තමා..."

පසුදා උදේ හතට වැඩට පැමිණ අනික් කොල්ලාට උතුරන වතුර සහිත සමොවාර භාර දුන් පාව්කා ඉකුත් රෑයෙහි නිදි මැරීම හා හැම තැනම දුවමින් ලහි ලහියේ වැඩ කිරීම නිසා වෙහෙසට පත් වී සිටියේය. වැඩ භාරගත් කොල්ලාගේ මුහුණ මහතය. ඇස් අවිනීතය.

සමොවාරවල ලිප් තුළ ඉතා හොඳින් ගිනි මොළවා ඇති බව සැක හැර දැනගත් කොල්ලා දැත් සාක්කුවලට ඔබා ගෙන කෙළ ගසා, තමා ඔහුට වඩා උසස්ය යන ව්‍යාජ මානයක්

ඇති කර ගනිමින්, පාවිකා දෙස සාවඥ ලෙස බැලීය. එවිට ඔහුගේ දෙනෙත් දිලිසිණි. අනෙකාට විරුද්ධ විය නොහැකි හඬකිනි, ඔහු කතා කළේ.

"ඒයි, හොටුවා! වැඩ බාරගන්ට හෙට උදේ හයට වරෙන්."

"උදේ හයට, ඒ මොකටද? වැඩ බාරගන්නේ උදේ හතට නොවැ."

"කාගෙවත් කීම් මට උවමනා නැහැ. නුඹ හයට වරෙන්. නුඹ ඕනෑවට වැඩිය බුරන්නට ආවොත් මූණ හංවඩු ගහනවා. හරි කෙරුමෙක්. ඊයෙයි වැඩට ආවෙ. අද ඉඳලා බොරු ගණන් දාන්ට එනවා."

ඉකුත් රැයෙහි වැඩ කළ ගැහැනු උදේ වැඩට ආ ගැහැනු සමඟ එක් වූවෝ කොල්ලන් දෙදෙනාගේ කතාවට මහත් වුවමනාවකින් සවන් දුන්හ. කොල්ලාගේ මුරණ්ඩුකාරී හැසිරීම සටනට අභියෝගයක් වූයෙන් පාවෙල් කෝප විය. ඔහු අඩියක් පෙරට තබා කට මැත දොඩවන කොල්ලාට ඉළ කැඩෙන පහරක් ගැසීමට සූදානම් වුණද, වැඩට ආ පළමුවැනි දවසේම කලහ කළොත් රැකියාවෙන් පන්නා දමනු ඇතැයි බිය විය.

"නුඹ සන්සුන් වෙයන්. ඕනෑවට වැඩියෙ උඩ පැන්නොත් ඇටකටු පොඩි වෙයි. මා වැඩට එන්නේ හෙට උදේ හතට. නුඹ වගේම මටත් පුළුවනි ගහගන්ට. නුඹ ලෑස්ති නම් බැහැපිය එළියට." පාවෙල් කීවේ මැඩගත් කෝපයෙනි.

කොල්ලා අඩියක් පස්සට ගෙන චතුර ටැංකිය දක්වා පසු බැස, පාවිකාගේ බැරෑරුම් මුහුණ දෙස පුදුමයෙන් බැලීය. මෙතරම් දැඩි විරුද්ධත්වයක් බලාපොරොත්තු නොවූ ඔහු තරමක් තිගැස්සිණි.

"හොඳයි, පස්සේ බලමුකෝ." ඔහු මිමිනුවේය.

පළමුවැනි දවසේ වැඩ සාර්ථක විය. අවංක ලෙස වැඩ කිරීම නිසා විවේක ගැනීමට අයිතියක් ඇති මිනිහෙකු තුළ ඇති වන හැඟීමකින් යුතුව පාවිකාද සිය නිවෙස බලා පා නැඟීය. දැන් ඔහුද ශ්‍රමය වැය කර යැපෙන්නෙකි. ඔහු පින් බතකු වශයෙන් හැඳින්වීමට දැන් කිසිවෙකුට බැරිය.

දවදඬු කම්හලට එපිට, ඈත අහසේ හිරු කම්මැළියෙකු සේ උදා විය. පාවිකා ඉක්මනින්ම නිවසට සේන්දු වනු ඇත. ලෙෂින්ස්කිලාගේ බංගලාවට පිටුපසිනි ඔහුගේ නිවස පිහිටා ඇත්තේ.

"අම්මා නිදාගෙන නැතිව ඇති. මම වැඩ හමාර කොට

ගෙදර යනවා." පාවෙල් මෙසේ සිතමින් ඉක්මනින් පා නැඟීය. "මාව ඉස්කෝලෙන් පැන්නුවාට තත්ත්වය එතරම් නරක අතට හැරුණේ නැහැ. කොහොම හරි ඒ දුෂ්ට පූජකයා මගෙන් පළි ගනීවි. දැන් ඉතින් ඔහුට හෙණ වැදුණත් මට කමක් නෑ." පාවෙල් නිගමනය කරමින් ගෙවැටෙහි කඩුල්ල හරිමින්, යළි සිතන්නට විය. "අද මා ඉදිරියේ කටමැත දොඩවපු කොල්ලාගේ කන පළනවා, පළනවාමයි."

අම්මා ගෙවත්තට වී සමොවාරය පිළියෙල කරමින් සිටියා ය. පුතා දුටු ඇය කැලඹීමකින් යුතුව ඇසුවාය.

"ආ කොහොමද?"

"හොඳයි." පාවෙල් පිළිතුරු දුන්නේය.

අම්මා කිසිවක් දැන්වීමට සූදානම් වූ සැටියකි. පුළුල් ලෙස විවරව ඇති ගෙයි කවුළුවෙන් තම වැඩිමල් සොහොයුරු අර්ටියොම්ගේ පුළුල් උරතල දුටු පාවිකාට කාරණය වැටහිණි.

"අර්ටියොම් ගෙදර ඇවිල්ලද?" කුළැටි ගතියකින් ඔහු ඇසීය.

"ඊයෙයි, ආවෙ. මෙහෙ නවතීවි. දුම්රිය ඩිපෝවේ වැඩට යාවි.

පාවිකා ගෙයි දොර හැරියේ වැනෙනසුලු ගතියකිනි.

මේසය ළඟ වාඩි වී සිටි විශාල සිරුරකින් හෙබි ඒ තරුණයා පාවිකා දෙසට හැරුණේය. ඝනව වැඩුණු ඇහි බැමිවලට යටින් පිහිටි තියුණු නෙත් සඟළක් ඔහු දෙස බැලීය.

"ආ දුම්කුඩුකාරයා ආවද? ඉතින් සුවදුක් කොහොමද? ආයුබෝවන්!"

ගෙදර විත් සිටින වැඩිමල් සොහොයුරු සමඟ කරන සාකච්ඡාවෙන් තමාට සතුටක් නොලැබෙන බව පාවිකා දනී.

"අර්ටියොම් හැම දෙයක්ම දන්නවා. බණිනවා පමණක් නොවෙයි, ගුටි මුරයකුත් ලැබෙන්ට පුළුවනි." ඔහු සිතීය.

පාවෙල් අර්ටියොම්ට තරමක් බිය විය.

එහෙත්, අර්ටියොම් පාවෙල්ට දඬුවම් දීමට සැරසෙන බවක් නොපෙනිණි. වැළමිටි මේසය මත තබා ගෙන තම මල්ලී දෙස බලාගත් වනම හුන් අර්ටියොම් බංකුවක වාඩි වී සිටියේය. උපහාසය මුසු සාවඥතාවක් ඔහුගේ බැල්මෙහි දක්නට තිබිණි.

"ඉතින් නුඹ විශ්වවිද්‍යාලවලින් උපාධි ලබා ගෙන, සියලු ශාස්ත්‍ර ඉගෙන ගෙන, දැන් පිඟන් සෝදන විද්‍යාව හදාරනවාද? යි අර්ටියොම් ඇසීය.

පාච්කා ලීයෙන් කළ ගෙබිමට නෙත් හරවාගෙන, එහි වූ යකඩ ඇණයක් පිරික්සන්නට විය. අර්ටියොම් නැඟිට සිට කුස්සියට ගියේය.

"මේ පාර ගුටි කන්නට සිදු නොවන හැඩයි." පාච්කා සැහැල්ලු සුසුමක් හෙළීය.

තේ බොන විට අර්ටියොම් පාසලේ සිද්ධිය ගැන සවිස්තර ලෙස අසන්නට විය.

පාච්කා නොසඟවා හැම දෙයක්ම කීය.

"මේ වගේ මැරකම් කරන කොට නුඹට හෙට අනිද්දාට මොනවා වේවිද?" අම්මා සංවේගයෙන් ප්‍රශ්න කළාය." අපි මේ කොල්ලාව හදන්නෙ කොහොමද? කාගේ ආරෙටද මූ හැදෙන්නෙ? අනේ දෙවියනි, මේ කොල්ලා නිසා මා කොතරම් දුක් වින්දාද?" ඕ කන්නලව් කළාය.

හිස් කෝප්පය මෑත් කළ අර්ටියොම් පාච්කා වෙත හැරී මෙසේ පැවසීය.

"ඔන්න මල්ලියේ අහගනින්. දැන් ඉතින් වුණ දේ වුණා. වැඩ කරන තැන හොඳින් වැඩ කරපන්. ඉන්ද්‍රජාලම් පෙන්වීම නවත්වාපන්. දෙන හැම වැඩක්ම කරපන්. එතැනින් නුඹව පැන්නුවොත් නුඹගේ අඬු කඩනවා හැර වෙන කරන්ට දෙයක් නැහැ. ඔන්න මතක තියා ගනින්. අම්මාට වධ දුන්න මදිද? නුඹට යකා වැහිල. කොහෙ ගියත් ලෙඩක් දාගන්නවාමයි. දැන් ඉතින් ඒවා සේරම නවත්වාපන්. අවුරුද්දක් විතර ඔතන කොහොම හරි වැඩ කරපන්. ඊට පස්සේ ඩිපෝවේ වැඩ ඉගෙනගන්ට නුඹව බඳවා ගන්නම්. පිඟන් හෝදන රස්සාවෙන් නුඹට මිනිහෙක් වෙන්ට බැහැ. කර්මාන්තයක් ඉගෙන ගන්ට ඕන. තවම නුඹ පොඩි වැඩියි. අවුරුද්දක් විතර ගියාම ඩිපෝවෙ ලොක්කන්ගෙන් ඉල්ලා හිටින්නම්. සමහර විට නුඹට තැනක් දේවි. මම මෙහි ඩිපෝවට වැඩට එනවා. අම්මා ගෙවල් ගානේ ගිහින් වැඩ කිරීම නවත්වාවි. නීචයන් ඉදිරිපිට ඇය හිස පාත් කළා මදෑ. පාච්කා නුඹ ප්‍රවේසමින් වැඩ කරපන්. මිනිහෙක් වෙයන්."

යෝධයෙක් තරම් උසැති ඔහු නැඟිට සිටියේය. පුටු ඇන්දේ එල්ලා තිබුණු කබාය හැඳගත් ඔහු අම්මා ඇමතීය:

"මට වුවමනාවකට යන්ට තියෙනවා. පැයක් විතර යාවි." හිසත්, උඩුකයත් නමා ගනිමින් හෙතෙම උළුවස්සෙන් පිට විය. කවුළුව අසලින් ගමන් කළ ඔහු පාච්කාට ඇසෙන සේ, "මම නුඹට සපත්තු දෙකකුයි, පිහියකුයි ගෙනාවා. අම්මා නුඹට දෙයි." පැවසීය.

★ ★ ★

දුම්රියපොළේ අවන්හල නැවතීමක් නැතිව වෙළඳාම් කරයි.

දුම්රිය මාර්ග පහක් එකට සම්බන්ධ කරන දුම්රියපොළකි, එය. රාත්‍රියේදී පැය දෙක - තුනකදී පමණක් දුම්රියපොළ ජනයාගෙන් හිස්ව පවතී. දුම්රිය නැති කාලයේදී එතැන නිහඬතාවකි. මේ දුම්රියපොළේ සිට යුද පෙරමුණේ විවිධ පෙරමුණවලට යුද භටයන් ගෙන යති. එමෙන්ම නොයෙක් පෙරමුණුවලින් තුවාල ලැබූ හා අංගවිකල වූ සෙබළුන් රැගත් දුම්රිය මෙහි නැවැත්වෙයි. මෙහි සිට යුද පෙරමුණ බලා යන මිනිස්සු අළු පැහැති ඒකතානමය සෙබළ කබා හැඳගෙන ගමන් කළහ.

පාව්කා අවන්හලේ දැවුරුද්දක්ම වැඩ කළේය. මේ කාලය තුළදී ඔහු දුටුවේ පිඟන් සෝදන තැනත්, කුස්සියත් පමණකි. බිම් ගෙයක් වැනි කුස්සියේ ලහි ලහියේ වැඩ කෙරිණි. මෙහි වැඩ කළවුන්ගේ ගණන විස්සකටත් වැඩිය. වේටරවරු දහ දෙනෙක් නිතර නිතර අවන්හලේ සිට මුළුතැන්ගෙට දුව එති.

දැන් පාව්කාගේ මාසික වේතනය රූබල් අටක් නොව දහයකි. දැවුරුද්ද තුළදී ඔහු හැදී, වැඩී ශක්තිමත් විය. මේ කාලය තුළදී ඔහු බොහෝ දුක් කරදරවලට මූණ පෑවේය. හය මසක් තිස්සේ කුස්සියේ අත් උදවුකාරයෙකු ලෙස වැඩ කළ ඔහු නැවත ඉඳුල් පිඟන් සේදීමට යැවිණි. ප්‍රධාන කෝකියාගෙන් නිතර ටොකු කන මේ මුරණ්ඩු කොල්ලා කවදා හෝ තමාට පිහි මිටින් පහර දෙතියි ඔහු බිය විය. එබැවිනි, ප්‍රධාන කෝකියා පාව්කා නැවත පිඟන් සේදීමට යැව්වේ. වැඩ කිරීමේ හැකියාව නිසා නොවේ නම්, පාව්කා එතැනින් පන්නා දමා බොහෝ කල් වනු ඇත. අන් හැමටම වඩා වෙහෙස නොවී වැඩ කිරීමට හේ සමත්ය.

අවන්හල ජනයාගෙන් පිරී ඇති වේලාවලදී පාව්කා පිඟන් කෝප්ප සහිත තැටි රැගෙන පවනට බඳු වේගයෙන් දුවමින්, පඩිපෙළෙහි පඩි තුන හතරක් බැගින් මඟ හරිමින් පැන කුස්සියට යයි. නැවත අවන්හලට වදී.

අවන්හලේ ශාලා දෙකට පැමිණෙන ජනයා අඩු වූ විට, කුස්සියේ ගබඩා කාමරයේ රැස් වන වේටරවරු 'බුරුවා' හෝ 'තුන්සිය හතර' සෙල්ලම් කරති. මේසය මත තිබෙන මුදල් නෝට්ටු පාව්කා නිතර පාහේ දැක ඇත. ඔහු විශාල

නෝට්ටු ගොඩ නිසා පුදුම නොවූයේ, වැඩ කරන දවසකට එක වේටරයෙක් රුබල් තිහක්, හතළිහක් 'ටිප්' වශයෙන් ලබන බැවිනි. රුබලයක් හෝ කොපෙක් පනහක් බැගින් හෝ පාරිතෝෂික මුදලක් ලබා ගන්නා වේටර්වරු මැදියම් රාය වන විට මත්පැන් බීමට සහ බූරුවා ගැහීමට පටන් ගනිති. පාව්කා ඔවුන් දැඩි ලෙස පිළිකුල් කළේය.

"අධම නීචයෝ!" හේ ඔවුන් ගැන සිතීය. "අර්ටියෝම් ඉතාම දක්ෂ මිකැනික් කෙනෙකි. ඒ වුණාට මාසික පඩිය රුබල් හතළිස් අටයි. මට මාසෙට රුබල් දහයයි. උන් දවසකට කොච්චර හම්බ කරනවාද? කෑම බෙදනවා. ඉඳුල් පිඟන් ගෙන යනවා. බොනවා සූදු කෙළලා පරදිනවා."

ඔවුන්, අයිතිකාරයන් මෙන්ම, හතුරු පිටත්තර එවුන් බව පාව්කාගේ වැටහීම විය. "මේ නීචයෝ මෙතැන මෙහෙකරුවන් වගේ වැඩ කරනව. ඒ වුණාට උන්ගේ ගෑනු සහ ළමයි නගරවල පොහොසතුන් වගෙ ජීවත් වෙනවා."

ඔවුහු තම ළමයින්ට විදුහල්වල ඇඳුම් කට්ටල අන්දවාගෙන ආහ. ඔවුන්ගේ බිරියන් සතුටින් ඉපිලෙමින් ඔවුන් සමඟ පැමිණියහ. "උසස් රැකියා කරන මහත්වරුන්ට වඩා මේ වේටරයන් ළඟ මුදල් ඇතැ" යි පාව්කා සිතීය. මෙහි පිඟන් හෝදන ගැහැනුන් හා වෙළෙන්දියන් බලවත් එවුන්ට තම සිරුර රුබල් කිහිපයකට නොවිකුණති නම්, ඔවුන්ට වැඩි කලක් අවන්හලේ සේවය කළ නොහැකි බව දත් පාව්කා රාත්‍රියේ දී කුස්සියේ අහුමුලුවල සහ ගබඩාකාමරවල සිදු වන දේ නිසා පුදුම නොවීය. පාවෙල් ජීවිතයේ ගැඹුරු පතුල දිටීය. ගැඹුරු ළිඳක් වැනි එය පල් වතුරෙන් පිරිලාය. පෙඳ පාසිවලින් වැසී ඇති ඉන් නිකුත්වන්නේ ගඳකි. එහෙත්, හැම දෙයක්ම දැන ගැනීමට ඔහු තුළ ඇත්තේ අසීමිත ආසාවකි.

අර්ටියොම්ට තම බාල සොහොයුරා ඩිපෝවේ වැඩට බඳවා ගැනීමට බැරි විය. පහළොස් අවුරුද්දට වඩා වයසින් අඩු කොල්ලන් වැඩට නොගනී. අවන්හලින් පිටවෙන්නේ කවදාදැයි නිතර සිතන ඔහු නිතැතින්ම ඇදී ගියේ ගලින් තැනූ, දුමෙන් වැසුණු ඩිපෝව වෙතටය.

ඉඳහිට අර්ටියොම් බැලීමට යන පාව්කා ඔහු සමඟ ගොස් දුම්රිය යන්ත්‍ර හා මැදිරි බලයි. මල්ලී නිතර තම අයියාට උදව් කිරීමට වෙර දරයි.

ප්‍රොස්යා අවන්හලේ රැකියාවෙන් අස්ව ගිය පසු පාව්කාගේ කාන්සිය තවත් වැඩි විය.

නිතර සිනා පාන ප්‍රීතිමත් තරුණිය එහි නොවූවාය. ඇය සමඟ ඔහු ඇති කර ගත් මිතුරු බව වඩාත් තියුණු ලෙස ඔහුට දැනෙන්නට වූයේ එබැවිනි. උදැසන පිඟන් සෝදන කාමරයට එන ඔහුට එහි සිටින්නන්ගේ අඬදබර ඇසෙන විට, ඔහුගේ හුදෙකලා බව වැඩි වෙයි. ඔහුට දැනෙන පාළු බව උග්‍ර වෙයි.

රාත්‍රී විවේක කාලයේදී වතුර ටැංකිය සහිත ලිපට දර දමා ඇන තබාගෙන එය ඉදිරියෙහි වාඩි වූ පාච්කා දෙනෙත් හකුළුවාගෙන නටන ගිනි දැල් දෙස බැලීය. උණුසුම නිසා ඔහුට සතුටක් දැනිණි. පිඟන් සෝදන තැන කිසිවෙකු නැත.

දැනට මෙහි නැති ප්‍රොස්යා ගැන ඔහුට මතක් විය. ඇය පිළිබඳ මතක සටහන් මනසෙහි උපනි.

සෙනසුරාදා රාත්‍රී විවේක කාලයේදී පියගැටපෙළ දිගේ මුළුතැන්ගෙට ගිය පාච්කා කුතුහලය නිසා දර මඩුවට ඇතුළු විය. සූදුපොළ මෙතැනය.

වේටරවරු මහත් උනන්දුවෙන් සූදුකෙළියහ. සල්ලි ගොඩ භාරව සිටි සලිනෝව්ගේ මුහුණ කැලඹීම නිසා රතු පැහැ ගෙන තිබිණි.

පියගැටපෙළ දිගේ යන්නෙකු පිය නඟන හඬ ඇසිණි. පාච්කා හැරී බැලීය. ප්‍රහෝෂ්කා එන හඬ ඇසෙයි. ඔහු කුස්සියට යන තුරු පාච්කා පියගැටපෙළ යට සැඟවුණේය. දැඩි අඳුර නිසා ප්‍රහෝෂ්කාට ඔහු නොපෙනේ. කුස්සිය දෙසට පා නඟන ප්‍රහෝෂ්කාගේ පළල් උරතල හා ලොකු හිසද පාච්කාට පෙනේ.

තවත් කෙනෙකු ඉක්මනින් පියගැටපෙළ දිගේ පහළ බසින සැටි ඇසේ, පුරුදු කටහඬකි.

"ප්‍රහෝෂ්කා නැවතියන්"

ප්‍රහෝෂ්කා නැවතී ආපසු හැරී උඩ බැලුවේ ප්‍රශ්නයක් අසමිනි.

"නුඹට ඕනෑ මොනවාද?"

පහළට බැස්ස තැනැත්තියව පාච්කා හඳුනා ගත්තේය. ඕ ප්‍රොස්යාය.

ඈ වේටරගේ කබා - අත අල්ලා ගත්තී, බිඳුණු හඬකින් ඔහු ඇමතුවාය.

"ප්‍රහෝෂ්කා, යුද්ධ නිලධාරියා නුඹට දුන් සල්ලි කෝ?"

වේටරයා අත ගස්සා දැම්මේ මහත් වේගයෙනි.

"මොන සල්ලිද? මම නුඹට සල්ලි දුන්නෙ නැද්ද?" ඔහු කෝපයෙන් ඇසුවේය.

"යුද්ධ නිලධාරියා නුඹට රූබල් තුන්සීයක් දුන්නා නෙවද?" ප්‍රොස්යාගේ මුවින් ඒ වචන පිට වූයේ මැඩගත් සුසුම්ලෑම් සමඟය.

"රූබල් තුන්සීයක්ද?" අපහාසාත්මක ලෙස ප්‍රහෝෂ්කා ඇසීය. " නුඹට ඒ සල්ලි ඕනද? ඉඳුල් පිඟන් සෝදන ළමාතැනී කෙනෙකුට එතරම් ලොකු මුදලක් වැඩියි නේද? මා නුඹට දුන් රූබල් පනහ හොඳටම ඇති. කොතරම් ලොකු වාසනාවක්ද, හිතා බලපන්! නුඹට වැඩියෙ හොඳ උගත් නෝනලාට වුණත් රූබල් පනහක් ලැබෙන්නෙ නැහැ. ඔය ගණන දුන් නිසා නුඹ මට ස්තුති කරපන්. එක රැයක් නිදාගෙන රූබල් පනහක් හම්බ කළා. මෝඩයෝ නැහැ. නුඹට තව රූබල් විස්සක් විතර දෙන්නම්. නුඹ මෝඩියක් නොවී තව වැඩ කරපන්. මම නුඹේ ආරක්ෂාව හොඳට සලස්වන්නම්." අවසාන වැකිය කියමින් ප්‍රහෝෂ්කා ඇයට පිටු පා කුස්සිය දෙසට ගියේය.

"තෝ නීචයා, ජඩයා!" වේටරයාට ශාප කළ ප්‍රොස්යා දර ගොඩට පිට දී සුසුම්ලෑවාය.

පියගැටපෙළ යට සැඟවී, අඳුරට මුවා වී, මේ දෙබස අසා සිටි පාචිකාගේ හැඟීම් විස්තර කළ නොහැකිය. වචනයෙන් කිව නොහැකිය. ප්‍රොස්යා ඉකි බිඳිමින් දර ගොඩේ හිස හප්පා ගත්තාය. ඔහු වචනයකුදු කතා නොකර නිහඬ විය. ඔහුගේ ගත ගැහෙන්නට වූයෙන්, ඔහු පඩිපෙළෙහි යකඩ වැට අල්ලා ගත්තේය. හිස අවුල් නොවිණි. අදහස් පැහැදිලිව ගලා එන්නට විය.

"දුෂ්ටයෝ ඒ ගැනිවත් විකුණාගෙන කෑවා. අනේ ප්‍රොස්යා, ප්‍රොස්යා....!"

ප්‍රහෝෂ්කා වේටරයා කෙරෙහි පාචිකාගේ යටි සිතෙහි තිබූ වෛරය තවත් වැඩි වී උග්‍ර විය. අවට හැම දෙයක්ම අමිහිරි ලෙස ගල් ගැසී ගිය අතර, ඒවා තියුණු වෛරයට ලක් විය.

"ඔය නීචයාගේ පණ යනතුරු උඟට ගහන්ට ඇත්නම් මට හිටියත් එකයි, මළත් එකයි මගේ අයියා අර්ටියොම් තරම් මා ලොකු හා ශක්තිමත් තැත්තේ මන්ද?"

ලිපෙහි ගිනිදලු ඇවිළී, නැවත නිවිණි. රතු පැහැති ගිනි සිළු නටන්නට වූයේ නිල් පැහැති තුඩක් සමඟය. කිසිවෙකු තමාට උපහාස කරමින් දිව දිගු කොට පෙන්වන බවක් නටන ගිනි සිළු නිසා පාචිකාට දැනිණි.

කාමරය තුළ නිහඬතාවකි. ඉඳහිට ලිපෙහි දර පුපුරන

හඬකි. වතුර පයිප්පයෙන් කාන්දු වන වතුර බින්දු හඬක් නංවයි.

ලෝහ බඳුනක් ඉතා හොඳින් මැද පිරිසිදු කළ ක්ලීම්කා අරක්කැමියාගේ අත් උදවුකරු - දෑත් පිසදමා ගත්තේය. මුළුතැන්ගෙයිද කිසිවෙකු නැත. වැඩ බලන අරක්කැමියා සහ අනික් අය පිළිකන්නේ නිදති. රෑ යාමයෙහි තෙපැයකට මුළුතැන්ගෙයි වැඩ කටයුතු නවතී. ඒ වේලාවට ක්ලීම්කා උඩට ගොස් පාවෙල් සමඟ කතාබහ කරයි. අරක්කැමියාගේ අත් උදව්කාරයා සහ ගිනි උදුනට දර දමන්නා වූ කළු පැහැති නෙත් ඇති පාච්කා අතර ඇත්තේ සැබෑ මිත්‍රත්වයකි. නොවැසූ ගිනි උදුන ඉදිරියෙහි උක්කුටියෙන් වාඩි වී සිටින පාච්කා ක්ලීම්කාගේ නෙතට හසු විය. බිත්තියේ ඇති තම මිතුරාගේ සෙවණැල්ල පාච්කා දැක පුරුදුය. එහි හිසකේ අවුල්වෙලාය. ඔහු සෙවණැල්ල දෙස බලමින් කතා කළේය.

"ක්ලීම්කා වාඩිවෙයන්"

ගැටවරයා මනා ලෙස ගොඩගසා ඇති දර ගොඩ මත උඩුබැලි අතට දිගා වී උක්කුටියෙන් වාඩි වී නිහඬව සිටින පාච්කා දෙස බලා කතා කළේ මඳ සිනාවක් පාමිනි.

"නුඹ ගින්දර දිහා බලාගෙන ජප කරනවාද?"

පාච්කා නටන ගිනිසිළු දෙසින් දෙනෙත් ඉවතට ගත්තේ අසීරුවෙනි. දිලිසෙන ලොකු නෙත් දෙකක් ක්ලීම්කා දෙස බැලීය. ඒවායේ ගොළු කනගාටුවක් ඇති සැටි හේ දිටීය. තම සගයා කිසියම් දුක් සයුරෙක ගිලී සිටින සැටි ක්ලීම්කා දුටු පළමුවැනි වර එයය.

"පාච්කා නුඹ අද අමුතු වෙලා වගෙ ...." මොහොතක් නිහඬව සිටි හේ යළි මෙසේ පැවසීය: "මොනවා හරි නරකක් නුඹට සිදු වුණාද?"

නැඟිට සිටි පාච්කා සගයා අසලින් වාඩි විය.

"නරක කිසිවක් සිදු වුණේ නැහැ." යි කී පාච්කාගේ කටහඬෙහි ගොළු බවකි. "ක්ලීම්කා මට මෙතැන ඉඳීම අමාරු වැඩක්." දණහිස් මත තිබුණු ඔහුගේ දෑත් මිටින් ගත් කලෙක මෙන් ගුළි විය. "නුඹට අද මොනවා වෙලාද?" වැළමිටි වාරුවෙන් නැඟී සිටි ක්ලීම්කා යළි ඇසුවේය.

"නුඹ අහන්නෙ අද මොනවා වුණාදැයි කියලද? මා මෙහි වැඩට ආ දවසෙ ඉඳල වෙන දේ තමයි තවමත් වෙන්නේ. මෙතැන වෙන දේ ගැන නුඹ හිතා බලාපන්! අපි මෙතැන වැඩ කරනවා නොවෙයි කඹුරනවා, අපට ලැබෙන ස්තුතිය

තමා දත් කැඩෙන කම්මුල් පාර, හිතුණ එකා කැමති පරිදි ගහනවා. ආරක්ෂා කරන්ට කිසිවෙක් නැහැ. අයිතිකාරයා නුඹවයි, මාවයි වැඩට ගත්තේ වැඩ කරවා ගන්ටයි. සවි ශක්තිය ඇති එකාට පහර දීමට අයිතිය තියෙනවා. පණ යනතුරු වැඩ කළත් හැම දෙනාවම සතුටු කරන්න බැහැ. අසතුටු වුණු එකා පහර දෙනවා. පුළුවන් තරම් හොඳින් වැඩ කරන්ට මහන්සි ගන්නවා, කාටවත් වැරදි පෙන්වන්නට බැරිවන විදියට, හැමතැනම දුව, දුව වැඩ කරනවා. කොහොම වුණත් වෙලාවට නොගෙනාව කියලා කන හරහා ගහනවා." බිය වූ ක්ලීම්කා ඔහුගේ කථාවට බාධා කළේය.

" නුඹ කෑගහන්ට එපා. සද්දේ ඇහිලා කවුරුහරි එන්ට පුළුවනි."

"කමක් නැහැ, ඇහුණදෙන්, මම මෙතනින් යනවා යන්ට. මෙතනට වඩා හොඳයි මහ පාරේ හිම සුද්ද කිරීම.... මෙතන මිනී වළක්. හොරා පිට හොරා නැඟලා. උන් ළඟ කොච්චර සල්ලි තියෙනවද! අපව ගණන් ගන්නෙ බලු මැක්කන් හැටියට. කෙල්ලන්ව දූෂණය කරනවා. උන්ගෙ අණට අකීකරු වන ගෑනුන්ව දවසෙන් දෙකෙන් පන්නා දමනවා. උන් කොහේ යන්ටද? සතුරා විසින් අල්ලා ගනු ලැබූ පෙදෙස්වලින් පැනලා යන එවුන්, අසරණ දෙමාපියන් නැති එවුන් කුසගින්නෙන් පෙළෙන එවුන් මෙතන රැස් කරගෙන. උන් පාන් කැල්ලක් නිසා ඉවසගෙන ඉන්නවා. මෙතැන ඉඳුල් ටිකක්වත් හොයාගන්න පුළුවනි. මේ හැම දෙයක්ම වෙන්නේ බඩගින්න නිසා."

ඔහු කොතරම් කෝපාන්විතව කථා කළේද යත්, එය පිට අයට ඇසෙතියි බිය වූ ක්ලීම්කා වේගයෙන් ඉදිරියට පැන මුළුතැන්ගෙයි දොර වැසීය. හදවතින් බුර බුරා නැගෙන කෝපය පිට කරමින් පාවිකා නොනවත්වා කථා කළේය.

"ඔන්න බලපන් ක්ලීම්කා, නුඹට ගහනකොට නුඹ ගොළුවා වගේ කට නෑර ඉන්නවා. ඒ මොකද?"

පාවිකා කුඩා බංකුව මත වාඩි වී, විඩා පත් වූ කලෙක මෙන් අත්ල මත හිස තබා ගත්තේය. ක්ලීම්කා ලිපට දර දමා බංකුව අසල වූ මේසය අසල වාඩි විය.

"අද අපි කියවන්නේ නැතිද?" ඔහු පාවෙල්ගෙන් ඇසීය.

"පොත් ගන්ට බැරි වුණා. පොත් කඩේ වහලා." පාවෙල් පිළිතුරු දුන්නේය.

"අද පොත් කඩේ වෙළඳාමක් නැත්ද?" පුදුමයට පත්

ක්ලීම්කා යළි විචාළේය.

"පොත් වෙළෙන්දාව පොලිසිය අල්ලා ගෙන ගියා. ඔහු ළඟ මොනවදෝ තිබුණලු."

"මොනවටද?"

"දේශපාලනය හින්දා කියනවා"

මවිතයට පත් ක්ලීම්කා පාච්කාගේ මුහුණ දෙස බැලීය.

"දේශපාලනය කියන්නෙ මොනවාටද?"

පාච්කා දෙවුර සෙලවීය.

"මොන යකාද ඒ ගැන දන්නෙ! මිනිසුන් කියන හැටියට නම් සාර්ට විරුද්ධ වන මිනිහා තමයි, දේශපාලනකාරයා."

ක්ලීම්කා බියෙන් තිගැස්සිණි.

"ඒ වගේ උදවිය ඉන්නවාද?"

"දන්නෙ නැහැ." පාච්කා පිළිතුරු දුන්නේය.

දොර හැරිණි. නිදිමතින් සිටි ග්ලාෂා පිඟන් හෝදන කාමරයට ඇතුළු වුණා ය.

"කොල්ලනේ නුඹලා නිදාගන්නෙ නැත්තෙ මොකද? දුම්රිය එනතුරු පැයක් පමණ නිදාගන්න පුළුවනි. පාච්කා ගිහින් නිදා ගනින්. මම ලිපට දර දාන්නම්." ඕ කීවාය.

★ ★ ★

පාච්කාගේ සේවය හිටි හැටියේම අවසන් වූයේ ඔහු සිතුවාටත් වඩා කලිනි. ඔහු නොසිතූ පරිදි අවසානය එළැඹිණි.

ජනවාරි මාසයේ හිම තුෂාරය සහිත දැඩි ශීත දවසක පාච්කා පැය විසි හතරක් වැඩ කොට ගෙදර යාමට සූදානම් විය. වැඩ භාර ගැනීමට පැමිණිය යුතු කොල්ලා එදා නාවේය. අවහන්හල අයිතිකාරිය වෙත ගිය පාච්කා, තමා ගෙදර යන බව දැන්වුවද, ඈ ඔහුට අවසර නොදුන්නාය. නිදි නැතිව, වෙහෙසව සිටි ඔහුට තවත් පැය විසි හතරක් වැඩ කිරීමට බල කෙරිණි. රෑ වන විට ඔහුගේ ශක්තිය සිදිණි. මැදියම් රෑයෙහි විශාල ටැංකියට වතුර පුරවා, ලිපට දර දමා, හිමිදිරි පාන්දර තුනේ දුම්රියෙන් පැමිණෙන මඟීන් සඳහා සූදානම් විය යුතුය.

ජල නළයේ කරාමය හැරියද වතුර නැත. ජල නළ මඟෙහි අලුත්වැඩියා කිරීමක් විය යුතුය. නළයේ කරාමය හැර දැමූ පාච්කා මොහොතක් නිවාඩු ගැනීමට හාන්සි විය. විඩාව ඔහු මැඩ ජය ගති. ඔහු නින්දට විය.

විනාඩි කිහිපයකින් ටැංකිය තුළට ජලය ගලා එන්නට

වූයෙන් එය පිරිණි. පිඟන් සෝදන කාමරයටද වතුර ගලන්නට විය. එවේලෙහි එහි කිසිවෙකු නොසිටියෙන් වතුර ගැලීම නොනැවැතිණි. ජලය කෙමෙන් අවන්හලේ ශාලාවට ද ගලන්නට විය.

කෙමෙන්, ජලය නිදා සිටි මඟීන්ගේ සූට්කේස්, මලු, වට්ටි, පෙට්ටි දක්වා පැතිර ගියද එය කිසිවෙක් නොදුටුහ. බිම වැතිර සිටි මඟියෙක් වතුරට තෙමී, බිය වී නැඟිට සිට කෑ ගැසීය. හැම දෙනම තමන්ගේ ගමන් මලු අතින් ගෙන කෑ කෝ ගසන්නට වූහ.

කෙමෙන් කෙමෙන් නොනැවැතී වතුර ගලන්නට විය.

අවන්හලෙහි දෙවැනි ශාලාවේ පිඟන් අස්පස් කරමින් සිටි ප්‍රහෝෂ්කා වේටරයා මඟීන්ගේ කෑ කෝ ගැසීම නිසා ජලයට යට වී තිබුණු ශාලාව හරහා දිව ගොස් දොර හරිත් ම, දිය පහර වේගයෙන් ගලා විත් ශාලාව තවත් යට කළේය.

මඟීන්ගේ කෑගැසීම වැඩි විය. වේටර්වරු පිඟන් හෝදන කාමරයට වැදුණෝය. ප්‍රහෝෂ්කා, නිදා සිටි පාචිකා වෙත කඩා පැන්නේය.

පාචිකාගේ හිසට පහර පිට පහර වදින්නට වූ අතර, ඔහු වේදනාව නිසා අප්‍රාණික විය.

සිදුවන්නේ මොනවාදැයි ඔහුට වටහාගත නොහැකි වූයේ ඔහු තද නින්දේ පසු වූ බැවිනි. දෙනෙත් ඉදිරිපිට ගිනි බෝල මතු වී, නිවී ගියේ වදින පහරවල් නිසාය. පාචිකාගේ සිරුර වේදනාවෙන් කකියන්නට විය. පණ යන තුරු මෙලෙස පහර කෑ ඔහු ගෙදර ගියේ දෙපා අද්දමිනි.

උදැසන, අර්ටියොම් මැඩ ගත් කෝපයෙන් යුතුව සිදුවූ දේ ගැන පාචිකාගෙන් සවිස්තර ලෙස ඇසීය. පාචිකා ඔහුට හැම දෙයක් ගැනම පැහැදිලි කළේය.

"නුඹට ගැහුවේ කව්ද?" අර්ටියොම් ඇසුවේ දැඩි ගතියකිනි.

"ප්‍රහෝෂ්කා"

"නුඹ, ඔහොම වැතිර හිටපන්"

කබාය හැඳගත් අර්ටියොම් නිහඬව ගෙයින් පිට විය.

★ ★ ★

"ප්‍රහෝෂ්කා වේටරව මට හමුවන්ට පුළුවන්ද?"

නාඳුනන කම්කරුවෙක් ග්ලාෂාගෙන් ඇසීය.

"ඔහු දැන් ඒවි. පොඩ්ඩක් නවතින්න." ඕ කීවාය.

යෝධමය දේහයකින් හෙබි කම්කරුවා උළුවස්සට හේත්තු වූයේය.

"හොඳයි නවතින්නම්."

විශාල තැටියක් පුරවා පිඟන් කෝප්ප ගත් ප්‍රහෝෂ්කා දොර හැරගෙන පිඟන් හෝදන තැනට ඇතුළු විය.

"මේ තමා ඔහු" ග්ලාෂා අතක් දිගු කොට ප්‍රහෝෂ්කා පෙන්නුවාය.

අර්ටියොම් පයක් පෙරට තබා ප්‍රහෝෂ්කාගේ උරයක් අල්ලා ගත්තේය. වේටරයා තම උරහිස මුදා ගැනීමට තැන් කළද, දඬුඅඬුවකට අසු වූ කලක මෙන් වේදනාවක් ඔහුට දැනිණි. ඔහු දෙස එක එල්ලේ බැලූ අර්ටියොම් ප්‍රශ්න කළේය.

"තෝ මොකටද බොල මගේ මල්ලිට ගැහැව්වෙ?"

වේටරයා උරහිස මුදා ගැනීමට තැත් කරත්ම, මිට මෙළවූ අර්ටියොම්ගේ අත ඔහු මත පතිත වූයේ හෙණ පහරක වේගයෙනි. වේටරයා, අර්ටියොම්ගේ දෙපා මුල ඇද වැටිණි. ඔහු දැඩි වෑයමකින් නැඟී සිටීමට තැත් කළද, අර්ටියොම් වඩාත් දැඩිව තවත් පහරක් ගැසීය. එවිට වේටරයා මළාක් මෙන් බිම වැතිර ගත්තේය.

බිය ගත් ගැනු ඇත් වූහ.

අර්ටියොම් එතැනින් පිට විය. ලේ විලක් මැද ප්‍රහෝෂ්කා කෙඳිරි ගාමින් වැතිර සිටියේය.

අර්ටියොම් ඩිපෝවට ගියද ගෙදර නොගියේය. පොලීසියේ හිර කුඩුවක අර්ටියොම් ලගින බව පසුව අම්මා දැන ගත්තාය.

හය දවසකට පසුව, අම්මා නිදන විට ඔහු ගෙදර ආවේය. ඇඳ මත වාඩි වී සිටි පාච්කා වෙත පැමිණි අර්ටියොම් මුදු ලෙස කථා කළේය.

"මල්ලිට දැන් සනීපද?" හේ ඔහු අසලින් වාඩි විය. " කමක් නෑ ඔයිට වඩා නරක දේ සිදු වෙනවා." නිහඬව සිටි අර්ටියොම් යළි කථා කළේය. "නුඹට විදුලි ස්ථානයේ වැඩට යන්නට පුළුවනි. මම ඒ ගැන කථා කළා. නුඹ එතැන වැඩ ඉගෙන ගනින්."

පාච්කා කුළුගෙඩියක් වැනි අර්ටියොම්ගේ විශාල අතක් තම දෑතින් ගෙන මිරිකුවේ කෘතඥතාවයෙනි.

II

"සාර් රජුව නෙරපා දමලා!"යන පුවත කුඩා නගරයට වැදුණේ විදුලි වේගයෙනි.

නගර වැසියෝ එය විශ්වාස නොකළහ.

හිම කුණාටුව පැවැති දවසක දුම්රියපොළට පැමිණි

දුම්රියකින් විදුහල් සිසුහු දෙදෙනෙක් වේදිකාවට පැන්නාහ. සෙබළ කබා ඇඟ ලා, බයිනෙත්තු සවි කළ තුවක්කු රැගත් මේ දෙදෙනාගේ අත්වල රතු පටිය බැගින් බැඳ තිබිණි. ඔවුන් විප්ලවීය හට කණ්ඩායමකට අයත් බව එය කියා පෑවේය. රතු පටි සහිත විප්ලවීය හට සේනාව, පොලිස් නිලධාරීන් ද, මහලු කර්නල්වද, නගරාරක්ෂක හමුදාවේ අණ දෙන සෙනෙවියාවද සිර භාරයට ගත්තේය. සාර් රජු නෙරපා දමා ඇති බව නගර වැසියන් විශ්වාස කළේ ඉන් පසුවය. හිමෙන් පිරි වීදි හා චතුරශ්‍රවලට මිනිස්සු ඇදෙන්නට වූහ.

නිදහස, සමානාත්වය හා සහෝදරත්වය ආදී වචනවලට ජනතාව ඉමහත් ආසාවකින් සවන් දුන්හ. ප්‍රීතියෙන් හා උද්දාමයෙන් යුත් දවස් කීපය ගෙවිණි. අනතුරුව නිහඬතාවකි. නගර සභා කාර්යාලය මත පමණක් රතු ධජය ලෙළ දිණි. නගරයේ පාලන මෙන්ෂෙවික්වරුන් හා බුන්ඩ්වාදීන් අතට පත්වෙමින් ඇති වූ වෙනස් වීම ගැන ධජය කියා පෑවේය. එහෙත්, අන් හැම දෙයක්ම පෙර සේම කෙරිණි.

හිම කාලය අවසන් වෙත්ම, ආරක්ෂක අසරු භට සේනාංකයක් නගරයට විත් කඳවුරු ලෑවේය. දිනපතා උදෑසන මේ සේනාංකයට අයත් අසරු භට කණ්ඩායම් නිරිත දිග යුද පෙරමුණෙන් පැන යන සෙබළුන් ඇල්ලීම පිණිස දුම්රියපොළට ආවෝය.

අසරු සේනාවේ භටයෝ උසැති, ශක්තිමත් අය වූහ. ඔවුන් බඩ කට පුරා කා බී සැපෙන් සිටින බව පෙනිණි. එහි ලොකු නිලධාරීහු රදල සිටුවරු හා කුමාරවරුය. ඔවුන්ගේ නිලය පෙන්වන උර පටි රනින් නිම කොට තිබිණි. ඔවුන්ගේ සරුවාලවල ලණු රිදීමය කෙඳිවලින් සාදලාය. සාර් රජු සිහසුන දුරු කලක මෙනි. කිසිම විප්ලවයක් නොසිදුවූ කලක මෙනි.

නවසිය දහහතේ අවුරුද්ද ගෙවී යන්නට ආසන්න විය. පාවිකා, ක්ලීම්කා, සිරියෝෂ්කා, බ්රුෂ්ෂාක් ආදීන්ගේ ජීවිතවල වෙනසක් නොසිදුවිණි. දේපළ, කම්හල් හා ධනය පෙර මෙන්ම, ධනපති පන්තිය සතු විය. නොකඩවා වැසි වසින නොවැම්බර් මාසයේදී කිසියම් අමුත්තක් හටගත් සැටියකි. දුම්රියපොළට අලුත් මිනිස්සු පැමිණියහ. යුද පෙරමුණේ අගල්වල සිට සෙබළු වැඩි වැඩියෙන් ආහ. ඔවුන් හැඳින්වූයේ බොල්ෂෙවික් නමැති පුදුම නමකිනි.

ස්ථිර තද ගුණයක් ගැන කී එම නම කෙසේ ඇතිවී දැයි කිසිවෙක් නොදත්හ.

යුද පෙරමුණෙන් පැන යන සෙබළුන් අල්ලා ගැනීම අසරු සේනාංකයට අපහසු කාර්යයක් විය. වෙඩි තැබීම නිසා නිතර දුම්රියපොළේ වීදුරු බිඳිණි. යුද පෙරමුණෙන් පැන යන්නෝ කාණ්ඩ සෑදී එන්නට වූහ. ඔවුන් අල්ලා ගැනීමට කිසිවෙකු උත්සාහ ගත් විට ඔවුහු බයිනෙත්තු පවා පාවිච්චි කළහ. දෙසැම්බර් මස මුලදී පැන යන්නන්ගෙන් දුම්රිය මැදිරි පිරිණි.

අසරු භට කණ්ඩායම් දුම්රිය ස්ථානය තුළ කඳවුරු බැඳගෙන එය අල්ලා සිටීමට කල්පනා කළෝය. පැන යන සෙබළුන්ට මැෂින් තුවක්කුවලින් වෙඩි තැබූහ. මරණයට පුරුදුව සිටි සෙබළ ජනකාය මැදිරිවලින් පිටතට පැන සටන් වැදුණෝය.

යුද පෙරමුණුවල සිට පැමිණි සෙබළු, අසරු ආරක්ෂක භටයන් නගරයට පන්නා දැමුහ. අනතුරුව නගරයේ සිට දුම්රිය ස්ථානයට පැමිණ දුම්රියවල නැඟී ඈත නගර, ගම් බලා ගියහ.

★ ★ ★

නවසිය දහඅටේ වසන්තයේ එක් දවසක සිරියෝෂා බ්‍රූෂ්ෂාක්ගේ නිවසේ 'තුන්සිය හතර' සෙල්ලම් කළ පසු මිතුරෝ තිදෙනෙක් මහ මඟ දිගේ ගමන් කළහ. අසල වූ ගෙවත්ත පාවිකා කෝර්චාගින්ලාගේය. කාන්සිය උහුලාගත නොහැකිව මේ තිදෙනා තණපිටියේ වැතිර ගත්හ. දන්නා විනෝද ක්‍රීඩා එකක්වත් සිත් නොගති. මීට වඩා හොඳට දවස ගෙවන්නේ කොහොමදැයි ඔවුහු සිතන්නට වූහ. පිටුපසින් අසකුගේ කුර ගැටෙන හඬකි. මග දිගේ අසරු භටයෙක් එන සැටි පෙනෙයි. අශ්වයා මහ මග සහ ගෙවත්ත වෙන් කරන මාඉම වූ දිය අගලින් පැන ගෙවත්තේ වැට අසලට ආවේය. තණ පිටියෙහි වැතිර සිටි පාවිකා හා ක්ලීම්කා දෙස අතක් වැනූ අසරු භටයා ඔවුන්ට කතා කළේය.

"කොල්ලනේ මෙහෙ වරෙල්ලා!"

පාවිකා සහ ක්ලීම්කා නැඟිට සිට වැට දෙසට දිව ගියෝය. අසරු භටයා දහඩියෙන් තෙමී දූවිල්ලෙන් වැසී සිටියේය. හිස පැලඳි සෙබළ හිස්වැස්මද, කමිසය හා කලිසමද දූලි තට්ටුවකින් වැසිලාය. ශක්තිමත් සෙබළ බඳපටියේ ලොකු පිස්තෝලයක් එල්ලෙමින් තිබිණි. බඳපටියට සවි කළ ජර්මන් අත් බෝම්බ දෙකකි.

"කොල්ලනේ මට බීමට වතුර ටිකක් ගෙනෙල්ලා!" හේ

කීය. පාව්කා වතුර ගෙනෙනු පිණිස ගෙට යත්ම, අසරු භටයා තමා දෙස බලාගත්වනම සිටි සිර්යෝෂ්කා ඇමතීය. "ඉලන්දාරියා මේ ගමේ පාලනය කා අතේද?"

සිරියෝෂ්කා නගර තොරතුරු අමුත්තාට කීමට යුහුසුළු විය.

"දැන් සුමාන දෙකක් තිස්සේ අපේ නගරයේ කිසිම පාලනයක් නැහැ. ස්වයං ආරක්ෂකයෝ තමා නගරය පාලනය කරන්නෙ. වාරෙන්, වාරෙට. නගර වැසියෝ රෑට නගරෙ ආරක්ෂා කරනවා. ඔයගොල්ලො කවුද?" දිගටම කතා කළ ඔහු අසරු භටයාගෙන් ඇසුවේය.

"ඕනෑවට වැඩිය දේ දැනගත්තාම, ඉක්මනට නාකි වේවි." මඳ සිනා පාමින් අසරු භටයා පැවසීය.

දිය පිරි බඳුනක් අතින් ගෙන පාව්කා ගෙයින් එළියට දිව ආවේය.

අසරු භටයා මහත් ආසාවෙන් දිය බඳුන එකවර හිස්කොට, එය පාව්කා අතට දී අසුගේ පටි තද ලෙස ඇද වේගයෙන් උඟ පන්තමින් සස්නා[1] ගසින් පිරි බැද්දේ පිටියකට ගියේය.

"ඒ කවුද?" යි විමතියට පත් පාව්කා ක්ලීම්කාගෙන් ඇසීය.

"මා දන්නෙ කොහොමද?" සගයා දෙවුර සෙලවීය.

"සමහර විට පාලනයේ වෙනසක් වීමට ඉඩ තියෙනවා. ඒ නිසා තමා ලෙෂින්ස්කිලා ඊයේ පිට වෙලා ගියේ. ධනපතීන් පැනලා යන කොට පාටිසාන්වරු[2] එනවා." ඒ දේශපාලනමය ප්‍රශ්නය සිරියෝෂ්කා විසින් අවසන් ලෙසත් දැඩි ලෙසත් විසඳන ලදි.

ඔහුගේ නිගමන කොතරම් සුපැහැදිලි ද යත්, පාව්කා සහ ක්ලීම්කා ඔහු සමඟ එකවර එකඟ වූහ.

ඔවුන් එය කියා අවසන් කිරීමටත් පෙර, මහ මග දිගේ කුර ගැටෙන හඬ ඇසිණි. එකෙණෙහි කොල්ලෝ තිදෙන වැට ළඟට දිවූහ.

කැලෑවෙන් ඔබ්බට, වනාරක්ෂකයාගේ නිවෙසට ඈතින් මිනිස්සුද, ගැල්ද ගමන් කළහ. මහ මගට එතරම් ඈතින් නොවන සේ අසරුභටයෝ 15 දෙනෙක් අසුන් පිට නැඟ, සැදෑල හරහා තුවක්කු තබා ගෙන ගමන් ගත්හ. පෙරටුව ගමන් ගත්තෝ දෙදෙනෙකි. එකෙක් මහල්ලෙකි. හේ කොළ පැහැති යුද කබායක් ඇඳ සිටියේය. ඔහුගේ උරය හරහා

1 ඉංග්‍රීසි බසින් මෙය පයින් යනුවෙන් හැඳින්වේ.

නිලධාරීන් පලඳින පටියකි. කරෙහි මාලයක් වැනි පටියක් සහිත දුරදක්නයකි. ඔහු සමීපයෙන් කොල්ලන් තිදෙනා විසින් දකින ලද අසරු හටයාය. මැදිවියේ අසරු හටයාගේ අතක් වටා එතූ රතු පටියකි.

"මා නුඹට කීවේ මොනවාද?" සිරියෝෂ්කා වැළමිටෙන් පාච්කා තල්ලු කළේය. "පේනවද, රතු පටිය පාටිසන්වරු, මගෙ දෑස පොට්ට වේවි. පාටිසන්වරු..." හඬ නඟමින් සතුටු වූ ඔහු කුරුල්ලෙකු සේ වැටෙන් පැන මගට බටුයේය.

මිතුරෝ දෙදෙනා ඔහු පිටුපසින් ගමන් ගත්හ. තිදෙනාම මහ මග අසල සිටගෙන අසරුවන් දෙස බලන්නට වූවෝය.

අසරුවන් ඔවුනට වඩාත් ළං වත්ම, කොල්ලන් මීට පෙර දැක පුරුදු අසරුවා ඔවුන් දෙස බලා ඉඟි කොට, කසය දිගු කර අසල පිහිටි විශාල ගෙය පෙන්වා ප්‍රශ්න කළේය.

"මේ ගෙදර ඉන්නෙ කවුද?"

අසරුවාගෙන් ඇත් නොවීමට තැත් කරමින් පාච්කා දිගු විස්තරයක් කෙළේය.

"මේ ගෙදර අද්වකාත් ලෙෂින්ස්කි හිටියා. ඊයේ ඒ ගොල්ල පැනලා ගියා. ඔබලට බය වූ නිසා වෙන්න ඕන..."

"අපි කවුදැයි කියලා නුඹ දන්නෙ කොහොමද?" මඳ සිනාවක් පෑ මැදිවියේ මිනිසා ඇසීය.

පාච්කා ඔහුගේ අත වටා ඇති රතු පටිය පෙන්වමින් පිළිවදන් දුන්නේය.

"එහෙනම් මේ මොකද්ද? එකපාරටම පේනව නොවැ..."

නගර වැසියෝ මහමගට බටහ. නගරයට ඇතුළු වන අසරු සේනාව දෙස ඉමහත් කුතුහලයකින් බලන්නට වූහ. කොල්ලෝ තිදෙනාද, දූවිලිවලින් හා දහඩියෙන් නෑවී විඩාපත්ව සිටි රතු ආරක්ෂක සෙබළුන් දෙස බලන්නට වූහ.

රතු සේනාංකයේ එකම කාලතුවක්කුවද, මැෂින් තුවක්කු රැගත් රියද ගිය පසු, ඔවුන් හා ඒවා පසුපසින් ගමන් ගත් කොල්ලන් සිය නිවෙස් බලා ගියේ, සේනාංකය නගරය මැද කඳවුරු ලා ගොඩනැඟිලි හා තට්ටු නිවාසවල නැවතුණ පසුවය.

හවස, ලෙෂින්ස්කිලාගේ ගෙදර නවාතැන් ගත් සේනාංක නිලධාරී මණ්ඩලයේ සාමාජිකයෝ සතර දෙනා, එහි විශාල සාලයේ ලොකු මේසයක් වටා වාඩි වූහ. මේස කකුල් කැටයමින් නිම විය. සතර දෙනාගෙන් තිදෙනෙක් මණ්ඩලයේ සාමාජිකයෝය. මැදවියෙහි පසු වූ සතරවැන්නා

සේනාංකයේ ප්‍රධානියා වූ බුල්ගාකොව් සහෝදරයාය. ඔහුගේ හිසකේ පැසිලාය.

බුල්ගාකොව්, ගුබේර්නියාවේ[1] සිතියමක් දිග හැර මේසය මත තබා ගෙන නිය තුඩින් එය මත ඉරි අඳින්නේ, තමා ඉදිරිපිට වාඩි වී සිටි සගයා ඇමතීය. පුළුල් හකු ඇට සහිත ඔහුගේ දසන් ශක්තිමත්ය.

"යේර්මාචෙන්කෝ සහෝදරයා නුඹ කියන්නේ අපි මෙතැනදී සටන් කළ යුතුයි කියලද. මම හිතනවා උදේ වෙනකොට අපි මෙතැනින් ඉවත් විය යුතුයි කියලා. රෑට පසු බහිනව නම් වඩාත් හොඳයි. එහෙත්, අපේ සෙබළුන් විඩාවට පත් වෙලා. අපේ කාරිය ජර්මන් කාරයෝ එන්නට ඉස්සෙල්ලා කසාටින්වලට යාමයි. අපට තියෙන යුද්ධ ශක්තිය යොදලා සටන් කිරීම විහිළු වැඩක්... එක කාලතුවක්කුවයි, වෙඩි උණ්ඩ තිහයි. බයිනෙත්තු ගත් සෙබළුන් දෙසීයයි. කඩු ගත් භටයන් හැටයි. හරි භයානක යුද්ධ ශක්තියක් නොවැ... ජර්මන්නු විදුලිය වේගයෙන් ඉදිරියට එමින් හිටිනවා. අපට සටන් කරන්නට පුළුවන් වන්නේ පසුබසින අනෙක් සේනාංක සමඟ එකතු වුණාමයි. තවත් කරුණක් මතක තබා ගන්ට ඕනෑ සහෝදරයා. ජර්මන්නු හැරුණු විට, අපට බාධා කිරීමට තවත් ප්‍රතිවිප්ලවවාදී පල් හොරුන්ගේ කණ්ඩායම් ඉන්නවා. දුම්රියපොළට එහා තියෙන පාලම පුපුරුවා දමලා හෙට උදෙන්ම පසු බසින්ට ඕනෑ කියලා මා අදහස් කරනවා. ජර්මන්නු පාලම හදන කොට දවස් දෙක තුනක් ගත වේවි. දුම්රිය මග දිගේ උන්ගෙ ගමන ඇන හිටීවි. සහෝදරවරුන්ගේ අදහස් මොනවාද? අපි එකතු වී තීරණයක් ගනිමු." වාඩි වී සිටියවුන් දෙස බලා හේ පැවසීය.

බුල්ගාකොව් අසලින් වාඩි වී සිටි ස්ත්‍රෑස්කොව් සිතියම දෙස බලා දෙතොල් සෙලවීය. අනතුරුව බුල්ගාකොව් දෙස බලන්නේ, උගුරෙහි යමක් හිර වූ කලෙක මෙන් අසීරුවෙන් කථා කළේය.

"මම...ප... පක්ෂයි, බුල්ගාකොව් ගේ අදහසට."

කම්කරු කබායක් ඇඳ සිටි තරුණයාද එකඟ විය:

"බුල්ගාකොව් කාරිය කළ යුතු හැටි කියයි."

දහවල් කාලයේ දී කොල්ලන් තිදෙනා සමඟ කථා කළ යේර්මාචෙන්කෝ පමණක් විරුද්ධ වෙමින් හිස වැනීය.

---

1 සාර් රුසියාවේ දිසා ආණ්ඩුකාරවරයෙකු විසින් පාලනය කරන ලද විශාල පෙදෙසකි.

"එහෙනම් අපි සේනාංකයක් සංවිධානය කළේ අසවල් කාරණයකටද? සටන් නොකර ජර්මනුන් ඉදිරියේ පසු බසින්නටද? මා කල්පනා කරනවා අප මෙතනදී උන්ට විරුද්ධව යුද්ධ කළ යුතුයි කියල. පසු බැසීම එපා වෙලා... වගකීම් මට භාර වී තිබුණා නම්, මම මෙතැනදී සටන් කරනවා, කරනවාමයි."

මෙසේ පැවසූ යෙර්මාචෙන්කෝ රළු ලෙස පුටුව ඇද නැඟිට සිට ඔබ-මොබ සක්මන් කරන්නට විය.

බුල්ගාකොව් ඔහු දෙස බැලුවේ එකඟ නොවන ලීලාවකිනි.

"යෙර්මාචෙන්කෝ! සටන් කරන විටත් මොළය පාවිච්චි කරන්ට ඕන. මිනිසුන් විනාශ වෙන බව ස්ථීර ලෙසම දැන ගෙන උන්ව මාර කටට විසි කිරීම අපට කරන්ට බැරි දෙයක්. ඒක මහ විහිළුවක්. අපට විරුද්ධව එන්නේ ඩිවිෂන් හමුදාවක්. උන්ට මහා කාලතුවක්කු තියෙනවා. යුද්ධ රථ තියෙනවා... ළාමක වීරත්වයෙන් වැඩක් නැහැ. යෙර්මාචෙන්කෝ සහෝදරයා..." බුල්ගාකොව් කතාව අවසාන කළේ අනික් සාමාජිකයන් දෙස බලමිනි. "එහෙමනම් හෙට උදේට පසු බැසීමට කළ තීරණය සම්මත වුණා..."

"මීළඟට සම්බන්ධකම් පිළිබඳ ප්‍රශ්නයයි." හේ රැස්වීම පවත්වමින් කීවේය. "අපි තමා අන්තිමට පහු බහින අය, ජර්මන් කඳවුර තුළ වැඩ සංවිධාන කිරීම අපට භාර වී තිබෙනවා. මෙතැන විශාල දුම්රිය මර්මස්ථානයක්. මේ පුංචි නගරයේ දුම්රියපොළවල් දෙකක් තියෙනවා. මේවායේ විශ්වාසවත් සහෝදරයෙකු වැඩට යැවීම අපේ වගකීමයි. මෙතන වැඩ හරිහැටි කරන්නට අප කාවද පත් කළ යුත්තේ කියන එක ගැන අපි තීරණය කරන්නට ඕන. අපේක්ෂකයෝ ඉදිරිපත් කරන්න."

"මා හිතනවා මෙතන නවත්වන්නට ඕන ෂුක්රායි නාවික භටයාවයි." මේසය අසලට පැමිණි යෙර්මාචෙන්කෝ පැවසීය. "ෂුක්රායි මේ පළාතේ කෙනෙකු වීම පළමුවැනි කාරණයයි. ඔහු යකඩ වැඩකාරයෙක් හා පූට්ටු ශිල්පියෙකු වීම දෙවැනි කාරණයයි. ඔහුට මේ දුම්රියපොළේ වැඩ ලබාගන්ට පුළුවනි. අපේ සේනාංකය සමඟ ඉන්න ප්‍රයෝදර්ව කිසිවෙකු තවම දැකලා නැහැ. ඔහු රෑ වන විට මෙහි ඒවි. මිනිහා මොළය ඇති ඉලන්දාරියා. මෙහි වැඩ සංවිධානය කරාවි. මා හිතන හැටියට ඔහු තමා හොඳ අපේක්ෂකයා."

බුල්ගාකොව් හිස වැනීය,

"හරි, මා නුඹ සමඟ එකඟයි. යෙර්මාචෙන්කෝ, සහෝදරවරු මේ අදහසට විරුද්ධද?" ඔහු අන් අය දෙස බැලීය. "විරුද්ධත්වයක් නැති නම් එය සම්මත වුණා. අපි ෂුක්රායිට අවශ්‍ය මුදල් හා නියෝජිත බලය තබා යමු..."

"දැන් තුන්වැනි හා අවසාන ප්‍රශ්නය සහෝදරවරුනි." බුල්ගාකොව් තෙපලේය. "නගරයේ තිබෙන යුද්ධායුධ පිළිබඳ ප්‍රශ්නයයි. සාර්ගේ යුද්ධයේ ඉඳලා මෙතන ගොඩ ගැහිලා තියෙනවා තුවක්කු විසිදාහක්. ගොවියෙකුගේ පැලක මේවා ගබඩා කර තිබෙන්නේ. දැන් මේ ගැන හැමදෙනා ම අමතක කර දමලා. මේ ගැන මට කීවේ එම ගෙපැල අයිතිකාර ගොවියා. ඔහුට ඕන කරල තියෙනවා ඔය තුවක්කුවලින් සහනයක් ලබාගන්නට.... ජර්මානුන්ට මේ තරම් විශාල අවි ගොඩක් තැබීම කොහෙත්ම නරකයි. මම හිතනවා දැන්ම ඒවා ගිනි තබා විනාශ කරන්නට ඕන කියලා. හැබැයි ගිනි තැබීම භයානකයි. දුප්පත් ගොවීන්ගේ ගෙවල් ළඟ තමයි ඒ ගොවියාගේ පැල තියෙන්නෙ. නගරයේ කෙළවර ගොවියන්ගෙ ගෙවල්වලට ගිනි ඇවිළෙන්ට පුළුවනි.

පුළුල් උරතල සහිත ස්ත්රුෂ්කොව් සෙලවුණේය. නොකැපූ යටි රැවුල ඔහුගේ මුහුණ වසා සිටී.

"මොක... මොක... මොකටද ගිනි තියන්නෙ? මම හිතනවා බෙද... බෙදන්ට ඕන මහජනයා අතර ඔය තුවක්කු."

බුල්ගාකොව් සැණෙකින් හැරී ඔහු දෙස බැලීය.

"බෙදා දෙන්ටයි කියනවද?"

"හරියට හරි. ඒ අදහස හරියට හරි!" උද්යෝගිමත් ලෙස යෙර්මාචෙන්කෝ කෑගැසීය. "කම්කරුවන්ටයි, වෙනත් කැමති මිනිසුන්ටයි ඒවා බෙදා දෙන්නට ඕන. ජර්මානුන්ගේ පැඟීම දැඩි වුණොත්, උන්ට කිති කවන්නටවත් මොනවා හරි තියෙන්ට ඕන නෙව. බලාපොරොත්තු වෙනවා උන් සෑහෙන්ට පාගාවි කියල. බැරිම වෙන කොට අපේ කොල්ලො අවි ගනීවි. ස්ත්රුෂ්කොව්ගෙ කතාව හරි, බෙදා දෙන්ට ඕන. සමහර අවි ගම්වලට ගෙනියන්ට පුළුවන් නම් හොඳයි. ගොවියෝ ඒවා බැදිවල හංගාවි. ජර්මන්කාරයො තුවක්කු බලෙන් පවරා ගත්තාම, ගම්වල හංගාපු ඒවායේ අගය කොතරම් වේවිද!"

බුල්ගාකොව් සිනාසුණේය.

"ජර්මන්නු අණ කරාවි සියලු යුධායුධ භාර දෙන ලෙස එවිට හැම තුවක්කුවක්ම ඔවුන්ට අයිති වේවි."

යෙර්මාචෙන්කෝ විරුද්ධත්වය ප්‍රකාශ කළේය.

"ඔක්කෝම අල්ලාගන්න එකක් නැහැ. සමහර ඒවා ගෙනියාවි. සමහර ඒවා ඉතුරු වේවි."

වාඩි වී සිටින්නවුන් දෙස බුල්ගාකොව් බැලුවේ ප්‍රශ්න කරන්නාක් මෙනි.

"තුවක්කු බෙදා දෙන්නට ඕන. බෙදා දෙන්නට ඕන." යෙර්මාචෙන්කෝගේ හා ස්ත්‍රූෂ්කොව්ගේ පැත්ත ගත් තරුණ කම්කරුවෙක් කෑ ගැසීය.

"හොඳා. එහෙනම් බෙදා දෙමු." බුල්ගාකොව් එකඟ විය. "ප්‍රශ්න එපමණයි." නැඟිට සිට ගත් හෙතෙම පැවසීය. "දැන් ඉතින් අපට උදේ එළිවන තුරු විවේක ගත හැකියි. ෂුක්රායි ආවොත් මා ළඟට එවන්න. මම ඔහු සමඟ සාකච්ඡා කරන්නම්. යෙර්මාචෙන්කෝ නුඹ ගිහිල්ලා මුරපොළවල් පරීක්ෂා කරපන්."

හුදෙකලාව සිටි බුල්ගාකොව් බංගලාවේ විසිත්ත කාමරයේ සිට නිදන කාමරයට ගොස් හමුදා කබාය ඇඳෙහි මේට්ටය මත එලා නිදා ගත්තේය.

★ ★ ★

උදෑසන පාචිකා විදුලිබල ස්ථානයේ සිට එමින් සිටියේය. ඔහු දැන් පුරා අවුරුද්දක්ම ගිනි උදුනට අඟුරු දමන්නාගේ අත් උදව්කාරයා හැටියට සේවය කරයි.

නගරය අසමානය ලෙස ප්‍රාණවත් බවක් දැරීය. පාචිකාට එය මනා සේ වැටහිණි. තුවක්කු එකක්, දෙකක් හෝ තුනක් බැගින් හෝ ගෙන යන නගර වැසියන් ඔහු දුටුවේය. කුමක් සිදුවන්නේද යන්න තේරුම් ගැනීමට අපොහොසත් වූ පාචිකා ඉක්මනින් ගෙදර ගියේය. ලෙෂින්ස්කිලාගේ බංගලාව අසලදී, ඔහු ඊයේ හඳුනාගත් භටයෝ අසුන් පිට නැඟ ගත්හ.

ගෙදර පැමිණි පාචිකා හණිකට ඇඟ සෝදා ගත්තේය. සිය වැඩිමහලු සොහොයුරු ගෙදර නැති බව අම්මාගෙන් දැන ගත් ඔහු, නගරයේ අනික් කෙළවරේ පදිංචි සිරියෝෂා බ්රූෂ්ෂාක් හමු වීමට ගියේය.

සිරියෝෂා දුම්රිය පදවන්නෙකුගේ අත් උදව්කරුවෙකුගේ පුතෙකි. ඔහුගේ පියා සතු ගෙයක් සහ කුඩා ගෙවත්තක්ද විය. සිරියෝෂා ගෙදර නොසිටියේය. ඔහුගේ මවු මහත් අසතුටකින් පාචිකා දෙස බැලුවාය. සුදු පැහැති මුහුණක් ඇති ඇය තරබාරුය.

"මොන යකාද දන්නෙ කොල්ලා කොහේ ගියාද කියල! එළිය වැටුණ හැටියේම රස්තියාදු වෙනවා. කොහේදෝ තුවක්කු බෙදනවලු. මා හිතන්නෙ එයත් එතැනට ගියයි කියල. නුඹලා හොටු පෙරන යුද භටයෝ. නුඹලාට කස පාර දෙන්න ඕන. නුඹලා ඕනවට වැඩියි. සැනසීමක් නැහැ. දණ ගෑවා නැඟිට්ටා. දැන් තුවක්කු ගන්නවා. නුඹ ඒ හොර ගෙඩියාට කියාපන් මම කිව්වා කියලා. බැරි වෙලාවත් එක පතොරමක්වත් ගෙදර ගෙනාවොත් මම උගේ බෙල්ල කඩනවා. ඕනෑ නැති කුණු ගොඩවල් ගෙදරට ගෙනේවි. වග කියන්නට වෙන්නේ මටයි. නුඹත් තුවක්කු ගන්ට යනවද?"

ඇගේ පැනයට පිළිතුරු දීමට පාච්කා එහි නොසිටියේය. සිරියෝහාගේ මවුගේ දෙඩීම නොතකා ඔහු මහ මඟ දෙසට පැන දිව්වේය.

මහ මඟ දිගේ ගමන් කළ මිනිහෙකුගේ දෙවුරෙහි තුවක්කුව බැගින් විය.

"මාමේ කොහෙන්ද ලැබුණේ?" ඔහු වෙත දිව ගිය පාච්කා ඇසීය.

"අන්න අතන උඩහ පැත්තේ බෙදනවා."

මිනිසා පෙන්වූ දිසාව දෙසට පාච්කා එක හුස්මට දුවන්නට විය. විදි දෙකක් ඔස්සේ දිව ගිය ඔහුට බයිනේත්තුවක් සහිත බරැති පාබළ හමුදා තුවක්කුවක් ඇදගෙන යන කොල්ලෙකු හමු විය.

"තුවක්කුව ලැබුණේ කොහෙන්ද?" ඔහු නැවැත් වූ පාච්කා ඇසීය.

"අන්න අර ඉස්කෝලේ ඉස්සරහ. හමුදා භටයෝ බෙදා දෙනවා. දැන් නම් ඉතුරු වෙලා නැතුව ඇති. හැම දෙනාම ගෙන ගියා. ඊයේ රෑ තිස්සේම බෙදුවා. හිස් පෙට්ටි විතරයි ඉතුරු වෙලා තියෙන්නෙ. මම දැන් මේ දෙවැනි තුවක්කුවයි ගෙනියන්නෙ." කොල්ලා ආඩම්බරයෙන් කීවේය.

කොල්ලාගේ කතාව ඇසූ පාච්කාගේ බලාපොරොත්තු සුන් විය.

"මදෑ මට යකා වැහිලා! නැති නම්, ගෙදර නොගිහින් මෙහෙ එන්නට තිබුණා නෙවද!" ඔහු කල්පනා කළේ සිත් තැවුලෙනි. "ඇයි මට වෙලාවට එන්ට බැරි වුණේ?"

මෙසේ සිතමින් හිටි හැටියේම වටයක් හැරුණු පාච්කා පිම් තුනක් පැන කොල්ලා ළඟට විත්, ඔහු අත තිබූ තුවක්කුව උදුරා ගත්තේය.

"නුඹ ළඟ එක තුවක්කුවක් තියෙනවා නේද. නුඹට ඒ ඇති. මේක මටයි." කොල්ලාට විරුද්ධ වීමට බැරි හඬකිනි ඔහු කථා කළේ.

මහ දවල් මංකොල්ල කෑම නිසා වියරු වූ කොල්ලා පාවිකාට පහර දීමට කඩා පැන්නේය. පාවිකා අඩියක් පස්සට පැන, ඔහු දෙසට බයිනෙත්තුව දිගු කරමින් කෑ ගැසීය.

"අහකට පල, නැති නම් තුවාල වේවි!"

බලාපොරොත්තු සුන් කරගත් කොල්ලා අඬ අඬා වැලපෙන්නට විය. තිත්ත බසින් බැණ වදිමින් ඔහු ආපසු දුවන්නට විය. පාවිකා සතුටු සිතින් නිවෙස බලා පා නැඟීය. ගෙවැටින් පැන ගබඩා කාමරය හැටියට පාවිච්චි කරන මඩුව තුළට වැදී වහලේ බාල්කයක පැහැර ගත් තුවක්කුව තබා ප්‍රීතියෙන් උරුවම් බා, අනතුරුව ගෙට ගියේය.

★ ★ ★

මැද නගරයත් අවට ගම් සහිත ෂෙපතොව්කා වැනි කුඩා නගරබද ස්ථාන සහිත වූ උක්රයීනයේ ගිම්හාන කාලයේ සැන්දෑ සිරිය සැබැවින්ම අපූරුය.

ගිම්හානයේ මෙවැනි සැන්දෑවලදී තරුණ පෙළ මහ මඟට බසිති. තරුණයෝ සහ තරුණියෝ මල් වතුවල සහ ගෙවතුවලද මහ මගෙහිද ඇවිදිති. මුලින් කපා බිම හෙළූ ලී කඳන් උඩ ද කාණ්ඩ හා ජෝඩු බැගින් දැකිය හැකිය. සිනා හඬ සහ ගී ගායනය දසත පැතිරේ.

කුසුම් සුවඳින් අවට වාතයෙහි පවා සුගඳකි. අහස ළා නිල් පැහැතිය. තරු, කණමැදිරියන් සේ යන්තමින් දිස් වේ. මිනිස් හඬ බෙහෝ ඈත ඇසෙයි...

පාවිකා සිය ඇකෝඩියනයට ආදරේය. ඔහු ඉමහත් සතුටකින් වියානාහි සෑදූ සංගීත භාණ්ඩය දණහිස මත තැබීය. ඔහුගේ කඩිසර ඇඟිලි එහි නළා ක්‍රියා කරවමින් ඉහළ සිට පහළට දුවයි. ඉන් මනහර ගීතමය වාදනයක් ඇති වෙයි.

ඇකෝඩියනය වරෙක හැකිළී තවත් වරෙක දිග හැරෙයි. එවිට ඉන් පණ ගන්වන ගීත රාවයක් බිහි වෙයි. අසන්නන්ගේ දෙපා ඉබේටම තාලය අනුව නැටවෙයි. ඇකෝඩියනය වේගයෙන් වාදනය වෙයි. මෙලොව ජීවත් වීම කොතරම් විශාල ප්‍රීතියක්ද?

අද හවස වඩාත් ප්‍රීතිදායකය. පාවිකා පදිංචි ගේ අසල ජීවත්වන තරුණ පෙළ - ලී කඳන් උඩ වාඩිවී, එක් වී සිටිති.

මොවුහු ක්‍රීඩා ලෝලියෝය. විහිළු කිරීමෙහි සමතුන්ය. පාවිකාගේ අසල්වැසි තරුණියක් වන ගාලවිකාගේ කටහඬ වඩාත් තියුණුය. ගල්වඩුවකුගේ දුවක් වන ඈ, නැටීමෙහි දස්කම් පෑවාය. කොල්ලන් සමඟ කරට කර ගී ගයන්නීය. උගුරෙන් නොව, පපුවේ පෙණහලුවලින් පැන නඟින ඇගේ කටහඬ ප්‍රබලය.

පාවිකා ඇයට බිය විය. ඈ කටකාරියකි. ඈ පාවිකා අසලින් ලී කඳක් මත වාඩි වී පාවිකා වැලඳගෙන මහ හඬින් සිනාසෙන්නීය.

"අනේ කොල්ලෝ නුඹ අපූරු වාදකයෙක්! මගේ පුංචි කොල්ලො නුඹ සෑහෙන්ට වැඩිලා නැහැ. නැත්නම් මට සෑහෙන හොඳ සැමියෙක් වෙන්නට ඉඩ තිබුණා. ඇකෝඩියන් වාදකයන්ට මා බොහෝම ආදරෙයි. උන් ඉදිරිපිට මගේ හදවත වෙඩරු වගේ උණු වී යනවා."

පාවිකා කේශාන්තය දක්වා ලජ්ජාවෙන් රතු වෙයි. හවස අඩ ඇඳිරි නිසා එය නොපෙනේ. ඇඳිර ඔහුට සහනයකි. ඔහු හුරතලියන්ගෙන් ඈත් වීමට මාන බලයි. ඈ ඔහු තදින් තදින් වැලඳගෙන, ඔහුට සෙලවීමට පවා ඉඩක් නොතබයි.

"අනේ මගේ ආදරවන්තයෝ, නුඹ කොහෙද පැන යන්ට හදන්නෙ? මදෑ නුඹ හරිම මනමාලයෙක් නොවැ." ඈ විහිළු කරයි.

පාවිකාගේ උරහිසක් ඇගේ පියයුරු ස්පර්ශ කරයි. ඒවායේ ප්‍රාණවත් බව නිසා ඔහුගේ සිතෙහි එක්කරා කුතුහලයක් හා කැලඹීමක් ඇති වෙයි. සාමාන්‍යයෙන් නිහඬතාව රජ කරන මේ වීදිය දැන් සිනා හඬින් පිරිලාය.

පාවිකා අතක් ඔසවා ගාලවිකාගේ උරහිස මත තබා ඇගෙන් ඈත් වෙයි.

"නුඹ මට වාදනය කරන්නට ඉඩ දෙන්නෙ නැහැ. පොඩ්ඩක් එහාට වෙයන්."

නැවත හඬ නඟමින් හැම දෙනාම සිනාසෙති. විහිළු කතා වැළ නොකැඩී ගලා යයි.

මරුස්යා බාධා කරයි.

"පාවිකා දුක්මුසු ගීතයක් වයපන්. හදවත දෙදරුම් කන දුක්මුසු ගීතයක්."

ඇකෝඩියනය හෙමින් දිග හැරේ. ඇඟිලි සෙමින් නළා මත දුවයි. හැම දෙනාම දන්නා ගීතයකි. ගලීනා පළමුවෙන්ම ගායනය අරඹයි. අනතුරුව මරුස්සා ගයයි. සෙස්සෝ අනුකරණය කරති.

නැව් ඇදලා, හති වැටිලා
පැලට ඇවිල්ලා,
දුකින් බර, සොවින් පිරි
ගී ගයති, බුර්ලාක්වරු[1]

තරුණ හඬ, ඔවුන්ගේ ගීත රාවය අසල බැද්දටද ඈත පෙදෙස්වලටද පැතිරේ.

"පාව්කා!" එය අර්ටියොම්ගේ කඩහඬය.

පාව්කා ඇකෝඩියන් වාදනය නවත්වා එහි පටි බැන්දේය.

"මට අඬගසනවා. මම යනවා."

මරෑස්සා බැගෑපත් ලෙස ඉල්ලා සිටී.

"තව පොඩ්ඩක් වාදනය කරපන්. ගෙදර යන්ට පසුව පුළුවනි.

එහෙත්, පාව්කා යුහුසුලු විය:

"බැහැ. හෙට ආයෙමත් සෙල්ලම් කරමු. දැන් ගෙදර යන්ට ඕන. අර්ටියොම් අයියා අඬගහනවා." ඔහු මඟ හරවා ගෙට දිව ගියේය.

මේසය වටා අර්ටියොම්ගේ සගයකු වන රොමාන්ද තවත් නාඳුනන මිනිහෙකුද වාඩි වී සිටින සැටි කාමරයෙන් දොර හැරිය පාව්කා දුටුවේය.

"අයියා මට අඬගැහුවාද?" පාව්කා ඇසීය.

අර්ටියොම්, පාව්කා දෙස බලා හිස වනා නාඳුනන මිනිහාට කතා කළේය.

"මේ තමා මා කී හාදයා. මගේ මල්ලී." නාඳුනන මිනිහා කරගැටවලින් පිරි අතක් පාව්කා වෙත දිගු කළේය.

"පාව්කා, මේ අහපන්." අර්ටියොම් සිය බාල සොහොයුරා ඇමතීය. " නුඹලගේ විදුලි බලස්ථානයේ වැඩ කරන මිනිහා අසනීප වුණයි කියලා නුඹ කීවා නේද? මේ එක්කෙනාව එතැන වැඩට ගන්ට පුළුවන්දැයි හෙට හොයලා බලපන්. එහෙම පුළුවන් නම් හෙටම ඇවිත් දන්වාපන්."

නාඳුනන මිනිසා කථාවට බාධා කළේය.

"නැහැ. මම ඔහුත් එක්ක යන්නම්. මම අයිතිකාරයා සමඟ කතා කරන්නම්."

"සත්තකින්ම ඕන. අද විදුලිබල ස්ථානය වැඩ කළේ නැහැ. ස්තන්කෝවිච් අසනීප වුණු හන්දා. අයිතිකාරයා දෙවරක්ම දුවගෙන ඇවිත් වැඩට යවන්නට කාව හරි සෙව්වා.

1 බත්තල් සහ පාරු වැනි විශාල බෝට්ටු කය වෙහෙසා නදී තීරය ඔස්සේ අදින පැරණි රුසියාවේ තිබූ වෘත්තිය විශේෂයකි.

හොයාගන්ට බැරි වුණා. පයර්මැන් විතරක් වැඩ කරලා විදුලිය ලබාදෙන්ට අයිතිකාරයා තිරණය කළේ නැහැ. විදුලිබල ශිල්පියාට උණ සන්නිපාතය හැදිලා."

"ඔන්න එහෙනම් වැඩක් කළා." නාඳුනන මිනිහා පැවසීය. "හෙට මම නුඹ සොයා එන්නම්. අපි දෙදෙනාම එකට යමු." ඔහු පාවිකාට කීවේය.

"හොඳා"

නාඳුනන මිනිසාගේ අළු පැහැති නිසල දෙනෙත් තමා විමැසිල්ලෙන් පිරික්සා බලන සැටි පාවිකාට දැනිණි. ඇසි පිය නොහෙළන ඔහුගේ දැඩි බැල්ම පාවිකා චකිතයට පත් කළේය. ඔහු ඇඳ සිටියේ අළු පැහැති උඩු කබායකි. ඉහළ සිට පහළ දක්වා බොත්තම්වලින් එය වසා ඇත. ඔහුගේ පුළුල් හා ශක්තිමත් උරතල විසින් එම කබාය දැන් දැන් ඉරා දමනු ඇතැයි හැඟීමක් ඇති කරන ලදි. එය ඔහුට නොසෑහෙන තරම් කුඩාය. හිසත්, උරහිසත් සම්බන්ධ කළ බෙල්ල වටකුරුය. ශක්තිමත්ය. ශක්තිමත් මුල් සහිත හොඳින් වැඩුණු පැරණි ඕක් ගහක් මෙන් ඔහු ශක්තියෙන් පිරී ඉතිරිලාය. ඔහු සමු ගනිද්දී අර්ටියොම් මෙසේ පැවසීය:

"ෂුක්රායි, මෙතෙක් හැම දෙයක්ම හොඳින් සිදු වෙලා තියෙනවා. හෙට මල්ලීත් එක්ක යන්න. හැම දෙයක්ම යසට කෙරේවි."

සේනාංකය ඉවත් වී ගොස් තෙදිනකට පසු ජර්මන්නු නගරයට ඇතුළු වූහ. පසුගිය දවස්වලදී පාළු වී තිබුණු දුම්රිය පොළේ, වාෂ්ප ඇන්ජිමක නළාවක් හූ හඬ නගමින් ඔවුන්ගේ පැමිණිම ගැන දැන්වීය. නගරය පුරා පුවත පැතිරෙන්නට විය.

"ජර්මන්නු එනවා."

කෝපයට පත් කුහුඹි රැළක් තුඹසකින් එළියට එන්නාක් මෙන් නගර වැසියෝ කැලඹුණහ. එසේ වුවද ජර්මන්නු නගරයට වදින බව ඔවුහු කල් ඇතිව දැන සිටියහ. ඒ ගැන ඔවුන් විශ්වාස කළේ දුබල ලෙසකිනි. දැන් ඉතින් ඒ බියකරු ජර්මන්නු එමින් සිටිති, දැනටමත් නගරවලට ඇතුළු වෙති.

නගර වැසියෝ සිය ගෙවල්වල වැටවලට හා ගේට්ටුවලට මුවා වී නරඹන්නට වූවෝ, මහ මඟට පිවිසීමට බිය වූහ.

ජර්මන්නු මහ මඟ මැද ඉඩ තබා, දෙපැත්තෙන් දම්වැලක් සේ ගමන් කළහ. තද කොළ පැහැති යුද ඇඳුමින් සැරසී සිටි ඔවුන්ගේ අත්වල තුවක්කුය. ඒවා ඕනෑම මොහොතක වුවද වෙඩි තැබීමට සූදානම් කර තිබිණි. තුවක්කු කටට උඩින්

පිහිය වැනි පුළුල් බයිනෙත්තුය. ඔවුහු හිස් වසා වානේ තොප්පි දමාගෙන සිටියහ. ඔවුන්ගේ පිටෙහි එල්ලා තිබුණු සෙබළු මලු විශාලය. දුම්රියපොළේ සිට ඔවුන් නගරය දෙසට පා තැබුවේ පටියක් මෙනි. සුපරීක්ෂාකාරී ලෙස ගමන් කළ ඔවුහු ඕනෑම මොහොතකදී පහර දීමට සූදානමින් සිටියහ. එසේ වුවද කිසිවෙක් ඔවුන්ට පහර දීමට ඉදිරිපත් නොවූහ.

මවුසර් පිස්තෝල දෙකක් අතින් ගත් ජර්මන් යුද නිලධාරීහු දෙදෙනෙක් මුලින් ගමන් ගත්හ. මහ මඟ මැදින් උක්රයින් ජාතික සාජන්ට් කෙනෙක් වන භාෂා පරිවර්තකයා ද ගමන් කළේය. පසු කී පුද්ගලයා නිල් පැහැති උක්රයීන කබායක් සහ හිස් වැස්මක් දමාගෙන සිටියේය. නගර මධ්‍යස්ථානයේ චතුරශ්‍රයේ පේළි තුනකට සිටින සේ යුද භටයෝ පෙළ ගැසුණහ. යුද බෙර වාදනය විය. බිය නැති නගර වැසි රස්තියාදුකාරයෝ කීප දෙනෙක් පමණක් එතැනට රොක් වූහ. උක්රයීන කබාය ඇඳ ගත් සාජන්ට් තැන බෙහෙත් කඩේ එළිපත්තට නැඟ අණ දෙන මේජර් කෝර්ප්ගේ ආඥාව කියැවීය.

එහි මෙසේ කියැවෙයි:

1

තමන් ළඟ ඇති වෙඩි තැබීමේ අවි සහ කඩු, පිහි, කැති වැනි සියලු අවි පැය විසි හතරක් ඇතුළත දී නගර වැසියන් මා වෙත භාර දිය යුතු බවට අණ කරමි. මේ අණ නොපිළිපදින අය වෙඩි තබා මරා දමනු ලැබේ.

2

නගරය තුළ යුද්ධ නීතිය පනවා ඇත. රාත්‍රී අටෙන් පසු ගෙයින් පිට වීම තහනම්.

නගරයේ අධිපති මේජර් කෝර්ප් විප්ලවයට පෙර නගර සභාව තිබුණු නිවසෙහි කම්කරුවන්ගේ සෝවියට් සභාවේ රැස්වීම් පැවැත්විණි. දැන් ඒ නිවෙස ජර්මනුන්ගේ අණදෙන කාර්යාලය බවට පත් වී ඇත. නිවසෙහි ආලින්දය ඉදිරිපිට යකඩ තොප්පියක් හිසලා ගත් ජර්මන් මුර භටයෙකි. ඔහුගේ යුද ලෝහ තොප්පිය ජර්මන් අධිරාජයාගේ රාජාලියා සහිත ලාංඡනයකින් යුක්ත විය. නගර වැසියන් ගෙනෙන අවි ගබඩා කිරීම සඳහා ගෙවත්තේ විශේෂ තැනක් විය.

වෙඩි තබා මරා දැමීමේ අණ නිසා බිය වූ රස්තියාදුකාර

නගර වැසියෝ, මුළු දවස තිස්සේම අවි ගෙනැවිත් භාර දුන්හ. වැඩිහිටි නගර වැසියන් එතැනට නොපැමිණියද, තරුණයෝ සහ කොල්ලෝ අවි ගෙනැවිත් භාර දුන්හ. ජර්මන්නු කිසිවෙකු සිරභාරයට නොගත්හ.

අවි භාර දීමට අකැමැති අය විසින් රැයෙහි ඒවා මහ මඟට වීසි කරන ලදින්, උදෑසන ජර්මන් මුර භටයෝ ඒවා එකතු කර යුද රියක පටවාගෙන ආහ.

දහවල් එක වන විට අවි ගෙනැවිත් භාර දීමේ කාල සීමාව ගෙවී ගියේය. ජර්මන්නු ගොඩගැසුණු අවි ගණන් කළහ. ඒවායේ ගණන දහහතර දහසකි. ඒ අනුව තුවක්කු හයදහසක් ජර්මනුන්ට නැවත ලබා ගැනීමට නොහැකි විය. නගරයේ තැනින් තැන වටලා සොයා ගත් අවිවල සංඛ්‍යාව ඉතා අල්ප විය.

පසුදින අරුණෝදයේ නගරයෙන් එපිට යුදෙව්වන්ගේ සොහොන් පිටියෙහිදී දුම්රිය කම්කරුවන් දෙදෙනෙකු වෙඩි තබා මරා දැමිණි. ඔවුන් විසින් සඟවා තබන ලද අවි ජර්මනුන්ට අසු වීම නිසා ඔවුන් මරණයට ගොදුරු විය.

★ ★ ★

අවි භාරදීමේ අණ පිළිබඳ තොරතුරු දැනගත් අර්ටියොම් හණිකට ගෙදර ආවේය. ගෙවත්තේ දී ඔහුට පාව්කා හමු වූයෙන්, ඔහු පාව්කාගේ උරහිසක් අල්ලගෙන සෙමින් එහෙත් ස්ථිර ලෙස මෙසේ ඇසීය:

"අවි මොනවා හරි ගෙදර ගෙනාවාද?"

පාව්කා තුවක්කුව ගැන කිසිවක් නොකීමට ඉටා ගත්තද, වැඩිමල් සොහොයුරා ඉදිරිපිට බොරු කීමට නොකැමැති වූයෙන් සියල්ල නොසඟවා කීය.

දෙදෙනාම මඩුවට ගියහ. අර්ටියොම් බාල්කයට එහා තබා ඇති තුවක්කුව ගෙන එහි යතුර ගලවා, බයිනෙත්තුව ඉවත් කළේය. තුවක්කු කානු බටය දැතින් ගත් අර්ටියොම් එය වැරෙන් කණුවට ගැසීය. තුවක්කු බටයෙන් ලී කඳ වෙන් විය. තුවක්කුවේ ඉතිරි කැලි ගෙවත්තට බොහෝ ඈතින් පාළු පිටියකට විසි කළේය. තුවක්කු යතුර සහ බයිනෙත්තුව වැසිකිළිවළට දැම්මේය. මේ සියල්ල කළ පසු අර්ටියොම් බාල සොහොයුරා ඇමතීය.

"පාව්කා නුඹ පුංචි කොල්ලෙක් නොවෙයි. තුවක්කු එක්ක සෙල්ලම් කිරීම තේරුමක් නැහැ. ගෙදරට කිසිවක්

ගේන්ට එපයි කියලා මම නුඹෙන් බොහොම බැරෑරුම් ලෙස ඉල්ලා හිටිනවා. ඔය වගේ වැඩ නිසා මැරුම් කන්ට සිද්ධ වේවි. බලාගෙන නුඹ මාව රවටන්නට එපා. නුඹ ඔය වගේ දේ ගෙනල්ලා අහු වුණොත් ඉස්සෙල්ලාම මැරුම් කන්ට වෙන්නෙ මටයි. නුඹ හොටුවා, නුඹට දඬුවම් කරන එකක් නැහැ. මේක නරක කාලයක්. තේරුණාද?"

කිසිවක් නොගෙනෙන බවට පාව්කා පොරොන්දු විය.

දෙදෙනා ගෙවත්තේ සිට ගෙදරට යන විට ලෙෂින්ස්කිලාගේ බංගලාව අසල අස් රියක් නැවැත්වීය. එම රියෙන් නීතිවේදියා සහ ඔහුගේ බිරිඳද, ඔවුන්ගේ ළමයින් - නෙලී සහ වික්ටර්ද බටහ.

"අන්න කුරුල්ලෝ ආපසු ඇවිල්ලා." අර්ටියොම් කෝපයෙන් කීවේය. "දැන් ඉතින් ලෙඩේ පටන් ගනීවි. ඕකුන්ට හෙණ වදීවි!" මෙසේ කී ඔහු ගෙට ඇතුළු විය.

පාව්කා මුළු දවස තිස්සේම තුවක්කුව ගැන දුක් විය.

මේ අතර, ඔහුගේ මිතුරා වන සිරියෝෂා ගරා වැටුණු මඩුවක් තුළ වළක් හාරන්නට විය. බොහෝ වෙහෙස වී වළක් හාරා පිළියෙල කරගන්නට ඔහු සමත් විය. අලුත් තුවක්කු තුනක් රෙදි කැලිවල ඔතා ඔහු ඒවා වළ තුළ බහාලීය. ඔහු තමා ලබාගත් තුවක්කු තුන ජර්මනුන්ට දීමට සූදානම් නැත. රෑ තිස්සේ නිදිමරා වළක් හාරා ඒවා සැඟවූයේ, ඒවායින් වෙන් වීමට නොවේ.

වළ වසා පස් පුරවා, බිම සමතලා කොට පැරණි කුණු රොඩු ඒ මත දමා විවේචනාත්මක ලෙස ඔහු තම ශ්‍රමය පිරික්සා බැලීය. ප්‍රතිඵල සතුටුදායක බව ඔහුට වැටහුණෙන්, ඔහු තම හිස් වැස්ම ගලවා නළල පිස දමා ගත්තේය.

"දැන් ඉතින් හොයාපුවාවෙ. හොයා ගත්තත් කාගේ බඩු දැයි කවුද දන්නෙ."

★ ★ ★

දැනට මසක් තිස්සේ විදුලි බලස්ථානයේ වැඩ කරන, දැඩි විදුලිබල ශිල්පියා දෙසට පාව්කා ඇදී ගියේ නොදැනුවත්වමය.

ගිනි උදුනට අඟුරු දමන්නා ගේ අත් උදවුකාරයා වන පාව්කාට ෂුක්රායි ඩයිනමෝ විදුලි යන්ත්‍ර ගැන කියා දී ඔහුට වැඩ උගැන්වීය.

මොළේ ඇති ගැටවරයාගේ හැසිරීම නාවිකයෙකු වූ ෂුක්රායිගේ සිත් ගත්තේය. නිවාඩු දවස්වලදී, ඉඳහිට ෂුක්රායි

අර්ටියොම් හමු වීමට ආවේය. නොයෙක් දේ ගැන හේතු සහිත තීරණ ගැනීමෙහි සමත්, බැරෑරුම් නාවිකයාට තම ගෙදර තොරතුරුද, විශේෂයෙන්ම පාවිකාගේ දඟකාරකම් ගැනද කීමට ඔහුගේ මවු ඉදිරිපත් වූ විට, නාවිකයා ඉවසිලිමත් ලෙස ඒවාට සවන් දෙයි. පවිකාගේ මව - මාරියා යකොව්ලෙව්නාව සන්සුන් කිරීමට ඔහු කොතරම් හොඳින් දැන සිටියේද යත්, ඔහුගේ උපදෙස්වලින් පසුව, ඇයට සිය දුක් කරදර අමතක වී, ඈ ප්‍රබෝධවත් වූවාය.

වරක් විදුලි බලස්ථානයට අයත් වත්තේ දර ගොඩක් අසල දී පාවිකා නැවැත්වූ ෂුක්රායි මඳ සිනා පාමින් මෙසේ ඇසුවේය.

නුඹලගෙ අම්මා කියනවා නුඹ ගහගන්ට හපනෙක් කියලා. "මගේ කොල්ලා පොර කුකුළෙක් වගේ." ෂුක්රායි ඔහු උනන්දු කරවමින් සිනාසුණේය. "ගහගැනීම සාමාන්‍යයෙන් නරක නැහැ. කාටද, මොකටද ගහන්ට ඕන කියන එක ගැන දැනගන්ට ඕන."

ෂුක්රායි තමා සිනහවට ලක් කරතියිද නැතිනම් ඔහු තමා සමඟ බැරෑරුම් ලෙස කතා කරති දැයි නොදත් පාවිකා පිළිතුරු දුන්නේය.

"මම නිකන්ම ගහගන්ට යන්නෙ නැහැ. සාධාරණත්වය සඳහා තමා හැමදාම ගහගන්නෙ."

බලාපොරොත්තු රහිත ලෙස ෂුක්රායි යෝජනාවක් ඉදිරිපත් කළේය.

"හැබෑටම ගහගන්නට නුඹට උගන්වනවාට නුඹ කැමති ද?"

පාවිකා පුදුමයෙන් ඔහු දෙස බැලීය.

"ඒ කොහොමද, හැබෑටමද?"

"නුඹට බලන්ට පුළුවන් වේවි."

ඉංග්‍රීසින්ගේ බොක්සිං ක්‍රීඩාව පිළිබඳ පළමුවැනි දේශනය එදින පාවිකාට අසන්නට ලැබිණි.

පාවිකාට බොක්සිං ක්‍රීඩාව ඉගෙන ගැනීම ලෙහෙසි නොවීය. ෂුක්රායිගෙන් පහර කන ඔහු බිම ඇද වැටී පෙරළුණේ වරක්, දෙවරක් නොවේ. එහෙත්, ඔහු ඉතා හොඳ ඉවසිලිමත් සිසුවෙක් විය.

ගිම්හාන දවසක පාවිකා, ක්ලීම්කාගේ ගෙදර සිට විත් වැඩක් නැතිව කාමරය තුළ ඔබ - මොබ ඇවිදින්නේ, තමා ඉතා ආදරය කරන ස්ථානයක් වන මුරපොළෙහි වහලට

නැඟීමට තීරණය කළේය. ඔහු ගෙමිදුලේ සිට ගෙවත්තටද ගෙදරින් එපිට පිහිටි මුරුකරුගේ මුර පොළ දක්වාද ගියේය. ලී පතුරුවලින් සෑදූ මඩුව වෙත ගිය ඔහු, පඩිපෙළ ඔස්සේ ගොස් පියස්සට නැඟ ගත්තේය. වහල මත වූ චෙරි පඳුරු ඇත් මෑත් කොට, වහල මැදට පැන, එහි වැතිර අව්ව තපින්නට විය.

මේ මුරපොළේ එක් කෙළවරක් ලෙෂීන්ස්කිලාගේ වත්ත දක්වා විහිද ඇත. පියස්ස දිගේ කෙළවර දක්වා ගියොත් ඔවුන්ගේ බංගලාවෙහි එක් අංශයක් හා මුළු ගෙවත්තද දැකිය හැකිය. පාච්කා හිස ඔසවා බැලූ විට, ගෙමිදුලද එහි නවත්වා ඇති රිය ද ඔහුට පෙනිණි. ජර්මන් යුද්ධ හමුදාවේ ලයිතන් කෙනෙක් සහ ඔහුගේ සේවක යුද භටයෙක් ලෙෂීන්ස්කිලාගේ ගෙදර නවාතැන් ගෙන සිටියහ. සේවකයා තම ස්වාමියාගේ ඇඳුම් පිරිසිදු කරන සැටි පාච්කා දුටුවේය. බංගලාවේ ගේට්ටුව අසලදී ජර්මන් ලයිතන්ව ඔහු නිතර දැක ඇත.

ලයිතන් තැන මිටි මිනිහෙකි. ඔහුගේ දෙකොපුල් රතුය. ඔහුගේ උඩු රැවුළ කුඩාය. කොටට කපලාය. පෙන්ස්නේ ඇස් කණ්ණාඩි කුට්ටමක් ඔහු දමාගෙන සිටියේය. හිස වසා ඇති හිස් වැස්මේ ඉදිරි කොටස දිලිසෙයි. බංගලාවේ කාමරයක ජර්මන් ජාතික ලයිතන් නවාතැන් ගෙන සිටින බව පාච්කා දනී. වත්තට මූණ ලා ඇති එම කාමරයේ කවුළුව වහල උඩ සිට බලන්නෙකුට පෙනෙයි.

ලයිතන් දැන් මේසය අසල වාඩි වී යමක් ලියා, එයද රැගෙන කාමරයෙන් පිටවිය. ලියුම තම සේවකයාට භාර දී ඔහු වත්තේ පටු මඟ ඔස්සේ යමින් ගේට්ටුව අසලට ආවේය. ගිම්හාන මඩුවේ වැට අසල නැවතී කිසිවෙකු සමඟ කතා කළේය. ගිම්හාන මඩුවේ සිට නෙලී ලෙෂීන්ස්කයා ආවාය. ඇගේ අතක් ගත් ලයිතන් අය කැටුව මහ මඟට ගියේය.

මේ සියල්ල පාච්කාගේ නිරීක්ෂණයට හසු විය. ඔහු පියස්ස මත වැතිර නිදාගන්නට සැරසෙන විට, කවුළුවේ දොර හැර ලයිතන්ගේ සේවකයා කාමරය පවිත්‍ර කොට, නිල ඇඳුම බෝල කූඩුවේ එල්ලා, ඇතුළු ගෙට වදින දොර වසා පිට වී ගියේය. සේවකයා එතැනින් අශ්වගාලට ගිය සැටි හේ දුටුවේය.

කවුළුවේ දොර හැර තිබුණු නිසා පාච්කාට ලයිතන්ගේ කාමරය ඉතා හොඳින් පෙනිණි. මේසය මත හමින් කළ පටි සහ දිලිසෙන යමක් පෙනෙන්නට තිබේ.

නොඉවසිලිමත් කුතුහලය විසින් පාවිකා ඉදිරියට තල්ලු කරන ලදි. ඔහු සෙමින් ගහ අල්ලා ගෙන වහලින් ලෙෂීන්ස්කිලාගේ වත්තට බටුයේය. උඩු කය නවාගත් පාවිකා අඩි දෙක තුනක් පැන දොර පියන් හැර ඇති කවුළුව අසලටම ගියේය. කාමරයේ මේසය මත හමින් කළ උරපටි සහ පිස්තෝල කොපුවකි. එය තුළ ඉස්තරම් 'මන්ලිහෙර්' වර්ගයේ කානු දොළහේ පිස්තෝලයකි.

පාවිකාගේ සිත ගැහෙන්නට විය. ගන්දෝ, නොගන්දෝ යන අදහස ඔහුගේ සිතෙහි පොරබදන්නට වූයේ තත්පර කීපයක සිටය. සාහසික එඩිතර බවකින් පිබිදුණු ඔහු කවුළුව තුළින් කාමරයට උඩු කය ඔබා පිස්තෝල කොපුව අතට ගෙන, එහි තුළ වූ අලුත් පිස්තෝලය ගත්තේය. අනතුරු ව වත්තට පැන්නේය. වටපිට බැලූ පාවිකා ප්‍රවේසමින් පිස්තෝලය සාක්කුව තුළට බහා, වත්ත හරහා චෙරි ගහ දිගේ නැග්ග ඔහු වහලට ගියේය. හේ යළිත් වරක් පිටුපස හැරී බැලීය. ලයිතන්ගේ සේවකයා, අශ්වගාලේ අස් ගොව්වා සමඟ කතාවෙක යෙදී සිටී. වත්තෙහි හැම දෙයක්ම නිසලය... ඔහු පියස්සේ එහා කෙළවර දක්වා ගොස් එයින් බිමට බැස ගෙදරට දිව්වේය.

කුස්සියෙහි ආහාර පිළියෙල කරමින් සිටි අම්මා පාවිකා ගැන සැලකිල්ලක් නොදැක්වූවාය.

පෙට්ටගමට එහා තිබුණු රෙදි කඩමාල්ලක් රැගත් පාවිකා එය සාක්කුවක ඔබාගෙන, හෙමින් සීරුවේ ගෙයින් පිටතට ගොස්, වත්ත හරහා දිව්වේය. වැට උඩින් පැන කැලෑවට යන මග දිගේ ගමන් කරන්නට විය. බරැති පිස්තෝලය ඔහු පා නඟත්ම කකුලට වැදෙයි. ඔහු මුළු වෙර යොදා ගරා වැටී ඇති ගඩොල් කම්හල වෙත දිව ගියේය.

ඔහුගේ දෙපා පොළොව සිප ගත්තේ යම්තමිනි. සුළං පහරින් දෙකන් තුළ හඬක් ඇති විය.

ගරා වැටුණු ගඩොල් කම්හල අසල නිසලතාවකි. තැනින් තැන ලී වහල පොළොවට කඩා වැටිලාය. බිඳුණු ගඩොල් කඳුද, විනාශ වී දැවී ගිය ලිප්ද කනස්සල්ලක් ඇති කළේය. මෙතැන හැම තැනම වල් තණ පඳුරුය. මිතුරන් තිදෙනෙකු පමණක් ඉඳ හිට මෙහි පැමිණියේ කෙළි සෙල්ලම් සඳහාය. සොරා ගත් අගනා වස්තුව සැඟවීමට තරම් සෑහෙන තැන් කීපයක් දැන සිටියේ පාවිකා පමණකි.

ගඩොල් පුලුස්සන පැරණි මහා උදුනකට රිංගා ගත් පාවිකා ප්‍රවේසමින් වටපිට පිරික්සුවේය. මඟ හිස් ය. සස්නා තුරු මුදුන් නිසලව සැලෙයි. මඳ සුළඟින් මඟෙහි ඇති දූලි තරමක් ඉහළ නැංගේය. ගස්වලින් මැලියම් සුවඳ වහනය වෙයි.

උදුන පතුලෙහි මුල්ලක රෙදි කඩින් එතූ පිස්තෝලය තැබූ පාවිකා එය වසා පිරැමීඩයක හැඩයකට ගඩොල් කැට තැබීය. ස්ථානය හඳුනා ගැනීම් වස් සලකුණු වශයෙන් තවත් ගඩොල් කැට තැබූ ඔහු, උදුනෙන් එළියට විත්, සෙමින් සෙමින් නිවෙස බලා පා නැඟීය.

ඔහුගේ දණහිස් යන්තමින් වෙවුලන්නාක් මෙනි.

"මෙය ඉවර වෙන්නෙ කොහොමද?" ඔහු මෙසේ සිතත්ම, ඔහුගේ හදවත හැකිළී කැලඹීමක් හට ගත්තේය.

ඔහු විදුලි බලස්ථානයට නියමිත වේලාවට කලින් පැමිණියේ ගෙදර සිටීමට නොහැකි බැවිනි. විදුලි ඩයිනමෝ යන්ත්‍ර තබා ඇති ස්ථානයට යා හැකි මඟ ඇති දොරවල්, ඔහු මුරකරුගෙන් යතුර ගෙන විවෘත කළේය. ලිපෙහි අළු ශුද්ධ කොට විශාල ටැංකියකට වතුර පුරවා, ලිපට අඟුරු දමන ගමන් ඔහු කල්පනා කරන්ට විය.

"ලෙෂීන්ස්කිලාගේ බංගලාවේ දැන් සිදුවන්නේ මොනවාද?"

"රෑ එකොළහට පමණ පාවිකා හමු වීමට ෂුක්රායි ආවේ ය. හේ ඔහු මිදුලට අඬ ගසා පහත් හඬින් ඇසුවේය.

"නුඹලගේ ගෙය අද හෝදිසි කළේ මොකද?"

පාවිකා බියෙන් තිගැස්සිණි.

"හෝදිසි කළාද?"

ෂුක්රායි නිහඬව සිට යළි මෙසේ කීය:

"ඒක එතරම් හොඳ නැහැ. උන් සෙව්වේ මොනවාදැයි නුඹ දන්නවද?"

ඔවුන් සෙවූ දේ ගැන පාවිකා ඉතා හොඳින් දැන සිටිය ද, පිස්තෝලය සොරකම් කිරීම පිළිබඳ පුවත ෂුක්රායිට දැන්වීමට ඔහු තීරණය නොකළේය. බියෙන් තිගැස්සුණු ඔහු ප්‍රශ්න කළේය.

"අර්ටියොම්ව සිරභාරයට ගත්තද?"

කිසි කෙනෙකුව හිර භාරයට ගත්තෙ නැහැ. ගෙදර බඩු මුට්ටු හැම තැනම විසි කරල දාලා."

ඔහුගේ විස්තරය නිසා තරමක සැහැල්ලුවක් දැනුණද, අවදානම තුනී නොවී ය. විනාඩි කිහිපයක් යන තුරු ඔවුහු

එක් එක්කෙනා තමන්ගේ තත්ත්වය ගැන පමණක් කල්පනා කරන්නට වූහ. එකෙක් ගෙය පරීක්ෂා කිරීමේ හේතුව දන්නේ, විය හැකි විපාකයන් ගැන බිය විය. අනිකා හේතුව නොදත් නිසා වඩාත් සුපරික්ෂාකාරී විය.

"මුන්ට මා ගැන ඉව වැටී තියෙනවද්දැයි කොයි යකාද දන්නෙ? අර්ටියොම් මා ගැන කිසිවක් දන්නෙ නැහැ. එහෙනම් එයාගේ ගෙදරට ජර්මාන්නු කඩා පැනලා හෝදිසි කළේ ඇයි? වඩාත් ප්‍රවේසම් වෙන්න ඕන. "ෂුක්රායි කල්පනා කළේය.

දෙදෙනාම නිහඬව සිය වැඩෙහි යෙදුණහ.

ලෙෂීන්ස්කිලාගේ බංගලාවේ මහ කලබගෑනියකි.

තම පිස්තෝලය නැති බව දැනගත් ලයිතන් නැත සේවකයාට අඬ ගැසීය. සාමාන්‍යයෙන් සිය හැඟීම් මැඩ ගැනීමෙහි සමත්, ආචාරශීලී ලයිතන් තැන පිස්තෝලය නැති බැව් දැනගත් විට, සේවකයාගේ කනට මුළු වැර යොදා පහරක් ගැසීය. සේවකයා පහර නිසා සෙලවුණද, දුනු තතක් මෙන් සෘජුව සිට ගත්තේය. වරදක් කළ එකෙකු සේ ඇසි පිය හෙළුවද ඔහු යටහත් පහත් ලෙස තවත් පහරවල් බලාපොරොත්තු විය.

පිස්තෝලය නැති වුණ හැටි විස්තර කරන ලෙස නීතිවේදී ලෙෂීන්ස්කි ගෙන් ඉල්ලා සිටි විට, තම නිවසේ දී එවැන්නක් සිදුවීම ගැන ඔහු ලයිතන්ගෙන් සමාව ඉල්ලා, සිය අප්‍රසාදය පළ කළේය.

පිස්තෝලය අසල්වැසියන්, විශේෂයෙන්ම මැරවරයෙකු වන පාවෙල් කොර්චාගින් විසින් සොරකම් කරනු ලැබීමට ඉඩ ඇතැයි, එතැන සිටි වික්ටර් ලෙෂීන්ස්කි තම පියාට කියා සිටියේය. පියා තම පුතාගේ මතය ලයිතන්ට විස්තර කිරීමට යුහුසුලු විය. එවිට ලයිතන් තැන පරීක්ෂා කිරීමේ සේනාංකය කැඳවීමට අණ කළේ ය.

අසල්වැසි නිවාස පරීක්ෂා කළ ද, ප්‍රතිඵල රහිත විය. නැති වුණ පිස්තෝලය පිළිබඳ සිද්ධිය නිසා එක් කරුණක් පාවිකාට ඒත්තු ගියේය. මෙතරම් අවදානම් සහිත ක්‍රියා පවා සමහර අවස්ථාවලදී සාර්ථක වන බවය.

III

තෝන්යා විවෘත කළ කවුළුව අසල සිටියාය. ස්වකීය ගෙවත්ත දෙසද, එය වට කොට ඇති සිහින් තොපොල් ගස් දෙසද ඇය බැලුවේ කනස්සලු ගතියකිනි. මඳ පවන නිසා ඒවා යන්තමින් සෙලවුණේය. සිය නිවස නොදැක වසරක් ගෙවී ගිය සැටි විශ්වාස කිරීමට පවා ඕ මැළි වූවාය. ඊයේ ඇය ඒවා අතහැර ගියාක් මෙනි, ඇයට දැනෙන්නේ. ළමා වියේ සිටම තමාට හුරු පුරුදු මේ පෙදෙස් අද උදෑසන දුම්රිය ගමනින් පසු තමාට නැවත කිට්ටු වූ සැටියක් ඇයට දැනෙයි.

මෙහි කිසිවක් වෙනස් වී නැත මලීන[1] පඳුරු පෙර මෙන්ම මනා ලෙස සකස් කොට ඇත. ජ්‍යාමිතියෙහි ඇති කෝණාකාර හැඩයක් අනුව පටු මඟ සකස් කොට තිබේ. අම්මා ප්‍රිය කළ 'අන්ෆූටාගේ නෙත්' නමින් හැඳින්වෙන මල් වවා ඇත. මල් වත්ත පිරිසිදුය, ප්‍රියමනාපය. වන සංවර්ධන විද්‍යාඥයෙකුගේ හුරුබුහුටි අතින් මේ හැම වැඩක්ම මෙහෙයවා ඇති බව පෙනේ. වල් පැළෑටි ආදිය උගුල්ලා මනා ලෙස පිරිසිදු කොට ඇති පටුමඟ නිසා තෝන්යා කාන්සියකින් පෙළෙයි.

කියවා අවසන් නොකළ නවකතාවක් අතට ගත් තොන්යා අලින්දයට පිවිසෙන දොර හැර, පඩිපෙළ දිගේ ගෙවත්තට විත්, පාට ගා අලංකාර කළ කුඩා ගේට්ටුව මෑත් කොට, දිය උල්පත් ළඟ ඇති පොකුණ දෙසට සෙමින්, සෙමින් පා තැබුවාය.

කුඩා පාලමක් ඔස්සේ ගමන් කළ ඈ, පටු මඟකට පිවිසියාය. ඒ මඟ උද්‍යාන පථයකට සමානය. දකුණු පසින් පොකුණකි. එහි කට වටා විලෝ හා ඝනව වැඩුණ නිදිකුම්බා වැනි පඳුරුය. වම් පසින් වනය පටන් ගැනේ.

ඈ පොකුණ අසල පැරණි ගල් පොත්තට යාමට සූදානම් වූවද, සිහින් යොත් පටක් සහිත බිළී පිත්තක් දුටුවෙන් නැවතුණාය.

විලෝ පඳුරට උඩින් එබී බැලූ ඈ අසල වැඩුණු ගසක අත්තක් මෑත් කළා ය. කලිසම් කකුල් දණහිසට උඩින් නමා ගත්, පාවහන් රහිත ගැටවරයෙක් බිළී පිත්ත අතින් ගෙන සිටී. ඔහුගේ හම අව්වට පිලිස්සී, රත් පැහැ ගෙන ඇත. ඔහු අසල යකඩ මල කෑ ටින් බඳුනක පණුවන් කීප දෙනෙකි. මාළු බෑම සඳහා සිත කය දෙකම යොදා සිටි ගැටවරයා

1. රසැති පලු වර්ගයකි.

තෝන්යාගේ පැමිණීම නොදත්තේය.

"මෙතැන මාළු අල්ලන්ට පුළුවන්ද?"

පාවිකා කෝපයෙන් ඇය දෙස බැලීය.

පඳුරක් අල්ලාගත් නාඳුනන තරුණිය පොකුණ දෙසට නැමී සිටියාය. ඇගේ උඩුකය සුදු සහ නිල් පැහැති නාවික කබායකට සමාන හැට්ටයකින් වැසී තිබිණි. ඇගේ සාය අළු පැහැතිය. අව්ව නිසා රත් පැහැ ගත් ඇගේ දෙකකුල් වැසී තිබුණේ ඉලාස්ටික් පටි සහිත මේස් කුට්ටමකිනි. පාවහන් දුඹුරු පැහැතිය. දුඹුරු පැහැති ඇගේ හිසකේ එක් කොට බැඳ තිබුණු අතර, එය කුඩා අසකුගේ වලිගයකට සමානය.

බිළිපිත්ත ගත් අත තරමක් සෙලවිණි. යොතට බැඳි ඉපිල්ල නැටවිණි. ඒ සමඟම දියෙහි කුඩා කවයක් මතු වී කෙමෙන් පුළුල්ව ගියේය.

තරුණිය කැලඹුණු හඬකින් කතා කළාය.

"අන්න මාළු කොටනවා, පේනවද කොටනවා..."

පාවෙල් හොඳටම කැලඹුණෙන් බිළිපිත්ත ඇද්දේය. විසිර ගිය දිය බිංදු සමඟ බිළී කටුවට ඇමුණූ පණුවා ගොඩට ගත්තේය.

"දැන් ඉතින් මොන යකෙකුටවත් බැහැ මාළු අල්ලන්න. මේ සමයම කොහෙ ඉඳල පාත් වුණාද" පාවිකා රොස් වී සිතන්නට විය. සිය නොහැකියාව වසා ගන්නට මෙන් පාවෙල් මේ වර යොත් පට වීසි කළේ ඈතටය. බිළීකටුව, වල් තණ පඳුරු දෙකකට මැදින් වැටිණි. එතැනට යොත්පට විසි කිරීම කොහෙත්ම සුදුසු නැත. මන්ද යත්, වල් පඳුරුවලට ඇමිණෙන බැවිනි.

නැවත ආපසු නොබැලූ පාවිකා තමාට තරමක් ඈතින් උඩහ වාඩි වී සිටින තරුණියට ඇසෙන සේ මෙසේ කීවේය:

"ගෝසා කරන්නේ මොකටද? මාළුවෝ බය වෙලා පැනල යාවි."

"නුඹව දැකලා මාළුවො පැනලා ගිහින් දැන් බොහෝ වේලාවක් ගත වුණා. දවල් කාලෙට මාළු බානවද? අනේ මදෑ මාළු කාරයෙකුගෙ හැටි!" යි කී තරුණියගේ කටහඬෙහි උපහාසාත්මක බවක් පමණක් නොව, අපහාසාත්මක බවක් ද තිබිණි.

ආචාරශීලී වීමට මහත් පරිශ්‍රමයක් දරන පාවිකාට එය විඳ දරාගත නොහැකි විය. ඔහු නැඟිට තම 'කැප් තොප්පියෙන් නළල වසා ගත්තේය. ඔහු මෙසේ කරන්නේ රොස් වූ විටය.

හැකි තරම් මුදු වචන පාවිච්චි කිරීමට ඔහු වෙර දැරීය.

"ඔබ, නෝනා මහත්මයා, වෙනත් දිහාවකට යනව නම් හොඳයි නේද ආ"

තෝන්යාගේ දෙනෙත් යන්තමින් හැකිළිණි. මඳහස පෑ දෙනෙත්වල දීප්තියකි.

"මම ඔබට බාධා කරනවද?"

මෙවර ඇගේ කටහඬෙහි අපහාසාත්මක බවක් නොතිබුණා පමණක් නොව, එහි යම් කිසි මිතුරු බවක් හා සාවදානකාමී බවක් ද තිබිණි. නොදන්නා පෙදෙසකින් පැමිණි 'ළමාතැනිට' බැණ වැදීමට සැරසුණු පාච්කා එම කටහඬ විසින් නිරායුධ කරන ලදි.

"මට මොකද, කැමති නම් බලන්න. මට ඇති පාඩුවක් නැහැ."ඔහු එකඟ වී නැවත වාඩි වෙමින් ඉපිල්ල දෙස බැලී ය. ඉපිල්ල පඳුරු දෙසට පාවෙන්නට වූයෙන්, බිළිකටුව පඳුරේ මුල්වල ඇමිණී ඇති බව පැහැදිලි විය. එය ඇද ගැනීමට පාච්කා තීරණය නොකළේය.

"ඇමිණිලා නම් ආයෙත් ඇදලා වැඩක් නැහැ. එතකොට මේකි හිනා වේවි. යන්නෙ නැතිව ඉන්නවා." ඔහු සිතමින් නිගමනය කළේය.

නැමී, යන්තම් සෙලවෙන පඳුරක් මත සැප පහසු ලෙස වාඩි වූ තෝන්යා පොත දෙදණ මත තබා, තමා සතුරු ලෙස පිළිගත්, දැන් වුවමනාවෙන්ම තමා දෙස සැලකිලි නොදක්වන, කළු පැහති දෙනෙත් ඇති ගොරහැඩි ගැටවරයා දෙස බලන්නට වූවාය.

තමා සමීපයෙහි වාඩි වී සිටින තරුණියගේ රුව පොකුණේ ජලයෙහි පිළිබිඹු වෙයි. එය පාච්කාට හොඳ හැටි පෙනේ. ඈ පොත කියවන්නීය. ඔහු පඳුරුවලට ඇමිණී ඇති බිළිකටුව ඇයට හොරෙන් අදී. ඉපිල්ල දිය යට ගොස් නැවත මතු වෙයි. පඳුරුවල පැටලී ඇති යොත්පට දිග හැරෙයි.

"පැටලුණා, කාලකණ්ණිකමක හැටි!" ඔහුගේ සිත කියයි. ජලයෙහි පිළිබිඹු වන ඇගේ වත යන්තමින් සිනාසෙන සැටි ඔහුට පෙනේ.

උල්පත අසල කුඩා පාලමෙන් හත්වැනි පන්තියේ ඉගෙන ගන්නා විදුහල් සිසුන් දෙදෙනෙක් මෙගොඩ වූහ. එකෙක් ඩිපෝවේ අධ්‍යක්ෂ වන සුහර්කෝගේ පුතාය. ඔහුගේ හිසකේ රන් පැහැතිය. ඔහුගේ මුහුණ වසන්ත ලපවලින් පිරිලාය. දාහත් හැවිරිදි වියේ සිටි ඔහු මහ මෝඩයෙකි. අඟනුන්

මුළා කරන සල්ලාලයෙකි. විදුහල් සිසුන් ඔහු හැඳින්වූයේ ෂුර්කා නමිනි. ඉස්තරම් වර්ගයේ බිළිපිත්තක් අතින් ගෙන, දුම්වැටියක් උරමින් ඔහු ගමන් කළේය. ඔහු සමීපයෙන් වික්ටර් ලෙෂින්ස්කි පා නැඟීය. ඔහු සිහින් අතිශයින්ම මුදු තරුණයෙකි.

ෂුර්කා සුහර්කෝ ඉඟි මරමින් වික්ටර් දෙසට නැමුණේය.

"ඒ කෙල්ල හරි බඩුවක්. ඒ තරම් හොඳ කෙල්ලෙක් මෙහි නැහැ. මම නුඹට සහතික කරනවා ආලය කරන්නට කියාපු බඩුව. ඉගෙන ගන්නේ හයවැනි පන්තියේ, කීයෙව් නගරයේ. නිවාඩුවට තාත්තාව බලන්ට ඇවිල්ලා. ඇගේ තාත්තා මෙහි වන සංවර්ධන ලොක්කා. ඈ මගේ සහෝදරිය ලීසාව හඳුනනවා. මම කෙල්ලට පොඩි හොර ලියුම් කෑල්ලක් දුන්නා. බොහොම උසස් ආධ්‍යාත්මික ලියුමක්. මුළු හිතින්ම ආලය කරනවා, පිළිතුරක් බලාපොරොත්තු වෙනවා කියලා ලිව්වා. අදහසට ගැළපෙන කවියක් පවා නැඩිසන්ගේ කවිවලින් උපුටා ගත්තා."

"ඉතින් මොකද වුණේ." කුතුහලයෙන් යුතුව වික්ටර් ප්‍රශ්න කළේය.

සුහර්කෝ තරමක් ලජ්ජා විය.

"ඔව්, තරමක් මෙල්ල වෙලා. ඒ කියන්නේ ආඩම්බර වෙන බවයි... ඈ කියනවා කඩදාසි නාස්ති කරන්ට එපයි කියලා. පටන්ගන්න කොට ඔහොම තමයි. මම ඕවට පුරුදුකාරයෙක්. මට ඒකිගෙ පස්සෙන් යන්ට හිතක් නැහැ. බොහොම කාලයක් ඈට සංග්‍රහ කරන්නටයි, ඈ වටේ යන්නටයි සිදුවේවි. එයට වැඩියෙ කොතරම් හොඳද හවස් වුණාම අලුත්වැඩියා කරන බැරක්වලට ගියාම. රූබල් තුනක් දුන්නම ලෙව කන්ට තරම් ලස්සන රූප සුන්දරියක් හොයා ගන්ට පුළුවන්. බොරු අඟර දඟර බලන්ට ඕන නැහැ. මම වාල්කා තීකනොව් සමඟ එහෙ ගියා. නුඹ පාර හදන බාස්ව හඳුනනවද?"

වික්ටර් සාවඥ ලෙස මුහුණ හකුළුවා ගත්තේය.

"ෂුරා නුඹ ඔය තරම් නීච වැඩ කරනවද?"

ෂුරා සිගරැට් බටය විකා කෙළ ගසා සගයා දෙස උපහාසාත්මක ලෙස බැලීය.

"මැදෑ හරිම සුද්දවන්තයෙක්. නුඹලා කරන වැඩ ගැන අපි දන්නවා." හේ කීය.

වික්ටර් ඔහුගේ කතාවට බාධා කළේය.

"නුඹ මාව කෙල්ලට හඳුන්වා දෙනවද?"

"සත්තකින්ම. ඈ යන්ට ඉස්සෙල්ලා අපි ඉක්මනින් යමු. ඊයේ උදේ ඈ තනිවම මාළු බැවා."

මිතුරන් දෙදෙනා තෝන්යා වෙත ළඟා වූහ. සිගරැට්ටුව කටින් අතට ගත් ෂුර්කා සුහර්කෝ ජේත්තුකාරයෙකු සේ රඟපාමින් උඩුකය නැමීය.

"සුබ උදෑසනක් වේවා මැඩමොසෙල්තුමා නොවැ. මොකද මාළු අල්ලනවද?"

"නැහැ. අල්ලන හැටි බලාගෙන ඉන්නවා." තෝන්යා පිළිවදන් දුන්නාය.

"ඔයගොල්ල හඳුනාගෙන නැත්ද?" වික්ටර්ගේ අතක් අල්ලාගත් සුහර්කෝ හණිකට පැවසීය. "මේ මගේ යාළුවා වික්ටර් ලෙෂීන්ස්කි."

වික්ටර් ලජ්ජාවෙන් ඇයට අත දිගු කළේය.

"ඔබ ඇයි අද මාළු අල්ලන්නෙ නැත්තෙ?" කතාවට මුල පිරීමක් වශයෙන් සුහර්කෝ ඇසීය.

"මම බිළිපිත්ත ගෙනාවේ නැහැ." තෝන්යා පැවසුවාය.

"මම ගිහිල්ලා තව බිළිපිත්තක් ගේන්නම්." සුහර්කෝ ඉක්මන් විය. "ඔයා මගේ බිළිපිත්තෙන් මාළු අල්ලන්ට, මම තව එකක් ගේන්නම්."

ඇය හඳුන්වා දීමට වික්ටර්ට දුන් පොරොන්දුව ඉටු කළ ඔහු, ඔවුන් දෙදෙනාගෙන් ඈත් වීමට වෑයම් කළේය.

"නැහැ. අප බාධා කරනවා. මෙතන දැනටමත් මාළු අල්ලනවා." ඕ කීවාය.

"බාධා කරන්නේ කාටද?" සුහර්කෝ ඇසීය. "ආ මෙන්න මූටද?" වාඩි වී මාළු බාමින් සිටි පාච්කාව ඔහු දුටුවේ මේ දැන්ය. "මේකව මම මෙතනින් වහාම පන්නා දමන්නම්."

තෝන්යාට බාධා කිරීමට නොහැකි විය. ඔහු පොකුණ අයිනේ සිට පාච්කා වෙත ගියේය.

"ඒයි, බිළිපිත්තත් අරගෙන වහාම පලයන්." ඔහු පාච්කාට තරවටු කළේය. "ඉක්මනට, ඉක්මනට පලයන්." පාච්කා සන්සුන්ව මාළු බාන සැටි දුටු ඔහු යළිත් කීය.

පාච්කා හිස ඔසවා සුහර්කෝ දෙස බැලීය. ඔහුගේ එම බැල්මෙහි කිසිදු යහපතක් නොතිබිණි.

"නුඹ සන්සුන් වෙයන්. කට හැකරකම් දොඩවන්නෙ මොකටද?"

"මොනවා?" සුහර්කෝ කෝපයෙන් වෙවුලන්නට විය. "නුඹ තවත් කථා කරනවද? කාලකණ්ණි හඬුවා! පල මෙතනින්

යන්ට!" ඔහු මෙසේ කියත්ම පණුවන් සහිත ටින් බඳුනට පා පහරක් ගැසීය. එය උඩ වීසි වී වතුරට වැටිණි. ටින් බඳුන වතුරට වැටීමේදී වතුර බින්දු තෝන්යාගේ මුහුණට ද විසි විය.

"සුහර්කෝ තමුසෙට ලජ්ජා නැත්ද!" තෝන්යා උස් හඬින් ඇසුවාය.

පාච්කා නැඟිට සිට ගත්තේය. සුහර්කෝ ඩිපෝවේ ලොක්කාගේ පුතා බවත්, තමාගේ වැඩිමහලු සොහොයුරු අර්ටියෝම් එම ඩිපෝවේ වැඩ කරන බවත් ඔහු දත්තේ ය. දැන් තමා මේ දුබල සිසුට පහර ගැසුවොත්, ඔහු ඒ බව ඔහුගේ පියාට පැමිණිලි කරනු ඇත. එම පුවත අර්ටියෝම්ටද අසන්නට ලැබෙනු ඒකාන්තය. සුහර්කෝට වහාම දඬුවම් නොදී පමා කිරීමේ එකම හේතුව එය විය.

තමාට දැන්, පහර දෙනු ඇතැයි සිතූ සුහර්කෝ, ඉදිරියට පැන, පොකුණ අයිනේ සිට ගෙන සිටි පාච්කාගේ පපුවට දැත් තබා ඔහු දියට තල්ලු කළේය. පාච්කා දැත් වනා, කඳ නැවුවද, දියට නොවැටී සිට ගැනීමට සමත් විය.

පාච්කාට වඩා අවුරුද්දකින් වැඩිමහලු සුහර්කෝ කලහ කිරීමෙහි හා නින්දා සහගත වැඩ කිරීමෙහි පළමුවැනි තැන දිනා සිටි කෙනෙකි.

තම පපුවට වැදුණු පහරින් පසුව පාච්කා සම්පූර්ණයෙන්ම වියරු වැටුණේය.

"ආ එහෙමද! එහෙනම් මෙන්න තොට!" පාච්කා මුහුණ හරහා දැඩි පහරක් ගැසීය. කෑ පහරින් පසු ප්‍රකෘති තත්ත්වයට පැමිණීමට පෙර සුහර්කෝගේ විදුහල් කබායෙන් අල්ලා ඔහු තමා වෙතට ඇදගත් පාච්කා ඔහු පොකුණට තල්ලු කළේය.

දණක් වතුරේ සිටගත් සුහර්කෝ පාච්කාගේ දැඩි ග්‍රහණයෙන් මිදීමට යෙදිය හැකි හැම ශක්තියක්ම යොදමින් වෙර දැරීය. ඔහුගේ දිලිසෙන පාවහන් යුගල සහ කලිසම ද වතුරට තෙමිණි. සුහර්කෝව වතුරට තල්ලු කළ පාච්කා පොකුණේ ඉවුරට පැන ගත්තේය.

සුහර්කෝ වියරු වැටුණකු සේ පාච්කා ලුහුබැඳ යමින් ඔහු තූ තූ කොට ඉරා දැමීමට සූදානම් විය.

ඉවුරට පැන ගෙන, තමා වෙත එන සුහර්කෝ දෙස හැරුණු පාච්කාට ෂුක්රායිගේ බොක්සිං පාඩම මතක් විය.

"වම් කකුලට බර වී සිට ගැනීම, දකුණු කකුල තරමක් නැවීම, එහි මස් පිඬු පිම්බී තිබිය යුතුය. පහර ගැසිය යුත්තේ අතේ බර පමණක් නොව, මුළු කයේම බර යොදවමිනි."

පහර එල්ල විය යුත්තේ පහළ සිට ඉහළටය. නිකටට පහළිනි.

"දඩාස් !"

දත් ගැටෙන හඬකි. නිකටින් මතු වුණු වේදනාවෙන් ද, දිව හැපුණු නිසා පැන නැඟි වේදනාවෙන් ද, සුහර්කෝ නුහුරු ලෙස දෑත් වැනීය. මුලින් කපා හෙළූ කඳක් මෙන් මේ වර ඔහු දියට වැටුණේය.

ඉවුරේ සිටි තෝන්යා කොක් හඬලමින් නොනවත්වා සිනාසුණාය.

"හපනා! හපනා!" දෑත් එක් කොට අත්පුඩි ගසමින් ඕ කෑගැසුවාය. " එය බොහෝම අපූරුයි."

බිළිපිත්ත අතට ගෙන පාවිකා එය අදිත්ම යොත් පට කැඩිණි. ඔහු මඟට පැන්නේය.

වික්ටර්, තෝන්යාට මෙසේ කියනවා ඔහුට ඇසිණි.

"ඒ තමා අමුම අමු මැරවරයා, පාවිකා කොර්චාගින්."

★ ★ ★

දුම්රියපොළේ නොසන්සුන්තාවක් ඇති විය. දුම්රිය කම්කරුවන් වැඩ නැවැත්වීමට සූදානම් වෙතියි යන රාවයක් පැතිර යන්නට විය. අසල නගරයේ විශාල දුම්රියපොළට අයත් ඩිපෝ කම්කරුවෝ අරගලයක් ඇති කළහ. කැරැලි ගැසීමට ආයාචනය කළ දුම්රිය ඇන්ජීමේ කම්කරුවන් දෙදෙනෙකු ජර්මනුන් විසින් සිරභාරයට ගන්නා ලදී. ජර්මනුන්ගේ පැමිණීමත් සමඟ තමන් සතු දේපළ උදුරා ගැනීම හා රදලයන් නැවත ගම්වලට පැමිණීම නිසා ගම් සමඟ සම්බන්ධකම් ඇති කරගත් කම්කරුවෝ දැඩි විරුද්ධත්වයක් ප්‍රකාශ කළහ.

ගම්භාර මුලාදෑනින් ගම්බද ගොවීන්ට කස පහර දෙන්නට වූයෙන්, ඔවුන්ගේ පිටවල්වල ලේ පැල්ලම් මතු විය. ගුබේර්නියා ප්‍රදේශවල පාටිසන් ව්‍යාපාරයක් වර්ධනය විය. බොල්ෂෙවිකයන් විසින් සංවිධානය කරන ලද පාටිසන් භට කණ්ඩායම්වල ගණන දහසක් දක්වා වැඩි විය.

ෂුක්රායි මේ දවස්වල වෙහෙස නොබලා වැඩ කරයි. කුඩා නගරයට පැමිණි දා සිට ඔහු විසින් කරන ලද වැඩවල ප්‍රමාණය ඉමහත් විය. බොහෝ දුම්රිය කම්කරුවන් හඳුනාගත් ඔහු, ඔවුන්ගේ සවස හමුවීම්වලට සහභාගි වූ අතර, එහි දී රැස්වූ තරුණයන් හමු විය. ඩිපෝවේ වැඩ කරන මිකැනික්වරුන් සහ ගස් ඉරන කම්කරුවන්ගේ ශක්තිමත්

කණ්ඩායමක් සෑදීමට ඔහු සමත් විය. බොල්ෂෙවික්වරුන්ගේ වැඩ හා පක්ෂය ගැන වරක් ඔහු අර්ටියොම්ගේ අදහස් දැන ගනු රිසියෙන් ඇසීය. එවිට යෝධමය කම්කරුවා දුන් පිළිතුර මෙසේ විය.

"ප්යෝදර් නුඹ දන්නවද, ඔය පක්ෂ ගැන මගේ දැනීම දුර්වලයි. නමුත්, මගෙන් උදවු ඕන නම් මම ඕනෑම වේලාවක ලෑස්තියි. මා ගැන විශ්වාසය තබන්න නුඹට පුළුවනි."

ප්යෝදර් ෂුක්රායි ඔහුගේ එම විස්තරය නිසා සතුටු විය. අර්ටියොම් කම්කරු පන්තියට අයත් වූවකු බවත්, ඔහු කී ඕනෑම දෙයක් නොපිරිහෙළා ඉටු කරන බවත් හේ දැන සිටියේය. පක්ෂය පිළිබඳ තතු වටහා ගැනීමට තරම් ඔහු මෝරා නැත. "කමක්නැහැ. අද තිබෙන තත්ත්වය අනුව ඉක්මනින්ම දේශපාලන දැනීම ලබා ගනීවි." නාවික භටයා සිතීය.

ප්යෝදර් විදුලිබලස්ථානයේ සිට ඩිපෝවට වැඩට පැමිණියේය. විදුලිබලස්ථානයේ වැඩ කරන විට දුම්රිය පොළින් කොන් වී සිටි ඔහුට දැන් වැඩ කිරීමට ඉතා පහසු විය.

දුම්රිය ගමනාගමනය අති විශාල විය. උක්රයීනයෙන් මංකොල්ල කෑ බාර්ලි, තිරිඟු, ගව මහීසාදීන් පැටවූ දුම්රිය මැදිරි දහස් ගණනක් ජර්මානුන් විසින් සිය රටට ගෙන යන ලදී...

නගර පාලකයාගේ හමුදාවේ භටයෝ බලාපොරොත්තු රහිතව විදුලි පණිවුඩකරුවකු වන පනමරේන්කෝව සිරභාරයට ගත්හ. අණ දෙන නිලධාරියාගේ කාමරයේ දී ඔහුට දුෂ්ට ලෙස පහර දුන්නේය. අර්ටියොම්ගේ සගයෙකු වන ඩිපෝවේ වැඩ කරන රොමාන් සිදරෙන්කෝ ගෙන ගිය උද්ඝෝෂණය පිළිබඳ තොරතුරු ඔහු හෙළි කළ බව පෙනෙන්නට තිබිණි.

රොමාන් සිරභාරයට ගැනීමට ඔහු වැඩ කරන වේලාවේ දී ජර්මන් සෙබළු දෙදෙනෙක් සහ දුම්රියපොළේ යුද්ධ අධිපතියාගේ සහකාරයෙක්ද පැමිණියහ. රොමාන් වැඩ කළ වඩුබංකුව දෙසට ගිය සහකාරයා, වචනයකුදු කථා නොකොට, කසයෙන් රොමාන්ගේ මුහුණට ගැසීය.

"නීචයා වර අප සමඟ! ගිහිල්ලා කථා කරමු." හේ බැණ වැදුණේය. වඳුරකු සේ දත් විරිත්තා රොමාන්ගේ අතින් ඇද්දේ ය. "තෝ අපේ ළඟ නම් උද්ඝෝෂණය කරාවි!"

අසල දඬුඅඬුවේ පීරි ගාමින් සිටි අර්ටියොම්, පීර වීසි

කොට, සිය දැවැන්තමය සිරුරින් නගර පාලක සහකරුගේ ඇඟට කඩා පැන්නේය. නැඟ ආ කෝපය මැඩ ගත් ඔහු ගොරවන්නට විය.

"නීචයා තෝ ගරු සරු නැතිව ගහනවද?"

නගර පාලකයාගේ සහකරු පස්සෙන් පස්සට යමින්, කොපුවෙන් පිස්තෝලය ඇද ගැනීමට යුහුසුලු විය. අඟුටුමිටි ජර්මන් සෙබළා කරේ තිබුණු බරැති රයිෆල් තුවක්කුව (එයට පළල් බයිනෙත්තුවක් සවි කර තිබිණි) ගෙන කොකා අමුණා ජර්මන් බසින් කෑ ගැසීය.

"හෝල්ට්!" සෙලවුණු විගස ඔහු වෙඩි තැබීමට සූදානම් විය.

උසැති කම්කරුවා අධම සෙබළා ඉදිරිපිට, කිසිවක් කිරීමෙහි අසමත්ව සිටියේය.

දෙදෙනාවම සිරභාරයට ගත්තේය. පැයකින් අර්ටියොම්ව නිදහස් කළ අතර, රොමාන්ව බිම් ගෙයක් වැනි ගබඩා කාමරයෙහි සිර කොට තැබූහ.

විනාඩි දහයක් ගත වෙත්ම ඩිපෝවේ හැම දෙනාම වැඩ නැවැත්වූහ. ඩිපෝ කම්කරුවෝ දුම්රියපොළේ වත්තට පැමිණියෝය. දුම්රිය මාර්ගයෙහි වෙනත් අංශවල වැඩ කරන කම්කරුවෝ සහ ගබඩා අංශයේ කම්කරුවෝ ද වැඩ නැවැත්වූවනට එක් වූහ. කැලඹීම උපරිමය අංශය දක්වා වැඩී තිබිණි. රොමාන් සහ පනමරේන්කෝව වහාම නිදහස් කළ යුතුය කියන ඉල්ලීමක් කෙනෙකු විසින් ලියන ලදි. නගර පාලක සහකරු හට පිරිසක් සමඟ විත් පිස්තෝල වනමින් කෑ ගසන්නට වූ විට, කම්කරුවන්ගේ කෝපය තවත් වැඩි විය.

"නුඹලා වහාම යන්නේ නැති නම් නුඹලාව හිරභාරයට ගන්නවා. කීප දෙනෙකුව බිත්තියට හේත්තු කරලා වෙඩි තියනවා." නගර පාලකයාගේ සහකරු තර්ජනය කළේය.

කම්කරුවන්ගේ කෝපාන්විත කෑ ගැසීම් නිසා භටයන්ට දුම්රියපොළ දක්වා පසුබැසීමට සිදු විය. දුම්රියපොළේ අණ දෙන නිලධාරී තැන විසින් කැඳවන ලද ජර්මන් භටයන් රැගත් ලොරි කිහිපයක් නගරයේ සිට වේගයෙන් එන්නට විය.

කම්කරුවෝ ගෙවල් බලා විසිර ගියහ. දුම්රියපොළේ සේවය භාර අය පවා පිටව ගියහ. ෂුක්රායිගේ වැඩවල ප්‍රතිඵල පෙනිණි. දුම්රියපොළේ පළමුවැනි බහුජන ක්‍රියාකාරිත්වය එය විය.

ජර්මන්නු දුම්රිය වේදිකාවේ බරැති මැෂින් තුවක්කුවක්

සවි කළහ. එය පනින්නට සූදානම් වූ දඩයම් බල්ලෙකුට සමාන විය. මැෂින් තුවක්කුව ළඟ උක්කුටියෙන් වාඩි වී සිටි ජර්මන් කෝප්රල් තැන එහි මිටට අත තබා ගෙන සිටියේය.

දුම්රියපොළ ජනයාගෙන් හිස් විය.

රෑ වූ විට සිරභාරයට ගැනීම පටන් ගැනිණි. අර්ටියොම් ද සිරභාරයට පත් විය. ෂුක්රායි එදින රෑයෙහි තම ගෙදර නොසිටි නිසා ඔහු අසු නොවීය.

අල්ලාගත් කම්කරුවන් සියලු දෙනාම ගබඩා කාමරයකට ගෙන ගොස් ඔවුනට අවසාන නිවේදනයක් නිකුත් කළේය. එක්කෝ වැඩට යනු, නැත්නම් යුද්ධාධිකරණයට මූණ පානු.

එහෙත්, දුම්රිය මාර්ගයේ වැඩ කළ කම්කරුවෝ වැඩ නවත්වා සිටියහ. පැය විසිහතරක් තිස්සේ එකද දුම්රියක්වත් ගියේ නැත. කිලෝමීටර් එකසිය විස්සක් දුරින් දුම්රිය මාර්ගය කඩා දමා, පාලම් පුපුරුවා දැමූ විශාල පාටිසන් භට සේනාවක් සටන් වැද සිටියෝය.

රාත්රියේ දී ජර්මන් භටයන් රැගත් දුම්රියක් එම දුම්රිය ස්ථානයට ආ නමුදු, යන්ත්රය පදවන්නාද, ඔහුගේ සහායකරු සහ අඟුරු දමන්නාද දුම්රිය අතහැර පැන ගියහ. යුද භටයන් රැගත් දුම්රිය හැරුණු විට, තවත් දුම්රිය දෙකක් පිටත් වීමට සූදානම් කොට තිබිණි.

ගබඩා කාමරයේ මහ දොරවල් ඇරගෙන දුම්රිය ස්ථානයේ ප්රධාන නිලධාරියා වන ජර්මන් ලයිතන් තැන සහ ඔහුගේ සහායකරු ද තවත් ජර්මන් භටයෝ ද ඇතුළු වූහ.

ප්රධානියාගේ සහායකයා හඬ නඟා නම් අඬ ගැසීය.

"කොර්චාගින්, පොලින්තොව්ස්කි, බ්රුෂ්ෂාක්. දැන් නුඹලා දුම්රිය නඩය හැටියට යන්ට ඕන. ප්රතික්ෂේප කළොත් එතැනම නුඹලාට වෙඩි තබා මරා දමනවා. යනවාද නැත්ද?"

කම්කරුවෝ තිදෙනා දුක්මුසුව හිස වැනූහ. අවිගත් භටයන්ගේ මුරකාවල් සහිතව ඔවුන් දුම්රිය යන්ත්රය වෙත ගෙන ගියහ. ප්රධානියාගේ සහායකයා වෙනත් දුම්රියක් සඳහා දුම්රිය පදවන්නකුගේ ද, සහකරුවකුගේ ද අඟුරු දමන්නකුගේ ද නම් අඬ ගසනු ඇසිණි.

දුම්රිය කේන්තියෙන් මෙන් හූ හඬ පිට කරමින්, කුඩා ගිනි කැට වීසි කරමින් හා ගැඹුරු ලෙස හුස්ම ගනිමින් අඳුරු රෑයෙහි දුවන්නට විය. අර්ටියොම් අඟුරු උදැල්ලක් ලිපට දමා, එහි යකඩ දොර කකුලකින් වැසුවේය. අසල පෙට්ටියක තිබූ කෙටි හොටක් සහිත කේතලයකින් වතුර

උගුරක් බීවේය. ඉනික්බිති හෙතෙම දුම්රිය යන්ත්‍රය පදවන මහලු පොලින්තොව්ස්කි ඇමතීය.

"තාත්තේ අපි උන්ව ගෙනියනවා නේද?"

මහල්ලා ඇස් බැමිවලට යටින් කෝපාන්විත බැල්මක් හෙළීය.

"ඔව්. පිටට බයිනේත්තුවක් එල්ල කරලා තියෙන නිසා ගෙනියනවා."

"ඔක්කෝම වීසි කර දාලා දුම්රියෙන් පැනලා යමු."

අඟුරු බක්කිය උඩ වාඩි වී සිටි ජර්මන් සෙබළා දෙස හොරැහින් බැලූ බ්‍රුෂ්ෂාක් යෝජනා කළේ ය.

"මාත් එහෙම හිතනවා."අර්ටියොම් පැවසීය. "ඒ වුණාට මේ කාලකණ්ණියා පිටිපස්සේ ඉන්නවා."

"ඔව්...." අරමුණු රහිතව කියා බ්‍රුෂ්ෂාක් කවුළුවෙන් එපිට බැලීය.

අර්ටියොම් ළඟට ආ මහලු පොලින්තොව්ස්කි පහත් හඬින් මිමිනුවේය.

"අපි ඔවුන්ව ගෙන යාම හරි නැහැ. තේරුණාද? එහෙ යුද්ධ කරනවා. පාටිසන් භටයෝ රේල් පාර පුපුරුවා දමලා. අපි මේ බල්ලන්ව එහාට ගෙනියනවා. මුන් අපේ එවුන්ව අඩියට දෙකට ඉවර කරලා දාවි. නුඹ දන්නවද පුතේ මම සාර් රජුගේ කාලෙදිත් වැඩ නවත්වපු අවස්ථාවලදි දුම්රිය එළෙව්වේ නැහැ. දැනුත් ගෙනියන්නෙ නැහැ. මම අපේ අය මරවන්ට මිනීමරුවන් ගෙනිච්චොත් මගේ වළටත් හෙණ ගහවි. දුම්රිය පදවන කණ්ඩායම පැනලා ගිහිල්ලා නෙව. පණත් එපයි කියලා ඔවුන් ඔක්කොම පැනලා ගිහින්. මේ දුම්රිය කොහොමටවත් උන්ට ඕන තැනට ගෙනියන්ට නරකයි. නුඹ හිතන්නෙ කොහොමද?"

"තාත්තේ මම එකඟයි. මේ කාලකණ්ණියා එක්ක මොනවද කරන්නෙ?" ඔහු ඉඟියෙන් ජර්මන් සෙබළා පෙන්වීය.

යන්ත්‍රය පදවන්නා මුහුණ රැලි ගසා, අතැති රෙදිකඩින් දහඩියෙන් පිරි නළල පිස දමා ගෙන මනෝමීටරය[1] දෙස බලන්නට වූයේ, තමාට වධ දෙන පැනයට පිළිතුරක් ඉන් ලබාගන්නට මෙනි. අනතුරුව උතුරා යන කෝපය පිට කිරීමට මෙන් ඔහු නොසරුප් බසින් බැණ වදින්නට විය.

අර්ටියොම් කේතලයෙන් වතුර උගුරක් බීවේය. දෙදෙනාම

1 පීඩමානය

එකක් ගැන කල්පනා කළහ. එහෙත්, එකෙක්වත් පළමුවෙන් සිය අදහස් කියා පෑමට ඉදිරිපත් නොවූහ. අර්ටියොම්ට ෂුක්රායිගේ වචන මතක් විය.

"සහෝදරයා, බොල්ෂෙවික් පක්ෂය ගැනයි, කොමියුනිස්ට්වාදී අදහස් ගැනයි නුඹේ මතය කොහොමද?" තමා පිළිතුරු දුන් හැටිද අර්ටියොම්ට මතක් විය.

"උදවු කරන්ට හැමදාම ලෑස්තියි. මා කෙරෙහි විශ්වාසය තබාපන්..."

"හරිම යස උදව්ව. මිනීමරුවන්ව ගෙනි යනවා..." ඔහු තමාටම කියා ගත්තේය.

උපකරණ පෙට්ටියට උඩින් නැමී සිටගත් මහලු පොලින්තොව්ස්කි, අර්ටියොම් සමඟ උරෙනු'ර ගැටී සිට ගනිමින් අසීරුවෙන් කථා කළේය.

"මේකාව ඉවර කරන්ට ඕන. තේරුණාද?"

අර්ටියොම් තිගැස්සිණි. පොලින්තොව්ස්කි දත්මිටි කමින් මෙසේ පැවසීය.

"වෙනත් විදිහක් නැහැ. මූව ඉවර කරමු. රෙගියුලේටරය[1] යි, ලීවර දෙකයි ලිපට දානවා. වේගය අඩු කරනවා. දුම්රියෙන් එළියට පනිනවා."

කරින් ගෙන ගිය බරැති මිටියක් වීසි කොට නිදහස් වන්නාක් මෙන් අර්ටියොම් "මම ලෑස්තියි" පැවසීය. ගත් තීරණය ගැන ඔහුට දැන්වීය.

දුම්රිය පදවන්නාගේ සහායකයා වන බ්රුෂ්ෂාක් වෙත ළංවූ අර්ටියොම් ගත් තීරණය ගැන ඔහුට දැන්වීය.

එකවර පිළිතුරු දුන්නේ බ්රුෂ්ෂාක් නොවේ. මේ හැම එකෙක්ම විශාල අනතුරකට මූණ පෑහ. හැම කෙනෙකුගේම දෙමාපියවරු හෝ අඹු දරුවෝ හෝ ගෙදර සිටිති. පොලින්තොව්ස්කිගේ පවුල ඉතා විශාලය. ඔහුගේ පවුලේ සාමාජිකයන්ගේ ගණන නව දෙනෙකි. එහෙත්, දුම්රිය ජර්මනුන්ට වුවමනා ස්ථානයට ගෙන යාම නොකළ යුතු දෙයකියි ඔවුහු පිළිගත්හ.

"මම එකඟයි..." බ්රුෂ්ෂක් පැවසීය. "ඒ වුණාට කවුද මේකාව..." අර්ටියොම්ට වැටහෙන වැකිය ඔහු අවසන් නොකළේය.

රෙගියුලේටරය අසල යමක් කරමින් සිටි මහලු පොලින්තොව්ස්කි දෙස බලා අර්ටියොම් හිස වැනුවේ

1 යාමකය

බ්‍රුෂ්ෂාක්ගේ එකඟත්වය ඔහුට දැන්වීමටය. මෙතෙක් නොවිසඳූ, සිතට වධ දෙන පැනය ගැන සිතමින් ඔහු පොලිතොව්ස්කි වෙත ළං විය.

"අපි එය කරන්නෙ කොහොමද?"

හේ අර්ටියොම් දෙස බැලීය.

"නුඹ පටන් ගනින්, නුඹ තමා මෙතන ඉන්න ශක්තිමත් පුරුෂයා. අලවංගුවෙන් උෆට එක පාරක් ගහපන්. වැඩේ ඉවරයි." මහල්ලා බොහෝ සේ කැලඹුණේය.

අර්ටියොම් බුම්මා ගත්තේය.

"මට ඒ වැඩේ කරන්ට බැහැ. මගේ අත ඔසවන්ට හිත ඉඩ දෙන්නෙ නැහැ. හැබෑටම හොයා බලනවා නම් සෙබළා වරදකරුවෙක් නොවෙයි නොවැ, ඔහුවත් මෙහාට ගෙනාවෙ බයිනෙත්තුවේ බලයෙන්."

පොලින්තොව්ස්කිගේ ඇස් දිලිසෙන්නට විය.

"වරදකරුවෙක් නොවෙයි කියනවද? ඒ වගේම අපිත් වරදකරුවො නොවෙයි. අපවත් මෙතැනට බලෙන් ගෙනාවා. අපි මීනිමරුවන්ව ගෙනයනවා. ඉතින් මේ නිවැරැදිකරුවෝ අපේ පාටිසන් හටයන්ට වෙඩි තබාවි. ඒ ගොල්ලොද වරදකරුවෝ? අනේ බං නුඹ හරි සමයමක්!... වලසෙක් වගේ විශාලයි. ඒ වූණාට ප්‍රයෝජනයක් නැහැ...."

"හොඳයි" කියමින් අර්ටියොම් අලවංගුව අතට ගත්තේය.

එවිට වාගේ පොලින්තොව්ස්කි මිමිනුවේය.

"මම ගන්නම්. මගේ පහර වඩාත් විශ්වාසයි. නුඹ උදැල්ලත් අරගෙන අඟුරු බක්කියට නැඟලා අඟුරු පටවාපන්. වුවමනා වුණොත් ජර්මන්කාරයාට උදැල්ලෙන් ගහපන්. මම අලවංගුවත් අරන් අඟුරු කඩන්නට වගේ යන්නම්."

බ්‍රුෂ්ෂාක් හිස වැනීය.

"ලොකු උන්නැහේ හරියට හරි." ඔහු රෙගියුලේටරය ළඟ සිටගත්තේය.

වටකුරු හිස්වැස්මක් ලාගෙන සිටි ජර්මන් සෙබළා අඟුරු බක්කිය මත වාඩි වී දෙකකුල් මත තුවක්කුව තබා ගෙන සුරුට්ටුවක් උරයි. ඔහුගේ හිස්වැස්ම වටා රතු පටියකි. ඔහු ඉඳහිට කම්කරුවන් තිදෙනා දෙස බැල්මක් හෙළයි.

අර්ටියොම් අඟුරු දැමීමට, අඟුරු ගොඩ උඩට නැංග විට, ජර්මන් සෙබළා ඒ ගැන අවධානය යොමු නොකළේ ය. අඟුරු බක්කිය අයිනේ ඇති අඟුරු කැට කැඩීමට තමාට වුවමනා බව අඟවමින් ජර්මානුවාට අයින් වෙන ලෙස

පොලින්තොව්ස්කි දැන්වූ විට, ඔහු කීකරුව දුම්රිය යන්ත්‍රය අසල වූ කුඩුවට ගියේය.

කල් යල් බලා පොලින්තොව්ස්කි අලවංගුවෙන් ජර්මානුවාගේ හිස් කබලට පහරක් ගැසීය. ඉන් හඬ පිට නොවීය. අර්ටියොම් හා බ්‍රුෂ්ෂාක් ගින්නට හසු වූ කලෙක මෙන් තිගැස්සුණහ. දුම්රිය ඉදිරිපිට පටු කොරිඩෝරයෙහි මිය ගිය ජර්මානුවාගේ සිරුර වැටිණි.

ඔහුගේ අළු පැහැති තොප්පිය සැණෙකින් රතු පැහැ ගත්තේය. දුම්රිය යන්ත්‍ර මැදිරියට හේත්තු වී ඇති තුවක්කුව සෙලවෙමින් හඬක් නැඟීය.

"ඉවරයි." පොලින්තොව්ස්කි මිමිනුවේය. අලවංගුව පසෙකට විසි කළ ඔහු ගැස්සෙන්නට විය. "දැන් ඉතින් අපට ආපසු යාමක් නැහැ." ඔහුගේ මුහුණේ මස් නැටුණි.

පොලින්තෙව්ස්කිගේ බිඳුණු කටහඬ සැණෙකින්, හැම කෙනෙකුම පාගමින් සිටි නිහඬතාව මැඩ බෙරිහන් දීමකට පරිවර්තනය විය.

"රෙගියුලේටරය ගලවපන්, ඉක්මනින්!" හේ කෑ ගැසීය.

විනාඩි දහයකින් සියල්ල අවසන් විය. මෙහෙය වීම රහිත වූ දුම්රියෙහි වේගය කෙමෙන් අඩු විය.

දුම්රිය යන්ත්‍රයේ ගිනි කටින් පිට වන ගිනි එළිය නිසා වරෙක මඟ දෙපස ඇති ගස් අඳුරු සෙවණැලි මෙන් පෙනෙයි. නැවත ඉමක් නැති දැඩි අඳුරකි. දුම්රිය යන්ත්‍රයේ පහන් යුගල, දැඩි අඳුර බිඳ දැමීමට වෙර දරයි. රාත්‍රී අන්ධකාරය බිඳ දමමින් මීටර දහයක් පමණ දුරකි, පහන් ආලෝකයට එළිය කළ හැකි වූයේ, දුම්රිය තම අවසාන ශක්තිය වැය කරන්නාක් මෙන් වඩාත් දුබලව හඬ නඟන්නට විය.

"පුතේ, පැනපන්!" පොලින්තොව්ස්කිගේ කට හඬ අර්ටියොම්ට ඇසිණි. ඔහු මිටින් ගෙන සිටි හරස් පොල්ල මුදා හැරියේය. අර්ටියොම්ගේ යෝධමය සිරුර අවස්ථිතිය අනුව පෙරට වීසි විය. ඔහුගේ දෙපා මහ පොළොවට හැප්පී වරක් විසි විය. දෙපියවරක් ඉදිරියට දිව ගිය අර්ටියොම් හිස උඩු යටිකුරු කොට පෙරළෙමින් බිම පතිත විය.

දුම්රිය යන්ත්‍ර මැදිරියේ පාපුවරුවලින් තවත් දෙදෙනෙක් ඉවත පැන්නාහ.

★ ★ ★

බ්‍රුෂ්ෂාක්ලාගේ ගෙදර දොම්නසකි. පසුගිය දවස් හතර තිස්සේම සිරියෝෂා බ්‍රුෂ්ෂාක්ගේ මවු අන්තොනීනා වසීල්යෙව්නා බොහෝ සේ කැලඹීමෙන් විඩාපත් වූවාය. සැමියාගෙන් කිසිදු පුවතක් නොලැබිණි. අර්ටියෝම් කෝර්චාගින් සහ පොලින්තොව්ස්කි සමඟ දුම්රිය යන්ත්‍රය පැදවීම පිණිස තම සැමියාවද ජර්මනුන් බලෙන් ගෙන ගිය බව ඕ දත්තාය. නගර පාලකයාගේ භට හමුදාවට අයත් තිදෙනෙක් ඊයේ ඇය හමුවීමට විත්, ඇයට පරුෂ ලෙස බැණ වැදී ඇගෙන් ප්‍රශ්න කළහ.

ඔවුන්ගේ ප්‍රශ්න අනුව කිසියම් අයහපතක් සිදුවී තිබෙන බව යන්තමින් ඕ දැනගත්තාය. සැමියා ගැන කිසිදු ආරංචියක් නැති නිසා සොවින් බරව තැවෙමින් සිටි කාන්තාව භටයන් ගිය පසු, ඔහු ගැන යම් කිසි තොරතුරක් දැන ගැනීමේ අටියෙන් ලේන්සුවක් හිස බැඳගෙන මාරියා යාකොව්ලෙව්නා හමුවීමට යාම පිණිස සැරසුණාය.

මුළුතැන්ගෙයි වැඩ කරමින් සිටි ඇගේ වැඩිමහලු දුව වාල්යා, අම්මා ගමනක් යාමට සැරසෙන සැටි දකින්නී, ඇය විචාළා ය.

"අම්මේ බැහැරක් යනවද?

කෝර්චාගින්ලාගේ ගෙදර යනවා. සමහර විට ඔවුන්ගෙන් තාත්තා ගැන ආරංචියක් ලබා ගන්නට හැකි වේවි. සිරියෝෂා ආවොත් එයාට කියාපන් පොලින්තොව්ස්කිලාගේ ගෙදරට යන්ටයි කියලා" කඳුළු පිරි දෙනෙතින් තම දුව දෙස බැලූ අන්තොනීනා වසීල්යෙව්නා කීවාය.

වාල්යා, අම්මාගේ උරහිසක් උණුසුම් ලෙස වැලඳගෙන ඇය සන්සුන් කරවමින්, ඇය සමඟ දොර දක්වා ගියාය.

"අම්මේ, අම්මා කලබල වෙන්ට එපා"

මාරියා යාකව්ලෙව්නා හැමදා මෙන්ම ඉමහත් සතුටකින් අන්තොනීනා වසීල්යෙව්නා බ්‍රුෂ්ෂාක් පිළිගත්තාය. දෙදෙනාම එක් එක්කෙනාගෙන් යම් කිසි අලුත් ආරංචියක් දැන ගැනීමට බලාපොරොත්තු වුණද, මුල් වචන කීපය හුවමාරු කරගත් විගසම ඒ බලාපොරොත්තුව අතුරුදහන් විය.

කෝර්චාගින්ලාගේ ගෙදර ද හෝදිසි කෙරිණි. අර්ටයෝම්ව සෙව්වේය. පුතා ගෙදර පැමිණි විගස යුද්ධ කාර්යාලයට දැනුම් දෙන ලෙස ගෙය පිරික්සා බැලූ භටයෝ පිට වී යද්දී මාරියා

යාකව්ලෙව්නාට අණ කළාය.

මහ රෑ ගෙට කඩා වැදුණු මුර භටයන් නිසා කොර්චාගින් මාතාව බොහෝ සේ බිය වූවාය. එවේලාවේ ගෙදර සිටියේ ඇය පමණකි. පාවෙල් හැමදා මෙන්ම එදත් විදුලි බලස්ථානයේ රෑ සේවයෙහි යෙදී සිටියේය.

පාවෙල් පසු දින උදෑසන ගෙදර ආවේය. භටයන් ගෙට කඩා පැන පිරික්සා බැලූ සැටි විස්තර කළ අම්මාගේ කතාව ඇසූ පාවෙල් සිය වැඩිමහලු සොහොයුරා නිසා බොහෝ සේ බිය වුණේය. සොහොයුරන් දෙදෙනාගේ චරිත එකිනෙකට වෙනස් වූව ද අර්ටියොම් කෙරෙහි දැඩි ගතියක් වැනි යමක් පෙනෙන්නට තිබුණ ද, ඔවුන් දෙදෙනා එකිනෙකාට තදින් ඇලුම් කළහ. එය දැඩි සහෝදර ප්‍රේමයක් විය. සිය වැඩිමහලු සොයුරාගේ අවශ්‍යතාව සඳහා කිසිදු චකිතයකින් තොරව ඕනෑම පරිත්‍යාගයක් කිරීමට තමා සූදානම් බව පාවෙල් පැහැදිලිව පිළිගත්තේය.

රෑ වැඩ හමාර කොට ගෙදර ආ පාවෙල් විවේකයක් පවා නොගෙන ඩිපෝවට දුව ගියේ ෂුක්‍රායි සෙවීමටය. ඔහු නොසිටියේය. ගෙන ගිය කම්කරුවන් ගැන කිසිවක් කීමට පාවෙල් හඳුනන කම්කරුවෝ අපොහොසත් වූහ. පොලින්තොව්ස්කිගේ පවුලත් කිසිවක් නොදන සිටියේය. පොලින්තොව්ස්කිලාගේ බාල පුත් බොරීස්, මිදුලේදී පාවෙල්ට හමු විය. පසුගිය රෑයෙහි ඔවුන්ගේ ගෙදර ද පරීක්ෂා කළ බව ඔහුට බොරීස්ගෙන් දැන ගන්නට ලැබිණි. ඔහුගේ පියා සොයමින් භටයෝ ආහ.

පාවෙල්, අයියා ගැන කිසිදු තොරතුරක් සොයා ගත නොහැකිව අම්මා වෙත විත්, උසුලාගත නොහැකි විඩාව නිසා ඇඳ මත වැතිර නිදා ගත්තේය. ඔහුට එකවර නින්ද ගිය ද, එහි නොසන්සුන්තාවක් තිබිණි.

★ ★ ★

දොරට තට්ටු කරන හඬ ඇසී වාල්යා හැරී බැලුවාය.

"ඔතන කවුද? මෙසේ ඇසූ ඈ දොර අගුළු හැරියාය.

විවෘත වුණු දොරින් ක්ලීම්කා මාර්චෙන්කෝගේ අවුල් වූ හිස පෙනිණි. ඔහුගේ හිසකේ රන් පැහැතිය. ක්ලීම්කා ඉක්මනින් දුවගෙන ආ සැටියකි. ඔහු හති දැමූ අතර, දිවීම නිසා ඔහුගේ මුහුණ රත් පැහැ ගෙන තිබිණි.

"අම්මා ගෙදරද?" ඔහු වාල්යාගෙන් ඇසීය.

"නැහැ. ගිහිල්ලා."

"ගියේ කොහෙද?"

"කොර්චාගින්ලාගේ දිහාවට යන්ට ඇති." ක්ලීම්කා ආපසු දුවන්නට සූදානම් වෙත්ම වාල්යා, ඔහුගේ කමීස අතින් අල්ලා ගත්තා ය.

ඔහු තීරණාත්මක බවකින් තොරව තරුණිය දෙස බැලීය.

"නැහැ නිකම්. නුඹලාගේ අම්මා මට හමුවන්ට ඕන. උවමනාවකට."

"මොකක්ද වුවමනාව?" ඈ ඔහු නැවැත්වූවාය. "ඉතින් කියපන් විගහට මොකක්ද වුවමනාව කියල. නුඹ හැබෑ රතු වලසෙක්. නුඹ මගේ හිතට වධ දෙනවා." තරුණිය බල කරන ස්වරයකින් අණ කළාය.

සුපරීක්ෂාකාරී විය යුතු බවට ෂුක්රායි විසින් කරන ලද නියමය ක්ලීම්කාට සම්පූර්ණයෙන්ම අමතක විය. ලිපිය අන්තොනීනා වසීල්යෙව්නාට පෞද්ගලිකව භාර දිය යුතු බව ෂුක්රායි විසින් ඔහුට දන්වන ලදී, ක්ලීම්කා තැළී පොඩි වුණු කඩදාසි කැබැල්ල තරුණිය අත තැබීය. සිරියෝෂාගේ සොහොයුරිය වන රන් පැහැති හිසකේ සහිත මේ තරුණියට ප්‍රතික්ෂේප කිරීමට රතු පැහැති හිසකේ සහිත ක්ලීම්කාට නොහැකිය. මේ යහපත් තරුණිය සමඟ තමාගේ ඇති සම්බන්ධකම් එකලසක් කර ගැනීමට ක්ලීම්කාට නොහැකි විය. කෝකියෙකුගේ අත් උදවුකරුවකු වන මේ චාම් ගැටවරයා, තමා සිරියෝෂාගේ සොහොයුරියට කැමැති බව කිසි විටෙක නොපිළිගනු ඇතැයි යන්න සත්‍යයකි. ඔහු විසින් දෙන ලද කඩදාසි කැබැල්ල ඈ හණිකට කියැවූවා ය.

"ආදරණීය තෝන්යා! කලබල වෙන්න එපා. හැම දෙයක්ම හොඳයි. අනතුරු රහිතව අපි ජීවත් වෙමු. ඉක්මනින්ම වැඩි දුරටත් දැනගන්නට ලැබේවි. හැම දෙයක්ම හොඳින් සිදු වී ඇති බවත්, කලබල වෙන්ට කරුණු නැති බවත් අනික් අයට දන්වන්න. ලියුම කියවා විනාශ කරන්න. මීට සහාර්."

ලියුම කියවූ වාල්යා, ක්ලීම්කාව බදා ගත්තාය.

"මගේ ආදරණීය රතුපාට වලස්පැටියෝ. නුඹ මේක කොහෙන්ද ගෙනාවේ? බකල වලස්පැටියෝ, නුඹ මේක ගෙනාවේ කොහෙන්ද? කියපන්." ඈ මුළු වෙර යොදා අන්දමන්ද වී සිටින ක්ලීම්කාව සොලවන්නට විය. ඔහු දෙවැනි වැරැද්ද කළේ කෙසේදැයි ඔහුටම අමතක විය.

"දුම්රියපොළේදී ඔය ලියුම් කෑල්ල දුන්නේ ෂුක්රායි." එසේ

නොකිව යුතු බව ඔහුට මතක් වූයෙන්, ඔහු යළි මෙසේද කීය. "එයා කීවා වෙන කාටවත් කියන්ට එපා කියලා."

"ආ හොඳයි, හොඳයි!" වාල්යා සිනාසුණාය. "මම කාටවත් කියන්නෙ නැහැ. ඉතින් පාවිකාලාගේ ගෙදරට දුවපන් රතු පැටියා. අපේ අම්මා එහෙදී හමු වේවි."

ඈ යන්තමින් ඔහු තල්ලු කළාය. තත්පරයක් ගත වෙත්ම ක්ලීම්කා වැටෙන් එපිට දුවන සැටි පෙනිණි.

තුන්දෙනාගෙන් එකකුවත් ගෙදර ආවේ නැත. හවස කොර්චාගින්ලාගේ ගෙදරට ආ ෂුක්රායි, මාරියා යාකව්ලෙව්නාට දුම්රිය පිළිබඳ සිද්ධිය විස්තර කළේය. බිය වී සිටි ස්ත්‍රිය හැකි තරම් සැනසුවේය. තිදෙනා ඈත හද්ද පිටිසර එක ගමක, බ්රුෂ්ෂාක්ලාගේ මාමා කෙනෙකුගේ ගෙදර නවාතැන් ගෙන සිටින බව දැන්වීය. ඔවුන් අන්තරායෙන් තොරව නිරුපද්‍රිතව සිටින බවත්, මෙහි පැමිණීම නුවණට හුරු නොවන බවත්, දැන් ජර්මනුන්ගේ තත්ත්වය නරක අතට හැරී තිබෙන බවත්, නුදුරු අනාගතයේ දී වෙනස්වීම් ඇති විය හැකි බවත් කීවේය.

දුම්රිය සිද්ධියෙන් පසු ඒ පවුල් තුන වඩාත් කිට්ටුවෙන් මිතුරු වූහ. ඉඳහිට ලැබෙන ලියුම් මහත් වූ සතුටකින් කියවූ අතර, එම නිවෙස්වල හිස් බවක් හා නිහඬ බවක් ද දැනෙන්නට විය.

දවසක් දා අහම්බෙන් මෙන් පොලින්තොව්ස්කිගේ බිරිඳ බැලීමට පැමිණි ෂුක්රායි ඇයට මුදල් දුන්නේය.

"මෙන්න අම්මේ, ස්වාමිපුරුෂයා එවා තිබුණා. මතක තියාගන්න. මේ ගැන කිසි කෙනෙකුට කියන්න එපා."

මහලු කාන්තාව කෘතඥතාවයෙන් යුතුව ඔහුගේ අත මිරිකුවාය.

"බොහෝම ස්තුතියි. නැතිනම් මහ අමාරුවකට මූණ පෑමටයි සිදුවන්නේ. කොල්ලන්ගේ බඩගිනි නිවන්නටවත් බැරුවයි හිටියේ."

නගරය අතහැර ගිය රතු සේනාංකයේ ප්‍රධානියා වන බුල්ගාකොව් තබා ගිය මුදල්වලින් කොටසකි ඒ.

"හොඳයි, හොඳයි. බලමු මින් පස්සේ මොනවද වෙන්නේ කියලා. වැඩ නැවැත්වීම හරි නොගියත්, වෙඩි තබා මරා දමන යුද්ධ නීතියට බයේ කම්කරුවන් වැඩ කළත්, ගිනි ඇවිළී තියෙනවා. දැන් ඉතින් ඒක නිවන්නට ඉඩක් ලැබෙන්නෙ නැහැ. අර තුන්දෙනා හැබෑ හපන්නු. නිර්ධන පන්තිකයෝ."

පොලින්තොව්ස්කිලාගේ ගෙදර සිට ඩිපෝවට යමින් සිටි නාවික භටයා එලෙස කල්පනා කළේය.

★ ★ ★

වරබියෝවා බාල්කා නමැති ගමට එහා පැරණි යකඩ කම්මලකි. දුමින් දූර්වර්ණ වූ බිත්ති මහමඟට මූණ ලා සිටී. කම්මලේ ගිනි උදුනේ පැහැදිලි ගිනි දැලු නිසා දෙනෙත් හකුළුවා ගත් පොලින්තොව්ස්කි, රත් වූ යකඩයක් දිගැති අඬුවකින් හරවයි.

අර්ටියෝම් හමින් කළ මයිනහමේ කොක්ක අදිමින් සිටියේය.

දුම්රිය පදවන්නා යටි රැවුළ අත ගාමින් මෙත් සිතින් මඳ සිනා පෑවේය.

"ගමේ කම්මල හන්දා අපට පාඩු වෙන්නේ නැහැ. කරන්ට බැරි තරම් වැඩ ලැබේවි. සුමානයක් දෙකක් වැඩ කරල සත්ව තෙල් මේදස් ටිකකුයි, තිරිඟු පිටි ටිකකුයි ගෙදර යවන්ට පුළුවන් වේවි. පුතේ, ගැමියන් අතුරෙන් යකඩ වැඩකාරයාට හැමදාම තැනක් තියෙනවා. ධනපති රදල වලව්කාරයන්ට වගේ සෑහෙන්ට කෑම ලැබේවි. සහාර් එයා විශේෂ මිනිහෙක්. එයා වැඩියෙන් ගොවිතැනට තමා කැමති. එයා මාමණ්ඩි එක්ක එකතු වෙලා බිම් කොටනවා. ඒක තේරුම් ගන්ට පුළුවනි. අර්ටියෝම්, නුඹටයි, මටයි ගෙවල්, වතුපිටි නැහැ. දැතේ හයිය විතරයි. ශත වරුස ගණනක් තිස්සේ නිර්ධන පන්තිකයෝ. හා, හා, සහාර් දෙකට බෙදිලා. එක කකුලක් දුම්රියේ ඇති, අනික් කකුල ගමේ." ගිනි ගෙන දැවෙන රත් පැහැති යකඩය දිගැති අඬුවලින් පිරික්සා බලා පොලින්තොව්ස්කි බැරෑරුම් හා කල්පනාකාරී ලෙස මෙසේ පැවසීය. "අපේ තත්ත්වය බොහොම නරකයි. පුතේ, ඉක්මනින්ම ජර්මානුන්ට පහර දුන්නේ නැති නම් අපට එක්කැතෙරිනස්ලාව් හරි රොස්ටොව්වලට හරි යන්ට සිද්ද වේවි. නැතිනම් අපව ගෙම්බන් වගේ අල්ලා එල්ලා මරා දමාවි."

"ඔව්" අර්ටියෝම් මිමිනුවේය.

"අපේ අයට එහෙ කොහොමද දන්නෙ නැහැ. ගයිදාමක්[1] භටයෝ අපේ අයට කරදර කරන්නේ නැතිද?"

"ඔව්, තාත්තේ, සෑහෙන ලෙඩක් දැම්මා. දැන් ඉතින් ගෙදර යන්ට බැහැ."

1 ප්‍රතිවිප්ලවවාදී හමුදා විශේෂයකි.

★ ★ ★

උදුනෙහි ගින්නෙන්, නිල් පැහැති යකඩයක් ඇදගත් පොලින්තොව්ස්කි එය කිණිහිරය මත තැබීය.

"ඔන්න පුතේ මිටියෙන් තළපන්!"

කිණිහිරය අසල තිබුණු බරැති මිටියක් අතින් ගත් අර්ටියෝම් හිසට ඉහළින් මිටිය යවා වැරෙන් පහරක් ගැසීය. කුඩා ගිනි පුපුරු, පුපුරන හඬක් පිට කරමින් මල් තරු මෙන් කිම්මල පුරා විසිර ගියේය. එහි ඇදිරි අහුමුලු මොහොතකට ආලෝකවත් විය.

ප්‍රබල මිටි පහරට අසුවන රත් පැහැති යකඩ කැල්ල පොලින්තොව්ස්කි විසින් හරවන ලදී. උණු ඉටි කැල්ලක් වැනි යකඩය හැළපයක් මෙන් තුනී විය.

අඳුරු රැයෙහි උණුසුම් සුළං කම්මලේ විවෘත වැට දක්වා හමන්නට විය.

★ ★ ★

පහළ තිබෙන පොකුණේ ඇඳිරිය විශාලය. එය වටා ඇති සස්නා ගස් හිස වනන්නාක් මෙන් සෙලවෙයි.

"හරියට පණ පිටින් වගෙයි."තෝන්යා සිතන්නට වූවාය. ගලින් පිරි පොකුණු ඉවුරේ, තණින් පිරි වළක් වැනි බිමෙක ඕ වැතිර සිටියාය. තණ සහිත වළට එහා උසැති ගස් සහිත ඇඳිරි වනයකි. අගාධයක් වැනි පල්ලම කෙළවර පොකුණ ය. තෝන්යාගේ ප්‍රියතම ස්ථානය මෙතැනය. දුම්රියපොළේ සිට හැතැප්මක් පමණ ඈතින් පැරණි ගල්පොතුවල ගැඹුරු වළවල්වල දිය උල්පත් තුනක් පැන නැඟිණි. දැන් එතැන දිය පාර සහිත පොකුණු තුනකි. පහළ පොකුණෙහි ජලය කැලතෙන හඬක් ඇසෙයි. තෝන්යා හිස ඔසවා අතු මෑත් කොට පහළින් ඇසුණු ශබ්දය ගැන සොයා බලයි. ඉවුරේ සිට පොකුණ මැදට කිසිවෙක් වේගයෙන් පීනති. අව්වට පිලිස්සී ඇති ඔහුගේ දේහය නැමී දිග හැරෙයි. දියෙහි පීනමින් නාන පුද්ගලයාගේ දුඹුරු පැහැති පිට සහ කළු හිසකේ සහිත හිස ද තෝන්යාට පෙනේ. ඔහු දළ තල්මසෙකු මෙන් හඬක් පිට කරයි. ඔහු දිය දෙබෑ කරමින් පීනයි. සිරුර ඒ මේ අත හරවමින් කිමිදෙයි. විඩාපත් වන ඔහු උඩුබැලි අතට දිගාවී දෑත් විදහා ගනී. හිරු රැස් නිසා ඔහුගේ දෙනෙත් යම්තමින් හැකිළී ඇත. තෝන්යා මෑත් කළ අත්ත අත හැරියාය. " ඔහොම බැලීම හොඳ නැහැ." උපහාසාත්මක ලෙස මෙසේ

සිතූ ඈ යළි කියවීමට පටන් ගත්තාය.

ලෙෂින්ස්කි දුන් පොත කියවමින් සිටි තෝන්යා, වනයෙන් වෙන්වී ඇති තණ පිටිය අසල ගල් පඩියට කෙනෙකු පැනගත් සැටි නොදුටුවාය. තමා කියවමින් සිටි පොතට කුඩා ගල් කැටයක් පෙරළී විත් වැටෙත්ම බලාපොරොත්තු රහිතව තිගැස්සුණු ඈ, හිස ඔසවා බැලුවාය. තණපිටියේ සිට ගෙන සිටි පාවෙල් කොර්චාගින් ඇගේ නෙතට හසු විය. බලාපොරොත්තු රහිත ලෙස ඇය හමුවීම නිසා මවිතයට පත් ඔහු, ලජ්ජාවට පත්වී, එතැනින් පිටවීමට සැරසුණේය.

"මෙතන දිය කෙළියේ මොහු තමා," පාවිකාගේ තෙතැති හිසකේ දුටු තෝන්යා සිතුවාය.

"ඔබ බය වුණාද? ඔබ මෙතන බව මා දැනගිටියේ නැහැ. මම මෙහි ආවේ අහම්බෙන්." මෙසේ කී පාවිකා ගල් පඩියට අත තැබීය. හේ තෝන්යා හැඳින ගත්තේය.

"ඔබ මට බාධා කරන්නෙ නැහැ. ඔබ කැමති නම් අපට යම් කිසිවක් කතා කරන්ට පුළුවනි."

පාවිකා විමතියෙන් යුතුව ඇය දෙස බැලීය.

"අප ඔබ සමඟ කතා කරන්නේ මොනවා ගැනද?"

තෝන්යා මඳහස පෑවාය.

"ඔබ ඇයි හිටගෙන ඉන්නෙ. මෙන්න මෙතනින් වාඩි වෙන්න." ඕ ගලක් පෙන්නුවාය. "ඔබේ නම මොකද්ද?"

"පාවෙල් කොර්චාගින්."

"මගේ නම තෝන්යා. ඔන්න ඉතින් අපි හඳුනා ගත්තා."

පාවිකා ලජ්ජාවට පත් වූයෙන්, තම හිස්වැස්ම පොඩි කරන්නට විය.

"ඔබට කියන්නෙ පාවිකා කියලද?" ඕ නිහඬතාව බින්දා ය. "පාවිකා කියන්නේ මොකද? එහෙම කීම ලස්සන නැහැ. වඩා හොඳයි පාවෙල් කියා ඇමතීම. මම ඔබට පාවෙල් කියා අමතනවා. ඔබ නිතර මෙහාට එනවද..." මෙහි විත් නානවාදැයි ඇසීමට ඇයට සිත් වූ නමුදු, ඔහු දියකෙළිමින් නාන සැටි දුටු බව හෙළි කිරීමට අකැමැති ඈ "මෙහි ඇවිදිනවදැයි ?" යි ඇසුවාය.

"නැහැ. නිතරම නොවෙයි. නිවාඩුවක් ලැබුණම එනවා." පාවෙල් පිළිතුරු දුන්නේය.

"ඔබ කොහේ හරි වැඩ කරනවද?" තෝන්යා කුතුහලයෙන් විමසුවාය.

"විදුලි බලස්ථානේ ගිනි උදුනේ වැඩ කරනවා."

"ඔය තරම් අපූරු ලෙස ගහගන්ට ඔබ ඉගෙන ගත්තෙ කොහෙන්ද කියලා කියන්නකො ?" බලාපොරොත්තු රහිත ලෙස තෝන්යා ප්‍රශ්න කළාය.

"මගේ ගහගැනීම් ගැන ඔබට ඇති උවමනාව මොකද්ද?" පාවෙල් අසතුටකින් මිමිනුවේය.

"කොර්චාගින්, ඔබ තරහ වෙන්ට එපා." ඇගේ ප්‍රශ්නය නිසා පාවෙල් අසතුටු වූ බව දැනගත් ඕ තෙපලාය. "මම බොහොම කැමතියි දැනගන්ට. ඔබ ගහපු පාර තමා පහර! අනුකම්පා රහිතව ඔහොම ගහන්ට එපා." ඕ කොක්හඬලමින් සිනාසුණාය.

"ඇයි ඔබට දුක හිතුණද?" පාවෙල් ඇසීය.

"නැහැ. නැහැ.පොඩ්ඩක්වත් දුක නැහැ. සුහර්කෝ කළ වැඩේට ඔහුට දඬුවම් ලැබුණා. ඒ ජවනිකාව හන්දා මම බොහොම සතුටු වුණා. ඔබ නිතර ගහගන්නවයි කියලා කියනවා..."

"කවුද කියන්නෙ?" පාවෙල් සුපරීක්ෂාකාරී විය.

"වික්ටර් ලෙෂින්ස්කි කියනවා, ඔබේ රස්සාව ගහගන්න එක විතරයි කියලා."

පාවෙල් කෝපයෙන් වෙවුලන්නට විය.

"වික්ටර් නීචයා. වැඩ නොකරන කම්මැළියෙක්. ඔහුට මම අත නොතැබූ හන්දා මට ඔහු ස්තුති කරන්ට ඕන. මට ඇහුණා ඔහු මා ගැන කී දේ. මගේ දෑත් කිලිටි කර ගැනීමට මා කැමති වුණේ නැහැ."

"පාවෙල්, ඔබ කෝපයෙන් කතා කරන්නෙ ඇයි? ඒක හොඳ නැහැ." තෝන්යා ඔහුගේ කතාවට බාධා කරමින් ඇසුවාය.

පාවෙල් අමනාප විය.

"අසවල් දේකට මම මේ ඔල්මාදකාරිය සමඟ කතා කරනවද? 'පාව්කා' ඇයට හොඳ මදියි. හිටිහැටියේ ඇය අණ දෙනවා. බණින්න එපා" ඔහු සිතුවේය.

"ඔබ ලෙෂින්ස්කි එක්ක තරහා ඇයි?" තෝන්යා ඇසුවාය.

"එයා කලිසම් ඇඳපු නෝනා මහත්තයෙක්, රදල පැටියෙක්, උෆට හෙණ වදින්ට ඕන! ඔය වගේ එවුන් දැක්කම මගේ දෑත් කසනවා. ඔහු පොහොසත් හන්දා ඔහුට හැමදෙයක්ම පුළුවන්. ඔහු හැම දෙයකටම අත දමනවා. එයාගේ පොහොසත්කමට මම යටවෙන්නෙ නැහැ. එයා මට අත තිබ්බොත් මම එයාට බඩ කට පුරා දෙනවා. ඔහොම එවුන්ට බැටදීලා පාඩම් උගන්වන්ට ඕන" කැලඹීගත් ඔහු කීය.

ලෙෂින්ස්කිගේ නම කතාවට ඇදගැනීම ගැන තෝන්යා කනගාටු වූවාය. ඔතැනි විදුහල් සිසුවාට විරුද්ධව මේ ගැටවරයා පරණ කේන්තියකින් පෙළෙන බව තේරුම් ගත් ඈ වඩාත් සන්සුන් තේමාවක් ඔස්සේ දෙබස මෙහෙයවන්නට වූවාය. ඇය ප්‍රශ්න කරන්නට වූයේ පාවෙල්ගේ පවුල හා රැකියාව ගැනය.

තමාට නොඳනුවත්ම පාවෙල් තරුණියගේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පටන් ගත් අතර, එතැනින් ඉවත්ව යාමේ අභිප්‍රාය ගැනද ඔහුට අමතක විය.

"ඔබ තවත් දුර ඉගෙන ගත්තෙ නැත්තෙ ඇයි ?" තෝන්යා ඇසුවා ය.

"මාව පාසලින් පැන්නුවා."

"මොනවා කළාටද?"

පාවෙල්ගේ මුහුණ රතු විය.

"මම පූජකයාගේ පිටිවලට දුම්කුඩු දැම්මා. ඉතින් මාව පාසලින් පැන්නුවා. පූජකයා බොහොම නපුරුයි. මම ඔහු නිසා බොහොම දුක් වින්දා." පාවෙල් ඇයට පාසල් සමය ගැන විස්තර කළේය.

තෝන්යා කතාවට සවන් දුන්නේ කුතුහලයෙන් යුතුවය. ඔහුට සිය ලජ්ජාව ගැන අමතක විය. පැරණි කුලුපග මිතුරකු සේ ඇයට හැමදෙයක් ගැනත්, වැඩිමල් සොහොයුරා ගෙදර නොපැමිණීම ගැනත් ඔහු කීවේය. තණ පිටියට වී පැය කිහිපයක් තිස්සේ මිතුරු ලීලාවෙන් උනන්දුවකින් යුතුව කතා කළ මේ දෙදෙනාව කිසිවකු දැක්කේ නැත. පාවෙල්ට වැඩට යා යුතු බව මතක් වූයෙන් ඔහු නැඟිට සිට ගත්තේය.

"අනේ මට වැඩට යන්න වෙලාව හරි. මදෑ පල්හැලි දොඩවමින් හිටියා. ටැංකිවල වතුර උණු කරන්ට, දර දාන්ට ඕන. දැන් දනීලො කරදර කරාවි." අනතුරුව ඔහු නොසන්සුන් ලෙස කතා කළේය. "ඉතින් තරුණ නෝනා, සමුගනිමු. දැන් මම පණ එපායි කියලා නගරයට දුවන්ට ඕන."

තෝන්යා ඉක්මනින් නැඟිට සිට උඩ කබාය ඇඳ ගත්තාය.

"මටත් යන්න වෙලාව, දෙදෙනාම එකට යමු."

"බැහැ. මම ඉක්මනින් දුවන්න ඕන. ඔබට මා සමඟ දුවන්ට බැහැ."

"ඇයි බැරි? අපි ඔට්ටුවට දුවමු. බලමු කවුද වේගයෙන් දුවන්නේ කියලා."

පාවෙල් නොසැලකිල්ලකින් ඇය දෙස බැලුවේය.

"ඔට්ටුවට දුවන්ටද? ඔබ මා සමඟ කොහේ දුවන්ටද!"

"හොඳයි. බලමුකෝ. ඉස්සෙල්ලාම අපි මෙතැනින් එළියට යමු."

පාවෙල් ගලට උඩින් පැන තෝන්යාට අතක් දී ඇය උඩහට ඇදගත්තේය. දෙදෙනාම කැලය මැදින් දුම්රිය මඟ දක්වා වැටී ඇති පුළුල් සමතලා මඟක් ඔස්සේ ගියහ.

තෝන්යා මඟ මැද සිට ගත්තාය.

"හොඳයි. දැන් දුවමු. එකයි, දෙකයි, තුනයි. මාව අල්ලන්න!" ඈ වේගයෙන් ඉදිරියට දිව්වාය. ඇගේ සපත්තුවල යට අඩි පතුල් මහත් වේගයෙන්, පෙනී නෙපෙනී යන්නට විය. අගේ නිල් පැහැති උඩ කබාය සුළඟට ලෙළදිණි.

පාවෙල් ඇය පිටුපසින් දිව්වේය.

"අඩි දෙකට තුනට අල්ලාගත හැකියි." ඔහු සිතුවේ ය. එහෙත්, ඔහුට ඇය අල්ලා ගැනීමට පුළුවන් වූයේ මඟ අවසානයේ දී දුම්රියපොළ අසල දීය. ඔහු පුළුල් ලෙස දෙපා තබා දුවගොස් ඇගේ උරයක් තදින් අල්ලා ගත්තේය.

"හරි, කිරිල්ලී අහුවුණා." හතිදමමින් ඔහු ප්‍රීතියෙන් කෑ ගැසීය.

"රිදෙනවා අතහරින්නකෝ" තෝන්යා ගැලවීමට උත්සාහ දරමින් කීවාය.

මේ දෙදෙනා හතිදමමින් සහ ගැහෙන හදවතින් යුතුව සිටියහ. ඉමහත් වේගයකින් දිවීම නිසා විඩාපත්ව සිටි තෝන්යා අහම්බෙන් මෙන් යම්තමින් පාවෙල්ගේ සිරුරට ඇලී සිටියාය. ඒ නිසා ඇය ළං වූවාක් මෙනි. මේ තත්ත්වය පැවැතියේ නිමේෂයකටය. ඇය ඔහුට ළංවී ඇති බව දැනිණි.

"මාව අල්ලාගන්ට කාටවත් බැහැ" ඔහුගේ ග්‍රහණයෙන් මිදෙමින් ඈ කීවාය.

දෙදෙනා ඈත් වූහ. හිස්වැස්ම වනා ඇගෙන් සමුගත් පාවෙල් නගරයට දිව ගියේය.

පාවෙල් ගිනි උදුන් ඇති කාමරයේ දොර හරිත්ම, උදුන ළඟ කිසිවක් කරමින් සිටි දැනිලෝ කෝපයෙන් කෑ ගැසීය.

"නුඹට බැරිද තවත් පරක්කු වෙලා එන්න. නුඹ හිතුවද නුඹ වෙනුවට මම ලිප මොළවයි කියල ?"

එහෙත්, පාචිකා දනිලොගේ උරහිසට ප්‍රීතියෙන් තට්ටු කරමින්, සාමදානකාමී ලෙස කතා කළේය.

"ලොකු උන්නැහේ විනාඩියකින් මම ලිප මොළවන්නම්" කී ඔහු ලිපට දර දමා සකස් කරන්ට විය.

මැදියම් රෑවත්ම දනීලෝ දර ගොඩ උඩ වැතිර අසකු මෙන් ගොරවමින් නිදන්නට වූ අතර, පාවෙල් එන්ජිමට තෙල් දමා, රෙදි කඩකින් දැත් පිසදමා ගනිමින් පෙට්ටියකින් පොතක් එළියට ඇද ගත්තේය. එය 'ජූසෙප්පෙ ගැරිබෝල්ඩි' ජීවන චරිත කතාවේ හැට දෙවැනි කාණ්ඩයයි. නේපල්ස්හි 'රතු කමිසකාරයන්ගේ' නායකයා වන ගැරිබෝල්ඩිගේ පුරාවෘත්තියක් වැනි ත්‍රාසජනක කතා කියවූ ඔහු මනෝ ලෝකයකට පිවිසියේය.

"ඈ තම සුන්දර නිල් පැහැති දෙනෙතින් රදල සාම්වරයා දෙස බැලුවාය..."

"අර කෙල්ලගේ ඇස් දෙකත් නිල්පාටයි." පාවෙල්ට මතක් විය. "ඈ විශේෂ කෙනෙක්. පොහොසත් අය වගේ නොවෙයි. ඒ වුණාට යකින්නක් වගේ දුවනවා." හේ සිතන්නට විය.

දිවා කාලයේදී ඇය හමුවීම ගැන දිගින් දිගටම සිතන්නට වූ පාවෙල්ට එන්ජිමේ වැඩි වන හඬ නැසිණි. ආතතිය නිසා ඒන්ජිම දෙදරුම් කෑවේය. දූවැන්තමය ගුරු රෝදය ඉමහත් වේගයෙන් භ්‍රමණය විය. එන්ජිම තබා ඇති සිමෙන්ති වේදිකාව කම්පනය වූයේ ස්නායු දුර්වලතාවයෙන් පෙළෙන රෝගියෙකු මෙනි.

පාවෙල් ඒන්ජිමේ පීඩනමානය දෙස බැලීය. එහි කටුව රතු සංඥාව ඇති සීමාවෙන් අංශක කිහිපයක් ඉහළ ගොස් තිබිණි.

"මේකා යකෙක්! පාවෙල් පෙට්ටිය අසලින් වාෂ්ප පිට කරන ලීවරය දක්වා ගොස් එය දෙවරක් කැරකැවීය. ගිනි උදුන් කාමරයේ බිත්තියට එපිට නල දිගේ හඬ නඟමින් පිට වූ වාෂ්ප, ගඟට වැටිණි. පාවෙල් පොම්පය ක්‍රියාකරවන ලීවරය පහළට දැමු නිසා රෝදයට පටිය ඇමිණිණි.

පාවෙල් දනීලෝ දෙස බැලීය. ඔහු කට හැරගෙන සන්සුන් ලෙස නිදයි. ඔහුගේ නහයෙන් අමිහිරි හඬක් පිටවිය.

විනාඩි බාගයකින් පීඩනමානයේ කටුව පැරණි තැනටම ආවේය.

★ ★ ★

පාවෙල්ගෙන් වෙන්වුණු තෝන්යා ගෙදර ගියාය. කළුවන් ඇස් ඇති එම තරුණයා සමඟ මේ දැන් පැවැති හමුවීම ගැන ඈ කල්පනා කළාය. ඇයට නොදැනුවත්වම එම හමුවීම ගැන අය තුළ සතුටක් ඇති විය.

"ඔහුගේ තරුණ බව හා මුරණ්ඩුකම් කොපමණද! ඔහු

මා ඉස්සෙල්ලා හිතූ විදිහේ ගොරහැඩියෙක් නොවෙයි. කොහොම වුණත් හොටු පෙරන අර විදුහල් සිසුන් වගේ නම් නොවෙයි.."

තෝන්යා, මෙතෙක් කිට්ටුවෙන් ඇසුරු නොකළ වටපිටාවකට හා වර්ගයකට ඔහු අයත්ය.

"ඔහුට උගන්වන්ට පුළුවනි."ඈ සිතුවාය. "එය සිත් ඇද ගන්නා මිත්‍රත්වයක් වනු ඇත."

නිවසට ළං වූ තෝන්යා ගෙවත්තේ වාඩි වී සිටින ලීසා සුහර්කෝ, නෙලී හා වික්ටර් ලෙෂීන්ස්කිලා දුටුවාය. වික්ටර් පොතක් කියවමින් සිටියේය. ඔවුහු ඇය බලාපොරොත්තුවෙන් සිටියහ.

ඈ හැම දෙනාටම ආචාර කොට බංකුව මත වාඩි වුණාය. නුවුවමනා හිස් ලිහිල් සංවාදයක් කෙරීගෙන යන විට වික්ටර් ලෙෂීන්ස්කි, තෝන්යා ළඟින් වාඩි වී පහත් හඬින් ඇසීය.

"ඔබ නවකතාව කියෙව්වද?"

"ආ! ඔව්, නවකතාව!" තෝන්යාට හිටිහැටියේම මතක් වූයෙන් "මට ඒක..." තමාට අමතක වීමකින් පොත පොකුණ අසල තබා ආ බව නොකීවා පමණකි.

"කොහොමද ආලය ගැන ඒ නවකතාවට ඔබ කැමතිද?" වික්ටර් සැලකිල්ලකින් ඇය දෙස බැලීය.

වැල්ලේ පාවහන් තුඩින් යම් කිසි අදහසක් ඇති රූපයක් සෙමින් අඳිමින් කල්පනා කළ තෝන්යා හිස ඔසවා ඔහු දෙස බලුවාය.

"නැහැ, මම වෙනත් ආලයක් ගැන නවකතාවක් පටන්ගත්තා. ඒක ඔබ ගෙනා එකට වඩා බොහොම සිත් ගන්නා එකක්."

"ඒකත් එහෙමද?" අමනාපයට පත් වික්ටර් ඇද පැද කීය. "කතුවරයා කවුද?" හේ ඇසීය.

තෝන්යා ඔහු දෙස බැලීය. ඇගේ නෙත්වල ගිනි පුපුරු පිටවන උපහාසාත්මක බවක් පෙනෙන්නට තිබිණි.

"කතුවරයෙක් නැහැ."

"තෝන්යා, නුඹේ මිතුරන්ව කාමරයට කැඳවාපන්. නුඹලාට තේ ලෑස්තියි." තෝන්යාගේ මවු අඬගැසුවාය.

යෙහෙළියන් දෙදෙනාගේ දැතින් අල්ලාගත් තෝන්යා ඔවුන් සමඟ නිවසට ගියාය. ඔවුන් පසුපසින් ගමන් කළ වික්ටර්, තෝන්යාගේ කතාවේ තේරුම් වටහා ගනු වස් හිසට වධ දෙන්නට විය.

★ ★ ★

පළමුව, සංවිඥානක බවෙන් තොර වුවද, ගිනි උදුන් මොළවන තරුණයාගේ ජීවිතයට නොදැනුවත්ම ඇතුළු වුණු හැඟීම් එතරම් නවක, එමෙන්ම අවබෝධයෙන් තොර කැලඹෙනසුලු වූවක් විය. එම හැඟීම් විසින් දඟකාරී, කැරැලිකාර ගැටවරයා තුළ චින්තාපර ගතියක් ඇති කරන ලදි.

තෝන්යා වන සංවර්ධන ප්‍රධානියාගේ දුව වූවා ය. පාවෙල්ට නම් වන සංවර්ධන ප්‍රධානියා නීතිවේදී ලෙෂීන්ස්කිට සමානය.

දුගී බවෙන් හා කුසගින්නෙන් පිරි ජීවිතයක් ගත කරමින් වැඩුණු පාවෙල්, සිය අවබෝධය අනුව පොහොසතුන්ට වෛර කළේය. ඔහු තම හැඟීමට ළං වූයේ ප්‍රවේසම්කාරී බවකින් හා බියකිනි. ගල් වඩුවකුගේ දූ ගලීනා කෙරෙහි දක්වන චාම් හා තේරුම් ගත හැකි ආකල්පයක් ඔහු තෝන්යා කෙරෙහි නොදැක්වූ අතර, ඇය දෙස අවිශ්වාසයකින් බැලීය. රුවැති, උගත් තරුණිය තමා කෙරෙහි දක්වන හැම උපහාසාත්මක හා නොසැලකිලි ගතියකටම ගිනි උදුන් මොළවන්නා දැඩි ලෙස පිළිතුරු දීමට සූදානම්ව සිටියේය.

පුරා සතියක් තිස්සේ පාවෙල් වන සංවර්ධන ප්‍රධානියාගේ දුව නොදක සිටියද, අද පොකුණට යාමට ඉටා ගත්තේය. ඇය හමුවීමේ අදහස ඇතිව වුවමනාවෙන්ම ඔහු ඇගේ නිවෙස අසලින් ගියේය. නිවෙස සමීපයෙහි වූ වැට අසලින් සෙමින්, සෙමින් ගමන් කළ ඔහුට, වැට අයිනේ දී නාවික බැනියමක් වැනි ඇගේ උඩු කබාය පෙනිණි. වැට අයිනේ තිබූ සස්නා ගෙඩියක් අහුලාගත් ඔහු, සුදු හැට්ටයට එල්ල කොට ගැසූවෙන් තෝන්යා හඬක හැරුණාය. ඈ පාවෙල් දකින්නී, වැට අසලට දිව ආවාය. ඇය ඔහුට අත දී ආචාර කළේ, ප්‍රීතියෙන් මදහස පාමිනි.

"මදෑ, අන්තිමට ඔබ ආවා." ඈ සතුට පෙන්වමින් කීවාය.

"මෙච්චර කල් කොහෙද ගියේ? අමතක වුණු පොත ගන්ට මම පොකුණට ගියා. ඔබ එතැනට ඒවි කියලා මම හිතුවා. මෙහාට, අපේ වත්තට එන්නැ"යි ඈ කීවාය.

පාවිකා අකැමත්ත පළ කරමින් හිස වැනීය.

"මට බැහැ."

"බැරි මොකද?" ඇගෙ බැමි සඟළ විමතියෙන් හැකිළිණි.

"ඔබේ තාත්තා බැණ වදින්ට පටන් ගනීවි. මා නිසා ඔබට බැණුම් අහන්ට සිදු වේවි. මේ වගේ කාලකණ්ණියකුව

ගෙනාවේ මොකටද කියල අහවි."

"පාවෙල් ඔබ තේරුමක් නැති කතා කියනව." තෝන්යා රොස් වූවාය."ඉක්මනට මෙහාට එන්න. මගෙ තාත්තා කිසිම දවසක කිසිවක් කියන්නෙ නැහැ. ඔබටම පෙනේවි යමු."

ඈ දුවැවිත් ගෙවැටෙහි කඩුල්ල හැරියාය. පාවෙල් ඇය පිටුපසින් ගමන් කළේ දැඩි විශ්වාසයකින් නොවේ.

"ඔබ පොත් කියවීමට ආසා කරනවද?" පසට යට කළ කකුල් සහිත මේසයක් වටා ඔවුන් වාඩි වන විට, ඈ ඇසුවාය.

"බොහොම කැමතියි." පාවෙල් උනන්දුවකින් පැවසීය.

"කියවපු පොත්වලින් ඔබ වැඩියෙන්ම ආසා කරන්නේ මොන පොතටද?"

පාවෙල් කල්පනා කොට පිළිතුරු දුන්නේය.

"ජූසෙප් ගැරිබෝල්ඩි."

"ජූසෙප්පෙ ගැරිබෝල්ඩි" තෝන්යා නිවැරැදි කළාය.

"ඔබ ඒ පොතට බොහොම කැමතිද?"

"ඔව්. මම කාණ්ඩ හැට අටක්ම කියවලා තියෙනවා. පඩි ගත්න හැම වාරයටම කාණ්ඩ පහ බැගින් මිලට ගන්නවා ගැරිබෝල්ඩි තමා නියම මිනිහා!" ආස්වාදයෙන් යුතුව පාවෙල් කීවේය. "ඔන්න වීරයා! එය මට අවබෝධ කර ගන්ට පුළුවනි! ඔහුට සතුරන් කී දෙනෙකුට විරුද්ධව සටන් කරන්ට සිදු වුණාද, ඔහු හැමදාම ජයගත්තා. හැම රටකටම ගියා! දැන් ඔහු ජීවත්ව හිටියා නම් මම ඔහුට එක්වෙනවා. ඔහු දක්ෂ වැඩකාරයන් සොයා බඳවාගෙන දුප්පතුන් සඳහා ව්‍යාපාරයක් ගෙන ගියා."

"අපේ පුස්තකාලෙ බලන්ට ඔබ කැමතිද?" මෙසේ ඇසූ තෝන්යා ඔහුගේ අතක් අල්ලා ගත්තාය.

"බැහැ. බැහැ. මට යන්ට බැහැ." පාවෙල් දැඩි ලෙසම ප්‍රතික්ෂේප කළේය.

"ඔබ මෙතරම් මුරණ්ඩු මොකද? නැතිනම් බයද?"

පවිත්‍ර බව නිසා නොදිලිසෙන, පාවහන් රහිත සිය දෙපා දෙස බැලූ පාවෙල් හිස කසන්නට විය.

"ඔබේ අම්මා හෝ තාත්තා හෝ මාව මෙතැනින් එළවා දමන්නෙ නැතිද?"

"අනේ ඇත්තටම ඔය කතාව නවත්වනවා. නැති නම් මා හැබෑටම තරහ වෙනවා." තෝන්යා රොස් වූවාය.

"ලෙෂීන්ස්කිලා උන්ගේ ගෙදරට මාව වැද්දගන්නෙ නැහැ. අප වගේ අය සමඟ ඔවුන් කතා කරන්නේ කුස්සියට

වෙලා. මම උන්ගෙ ගෙදරට ගියා එක වැඩකට. නෙලී මාව කාමරයටවත් වැද්ද ගත්තෙ නැහැ. මම කාපට්වල කුණු තවරයි කියලා වෙන්නට ඇති. මොන යකාද දන්නෙ" පාවෙල් මඳ සිනා පෑවේය.

"යමු. යමු" ඈ ඔහුගේ උරහිසින් අල්ලා සඳලුතලයට තල්ලු කළාය.

ඕක් ලීයෙන් සෑදූ දෑවැන්තමය අල්මාරියක් සහිත කාමරයකට කෑම ගන්නා ශාලාව හරහා ඔහු සමඟ ගිය ඈ ඇතුළු වුණාය. තෝන්යා අල්මාරියේ දොර පියන් හැරියා ය. එහි පොත් සිය ගණනකි. ඒවා මනා ලෙස පෙළට තබා ඇත. ඔහු මෙතෙක් නොදුටුවිරූ ධනය නිසා විමතියට පත් විය.

"දැන් අපි ඔබ කැමති පොතක් තෝරා ගනිමු. අපෙන් නිතරම පොත් ලබා ගෙන කියවන්ට ඔබ පොරොන්දු වෙන්න හොඳද?"

පාවෙල් ප්‍රීතියෙන් හිස වැනීය.

"මම පොත්වලට බොහොම කැමතියි."

දෙදෙනා පැය කීපයක්ම ඉතා හොඳින් හා ප්‍රීතියෙන් ගත කළහ. ඈ ඔහු තම මවුට හඳුන්වා දුන්නාය. ඔහු සිතූ තරම් එය බිය ජනක ජවනිකාවක් නොවීය. තෝන්යාගේ මවු ඔහුගේ සිත් ගත්තේය.

තෝන්යා පාවෙල් සමඟ සිය කාමරයට විත් සිය පොත් සහ පාඩම් පොත් ඔහුට පෙන්නුවාය.

ඇගේ සුවඳ විලවුන් ආදීය තබා ඇති මේසය අසල මූණ බලන කණ්ණාඩියකි. තෝන්යා එය ළඟට පාවෙල් ඇදගෙන ගොස් සිනාසී කතා කළාය.

"ඔබගෙ කෙස්වැටිය හරියට වැද්දෙකුගේ වගේනෙ, ඒ මොකද? ඔබ කොණ්ඩෙ කපන්නෙවත්, පීරන්නෙවත් නැහැ නේද?"

"කොණ්ඩෙ වැවුණම මම සම්පූර්ණයෙන්ම එය බූගා දමනවා. එයිට වැඩියෙ මොනවා කරන්ටද?" පාවෙල් තම හැසිරීම සාධාරණ බැව් පෙන්වීමට තැත් කරමින් කීය.

තෝන්යා සිනාසෙමින් මේසය උඩ තිබුණු පණාව අතට ගෙන ඔහුගේ හිසෙහි අවුල් වී, ගොඩ ගැසී ඇති කෙස් කැරැලි ඉක්මනින් පීරන්නට වූවාය.

"ඔන්න දැන් සම්පූර්ණයෙන්ම වෙනස්." ඇය කීවේ පාවෙල් දෙස බලමිනි. "කෙස්වැටිය ලස්සනට කපන්ට ඕන. නැති නම් මූසල පෙනුමයි."

හිරු රැස්වලට දැවී ගිය රත් පැහැති කමිසය දෙසද, ඉරි වැකී ගිය කලිසම දෙසද තෝන්යා විවේචනාත්මක බැල්මක් හෙළුවද, කිසිවක් නොකීවාය.

පාවෙල් ඇගේ බැල්ම දුටුවෙන් තම ඇඳුම් නිසා අමනාපයට පත් විය.

ඔහුගෙන් සමුගත් තෝන්යා, නැවත තම නිවසට එන ලෙස ඔහුට ආරාධනා කළාය. තවත් දවස් දෙකකින් ඇය සමඟ මාළු බෑමට එන ලෙස ඈ ඔහු පොරොන්දු කරවා ගත්තාය.

පාවෙල් කාමරයේ ජනේලයෙන් පැන ගෙවත්තට ආවේ, නැවත එම ගෙදර කාමර පාසා යාමට ගියොත් ඇගේ මවු හමුවීමට ඉඩ ඇති බැවිනි.

★ ★ ★

අර්ටියොම් නැති නිසා කොර්චාගින් පවුලේ අගහිඟකම් වැඩි විය. පාවෙල්ගේ වැටුප් ප්‍රමාණවත් නොවිණි.

මාරියා යාකව්ලෙව්නා තම පුතු සමඟ සාකච්ඡා කිරීමට ඉටා ගත්තාය. ලෙෂින්ස්කි පවුලට කුස්සි අම්මා කෙනෙකු වුවමනා වූ බැවින් ඇයට නැවැතත් වැඩ කිරීමට යාමට සුදුසු නොවේදැයි පුතාට කීමට ඈ සිතුවාය. එහෙත්, පාවෙල් ඊට එකඟ නොවීය.

"නැහැ. අම්මේ මම වෙනත් අමතර වැඩක් හොයා ගන්නම්. ලී ඉරන මඩුවේ ලෑලි ගොඩ ගැසීමට මිනිසුන් ඕන. එතැන මම දවස් බාගයක් වැඩ කරන්නම්. එතකොට අප දෙදෙනාට එය සෑහෙනවා. අම්මා වැඩට යන්ට එපා. නැති නම් අර්ටියොම්ට කේන්ති යාවි. අම්මාව වැඩට නොයවා නුඹට ගෙදර වැඩ පිරිමහගන්ට බැරි වුණයි කියල මට බණිවි."

ඇගේ වැඩ කිරීම අවශ්‍ය බව ඈ ඔප්පු කළාය. එහෙත්, පාවෙල් මුරණ්ඩු ලෙසම එම අදහසට විරුද්ධ වුයෙන්, ඇය ඔහුගේ මතයට එකඟ විය.

පසුදින පාවෙල් ලී මඩුවේ වැඩට ගියේය. අලුත ඉරූ ලී අච්චේ වේළාගැනීම සඳහා අසුරන්නට විය. එහිදී ඔහුට දන්නා හඳුනන මිතුරන් හමු විය. මීෂ්කා ලෙව්චුකොව් ඔහු සමඟ පාසල් ගිය කොල්ලෙකි. අනිකා වාන්යා කුලිෂොව්ය. පාවෙල් සහ මීෂා කැලි ගණනට වැඩ කිරීම අරඹූහ. සෑහෙන වැටුපක් ඔවුන්ට ලැබිණි. දහවල් කාලය ලී මඩුවේ ගත කරන පාවෙල්, හවස් වන විට විදුලි බලස්ථානයට වැඩට යයි.

දවස් දහයකට පසු, වැටුප් මුදල් පාවෙල් තම මවට ගෙනැවිත් දෙමින්, කුළුවට් ගතියක් පාමින් අවසානයේ දී ඉල්ලීමක් කළේය.

"අම්මේ මට නිල්පාට සැටින් රෙදි කමිසයක් මිලදී ගන්න. ගිය අවුරුද්දේ මට තිබුණ කමිසය වගේ එකක්. මගෙ පඩියෙන් බාගයක් ඒකට යාවි. ඒකට කමක් නැහැ. මම තවත් හම්බ කරන්නම්. අම්මා බයවෙන්ට එපා. මගේ කමිසෙ බොහෝම පරණ වෙලා." අම්මාගෙන් සමාව ඉල්ලන්නාක් මෙන් ඔහු තම ඉල්ලීම සාධාරණ බව පෙන්වීමට ඉදිරිපත් විය.

"සත්තකින්ම. සත්තකින්ම මිලදී ගන්නම්. පව්ලූෂා, අදම මිලදීගෙන හෙට මහන්නම්. ඇත්ත තමා, නුඹට අලුත් කමිසයක් නැහැ" මෙසේ කී ඈ සුරතල් ලෙස තම පුතු දෙස බැලුවාය.

★ ★ ★

පාවෙල් බාබර් සාප්පුව ඉදිරිපිට නැවතී, තම සාක්කුව තුළ ඇති රූබලය අත ගා, දොර හැර ඇතුළු විය.

කරනැවෑමියා බිය සැක නැති තරුණයෙකි. ඇතුළු වූ ගැටවරයා දැක හේ හිස වනා පුටුවක් පෙන්වීය.

"වාඩිවෙන්න."

ගැඹුරු, සැපපහසු පුටුවේ වාඩිවුණු පාවෙල් කණ්ණාඩියෙන් ලජ්ජා සහගත, ව්‍යාකුල වූ තම මුහුණ දුටුවේය.

"බූ ගාන්ටද?" කරනැවෑමියා ඇසුවේය.

"නිකම් කොණ්ඩය කපන්න. කොහොමද ඒ කට් එකට කියන නම ?" ඔහු බලාපොරොත්තු රහිත ලෙස අතක් වනා සංඥා කළේය.

"මට තේරෙනවා" කරනැවෑමියා මඳ සිනා පෑවේය.

පැය කාලකට පසු දහඩිය පෙරමින්, වෙහෙසට පත් නමුදු මනා ලෙස කොණ්ඩය කපා පීරූ පාවෙල් බාබර් සාප්පුවෙන් පිට විය. ඔහුගේ කැරැලිකාර කෙස් කැරැලි මෙල්ල කර ගැනීමට කරනැවෑමියාට සෑහෙන ලෙස මහන්සි වීමට සිදු විය. අවසානයේදී වතුර සහ පණාව ජය ගත්තේය. හිසකේ ලස්සනට පීරා තිබිණි.

මඟට බට පාවෙල් නිදහස් ලෙස ආස්වාද කොට හිස් වැස්ම ගැඹුරට දමා ගත්තේය.

"අම්මා දැක්කොත් මොනවා හිතාවිද?"

★ ★ ★

පොරොන්දු වූ පරිදි මාළු බෑමට පාවෙල් නොපැමිණියෙන්, තෝන්යා අමනාපයට පත් වූවාය.

"ගිනි උදුන් රත් කරන කොල්ලා මා ගැන වැඩි සැලකිල්ලක් දක්වන්නෙ නැහැ." සිත් තැවුලෙන් ඕ කල්පනා කළාය. එහෙත්, ඊට පසු දිනවල ඔහු නොපැමිණි නිසා ඇයට කාන්සියක් දැනිණි.

ඈ ඇවිදීමට යාමට සැරසෙන විට, ඇගේ කාමරයේ දොර හැරගෙන පැමිණි අම්මා මෙසේ කීවාය:

"තෝනිච්කා[1] නුඹව බලන්ට අමුත්තෙක් ඇවිත්. එයාට අවසරද?

දොර අසල පාවෙල් සිට ගෙන සිටියද, තෝන්යාට ඔහු එක වර හඳුනාගැනීමට බැරි විය.

ඔහු නිල් පැහැති අලුත් සැටින් රෙදි කමීසයකින් හා කළු පැහැති කලිසමකින් සැරසී සිටියේය. ඔහුගේ මැදපු සපත්තු දිලිසුණේය. ඔහුගේ කෙස්වැටිය කපා තිබෙන බවත්, එය පෙර මෙන් ගොඩ ගැසී වැටී නැති බවත් තෝන්යා එකවර දුටුවාය. කුණු තවරාගෙන සිටි ගිනි උදුන් මොළවන්නා දැන් අමුතුම පෙනුමක් ඇති කෙනෙකි.

සිය විමතිය පෙන්වීමට තෝන්යාට සිතුණද, දැනටමත් කුළැටි ගතියක් දක්වන ගැටවරයාට ලැජ්ජා කිරීමට නොකැමැති වූ ඈ, කැපී පෙනෙන එම වෙනස්වීම් නොදුටුවාක් මෙන් හැසුරුණාය.

ඈ ඔහුට දොස් පවරන්නට වූවාය.

"ඔබට ලජ්ජා නැතිද? ඔබ මාළු අල්ලන්ට නාවෙ ඇයි? පොරොන්දු වුණු කෙනෙක් හැසිරෙන්නෙ ඔහොමද?"

"මම මේ දවස්වල ලෑලි ඉරන මඩුවේ වැඩ කළා. ඒ නිසයි එන්ට බැරි වුණේ!"

කමිසයක් හා කලිසමක් මිලදී ගැනීම සඳහා මේ දවස්වල ඔහු වෙහෙස නොබලා වැඩ කළ බව කීමට ඔහුට හැකියාවක් නොතිබිණි.

එහෙත්, තෝන්යා ඒ ගැන අනුමාන කරන්නී, පාවෙල් කෙරෙහි තිබූ ඇගේ අමනාපය තුනී කරගත්තාය.

"පොකුණ පැත්තට ඇවිදින්නට යමු." ඕ යෝජනා කළාය. ගෙවත්තට ගිය ඔවුහු අනතුරුව මඟ ඔස්සේ ඇවිද්දාහ.

තමාගේ කිට්ටුම මිතුරෙකුට කියන රහසක් මෙන්, ඔහු ජර්මන් ලයිතන්ගෙන් පිස්තෝලය සොරකම් කළ සැටි ඇයට

1 තෝන්යා නමෙන් බිඳගත් සුරතල් ඇමතීමකි.

විස්තර කළේය. තව දවස් කීපයකින් ඇය කැටුව මහ වනය මැදට ගොස් ඉන් වෙඩි තැබීමටද ඔහු පොරොන්දු විය.

"බලන්න, ඔයා එහෙම මාව පාවා දෙන්ට එපා." ඔහු හිටි හැටියේම ඇයට 'ඔයා' යන වචනයෙන් ඇමතීය.

"මම ඔයාව කිසිම දවසක කාටවත් එහෙම පාවා දෙන්නෙ නැහැ." තෝන්යා භක්තියෙන් යුතුව පොරොන්දු වූවාය.

IV

තියුණු මාරාන්තික පන්ති සටන්වලට උක්රයීනය හසු විය. එන්ට එන්ටම වැඩි වන මිනිසුන් සංඛ්‍යාවක් විසින් අවි ගන්නා ලදී. හැම සටනක් නිසාම අලුත් සටන්කාමීහු උපන්හ.

සාමාන්‍ය මිනිසාට හුරු පුරුදු සන්සුන් දවස්, ඈත අතීතයට අයත් වූවක් විය.

හිම කුණාටු ඇති විණි. දිරාපත් වුණු කුඩා ගෙවල් වෙඩි හඬ නිසා දෙදරන්නට විය. බිම්ගෙවල්වලට සමාන කුඩා ගෙවල්වල බිත්තිවලට පිටදී සිටගනිමින් සහ කපා සාදා ගත් අගල්වල සැඟවෙමින් සාමාන්‍ය මිනිහා පණ බේරා ගැනීමට තැත් කළේය.

විවිධ වර්ණ හා වර්ගවලට අයත් පෙත්ල්යූරාගේ පල්හොරු කණ්ඩායම්වලින් ගුබේර්නියාව පිරිණි. කුඩා හා ලොකු 'බාත්කා[1]වරුන්ද,' විවිධ ගෝලුබ්ලාද, අර්හාන්ගෙල්වරුන්ද, ආන්ගෙල්වරුන්ද, ගොර්දීවරුන් හා ඉමක් නැති වෙනත් පල් හොරු කණ්ඩායම්ද මෙයට අයත් විය.

හිටපු යුද්ධ හමුදා නිලධාරීහුද, වාමාංශික හා දක්ෂිණාංශික එස්එර්වරුන්ද, මිනීමරුවන් කණ්ඩායමක් එක් රැස් කරගැනීමෙහි සමත්, තීරණාත්මක හැම සාහසිකයෙක්ද තමන් අටමාන්වරුන්[2] බව ප්‍රකාශ කරමින්, සමහර විට පෙත්ල්යූරාගේ නිල් සහ කහ පැහැති කොඩි ඔසවමින් තම තමන්ගේ ශක්තිය හා හැකියාව අනුව පෙදෙස් අල්ලාගෙන පාලනය කළහ.

මෙවැනි විවිධ පල්හොරු කණ්ඩායම්වලින්ද, කුලාක්වරුන්ගෙන් හා ගලීසියානි[3] සේනාංකවලින් සෑදූ අටමාන් කනවාලෙට්ස්ගේ කෝර්පූස් සේනාවෙන්ද (මෙය වැටලීමේ යුද උපක්‍රම ගැන දැන සිටි සේනාවකි.) 'මහා

1 ප්‍රතිවිප්ලවවාදීන්ගේ නායකයා.

2 අටමාන් - පැරණි රුසියාවේ කොසාක්සවරුන්ගේ නායකයෙකි. සමාජවාදී විප්ලවයෙන් පසු මොවුහු ප්‍රතිවිප්ලවවාදීන් බවට පත් වූහ.

3 ගලීසියාව - උක්රයීනයේ පළාතකි.

අටමාන් පෙත්ලූයූරා' සිය සේනාංක හා ඩිවිෂන් හමුදා සැදීය. මේ එස්එර්වාදී - කුලාක් හොරුන් මැදට මහා පරිශ්‍රමයකින් යුතුව රතු පාටිසාන් සේනාංක කඩා වැදුණහ. එවිට අසුන් දහස් ගණනකගේ කුර ගැටෙන හඬින්ද, තුවක්කු සහිත රියවල සහ කාලතුවක්කු රෝද හා රියවල හඬින් ද මහ පොළොව කම්පනය විය.

කැරැලිකාර, එක්දාස් නවසිය දහනවයේ අප්‍රේල් මාසයේදී මරණ බියෙන් පසුවන සාමාන්‍ය මිනිසා නින්දෙන් අවදිව දෙනෙත් පිසදා ගනිමින් තම කුඩා නිවසේ කවුළුව හරිමින්, චකිතයකින් යුතුව, තමාට කලින් නැඟිට සිටි තම අසල්වැසියාගෙන් විමසීය.

"අචිතනොම් පෙත්රොවිච් අද අප නගරයේ බලය කා අතේද?"

අචිතනොම් පෙත්රොවිච් තම කලිසම ඇඳ ගනිමින් බියෙන් වට පිට බලමින් පිළිතුරු දුන්නේය.

"අපනාස් කිරීලවිච්, දන්නෙ නැහැ. ඊයේ රෑ කාගේදෝ හමුදාවක් ආවා. මොනවද වෙන්නේ කියලා බලමු. යුදෙව්වන්ව කොල්ල කනවා නම්, ඒ කියන්නේ පෙත්ල්යූරාගේ හමුදා ඇවිල්ලයි කියලයි. 'සහෝදරයෝ ඇවිල්ලා නම් එක පාරම කතාබහ අනුව දැනගන්නට පුළුවනි. දැන් ඉතින් මමත් හොඳට වටපිට බලනවා කාගේ පින්තූරය එල්ලන්ට ඕනද කියලා. එහෙම නැත්නම් දන්නවද ගෙරාසිම් ලියොන්තියෙවිච්ට වෙච්ච දේ මටත් වෙන්ට පුළුවනි. මිනිසා වැඩිදුර කල්පනා නොකර ලෙනින්ගේ පින්තූරයක් එල්ලුවා. ඔන්න, මිනිහාගේ ගෙදරට ආවා අසරු භටයෝ තුන්දෙනෙක්. උන් පෙත්ල්යූරාගේ මිනිස්සු. පින්තූරය දැක්කා විතරයි, ගෙරාසිම් අල්ලා ගත්තා. මිනිහට කස පහරවල් විස්සක් ගැහුවා. 'තෝ දන්නවද බොල බැල්ලිගේ පුතා, කොමියුනිස්ට්කාර ජඩයා, තොගේ හම ගලවනවා' කියලා උන් ගෙරාසිම්ට බැන්නා. ඒ මිනිහා කොච්චර සමාව ඉල්ලා හිටියද, හරි ගියේ නැහැ."

මහ මඟට බට, අවිගත් සෙබළ කණ්ඩායම් දුටු සාමාන්‍ය මිනිසා කවුළු දොර වසා සැඟවුණේය. දසාව හොඳ නැත...

පෙත්ල්යූරාගේ පල්හොරු කණ්ඩායම්වල කහ - නිල් කොඩිය දෙස කම්කරුවෝ සැඟවුණු ද්වේෂයකින් යුතුව බැලූහ. අන්තජාතිවාදී ප්‍රවාහය ඉදිරියේ හැඟීම් බෙලහීන විය. එය යළි පණ ලැබ නැඟී සිටියේ, හැම පෙදෙසකින්ම පසු බසින නිල් - කහ පැහැති කොඩි රැගත් පල්හොරුන්ට

එදිරිව දැඩි සටනක් කොට, තියුණු තුඩක් සේ නගරයට කඩා වදින රතු සේනාංක නිසාය. දවසක් දෙකක් නගර සභාවට ඉහළින් රතු කොඩිය ලෙළ දිණි. වරෙක නගරයෙන් පිටත්ව යන එය ඇඳිරි වූ විට නැවත ආවේය.

සාද්නෙප්රොව්ස්කය ඩිවිෂන් හමුදාවේ 'අනංගයා සහ වසභයා' යන විරුදාවලි ලත් කර්නල් ගොලූබ් දැන් නගරයේ අධිපතියාය.

මිනීමරුවන් දෙදහසකින් යුත් ඔහුගේ හමුදාවෝ ඊයේ උත්සවාකාරයෙන් නගරයට ඇතුළු වූහ. කර්නල් තැන හමුදාවේ ඉදිරිපසින් උසස් වර්ගයකට අයත් අසකු පිට නැඟ ගමන් ගත්තේය. අප්‍රේල් මාසයේ උණුසුම් හිරු රැස් නොතකා ඔහු කොකේසියානු බූර්කා කබායක් ඇඳ දම් පැහැති තීරයක් සහිත අස්ත්‍රහාන් හිම තොප්පියක් පැලඳ සිටියේය. උඩු කබාය අවිවලින් පිරිලාය. කිරිච්චියකි, රිදියෙන් කළ අසිපතකි.

කර්නල් රදල හාමුදුරුවෝ රුවැත්තෙකි. ඔහුගේ බැම සඟළ කළු පැහැතිය. මුහුණ මලානිකය. ඉමක් නැති මත්පැන් පානය නිසා ඔහුගේ හම යම්තමින් කහ පැහැතිය. ඔහුගේ කටෙහි දුම් පයිප්පයකි. මේ කර්නල් තැන විප්ලවයට පෙර, සීනි සෑදීමට ගන්නා බීට් අල වතුවල කෘෂිකාර්මික නිලධාරියෙකු විය. එහෙත්, එය කාන්සියෙන් පිරි ජීවිතයක් වූ අතර, අටමාන් ධුරය සමඟ එය කොහෙත්ම සම නොකළ හැකිය. රට හැම තැන ඇති වූ නොසන්සුන්තාව නමැති සුළි සුළඟ විසින් කෘෂිකාර්මික නිලධාරියා කර්නල් ගෝලූබ් බවට පත් කරනු ලැබීය.

නගරයට පැමිණි හමුදාව පිළි ගැනීම සඳහා නගරයේ එකම රඟහලෙහි ජය පානයක් පැවැත්විණි. පෙත්ල්යුරා කණ්ඩායමේ බුද්ධිමතුන්ගේ උසස් සමාජය, උක්රයීනයේ පාසල් ගුරුවරුද, පූජකයෙකුගේ දුවරු දෙදෙනෙක්ද, වැඩිමහලු තරුණිය ආන්යා රූමතියකි. බාල දුවගේ නම දීනා, කුඩා රදල පට්ටම් ඇතියවුද, රදල අධිපති පතොත්ස්කිගේ හිටපු සේවකයෝද, 'නිදහස්කාමී කොසාක්වරුන්' යන නමින් තමන් හඳුන්වා ගන්නා පහත් මැද පන්තියට අයත් වුවන්ගෙන් සමන්විත සමූහයක්ද, උක්රයීනයේ එස්එර්වාදී නටබුන් ද මේ උත්සවයට සහභාගි වූහ.

රඟහල පිරී පැවැතිණි. උක්රයින් ජාතික ඇඳුම් ඇඳගත්, දීප්තිමත් මල් සහිත රෙදිවලින්, පබළු හා පීත්ත පටිවලින් සැරසුණු ගුරුවරියෝද, පූජක දූවරුද, පහත් මැද පෙළට අයත්

ගැහැනුද, අඬු සහිත සපත්තු දමා සිටි යුද්ධ නිලධාරීන් විසින් වට කරගනු ලැබ සිටියහ. ඔවුහු පැරණි චිත්‍රවල දැකිය හැකි පැරණි සපරෝෂට්සිවරුනට සමාන වූහ.

හමුදා වාදක කණ්ඩායම වැයීය. 'නසාර් ස්තොදොල්යා' නාටකය පෙන්වීමට ලහි ලහියේ සූදානම් විය.

විදුලි බලය නොතිබුණෙන්, ඒ ගැන කර්නල් තැනට සිය කාර්යාලයේ දී දැන්වීය. කර්නල් තැන එම උත්සවයට යාමට සූදානම්ව සිටියේය. ඔහුගේ අත් උදවුකාරයා වන පාල්යනීට්ස්යාගේ (පල්යාන්ට්සෙව් උක්රයීන් නිලධාරීන් සතුටු කරවීම් වස් උක්රයීන් වාසගමක් නමට ඇඳා ගත්තේ ය.) වාර්තාවට සවන් දුන් කර්නල් තැන, නොසැලකිල්ලකින් නමුදු අධිපති බවක් පාමින් අණ කළේය."

"විදුලි එළිය ඕන, නුඹ මැරිලා හරි විදුලිබල ශිල්පියකුව හොයා ගෙන බලස්ථානය ක්‍රියා කරවාපන්."

"එහෙමයි කර්නල්තුමනි."

පාල්යනීට්ස්යා සහකාර මුලාදෑනියා මළේ නැති නමුදු, ඔහු විදුලිබල ශිල්පියන් හොයා ගත්තේය.

දෙපැයක් ඉකුත් වන්නට පෙර පෙත්ල්යූරාගේ සෙබළු දෙදෙනෙක් පාවෙල් විදුලි බලස්ථානයට ගෙන ගියහ. එලෙසම විදුලිබල ශිල්පියකු හා යන්ත්‍රය ක්‍රියා කරවන්නකු ද ඔවුහු සොයා ගත්හ.

පාල්යනීස්ට්ස්යා කෙටියෙන් කීවේය.

"රෑ හත වෙන්ට ඉස්සෙල්ලා විදුලි එළිය නොලැබුණොත් තොපි තුන්දෙනාව එල්ලා මරනවා!" ඔහු අසල තිබූ යකඩ බාල්කයක් පෙන්විය.

ඒ කෙටි නිගමනය ප්‍රතිඵල ලබා දුන්නේය. නියමිත වේලාවට විදුලි එළිය ලැබිණි.

උත්සවය ජයට කෙරී ගෙන යන විට කර්නල් තැන සිය පෙම්වතියත් සමඟ රඟහලට ආවේය. අවන්හලක් අයිතිකරුවකුගේ දුවක වූ ඇගේ පියයුරු මනාව වැඩී තිබිණි. ඇගේ හිසකේ පිදුරු මෙන් කහ පැහැතිය. කර්නල් තැන නැවතී සිටියේ අවන්හල් අයිතිකරුගේ ගෙදරකය.

පොහොසතෙක් වූ අවන්හල් අයිතිකරුවා ගුබේර්නියාවේ නගරයක විදුහලකින් තම දියණියට අධ්‍යාපනය ලබා දුන්නේ ය.

තමාට හිමි උසස් අසුනෙක වාඩි වූ කර්නල් තැන නාටකය රඟපෑමට අවසර දෙමින් සංඥා කළ විගසම තිරය ඇරිණි.

පැන දුවන නාටක අධ්‍යක්ෂවරයාගේ පිට කොන්ද වාඩිගෙන සිටි ප්‍රේක්ෂකයන්ගේ නෙත්වලට හසු විය.

නාටකය රඟපාන විට ගැහැනුන් සමඟ පැමිණි නිලධාරීහු පෙළ ගැසී, රඟහලේ අවන්හලට වූවෝ, පාල්යනීට්සා විසින් බලෙන් පැහැරගෙන විත් සපයන ලද විවිධ වර්ගවලට අයත් මත්පැන් හා පිසූ ආහාර වර්ග ගිල දැමුහ. නාටකය අවසන් වන විට, හැම දෙනෙක්ම වෙරි මත්ව සිටියෝය.

පාල්යනීට්ස්යා රඟ මඬලට පැන නැටුම් විලාසයෙන් අතක් දිගු කොට මෙසේ කිවේය:

"ගරු මහත්වරුනි, නැටීම පටන් ගනිමු!"

ප්‍රේක්ෂකයෝ එක්ව අත්පොළසන් දුන්හ. උත්සවයට සහභාගි වූ මිනිසුන් ආරක්ෂා කිරීම සඳහා පැමිණ සිටි සෙබළුන්ට පුටු ආදිය අස්කොට රඟහල නැටුම් හලකට පෙරළීමට ඉඩ දී අමුත්තෝ පිට්ටනියට ගියහ.

පැය භාගයකින් නැටුම්හල ව්‍යාකුලත්වයකින් පිරිණි.

තමන් පාලනය කර ගැනීමෙහි අසමත් වූ පෙත්ල්යූරාගේ නිලධාරීහු, උෂ්ණය නිසා රත් පැහැ ගෙන සිටි නගරයේ රූමතියන් සමඟ එක්වී නටන්නට වූහ. දිරාපත් වූ රඟහලේ බිත්ති ඔවුන්ගේ පා ගැටීම් නිසා කම්පනය විය.

මේ අතරතුර පිටිමෝල පැත්තෙන් අවිගත් අසරු හමුදාවක් නගරයට පිවිසියේය.

ඉදිරියට එන අසරු හමුදාව දුටු පෙත්ල්යූරාගේ මුරපොළේ සෙබළ මුළ හණිකට මැෂින් තුවක්කුව සුදානම් කළහ. අගුළු වැටිණි. රාත්‍රී අඳුර බිඳ හඬක් මතු විය.

"නැවතියන් නුඹලා කවුද?"

අඳුරේ සිට අඳුරු පැහැති දෙදෙනෙක් ඉදිරියට ආවෝය. එකෙක් මුරපොළ සමීපයට විත් ගොරෝසු හඬකින් කෑ ගැසීය.

"මම අටමාන් පව්ල්යුක්. මගේ හමුදා එක්ක ආවා. නුඹලා ගෝලූබ්ගේ උදවියද?"

ඉදිරියට ආ නිලධාරියා 'ඔව්' යැයි පිළිතුරු දුන්නේය.

"මගේ හමුදාවට නවාතැන් ගන්ට පුළුවන් කොතැනද?" පව්ල්යුක් විමසීය.

"මම වහාම ප්‍රධාන කාර්යාලයට ටෙලිෆෝන් කරන්නම්"

මෙසේ කී නිලධාරියා මහ මඟ අසල වූ කුඩා ගෙයට ඇතුළු විය.

විනාඩියකට පසු ගෙයින් එළියට දුව ආ ඔහු අණ කළේය.

"භටයිනි, මැෂින් තුවක්කුව අහකට ගනිල්ලා, අටමාන්තුමාගේ හමුදාවට ඉඩ දීපල්ලා."

පව්ල්යුක් අසුගේ පටි ඇද විදුලි ආලෝකය සහිත රඟහල අසල උඟ නැවැත්වීය. එය වටා මිනිස්සු ප්‍රීති වෙමින් ඇවිදිති.

"හැබෑටම මෙතන බොහෝම ජයයි." පව්ල්යුක් සිය අතවැසියා දෙසට හැරී පැවසීය. "අපි මෙතැන බහිමු, ගුක්මාච්, අපි ද ප්‍රීති වෙමු. මෙතැන සෑහෙන්ට ගෑනු ඉන්නවා. සෑහෙන එකියක් තෝරා ගනිමු. ඒයි ස්තාලෙෂ්කෝ අපේ භටයන්ට ගෙවල් හොයා දීපන්! අපි මෙතන නවතිනවා. ආරක්ෂක කණ්ඩායම මා සමඟ වරෙල්ලා." මෙසේ කී අටමානයා සෙලවුණු අසු පිටින් නුහුරු ලෙස බිමට පැන්නේය.

රඟහල අසල දී පව්ල්යුක් නැවත්වූ අවිගත් පෙත්ල්යුරාවරු දෙදෙනෙක් ප්‍රශ්න කළෝය.

"ටිකට් තියෙනවද?"

පව්ල්යුක් අවඥා සහගත ලෙස ප්‍රශ්න කළ සෙබළෙකු දෙස බලා ඔහු උරයකින් මෑත් කොට ගමන් කළේය. ඔහු පසුපසින් ඔහුගේ හමුදාවේ සෙබළුන් දොළොස් දෙනෙක් ගමන් ගත්හ. ඔවුන්ගේ අසුන් වැට අසලය.

අලුත පැමිණියවුන් කැපී පෙනිණි. අන් හැමටම වඩා විශාල සිරුරකින් හෙබි පව්ල්යුක් කෙරෙහි අවධානය යොමු විය. ඔහු හොඳ රෙදිවලින් කළ යුද නිලධාරී කාබායක්ද නිල් පැහැති කලිසමක්ද ලොමින් කළ තොප්පියක්ද දමාගෙන සිටියේ ය. උරහිස් පටියේ පිස්තෝලයකි. සාක්කුවේ දොට්ට පැනීමට සැරසෙන අත් බෝම්බයකි.

"ඒ කවුද?" නටන අය වටා කවාකාරව සිටි මිනිස්සු මුමුනන්නට වූහ. ගෝලුබ්ගේ සහායක නිලධාරියා රෝදයක් මෙන් කරකැවෙමින් නැටීය.

ඔහු සමඟ නැටීමට සහභාගි වූයේ පූජකයාගේ වැඩිමහලු දුවය. ඈ නටන විට ඇගේ සාය සුළඟට හසුව උඩ විසි විණි. යුද්ධ නිලධාරීන් ආස්වාදයට පත් කරවමින් ඇගේ යට ජංගිය දිස්වූයේ ඈ උවමනාවට වඩා එසේ නැටූ බැවිනි.

උරහිසින් සෙනඟ ඈත් මැත් කළ පව්ල්යුක්, කවය දක්වා ඉදිරියට ගියේය.

පව්ල්යුක් නොතියුණු බැල්මකින් පූජක දුවගේ කකුල් දෙස බලා, තම වියළි දෙතොල් ලෙවකා කවය මැදින් වාදක කණ්ඩායම වෙත ගියේය. ආලෝක මණ්ඩපය අසල සිට ගත් ඔහු සිය'තෙහි තිබූ කසය වැනීය.

"ගොපාක් නැටුම!"

වාදක කණ්ඩායමේ නායක තැන ඔහුගේ ඉල්ලීම සැලකිල්ලට නොගත්තේය.

එවිට පව්ල්යුක් කසය වරක් වනා වාදකයාගේ පිටට ඉන් ගැසීය. පහර කෑ වාදක කණ්ඩායමේ නායකයා සතෙකු විසින් දෂ්ට කරන ලද කලෙක මෙන් උඩ පැන්නේය.

සංගීත වාදනය ඇන හිටි අතර, ශාලාව නිහඬ විය.

"ඒක මහා උද්දච්ච වැඩක්!"අවන්හල අයිතිකරුගේ දුව කෝපය පළ කළාය. "ඔයා එහෙම වැඩකට අවසර දෙන්න එපා." තමා අසල අසුන් ගෙන සිටි ගෝලූබ්ගේ වැළමිට මිරිකු ඈ පැවසුවාය.

ගෝලූබ් බැරෑරුම් ලෙස නැඟී සිට තමා ඉදිරිපිට වූ පුටුව පයින් පසෙකට තල්ලු කොට පව්ල්යුක් වෙතට පියවර තුනක් තබා නැවතුණේය. දැන් හේ ඔහුට වැදෙන තරම් ළං වී සිටී. ගෝලූබ් පව්ල්යුක් එකවර හැඳින ගත්තේය. මේ පෙදෙසේ බලය අල්ලා ගැනීම සඳහා තරග කරන ඔහු සමඟ ඇති එදිරිවාදීකම් සියල්ලක්ම ගෝලූබ් විසඳා ඉවර නැත.

මීට සතියකට පෙර පව්ල්යූක් කර්නල් තැනට ඉතාම කැත අන්දමට උගුලක් ඇටවීය.

ගෝලූබ්ගේ හමුදා රතු හමුදාවල ප්‍රහාරයට මුහුණ දෙමින් දැඩි සටනක් කරන විට පව්ල්යූක්, රතු හමුදාව පසු පසින් පහර දෙනවා වෙනුවට, එක් කුඩා නගරයකට කඩා වැදී බොල්ෂෙවික්වරුන්ගේ කුඩා සේනාංක ඇති මුර පොළවලට පහර දී, කපොල්ලක් සාදා ඒ කුඩා පෙදෙසේ ඇති හැම දෙයක්ම පෙර නොවූ විරූ ලෙස මංකොල්ල කෑවේය. සත්තකින්ම ඒ කොල්ල කෑම 'සැබෑ' පෙත්ල්යුරාගේ හමුදාවේ කෙනෙකු කරන්නාක් මෙන්ම, යුදෙව්වන් කොල්ලකෑමට පමණක් සීමා විය.

රතු හමුදා ඒ අතර ගෝලූබ්ගේ හමුදාවල දකුණු අංශය සමූල ඝාතනය කොට ඉවත්ව ගියහ.

අසරු හමුදාවක මේ උද්දච්ච කපිතාන් තැන, දැන් කර්නල් ඉදිරියේදීම ඔහුගේ තූර්ය වාදක කණ්ඩායමේ නායක වාදකයාට ගරු සරු නැතිව පහර දුන්නේය. නැත. එවැන්නකට අවසර දීමට ඔහුට නොහැකිය. උඩඟු අටමානයාට දැන් තමා දඬුවම් නොකරති නම්, තම සේනාව මත තමාට අයත් අධිපති බව විනාශ වන බව ගෝලූබ්ට වැටහිණි.

එකිනෙකා දෙස ඔරවමින් බැලූ මේ දෙදෙනා ඔවුනොවුන්ට මුහුණ ලා තත්පර කිහිපයක් නිහඬව උන්හ.

එක් අතකින් කඩු මිටි දැඩි ලෙස ගෙන, අනික් අතින් සාක්කුව තුළ ඇති පිස්තෝලය අත ගාමින් ගෝලූබ් කෑ ගැසීය.

"නීචයා, මගේ මිනිසුන්ට පහර දීමට තොට අවසර දුන්නේ කව්ද?"

පව්ල්යූක්ගේ අතක් සෙමින් ඔහුගේ පිස්තෝල කවරය දක්වා ගියේය.

"කලබල වෙන්ට එපා, කර්නල් ගෝලූබ් උන්නැහේ. පය ලිස්සා බිම වැටෙන්ට පුළුවනි. මගේ කරගැට පාගන්ට එපා. මටත් කේන්ති යාවි."

ගෝලූබ්ගේ ඉවසීමේ සීමා සියල්ල සිදිණි.

"මුන්ව අල්ලා ගනිල්ලා. රඟ හලෙන් එළියට දමලා, එක එකාට කස පහරවල් විසිපහ බැගින් ගහපල්ලා !" ගෝලූබ් කෑ ගැසීය.

පව්ල්යුක්ගේ පිරිස වෙත, රැස්ව සිටි නිලධාරීන් හැම පැත්තෙන්ම කඩා පැන්නේ දඩයම් බල්ලන් මෙනි.

කිසිවෙකු විසින් තබන ලද වෙඩිල්ලක් නිසා බිම වැටුණු විදුලි පහනක් බෝම්බයක් මෙන් හඬක් නැඟීය. පොරකන බල්ලන්ගේ රංචු දෙකක් මෙන් ඔවුහු අන්ධව ශාලාව තුළ දුව පැන ඇවිදින්නට වුහ. ක්‍රෝධයෙන් අන්ධව සටන් කළ ඔවුහු එකිනෙකා කඩුවලින් කැපුහ. කෙටූහ. කෙස්වැටිවලින් හා බෙල්ලෙන් අල්ලා ගත්හ. පොරකන්නන්ගෙන් ඈත් මෑත් වූ ගැහැනු මර බියෙන් තැති ගෙන උඟරු පැටවුන් සේ හඬ නැගූහ.

විනාඩි කිහිපයක් ගතවත්ම, නිරායුධ කරනු ලැබූ පව්ල්යූක්ගේ පිරිසට පහර දෙමින්, ඔවුන් රඟහලේ වත්තට ගෙනැවිත්, මහ මඟට ඇද දැමූහ.

සටනේදී පව්ල්යූක්ගේ තොප්පිය නැති විය. ඔහුගේ මුහුණේ තුවාල තිබිණි. ඔහුද නිරායුධ කළේය. මේ නිසා ඔහු පිස්සෙකු මෙන් වියරු විය. තම පිරිස සමඟ අසුන් පිට නැඟ ගත් ඔහු, මග ඔස්සේ අසු පැන්නීය.

එදින උත්සවය කඩාකප්පල් විය. එම සිද්ධියෙන් පසු ප්‍රීති වීමට කිසිවෙකු ඉදිරිපත් නොවීය. නැටීමට දැඩි ලෙසම විරුද්ධ වූ ගැහැනු, තමන් සිය නිවෙස්වලට ගෙන යා යුතු යැයි ඉල්ලා සිටියහ. ගෝලූබ් කෝප විය.

"ශාලාවෙන් කාටවත් එළියට යාම තහනම්. මුර සෙබළුන් පත් කරව්." හේ අණ කළේය.

පාල්යානිට්ස්යා වහාම අණ ක්‍රියාවේ යෙදවීය.

විරුද්ධකම් පෑමට එදිරිව නැඟී සිටි ගෝලූබ් මුරණ්ඩු ලෙස පිළිතුරු දුන්නේය.

"එළිවන තුරු නටන්නට ඕන. නෝනාවරුනි, මහත්වරුනි! පළමුවැනි වෝල්ස් නැටුමට මමත් එනවා."

නැවත වාදනය පටත් ගත්තද, ප්‍රීතිවීමට නොහැකි විය.

කර්නල් තැන පූජකයාගේ දුවත් සමඟ එක වටයක් නටා අවසන් වීමටත් පෙර, මුර සෙබළු දොර අසලට විත් කෑ ගැසූහ.

"පව්ල්යූක්ගේ හමුදාව රඟහල වට කරනවා."

රඟ මඬල අසල මගට මුහුණ ලා ඇති කවුළුවේ වීදුරුව බිඳිණි. එයින් රඟ මඬලේ ශාලාවට මැෂින් තුවක්කු බටයක් ඇතුළු විය. එය දුව පැන ඇවිදින මිනිසුන් සොයමින් ඉලක්කය ඇල්ලීය. ගැහැනු සහ පිරිමි යකෙකු දුටු කලෙක මෙන් බිය වී ශාලාවේ මැදට වූහ.

පාල්යනීට්ස්යා ඉටිපන්දම් ආලෝකයක් විහිදුවන විදුලි පහනට වෙඩි තබත්ම, එය බෝම්බයක් පුපුරන්නාක් මෙන් හඬ පිට කරමින්, වීදුරු කැට වැස්සක් ඇති කළේය.

ඇඳිරි පැතිරිණි. මහ මඟ සිටි අය කෑ ගැසූහ.

"එළියට බැහැපියව්" නොසරුප් බසින් බැණ වදින්නට වූහ.

ගැහැනුන්ගේ මායාකාරී වියරු කෑ ගැසීම්ද, ශාලාවේ ඒ මේ අත යමින්, අන්දමන්ද වී සිටින නිලධාරීන් එක්රැස් කිරීම සඳහා ගෝලූබ් විසින් දෙනු ලබන වියරු අණ කිරීම්ද, වත්තේ වෙඩි තැබීම් හා කෑ ගැසීම්ද ආදී සියල්ලක්ම නිසා නොවූ විරූ කලබලයක් ඇති විය. නයෙකු සේ එළියට පැන ගත් පාල්යනීට්ස්යා පස්සා දොරෙන් යාබද හිස් වීදියට ගොස් ගෝලූබ්ගේ කාර්යාලයට ගිය සැටි කිසිවෙකු දුටුවේ නැත.

අඩ පැයක් ගතවත්ම නගරයේ වීදිවල නියම සටන් ඇවිළිණි.

රැයෙහි නිසලතාව බිඳිමින් දිගටම වෙඩි හඬ ඇසිණි. මැෂින් තුවක්කු කෙටියෙන් විටින් විට වෙඩි පිට කළේය. මේ කිසිවක් වටහා ගැන්මෙහි සමත් නොවූ සාමාන්‍ය මිනිසා නිදා සිටි උණුසුම් ඇඳන්වලින් පිටතට පැන කවුළුවලට ඇලුණාහ.

වෙඩි තැබීම් කෙමෙන් තුනී විය. නගරාසන්නයේ මැෂින් තුවක්කුවක් පමණක් බල්ලෙක් බුරන්නා සේ හඬ නැඟීය.

සටන තුනී විය. අරුණෝදය පැතිරෙයි...

යුදෙව් සංහාරයක් කිරීමට යතියි යන ආරංචිය නගරය පුරා පැතිර යන්නට විය. එය යුදෙව්වන්ගේ ගෙවල්වලටද පැතිරිණි. කුඩා, පහත් වපරැස් වැනි ඇද වූ කවුළු සහිත මේ ගෙවල් ගඟ දක්වා ඇති අපිරිසිදු ඉවුරේ නොයෙක් ආකාරයට පිහිටා තිබිණි. නමින් පමණක් ගෙවල් හැටියට හැඳින්වෙන මේ පෙට්ටි තුළ නොවූ විරූ තදබදයකින් යුතුව යුදෙව් දුප්පත් ජනතාව ජීවත් වූහ.

අවුරුදු දෙකක් තිස්සේ සිරියෝෂා බ්රැෂ්ෂාක් වැඩ කරන මුද්‍රණාලයේ අකුරු අමුණන්නෝ සහ කම්කරුවෝ, යුදෙව්වෝ වුහ. සිරියෝෂා ඔවුන් සමඟ ජීවත් වූයේ නෑයන් සමඟ මෙනි. වැඩකරුවෝ, මුද්‍රණාලය අයිතිකරු තරබාරු, ස්වයං තෘප්තිමත් බ්ලූම්ෂ්ටෙයින් මහතාට විරුද්ධව එකම පවුලක් සේ නැඟී සිටියහ. මුද්‍රණාලය අයිතිකරු සහ සේවකයන් අතර නොකඩවාම සටනක් ඇති විය. බ්ලූම්ෂ්ටෙයින් කම්කරුවන්ගෙන් වැඩියෙන් වැඩ ගැනීමටත්, ඔවුනට අඩු පඩි ගෙවීමටත් වෙර දැරීය. මේ නිසා සති දෙකක්, තුනක් මුද්‍රණාලය වසා දැමීමට සිදු වූ අවස්ථාද විය. මුද්‍රණ කම්කරුවෝ වැඩ නැවැත්වූහ. එහි වැඩ කළ මුළු ගණන දහහතර දෙනෙක් විය. ඔවුන්ගෙන් බාලයා වූ සිරියෝෂා දවසකට පැය දොළහක් මුද්‍රණාලයේ රෝදය කරකැවීය.

කම්කරුවන් අතර ඇති නොසන්සුන්තාව සිරියෝෂා අද දුටුවේය. අවදානම් සහිත පසුගිය මාස කිහිපය තුළදී මුද්‍රණාලය වැඩ කළේ ඇණවුමෙන් ඇණවුමටය. 'ප්‍රධාන'අටමාන්ගේ ප්‍රකාශන මෙහි මුද්‍රණය කළේය.

කාස රෝගයෙන් පෙළෙන්නෙකු හා අකුරු අමුණන්නෙකු වූ මෙන්ඩල් සිරියෝෂා මුල්ලකට අඬ ගැසීය.

ඔහු සිරියෝෂා දෙස දුක්මුසු නෙත්වලින් බලමින් මෙසේ පැවසීය:

"යුදෙව්වන් මංකොල්ල කන්ට යන බව නුඹ දන්නවාද?"

සිරියෝෂා මවිතව ඔහු දෙස බැලීය.

"නැහැ. මම දන්නෙ නැහැ."

මෙන්ඩෙල් තම වියළි, කහ පැහැති අතක් සිරියෝෂාගේ උරහිස මත තබමින් පියෙකු සේ විශ්වාසයකින් යුතුව කථා කළේය.

"කොල්ලකෑම ඇති වේවි. ඒක හැබෑවක්. යුදෙව්වන්ට වධ දේවි. මම නුඹෙන් ප්‍රශ්නයක් අහනවා. නුඹේ සහෝදරවරුන් විපතට වැටෙන්ට යන මේ වේලාවේ දී නුඹ ඔවුන්ට ආධාර

දෙනවාද නැතිද?"

"සත්තකින්ම, මට පුළුවන් දෙයක් කරන්නම්, මෙන්ඩෙල් විස්තර කරන්න."

අකුරු අමුණන්නෝ මේ කතාවට සවන් දුන්හ.

"සිරියෝෂා නුඹ බොහෝම අපූරු ඉලන්දාරියෙක්. අපි නුඹව විශ්වාස කරනවා. නුඹේ තාත්තාත් කම්කරුවෙක්. අපේ මහල්ලන් හා ගැහැනුන් කීප දෙනෙක් සඟවා තැබීමට නුඹලෑ තාත්තාට පුළුවන්ද කියලා නුඹ ගෙදර ගිහිල්ලා දැන ගනින්. නුඹලෑ ගෙදර හැංගෙන්නේ කවුදැයි කියලා අපි වේලාසනින් තීරණය කරමු. තවත්, යුදෙව්වන්ව සඟවා තැබීමට පුළුවන් අය ගැන නුඹගේ දෙමාපියන්ගෙන් අහලා බලාපන්. ඒ පල්හොරු දැනට රුසියන්කාරයන්ට අත තියන්නේ නැහැ. සිරියෝෂා දුවපන්, බලා ඉන්ට වේලාවක් නැහැ."

"හොඳයි, මෙන්ඩෙල්, විශ්වාසය ඇති කරගන්න. මම දැන් පාච්කා සහ ක්ලීම්කා ළඟට දුවන්නම්. ඒ ගොල්ල ඒ වැඩේ භාර ගනීවි."

"පොඩ්ඩකට නැවතියන්." මෙන්ඩෙල්, නොසන්සුන් වෙමින් දුවන්නට සූදානම් වන සිරියෝෂා නැවත්වීය. පාච්කා, ක්ලීම්කා කියන්නේ කවුද? නුඹ ඒගොල්ලන්ව හොඳට අඳුනනවද?

සිරියෝෂා විශ්වාසයෙන් යුතුව හිස සෙලවීය.

"ඒ කොහොමද, සත්තකින් ම දන්නවා. ඒ ගොල්ලෝ මගේ හොඳම යාළුවෝ. පාච්කා කොර්චාගින්, එයාගේ අයියා මිකැනික් කෙනෙක්."

"ඒ වුණාට කොර්චාගින්" මෙන්ඩෙල් සන්සුන් විය.

"එයාව මම අඳුනනවා. ඒගොල්ල එක්ක එක ගෙයක පදිංචි වෙලා හිටියා. එයා ගැන විශ්වාසය තබන්න පුළුවනි. සිරියෝෂා පලයන් පිළිතුරක් ලබාගෙන ඉක්මනින් වරෙන්."

සිරියෝෂා මහ මඟට පැන ගත්තේ ය.

★ ★ ★

පව්ල්යූක්ගේ සේනාංක සහ ගෝලුබ්ගේ හමුදා අතර සටන් ඇති වී, දවස් තුනකට පසු යුදෙව්වන් කොල්ල කෑම ආරම්භ කළේය.

පහර කා නගරයෙන් පිටතට එළවා දැමූ පව්ල්යූක් ආපසු ගියෙන්, අසල වූ කුඩා තැනක් අල්ලා ගත්තේය. සටන්වලදී ඔහුගේ සෙබළු විසිදෙනෙක් පමණ මිය ගියහ. ගෝලූබ්ගේ

හමුදාවේද නැති වූ සංඛ්‍යාව විසි දෙනෙකු පමණ විය.

මිය ගිය සෙබළුන් හණිකට සොහොන් බිමට එදිනම ගෙන ගොස් විශේෂ උත්සව රහිතව වැළලූයේ උදම් ඇනීමට තරම් මෙය වැඩක් නොවූ බැවිනි. දඩාවතේ යන බල්ලන් දෙදෙනෙකු මෙන් මේ අටමාන්වරු දෙදෙනා පොර කා ගත් බැවින් අවමංගල උත්සව ජයට සංවිධාන කිරීම අපහසු විය. සටනේ දී මිය ගිය සෙබළුන් පාල්යනිට්ස්යා විසින් උත්සවාකාරයෙන් වළලනු ලැබීමට පව්ල්යුක් රත්තෙකු හා පල්හොරෙකු හැටියට ප්‍රකාශ කිරීමටද කැමැති වූ නමුදු, වසීලි පූජකයාගේ නායකත්වයෙන් යුත් එස්එර් පක්ෂ කමිටුව එයට විරුද්ධ වූයේය.

රාත්‍රියේ දී ඇති වූ සටන් නිසා ගෝලූබ්ගේ හමුදාවේ, විශේෂයෙන්ම ගෝලූබ්ගේ ආරක්ෂක සේනාංකයේ දැඩි අසතුටක් පැන නැඟිණි. මැරුම් කෑ සෙබළුන්ගෙන් වැඩි සංඛ්‍යාව මේ සේනාංකයට අයත් විය. මේ අසතුට තුනී කිරීමට සහ සෙබළුන්ගේ උනන්දුව වැඩි කිරීමට පාල්යනීට්ස්යා "ජීවත්වීම පහසු කිරීමේ" යෝජනාවක් ගෝලූබ් වෙත ඉදිරිපත් කළේය. යුදෙව්වන්ට පහර දී ඔවුන් කොල්ල කෑම පාල්යනීට්ස්යා නරුමවාදී ලෙස හැඳින්වූයේ මේ යෝජනාවෙනි. සේනාංකයේ අසතුට පෙන්වා දෙමින් එවැනි කෝලාහලකාරී අත්‍යවශ්‍ය බව ගෝලූබ්ට ඔහු ඒත්තු ගැන්වීය. අවන්හල් අයිතිකරුගේ දුව සමඟ විවාහ වීමට සූදානම් වූ ගෝලූබ් කර්නල් තැන, නගරයේ සන්සුන්තාව නැති කිරීමට අකැමැති වුවද, පාල්යනීට්ස්යාගේ තර්ජනය ඉදිරියේ යුදෙව්වන්ට පහර දී ඔවුන් කොල්ල කෑමට අවසර දුන්නේය.

කර්නල් තැන එස්එර් පක්ෂයේ සාමාජිකයෙකු වීම නිසා මේ කොල්ල කෑම ඔහුගේ චකිතයට භාජන වූ බව සැබැවි. නැවත ඔහුගේ හතුරෝ ඔහුගේ නම වටා අහිතකර කතාබහ ගොතනු ඇත. ඔන්න ගෝලූබ් කර්නල් තැන යුදෙව්වන් කොල්ල කන්නෙකු බව කියනු ඇත. අනිවාර්යයෙන් ම ඔහුට විරුද්ධව 'මහා අටමානයාට' පැමිණිලි කරනු ඇත. මහා අටමානයාගේ බලය යටතේ එතරම් දැඩි ලෙස නොපවතින තමාගේ අවදානම හා බිය අනුව තම හමුදාවට අවශ්‍ය දෑ සපයන තත්ත්වයකි දැනට ඇත්තේ. තමන් යටතේ සේවය කරන්නේ කිනම් වර්ගයට අයත් එවුන්ද යන්න "මහා අටමානයා" ඉතා හොඳින් දැන සිටියේය. ඔවුන් විසින්

උදුරාගනු ලැබූ දේවලින් තම අධ්‍යක්ෂ මණ්ඩලයේ නඩත්තුව සඳහා ඔහු මුදල් ඉල්ලා සිටියේ වරක් නොවේ. යුදෙව්වන් කොල්ලකන්නන් හැටියට ලබා ඇති අපකීර්තිය අනුව බලන විට, ගෝලූබ් සෑහෙන ප්‍රසිද්ධියක් උසුලන්නෙක් විය. එයට තවත් එකතු කළ හැක්කේ ඉතා මඳ වශයෙනි.

යුදෙව් සංහාරය හිමිදිරි උදෑසන ඇරඹිණි.

අරුණෝදයට පෙර නගරය අළු පැහැති මීදුමකින් වැසිණි. හිස් වීදි තෙමුණු හණ රෙදිකඩවලට සමානය. අවුල් සහිත ලෙස හිස් වූ, අශෝභන යුදෙව් ගෙවල් ජන ජීවිතයෙන් තොර විය. අඩක් අන්ධයන් වැනි කවුළු අගුළු දමා තද කොට වසා තිබිණි.

පිටත සිට බලන විට ගෙවල් අරුණෝදයෙහි තද නින්දක සැතපී සිටින්නාක් මෙනි. එසේ වුවද ගෙවල් තුළ කිසිවෙක් නිදා නොගත්හ. නැඟ එන විපතට මුහුණ දෙනු වස් පවුල් ඇඳගෙන සුදානම් වී කිසියම් කුඩා කාමරයකට රැස්වූහ. කිසිවක් නොදත් කුඩා ළමයි පමණක් සැප සේ සන්සුන්ව සිය මවුවරුන්ගේ තුරුල්ලට වී නිදා ගත්හ.

ගෝලූබ්ගේ සහකාර නිලධාරියා වූ පාල්යනීට්ස්යා, එදවස උදෑසන ආරක්ෂක සේනාංකයේ නායක සලොමීගා බොහෝ වේලාවක් තිස්සේ අවදි කළේය. සලොමීගා කළු පැහැතිය. මුහුණ අභිගුණ්ඨිකයෙකුගේ මෙනි. කඩු පහරකින් ලත් තුවාලයක කැළලක් ඔහුගේ කම්මුලක ඇත. එය අළු පැහැතිය.

සහකාර නිලධාරියා තද නින්දේ පසු විය. ඒ මුග්ධ නින්දෙන් ඔහු අවදි කිරීමට කොහෙත්ම නොහැකි විය. දත් විරිත්තන කුදු යකෙක් ඔහුගේ උගුර කසන හැටි ඔහුට සිහිනෙන් පෙනේ. මුළු රෑය තිස්සේම එය ඔහුට සැනසීමක් නොදිණි. තද හිසේ කැක්කුම නිසා අවසානයේදී ඔහු නැඟී සිටි විට, ඔහු අවදි කරන්නේ සලොමීගා බව ඔහුට වැටහිණි.

"ඇයි මිනිහෝ නැඟිටපන්." සලොමීගා ඔහුගේ උරහිසින් අල්ලා සෙලවීය. "පරක්කු වුණා. දැන් පටන් ගන්න වේලාව හරි, නුඹට තිබුණේ මීට වඩා වැඩියෙන් බොන්ටයි."

පාල්යනීට්ස්යා අවදි වී නැඟිට්ටේය. උගුර දැවෙන්ට වූ බැවින් ඔහු අමිහිරි කෙළ පිඩක් ගැසීය.

"මොනවා පටන් ගන්නටද?" ඔහු තේරුම් රහිත ලෙස සොලොමීගා දෙස බැලීය.

"මොනවද? යුදෙව්වන්ට බැට දෙන්ට. නුඹ දන්නේ නැතිද?"

පාල්යානීට්ස්යාට මතක් විය. එය සැබෑවකි. ඔහුට සම්පූර්ණයෙන්ම එය අමතක විය. කර්නල් ගෝලූබ්, ඔහුගේ මනාලිය සහ ඔහුගේ බෝතල් සගයෝ නගරයෙන් එපිට ගමකට ගොස් මත්පැන් පානය ඇරැඹූහ. එහිදී පාල්යනීට්ස්යාද කට ගොන්නක් බී වෙරි විය.

යුදෙව් සංහාරය ඇති කරන වේලාවේදී කර්නල් ගෝලූබ් නගරයෙන් පිටව සිටීම පහසුවකි. තමා නැති අවස්ථාවෙක එවැනි දෙයක් සිදු වීම අත්වැරැද්දක් හැටියට කිව හැකිය. හිතේ හැටියට විනාශ කිරීමට ඒ කාලය තුළ දී පාල්යනීට්ස්යා සමත් වනු ඇත. අහෝ! ඒ පාල්යනීට්ස්යා "පහසුකම් ඇති කිරීමේ" සම්භාවනීය විශේෂඥයෙකි.

ඔහු වතුර බාල්දියක් හිස වත් කර ගත් ඉනික්බිති ඔහුට කල්පනා කිරීමේ ශක්තිය ලැබිණි. හමුදා කාර්යාලයේ ඒ මේ අත යමින් ඔහු විවිධ නියමයන් කරන්නට විය.

ආරක්ෂක සේනාංකයේ භටයෝ අසුන් පිට නැඟ ගත්හ. ඇති විය හැකි අමාරුකම්වලට නිසි පියවර ගැනීම් වස් පාල්යනීට්ස්යා කම්කරු ජනපදය හා දුම්රිය ස්ථානය නගරයෙන් වෙන් කර මුර භටයන් යොදන ලෙස අණ කළේය.

ලෙෂින්ස්කිලාගේ බංගලා වත්තේ මැෂින් තුවක්කුවක් තබා එය මහ මගට හැරවීය.

කම්කරුවන් බාධා කිරීමට ඉදිරිපත් වූවොත් ඔවුන් වෙඩි පහරින් පිළිගනු ඇත.

මේ සියලු කාර්යයන් ඉටු කළ පසු පාල්යනීට්ස්යා සහ සලොමීගා අසුන් පිට නැඟ ගත්හ.

ගමනට පිටත් වූ ඉනික්බිති පාල්යනීට්ස්යාට කිසිවක් මතක් විය.

"නැවතියන්, අමතක වුණා, කරත්ත දෙකක් ගනිමු. අපි ගෝලූබ්ට දැවැද්ද හොයමු. හා, හා, හා, පළමුවැනි ගොදුර සිරිත් පරිදි නායකයාටයි. පළමුවැනි ගෑනි එයාගේ දෙවැනියාට, ඒ කියන්නේ මට, මෝඩ තකතීරුවා නුඹට තේරුණාද?" අවසන් වැකිය ඔහු එල්ල කළේ සලොමීගා වෙතටය.

හේ සිය කහ පැහැති නෙත්වලින් ඔහු දෙස බැලීය.

"ඔක්කෝටම සෑහෙන්ට ගත හැකියි"

ඔවුහු මහමඟ ඔස්සේ ගමන් කරති. ඉදිරියෙන් පාල්යනීට්ස්යා හා සලොමීගාය. පසුපසින් පිළිවෙළක් නැතිව

යන ආරක්ෂක පිරිසය.

මීදුම බිඳ, ළා හිරු රැස් පැතිරෙයි. "පුක්ස්ගේ සුළු බඩු වෙළෙඳ හල" නමැති මලකඩ කෑ නාම පුවරුවක් සහිත දෙමහල් ගොඩනැඟිල්ලක් ඉදිරියේ පාල්යනීට්ස්යා රිය නැවැත්වීය.

සිහින් පාද ඇති අළු පැහැති අශ්වයා නොසන්සුන්ව ලාඩමකින් ගලකට ගැසීය.

"දැන් ඉතින් දෙවි පිහිටෙන් මෙතැනින් පටන් ගනිමු." මෙසේ කී පාල්යනීට්ස්යා බිමට පැන්නේය.

"කොල්ලනේ අස්පයන්ගෙන් බිමට බැහැපියව්." ඔහුට ළං වූ සේනාංකයට කීවේය. "නැටුම පටන් ගන්නට යනවා." ඔහු පැහැදිලි කළේය. "කොල්ලනේ කාගේවත් ඔළුගෙඩිවලට ගහන්ට එපා. ඒකට වේලාවක් ඒවි. ගැහැනුන්ටත් අත තියන්න එපා. බොහෝම හදිස්සි වුවමනාවක් නැත්නම්, හවස් වන තුරු ඉවසාගෙන හිටපල්ලා!"

එක් ආරක්ෂක සෙබළෙක් දත්මිටි කමින් විරුද්ධත්වය ප්‍රකාශ කළේය.

"එහෙම කොහොමද, සහකාර නිලධාරිතුමනි, දෙදෙනාගේ ම කැමැත්ත අනුව කරනවා නම්?"

හැම දෙනෙක්ම සිනාසුණහ. අස්වාදකාමී අනුමත කිරීමකින් යුතුව පාල්යනීට්ස්යා සෙබළා දෙස බැලීය.

"දෙදෙනාගේම කැමැත්ත අනුව නම්, ඔහේ කරපියව්. එවැනි දෙයක් තහනම් කිරීමට කාටවත් අයිතියක් නැහැ."

පාල්යනීට්ස්යා වෙළෙඳහලෙහි දොර ළඟට ගොස් පයින් ගසා එය විවෘත කිරීමට මහන්සි ගත්තද, ශක්තිමත් ඕක් ලීයෙන් කළ දොර නොසෙල්විණි.

පටන් ගත යුත්තේ මෙතැනින් නොවේ. ගෝලූබ්ගේ සහකාර නිලධාරියා පුක්ස්ගේ නිවස දෙසට පා නැඟීය. ඔහු අත අසිපතකි. ඔහු පසුපසින් සලොමීගා ගමන් ගත්තේය.

මඟෙහි කුර ගැටෙන හඬ ගෙතුළට ඇසිණි. කුර ගැටෙන හඬ වෙළඳ හල අසලදී තුනී වුණු පසු බිත්තියෙන් එපිට නඟන හඬ ඇසිණි. හදවත් වෙන් වී ගිය අතර, සිරුරු අප්‍රාණික වූවාක් මෙනි. ඒ ගෙදර තිදෙනෙක් සිටියහ.

පොහොසත් පුක්ස් තම අඹුව හා දූවරුන් සමඟ ඊයේ ගෙදරින් පැන ගොසිනි. පොහොසතා සිය ධනය රැක බලා ගැනීමට සිය දහනව හැවිරිදි පීඩිත මෙහෙකාරිය වන රීවාට භාර දුන්නේය. ඇයට පාළු ගෙදර හුදෙකලා බවක්

නොදනෙන පිණිස ඇගේ මහලු මවු සහ පියාද ගෙන්වා ගත්තේය. පුක්ස් හැරී එන තුරු මේ තිදෙනා ඔහුගේ ගෙදර පදිංචි වී සිටිය යුතු විය.

කපටි ධනවත් වෙළෙන්දා දුබල ලෙස විරුද්ධත්වය පෑ රීවාට, යුදෙව් සංහාරයක් සමහර විට නොවන බවත්, එසේ වුව ද, රීවා වැනි දුප්පතුන්ගෙන් පැහැර ගැනීමට කිසිවක් නැති බවත් කියා ඇය අස්වසාලීය. නැවත ගෙදර පැමිණි පසු ඇයට ගවුමක් තෑගි කරන බවට පොරොන්දු විය.

තිදෙනාම එකතු වී වේදනා සහගත බලාපොරොත්තුවකින් අසා සිටියහ. සමහර විට ඔවුන් ගේ අසලින් යාමටද ඉඩ ඇත. සමහර විට ඔවුන්ට වරදින්නට පුළුවනි. එසේත් නැතිනම් ඔවුන් නැවතුණේ එම ගෙය අසල නොවිය හැකිය. මේවා සැබැවින්ම සිදුවන දේ නොව, සිත තුළ හට ගන්නා දේ විය හැකිය. එහෙත්, ඒ සියලු බලාපොරොත්තු සුන් කරමින්, වෙළඳ හලේ දොර බිඳින හඬ ඇසිණි.

රිදී මෙන් සුදු පැහැති පැසුණු හිසකේ ඇති මහලු පෙයිසාක්, බියගත් දරුවකු සේ බලමින්, වෙළඳ හලට ඇතුළු වන දොර ළඟ සිටගෙන දෙවියන් යැදීය. දැඩි භක්තිවතෙකු වූ ඔහු ඉමහත් ආයාසයකින් සිත මෙහෙයවමින් සර්වබලධාරී යේහෝවාඃ දෙවියන් වහන්සේට යාඥා කළේය. ගෙදරට කඩා වැටෙන්නට යන අවාසනාව වළක්වාලන ලෙස ඔහු දෙවියන්ගෙන් ඉල්ලා සිටියේය. මහල්ලාගේ මුමුනන හඬ නිසා ළංව එන පියවර හඬ වෙන් කොට හැඳින ගැනීමට, ඔහු අසල සිටි මැහැල්ලට නොහැකි වූවාය.

රීවා ගෙදර ඈත කාමරයේ ආහාර අල්මාරිය පිටුපස සැඟවී ගත්තාය. එය ඕක් ලීයෙන් තැනූවකි.

දොරට වැදුණු දැඩි රළු පහර නිසා දෙමල්ලෝ තිගැස්සුණහ.

"දොර ඇරපිය! " මේ වර දොරට ගැසූ පහර වඩාත් දැඩි විය. කෝප වූවන් නොසරුප් බසින් බැණ වදින සැටි ඇසේ.

එහෙත්, දොරෙහි අගුල ඇරීමට තරම් ශක්තියක් නැත. පිටත සිට තුවක්කු මිටිවලින් දොරට ගැසීය. දොරෙහි අගුළු ගැලවී එය බිඳී වැටිණි.

ගෙතුළට වූ අවි ගත් සෙබළු හැම මුල්ලක් පාසාම යමින් සොයන්නට වූහ. වෙළෙඳ හලෙහි දොර තුවක්කු මිටින් ගසා බින්දේය. ඇතුළු වූ අය පිට දොරෙහි අඟුළු ගැලවූහ.

කොල්ලකෑම පටන් ගැනිණි.

කොල්ල කෑ රෙදි, පාවහන් හා අනිකුත් බඩුවලින් ගැල්

පුරවාගත් සලොමීගා කර්නල් ගෝලූබ්ගේ නිවෙසට ඒවා ගෙන ගොස් භාර දී එන විට, වියරු කෑ ගැසීමක් ඇසිණි.

පාල්යනීට්ස්යා තම සහචරයන්ට වෙළෙඳ හල කොල්ල කෑමට ඉඩ දී කාමරයට පැමිණියේය. කොළ පැහැති නෙත්වලින් තිදෙනා දෙස පිරික්සුම් බැල්මක් හෙළූ ඔහු මහල්ලන්ට අණ කළේය.

"පලයව් යන්ට!"

මව සහ පියා නොසැලී සිටියහ. පාල්යනීට්ස්යා සෙමින් ඉදිරියට විත් කොපුවෙන් අසිපත ඇද ගත්තේය.

"අම්මා!" හදවත බිඳී යන සේ දුව කෑගැසුවාය.

සලොමීගාට එම හඬ ඇසිණි. තමාට සහාය පිණිස ඉදිරියට ආ සහචරයන්ට ඔහු අණ කළේය.

"මේ දෙදෙනාව එළියට ඇද දමව්!" ඔහු දෙමහල්ලන් පෙන්වීය. ඔවුන් බලෙන් එළියට ඇද දැමූ පසු තමා ළඟට පැමිණි සලොමීගාට පාල්යනීට්ස්යා මෙසේ කීය. "නුඹ මෙතන දොර ළඟ නැවතියන්, මම කෙල්ල සමඟ කතා කරන්නම්."

මහලු පෙයිසාක් දුවගේ විලාපය නිසා දොර වෙතට යාමට තැත් කළ විට, පපුවට වැදුණු පහර නිසා බිත්තියට හේත්තු විය. මහල්ලා කෙඳිරි ගෑවේය. එවිට මෙතෙක් නිහඬව සිටි ටොයිබා - රීවාගේ මවු වෘක දෙනක් සේ සලොමීගා වෙත කඩා පැන්නාය.

"අයියෝ, අතහැරපල්ලා, මොනවා කරනවාද?"

ඈ දොර වෙතට පැන්නාය. මහලු ඇගේ දුබල ඇඟිලි ඔහුගේ කබාය තරයේ අල්ලා ගත් නිසා එයින් මිදීමට සලොමීගාට බැරි විය.

පියවී සිහිය ලැබූ පෙයිසාක් සිය බිරිඳට ආධාර පිණිස ඉදිරියට ආවේය.

"අත හැරපල්ලා, අත හැරපල්ලා...! අනේ මගේ දුව!"

දෙමහල්ලෝ සලොමීගා දොරින් ඉවතට තල්ලු කළහ. ඔහු කෝපව, කොපුවෙන් පිස්තෝලය ඇද යකඩ මිටින් මහල්ලාගේ හිසට ගැසීය. පෙයිසාක් නිහඬව බිම ඇද වැටුණේය.

කාමරය තුළින් රීවාගේ විලාපය ඇසේ.

වියරු වැටුණු ටොයිබා මහ පාරට ඇද දැමූ විට, ඈ අමනුස්ස ලෙස විලාප හඬ නගමින් පිහිට ඉල්ලා සිටියාය.

ගෙතුළ විලාප නඟන හඬ නැවැතිණි.

කාමරයෙන් පිටතට පැමිණි පාල්යනීට්ස්යා දොරෙහි මිට අල්ලාගෙන සිටි සලොමීගා දෙස නොබලා මෙසේ කීවේය.

"නුඹ යන්ට එපා. ඈ මළා. මම ඇගේ බෙල්ල කොට්ටවලින් හෙමින් මිරිකුවා." පෙයිසාක්ගේ මළ කඳට උඩින් පැන ගොස් ඔහු කළු පැහැති ගොම ගොඩක් වැනි පිරිස මැදට ගියේය.

"පටන් ගත්තේ අවාසනාවන්ත විදිහට" මඟට බට ඔහු අමාරුවෙන් පැවසීය.

ඔහු පිටුපසින් පිරිස නිහඬව ගමන් ගත්තෝය. ඔවුන්ගේ පා සටහන් නිසා කාමරයෙහිද පඩි පෙළෙහිද ලේ පැල්ලම් ඇති විය.

නගරය පුරාම යුදෙව් සංහාරය හා කොල්ලකෑම් ඇති විය. මංකොල්ල කෑ දේ බෙදා ගැනීමට බැරි වීම නිසා තැනින් තැන බලු පොරකෑම්වලට සමාන කෙටි සටන් ඇවිළිණි. තැනින් තැන උදුරාගත් දේ නිසා කඩු ගැටෙන හඬ ඇසිණි. හැම තැනම පාහේ ගුටි බැට හුවමාරු කර ගැනීම් ඇති විය.

බීර තැබෑරුමේ සිට විශාල බීර පීප්ප මහ පාරට ගෙනාවේය.

ඉනික්බිති ගෙවල් කොල්ලකෑම් ඇති විය.

කිසිවකු එයට විරුද්ධ නොවීය. සෙබළු කුඩා කාමරවලට වැදී හැම දෙයක්ම සොයා බැලූහ. අහුමුලු පිරික්සූහ. කොල්ල කෑ බඩු පොදි රැගත් සෙබළු ඇද දමා ඇවිස්සූ රෙදි ගොඩවල්ද, බඩු මුට්ටුද, ඉරා දැමූ කොට්ටවල පුලුන් හා පිහාටුද තබා පිටව ගියහ. පළමු දවසේදී මැරුම් කෑවේ දෙදෙනෙකු පමණි. රීවා සහ ඇගේ පියා පමණක් විය. එහෙත්, එදින රැය කිව නොහැකි තරම් විශාල විනාශයක් ළඟා කළේය.

හවස් වන විට විවිධ පාටින් යුත් හිවල් රංචුවකට සමාන ඔවුහු කට ගොන්නක් බී වෙරි වූහ. බැමෙන හිසින් යුත් පෙත්ල්සූරාගේ සහචරයෝ රෑ වන තුරු බලා සිටියහ.

ඇඳිරිය විසින් දෑතට නිදහස ලැබිණි. ඇඳිරි රැයෙහි මිනිහකු පාගා දැමීම ලෙහෙසි වැඩකි. හිවලා පවා රෑ යට කැමැතිය. උෂ පහර දෙන්නේ විනාශයට මුණ පෑ අසරණයන්ට පමණි.

ඒ බියජනක රාත්‍රී දෙකත්, දහවල් තුනත් බොහෝ දෙනෙකුට අමතක කළ නොහැකිය. වධ දී, තූ තූ කොට ඉරා දැමූ ජීවිත කොපමණද, ඒ බිහිසුණු පැය කීපය තුළ දී තරුණ හිස් කීයක හිසකේ පැසුණේද, ඇඩූ කඳුළු කොපමණද, හිස්

වූ අධ්‍යාත්මය සහිතව, කිසි කලෙක නොමැකෙන නින්දා සහ අපහාස සහිතව, මිනිසෙකුට විඳ දරා ගැනීමට බැරි වධ වේදනා සහිතව, අන් කෙනෙකුට විස්තර කළ නොහැකි කාන්සිය සහිතව, තම කිට්ටු නෑයන් නැවත කිසි කලෙක නොඑන ලෙස මැරුම් කෑ නිසා ඇති වූ දොම්නස සහිතව ජීවත් වූවන් වාසනාවන්තයන් වූහයි කාහට නම් කිව හැකි ද? මන්දෝත්සාහී තරුණ කෙල්ලන්ගේ සිරුරු පටු අතුරු මඟවල තිබිණි. වධ විඳි, හිංසාවලට භාජන වූ, නැවී ගත් එම සිරුරුවල අත් වෙවුලුම් කෑ කලෙක මෙන් පස්සට නැමී තිබිණි.

ගඟ අසල කුඩා ගෙයක වාසය කළ කම්මල්කරුවකු වන නවුම්ගේ බිරිය සාරා, පැහැර ගැනීමට ඉදිරියට ආ හිවලුන්ට පමණක් දරුණු ලෙස පහර කෑමට සිදු විය. විසි හතර හැවිරිදි යෝධයෙකු වූ මේ කම්හල්කරුවාගේ මස් පිඬු වානේ මෙන් විය. ඔහු තම බිරිය පාවා නොදුන්නේය.

කුඩා ගෙදර ඇති වූ බිහිසුණු කෙටි සටනේදී පෙත්ල්යූරා සෙබළුන්ගේ ඔළුගෙඩි දෙකක් කුණු වූ කොමඩු ගෙඩි දෙකක් මෙන් බිඳී විසි විණි. විනාශයට මූණ පෑ කම්මල්කරුවා වියරු කෝපයෙන් නැඟී සිට ජීවිත දෙකක් ආරක්ෂා කරමින් සටන් කළේය. ගෝලූබ්ගේ සහචරයන් අවදානම දැන ගෙන ගඟ අසල ගෙදරට පැමිණියෙන් එතැන බොහෝ වේලාවක් වියළි වෙඩි හඬ ඇසිණි. එකක් හැර සියලු පතොරම්වලින් සතුරන්ට වෙඩි තැබූ නවුම්, අවසාන පතොරමෙන් සාරාට වෙඩි තබා සතුරන් ඉදිරියට ගියේ ඔහු පිළිගැනීමට ආ බයිනෙත්තුවලට මුහුණ දෙමිණි. ගෙපිලෙහි පළමුවැනි පඩියට පා තබත්ම ඔහු වෙත වැස්සක් මෙන් පතොරම් රාශියක් එල්ල වූයෙන්, සිය සිරුරෙන් පොළොව තද කරමින් ඔහු බිම පතිත විය.

ආසන්න ගම්වලින්, තරබාරු අසුන් බැඳි ගැල්වලින් පොහොසත් ගම්මු නගරයට පැමිණියහ. ඔවුහු තමන් රිසි හැම දෙයක්ම පැහැරගෙන ගැල් පුරවාගෙන ගෝලූබ්ගේ හමුදාවට බැඳී සිටින තම පුතුන් සමඟ හෝ නෑයන් සමඟ හෝ ආපසු ගමට ගියහ. මෙලෙස දෙතුන් වරක් ගැල් පුරවාගෙන ගමට යාමට ඔවුනට හැකි විය.

තාත්තාත් සමඟ මුද්‍රණාලයේ තම සගයන්ගෙන් හරි අඩක්ම බිම් ගෙයක් වැනි පහළ ගෙයි සහ අට්ටාලයෙහි සඟවා තැබූ සිරියෝෂා බ්‍රූෂ්ෂාක්, ගෙවත්ත ඔස්සේ මිදුලට එන විට, මහ මග ඔස්සේ දුවන මිනිහෙකු දුටුවේය.

දැත් වනමින් දුවන ඔහුගේ කබාය දිගය. ඔහුගේ හිසෙහි තොප්පියක් නැත. ඔහුගේ මුහුණ බිය නිසා මළ එකෙකුගේ මෙනි. හති දමමින් දුවන ඔහු මහලු යුදෙව්වෙකි. ඔහු පසුපසින් අළු පැහැති අසෙකු පිට නැඟ පහර දීමට සූදානම්ව උඩුකය ඉදිරියට නවා ගනිමින් අසිපතක් අතින් ගෙන වේගයෙන් එන පෙත්ල්යුරාගේ සෙබළෙකි. තමා පිටුපසින් එන අසුගේ කුර ගැටෙන හඬ ඇසුණෙන් මහල්ලා ආරක්ෂාවට මෙන් දැත් එසවීය. සිරියෝෂා මඟට පැන, අසු ඉදිරියට දිව ගොස් මහල්ලා ආරක්ෂා කරමින් සිට ගත්තේය.

"අත තියන්ට එපා. පල් හොරා, බල්ලා!"

කඩු පහර නැවැත්වීමට නොසිතූ අසරු සෙබළා රන්වන් හිසකේ සහිත තරුණ හිස හරවා පෙතැලි පැත්තෙන් පහර ගැසීය.

V

'මහා අටමානයා' වන පෙත්ල්යූරාගේ හමුදාවලට එදිරිව රතු හමුදාවෝ දැඩි ලෙස පහර ගැසූහ. ගොලූබ්ගේ හමුදාවද පෙරමුණට කැඳවීය. පසු පස සෙබළ සංඛ්‍යාවෙන් අල්ප ආරක්ෂක භට පිරිසක් හා නගර පාලක නිලධාරියාගේ හමුදා කාර්යාලයක් පමණක් නගරයෙහි ඉතිරි විය.

මිනිස්සු ක්‍රියාකාරී වූහ. තාවකාලික නිසල බව ප්‍රයෝජනයට ගත් යුදෙව් ජාතිකයෝ මැරුම් කෑ තම නෑයන් වළලා දැමූහ. යුදෙව්වන් පදිංචි වී සිටි කුඩා ගෙවල්වල යළි ජීවිතය පණ ලැබීය.

නිසල රාත්‍රීවලදී නොපැහැදිලි වෙඩි හඬ ඇසිණි. අසල තැනක සටන් ඇති විය.

දුම්රියපොළෙහි වැඩ කළ කම්කරුවෝ, රැකියා සොයා ගම්වලට ගියහ.

විදුහල වසා දැමිණි.

නගරය තුළ යුද්ධ තත්ත්වයක් ප්‍රකාශයට පත් විය.

★ ★ ★

ඇඳිරි රැයකි. එවැනි රැයක දෙනෙත් මහත් කොට බැලුවද අඳුර බිඳ නොපෙනේ. මිනිසුන් අඳුරේ අතපත ගාමින්, අන්ධයන් මෙන් ගමන් කරන්නේ ඕනෑම මොහොතකදී අගලක වැටී බෙල්ල කඩා ගැනීමේ අවදානම සහිතවය.

මෙවැනි වෙලාවක ගෙදරට වී සිටිය යුතු බවත්, ගිනි දැල්වීම

නොකළ යුතු බවත් සාමාන්‍ය මිනිසා දනී. ගිනි එළිය නිසා ආරාධනය නොකළ කිසිවකු පැමිණීමට ඉඩ ඇති බැවිනි. අඳුර වඩාත් හොඳය. වඩාත් නිසලය. හැමදාම නොසන්සුන් මිනිස්සුද ඇත. එවුන් ඔහේ ඇවිද්දාවේ. සාමාන්‍ය මිනිසාට ඔවුන්ගෙන් වැඩක් නැත. එසේ වුවද සාමාන්‍ය මිනිසා එසේ නොයයි. ඔහු නොයන බව සහතිකය.

මෙවැනි රැයක මිනිහෙක් ගමන් කරයි. ඔහු කෝර්වාගින්ගේ ගෙය දක්වා ගොස් ප්‍රවේසමින් කවුළුවේ රාමුවට තට්ටු කළේය. පිළිතුරක් නොලැබුණෙන් දෙවැනි වර වඩාත් හයියෙන් හා දැඩි ලෙස තට්ටු කළේය.

පාවෙල් සිහිනයක් දකියි. මිනිහකුට කොහෙත්ම සමාන නැති යම් කිසිවකු ඔහු වෙත මැෂින් තුවක්කුවක් එල්ල කරයි. ඔහු දුවන්ට වෑයම් කරයි. ඔහුට දුවන්නට ඉඩක් නැත. මැෂින් තුවක්කුව බියජනක ලෙස හඬ නඟයි.

කවුළුවට තට්ටු කරන නිසා එහි වීදුරුව කම්පනය වෙයි.

ඇඳෙන් නැඟිට සිටි පාවෙල් කවුළුව අසලට ගොස් තට්ටු කරන්නේ කවුදැයි පිරික්සීමට උත්සාහ කළේය. නොපැහැදිලි ඡායාවක් හැර වෙන කිසිවක් දැකීමට ඔහු අසමත් විය.

ඔහු ගෙදර සිටියේ තනිවමය. අම්මා වැඩිමල් දුව බැලීමට ගොසිනි. ඇගේ සැමියා සීනි හදන කම්හලක යාන්ත්‍රික ශිල්පියෙකි. අර්ටියොම් යාබද ගමේ කම්හල්කරුවකු ලෙස වැඩ කරන්නේ, යකඩ තළමින් ජීවිකාව උපයා ගනී.

තට්ටු කළ හැක්කේ අර්ටියොම්ට පමණකි.

පාවේල් කවුළුව ඇරීමට තීරණය කළේය.

"ඔය කවුද?"ඔහු අඳුර ඇමතීය.

කවුළුවට එපිට සිටි සේයාරුව සෙලවිණි. බැරැඩියට පත්වුණු ගොරොසු හඬකින් පිළිතුරු ලැබුණේය.

"ඒ, මම. ෂුක්රායි."

කවුළුවේ පඩිය මත දැතක් තිබිණි. පාවෙල්ගේ මුහුණ අසලින් ප්‍රයෝදර් ෂුක්රායිගේ හිස මතු විය.

"මම මෙහාට ආවා රෑ ගත කරන්න. මල්ලී නුඹ මාව පිළිගන්නවාද?" හේ මිමිනුවේය.

"සත්තකින්ම" පාවෙල් මිතුරු ලීලාවෙන් පිළිතුරු දුන්නේය. "ඔය ගැන අහන්නත් දෙයක්ද, ජනේලයෙන් පැනලා වරෙන්."

බරැති ෂුක්රායිගේ දේහය කවුළුවෙන් රිංගුවේය.

කවුළුව වසා සිටි සැණෙකින් එතැනින් ඉවත් නොවීය.

ඔහු කවුළුව අසල සිට ගෙන දෙනෙත් යොමා සවන් දුන්නේය. හඳ කළු වලාකුළකින් මතු වී පිටතට විත් එළිය කරත්ම මඟ පෙනුණෙන්, ඔහු එදෙස ඕනෑකමින් බැලීය. අනතුරුව, පාවෙල් වෙත හැරුණේය.

"අපි අම්මාව කුද්දනවා නේද? එයා නිදි ඇති නේද?"

තමා හැර අන් කිසිවකු ගෙදර නැති බව පාවෙල් ප්‍රයෝදර් ෂුක්‌රායිට කීවේය. නාවික භටයාට වඩාත් නිදහස් බවක් හැඟී ගියෙන්, ඔහු හඬ නඟා කතා කළේය.

"මල්ලී, අර මිනීමරුවෝ මා ගැන බැරෑරුම් ලෙස සලකන්නට පටන් අරගෙන, දුම්රියපොළේ අවසාන සිද්ධීන් නිසා පළිගන්ට පටන් අරගෙන. අපේ කට්ටිය මීට වඩා සමඟි වෙලා හිටියා නම්, යුදෙව් සංහාරය හා මංකොල්ලය වේලාවේදී අපට ඔය 'අළු කබා කාරයන්ට' සෑහෙන පාඩමක් උගන්වන්ට තිබුණා. නමුත්, ජනතාව තවම ගින්නට පැනීමට සූදානම් නැහැ, තේරුණාද. වැඩේ අසාර්ථක වුණා. දැන් මා පස්සේ එළවන්ට පටන් අරගෙන, මාව අල්ලන්න දෙපාරක්ම කොටු කළා. අද මම යම්තමින් ගැලවුණා. මම ගෙදර ගියා. එකවරම යන්නේ නැතුව ගෙවත්ත ළඟ නැවතුණා. මඩුව ළඟ හොඳට බැලුවා. ගහට හේත්තු වෙලා වත්තේ ඉන්නවා. උගේ බයිනේත්තුව නිසා මට අඳුනාගන්ට පුළුවන් වුණා. මම මාරුවක් දාලා ගියා. ඉතින් ඔන්න නුඹව හොයාගෙන ආවා. මල්ලී මම මෙතැන දවස් කීහිපයක් නැංගුරම් දාගන්නම්. විරුද්ධත්වයක් නැහැ නේද? අන්න හොඳා."

ෂුක්‌රායි මඩ තැවරී තිබුණු සපත්තු ගලවා දැම්මේය. ෂුක්‌රායිගේ පැමිණීම නිසා පාවෙල් සතුටු විය. පසුගිය දවස්වල සිට විදුලිබලස්ථානය වැඩ නොකළ බැවින්, හිස් කාමරය තුළ හුදෙකලාව ජීවත් වීම පාවෙල්ට කාන්සිය ගෙන දෙන්නක් විය.

ඔවුහු නිදාගන්නට ගියහ. පාවෙල් එකවරම නින්දට වැටුණේය. ප්‍රයෝදර් ෂුක්‌රායි බොහෝ වේලාවක් දුම් බොමින් සිටියේය. පසුව පාවහන් රහිතව සෙමින් කවුළුව අසලට ආවේය. ඔහු බොහෝ වේලාවක් මහමඟ දෙස බලා සිට ඇඳට විත් නිදාගත්තේ, ඔහු මැඩ විඩාව ජය ගත් බැවිනි. කොට්ටය යට ඇති ඔහුගේ අත එහි තිබුණු පිස්තෝලය උණුසුම් කළේය.

බලාපොරොත්තු රහිතව ෂුක්‌රායිගේ පැමිණීමද දවස් අටක් තිස්සේ ඔවුන් දෙදෙනා එකට ජීවත්වීමද පාවෙල්ට

සැහෙන ලෙස බලපෑවේය. සිත බොහෝ සේ කැලඹී ගන්නා, වැදගත් හා අලුත් දේ ජීවිතයේ පළමුවැනි වරට ඔහුට නාවිකයාගෙන් අසන්නට ලැබිණි. මේ දවස් තරුණ කොර්වාගින්ට තීරණාත්මක කාලයක් විය.

දෙවරක්ම වට කළ නිසා උගුලකට අසුවූ කලෙක මෙන් සිටි නාවිකයා තමා මත බලයෙන් පැටවූ ක්‍රියා විරහිත බව ප්‍රයෝජනයට ගනිමින්, මේ පෙදෙස අල්ලාගෙන එය පාගමින් සිටින 'කහ-නිල් කොඩි ගත් එවුන්ට' විරුද්ධව ඉමහත් කෝපයකින් හා ඇවිළෙන වෛරයකින් යුතුව, තම හැඟීම් ගිජු ලෙස අසා සිටින පාවෙල්ට පවසා සිටියේය.

ෂුක්‍රායි පැහැදිලි ලෙසත්, නිරවුල් ලෙසත්, සරල ලෙසත් කතා කළේය. තීරණයක් නැති දෙයක් ඔහුට නොවීය. නාවිකයා ඉතා දැඩි ලෙසම මඟ දැන සිටි අතර, පාවෙල් ලස්සන නම් ඇති විවිධ දේශපාලන පක්ෂවල සංකීර්ණත්වය වටහා ගත්තේය. සමාජවාදී විප්ලවවාදී පක්ෂය, සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය, සමාජවාදීන්ගේ පෝලන්ත පක්ෂය, කම්කරුවන්ගේ ජන්මන්ත හතුරන් හැටියටද, සියලු අන්දමේ ධනපතීන්ට විරුද්ධව සටන් කරන නොසැලෙන විප්ලවවාදී එකම පක්ෂය බෝල්ෂෙවික්වරුන්ගේ පක්ෂය බවද ඔහුට වැටහිණි.

මීට ඉහත පාවෙල් බලාපොරොත්තු රහිත ලෙස මේ ගැන ව්‍යාකුල අදහස් දැරීය.

උසැති මහතැති, ඉතා ශක්තිමත් පුද්ගලයකු වූද, දැඩි බොල්ෂෙවික්වාදියකු වූද, නාවික වෘත්තියෙන් විශාල අත්දැකීම් ලැබුවා වූද, එක්දාස් නවසිය පහළොවේ සිට රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ. (බෝල්ෂෙවික්) සාමාජිකයකු වූද, නාවිකයකු වූ ජයොදර් ෂුක්‍රායි. තමා දෙස දෙනෙත් මහත් කරගෙන බලා සිටින ගිනි උදුන් වැඩ කරන තරුණ කම්කරුවාට ජීවිතය පිළිබඳ කටුක සත්‍යය විස්තර කළේය.

"මල්ලී, මම කුඩා කාලයේදී නුඹ වගේම තමයි. මගේ හයිය කොහේ යොදවන්නටදැයි දැන හිටියේ නැහැ. මගේ මුරණ්ඩුකම් එළියට පැන්නා. අප අගහිඟකමින් ජීවත් වුණා. බඩ පුරා කාලා හොඳට ඇඳ පැලඳගෙන යන මහත්වරුන්ගේ පුතුන් දැක්කම හිතට වෛරයක් ආවා. මම උන්ට නිතර ගුටි ඇන්නා. ඒකෙන් වැඩක් වුණේ නැහැ. තනිවම සටන් කරලා ජීවිතය වෙනස් කරන්ට බැහැ. කම්කරුවන්ගේ අයිතිය සඳහා

සටන් කිරීමට පව්ලූෂා නුඹ තුළ හැම හොඳ ගුණයක්ම තියෙනවා. නුඹ තරුණයි, පන්ති සටන් ගැන නුඹ බොහෝම පොඩ්ඩයි දන්නෙ. මල්ලි මම නුඹට නියම මඟ පෙන්වා දෙන්නම්. මම එම මඟ හොඳට දන්නවා. නුඹ ප්‍රයෝජනවත් කෙනෙකු වේවි. හිමිජ්ජන්වයි, බොරු ෂෝක් කාරයන්වයි. මට පෙන්වන්ට බැහැ. දැන් මුළු ලෝකයම ගිනිගන්ට පටන් අරගෙන වහල්ලු නැඟිටලා සටන් කරනවා, පැරැණි ජීවිතය පාගා දමන්න ඕන. ඒ සඳහා නිර්භය උදවිය ඕන, වැනෙන උන්ගෙන් වැඩක් නැහැ. උසස් වරිගෙට අයත් කැරපොත්තා එළියට බයේ හිලකට රිංගන්නා වගේ ජනතාව සටන්වලදී හැංගෙන්නේ නැහැ. අනුකම්පා විරහිතව පහර ගහන්ට දක්ෂ අය ඕන."

ඔහු මිට මොළවා මේසයට ගැසීය.

ෂුක්රායි නැඟිට, දැත් සාක්කු තුළ ඔබා ගෙන, බුම්මාගෙන, කාමරය තුළ සක්මන් කරන්ට විය.

වැඩක් නැතිව සිටීම ප්යොදර් ෂුක්රායිට පීඩාවක් ගෙන දුන්නේය. මේ කුඩා නගරයේ පදිංචි වීමට සිදු වීම නිසා ඔහු කනගාටු විය. තවදුරටත් මෙහි නැවතී සිටීම ප්‍රයෝජනයක් නැති වැඩකියි ඔහු තීරණය කළේ එබැවිනි. පෙරමුණ හරහා ගොස් රතු හමුදා සමඟ එක්වීමට ඔහු දැඩි ලෙසම තීරණය කළේය.

කළ යුතු කාර්යයන් භාරගත් පක්ෂ සාමාජිකයන් නව දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් නගරයේ නැවැතිණි.

"මා නැතුව ඒගොල්ලන්ට වැඩ කරන්ට පුළුවනි. තවත් දුර නිකන් ඉන්න මට බැහැ. මාස දහයක් නිකම් විනාශ කළා." කිපුණු ගතියකින් යුතුව ෂුක්රායි සිතන්නට විය.

"ප්යෝදර්, නුඹ කවුදයි" වරක් පාවෙල් ඔහුගෙන් ප්‍රශ්න කළේය.

දැත් සාක්කුවල ඔබාගෙන ෂුක්රායි නැඟිට සිටියේය. එකවරම ඔහුට ප්‍රශ්නය නොවැටහිණි.

"මම කවුද කියලා නුඹ දන්නෙ නැතිද?"

"මම හිතනවා නුඹ බොල්ෂෙවික්කාරයෙක් නැතිනම් කොමියුනිස්ට්කාරයෙක් කියලා." පාවෙල් පිළිතුරු දුන්නේය.

ෂුක්රායි සිනාසී, නාවික බැනියමින් වැසී තිබුණු සිය පළල් පපුවට විසුළු ලෙස තට්ටු කළේය.

"මල්ලී, එය පැහැදිලියි. බෝල්ෂෙවික්, කොමියුනිස්ට් කියන දෙකම එකයි කියන්න වගේ එය සත්‍යයක්." ඔහු වහාම

බැරෑරුම් බවක් පෙන්වීය. "නුඹට එය තේරුණා නම්, මගේ බඩ පළා බොකු ඇද දැමීමට නුඹ නොකැමැති නම් නුඹ ඒ ගැන කිසිම තැනක හෝ කිසිම කෙනෙකුට හෝ නොකීමට වග බලාගනින්. තේරුණාද?"

"තේරුණා" පාවෙල් දැඩි ලෙස පිළිතුරු දුන්නේය.

ගෙවත්තේ කටහඬ ඇසිණි. දොරට තට්ටු නොකර එය හැරියේය. ෂුක්රායිගේ අත සාක්කුව තුළට හණික ගියද, එය ඉවත දැම්මේය. වෙළුම් පටි සහිත හිසක් ඇතිව සිරියෝෂා බ්රුෂ්ෂාක් ගෙට ඇතුළු විය. ඔහු කෙට්ටුය. සුදුමැලිය. ඔහු පිටුපසින් වාල්යා හා ක්ලීම්කාද ඇතුළු වූහ.

"ආයුබෝවන් යක්පැටියා" මඳ සිනා පාමින්, සිරියෝෂා පාවෙල්ට අත දුන්නේය. "අපි තුන්දෙනාම නුඹ බලන්ට ආවා. වාල්යා මට තනිවම යන්ට ඉඩ දෙන්නෙ නෑ. ඈ බයයි. වාල්යාට තනිවම යන්ට ක්ලීම්කා ඉඩ දෙන්නෙ නෑ. ඔහුත් බයයි. මිනිහාගේ හිසකේ රතු වුණාට මොකද තනිවම කාව හරි, කොහේ හරි යැවීම භයානක බව ඔහු දන්නවා."

වාල්යා, සිරියෝෂාගේ කට විහිළුවට මෙන් වැසුවාය.

"ඔන්න හරිම වාචාලයෙක්." ඈ සිනාසුණාය.

"මෙයා අද ක්ලීම්කාට ජීවත් වීමටවත් ඉඩ දෙන්නෙ නැහැ."

ක්ලීම්කා තම සුදු පැහැති දත් පෙන්වමින් සුහද සිනාවක් පෑවේය.

"ලෙඩෙකුගෙන් මොනවා ගන්ටද? එයාගේ හිස් කබල බිඳිලා. ඒ හින්දා මෝඩ කතා කියනවා."

හැමදෙනාම සිනාසුණාහ.

තවමත් සම්පූර්ණ සුවය නොලබා සිටින සිරියෝෂා පාවෙල්ගේ ඇඳ මත දිගා වීය. සැණෙකින් මිතුරන් අතර උනන්දු සහගත සාකච්ඡාවක් ඇති විය. හැමදා සතුටෙන් හා අධෛර්යයට පත් නොවී සිටි සිරියෝෂා දැන් පහත් හඬින් පැගුණු හැඟීමකින් යුතුව පෙත්ල්යූරා හමුදාවේ අසරු සෙබළකු තමාට පහර දුන් සැටි ෂුක්රායිට විස්තර කළේය.

පාවෙල් වෙත පැමිණි මොවුන් ෂුක්රායි දැන සිටියේ ය. ඔහු සිරියෝෂා බ්රුෂ්ෂාක්ලාගේ ගෙදරට කීප වරක්ම ගොස් ඇත. සටන නමැති ජල ප්‍රවාහයේ නියම මග තවම සොයාගෙන නැති වුවද, තම පන්තියේ හැඟීම් පැහැදිලිව ප්‍රකාශ කරන මේ තරුණයන් ඔහුට රිසි විය. හැම තරුණයෙක්ම සංහාරයෙන් යුදෙව්වන් බේරා ගැනීම පිණිස

මහත් ඕනෑ කමින් එයට සහාය දුන්නේය. එදින සවස ඔහු ඔවුනට බෝල්ෂෙවික්වාදීන් ගැනද, ලෙනින් ගැනද බොහෝ දේ කියා දෙමින් සිද්ධීන් පිළිබඳ නියම අවබෝධයක් ලබා දීමට සහාය දුන්නේය.

හවස ඇඳිරි වැටුණු පසු පාවෙල් තම අමුත්තන් කැටුව ගියේය.

සවස පිටව යන ෂුක්රායි රෑ වුණු පසු ගෙදර ආවේය. ඔහු නගරයෙන් පිටත්ව යාමට පෙර නැවතුණු සහෝදරයන් සමඟ පක්ෂයේ වැඩ ගැන කතා කර ගත්තේය.

එදින රෑයෙහි ෂුක්රායි ගෙදර ආවේ නැත. උදේ අවදි වූ පාවෙල් ෂුක්රායිගේ ඇඳ හිස්ව තිබෙන සැටි දිටීය.

යම් කිසි නොපැහැදිලි ඉවක් දැනුණෙන් පාවෙල් කෝර්චාගින් හණික ඇදගෙන ගෙදරින් පිට විය. ගෙදර දොර අගුළු දමා යතුර තිබිය යුතු තැන තබා, ඔහු ක්ලීම්කා සොයා ගෙන ගියේ ප්යොදර් ෂුක්රායි පිළිබඳ යම් කිසි තොරතුරක් දැන ගැනීම පිණිසය. මිටි ස්ත්‍රියක් වූ ක්ලීම්කාගේ මවගේ මුහුණ පුළුල්ය. එය වසුරිය කැළැල්වලින් ගහනය. ප්යොදර් පිළිබඳ කිසිවක් දන්නේ දැයි කෝර්චාගින් ඇසූ ප්‍රශ්නයට රෙදි සෝදමින් සිටි ඈ කෙටියෙන් පිළිතුරු දුන්නාය.

"දැන් මට තියෙන එකම කාරිය නුඹගේ ප්යොදර් ගැන හොයන්නද? ඒ යක්ෂයා හන්දා සසුලිහාලොගේ ගෙදර බඩු මුට්ටු ඔක්කොම පෙරළලා දාලා. නුඹට ඔහු ඕනෑ මොනවාටද? නුඹලාගේ කණ්ඩායමේ තේරුම කුමක්ද? හැබෑ යාළුවකු හොයාගෙන ක්ලීම්කා, නුඹ... "ඈ දැඩි ලෙස තෙත රෙද්දක් මිරිකුවාය.

ක්ලීම්කාගේ මව කටකාරියකි.

පාවෙල් ක්ලීම්කාගේ ගෙදර සිට සිරියෝෂාලාගේ ගෙදරට ගියේය. හේ ඔහුට තම හැඟීම් ගැන කීවේය. වාල්යා කතාවට මැදිහත් වූවාය.

"නුඹ බය වෙන්නෙ මොකටද? ඔහු සමහර විට අඳුනන කෙනෙකුගේ ගෙදර නවතින්ට ඇති." එහෙත්, ඇගේ හඬෙහි ස්ථිර බවක් නොතිබිණි.

බ්රුෂ්ෂාක්ලාගේ ගෙදර සිටීමට පාවෙල්ට බැරි වූයෙන්, දහවල් ආහාරය ගැනීමට නවතින ලෙස ඉල්ලා සිටියද, එයද නොතකා ඔහු එතැනින් පිට විය.

ඔහු ගෙදර පැමිණියේ ෂුක්රායි දැකීමේ මහත් බලාපොරොත්තුවෙනි.

ගෙය යතුරු ඉබ්බෙකු දමා වසා තිබිණි. දොම්නස මුසු හැඟීමකින් යුතුව ඔහු නැවතුණේ පාළු ගෙදරට යාමට අකැමැති වූ නිසාය.

විනාඩි කිහිපයක් තිස්සේ ඔහු කල්පනා කරමින් ගෙවත්තේ නැවතී සිට කිසියම් නොපැහැදිලි හැඟීමකින් යුතුව මඩුව දෙසට පියවර නැඟීය. මඩුවේ යට වහලේ බැඳී තිබුණු මකුළු දැල් කඩා දමා එක් මුල්ලක, රෙදි කැබැල්ලක ඔතා සඟවා තිබුණු 'මන්ලීහර්' පිස්තෝලය ගත්තේය.

මඩුවේ සිට දුම්රියපොළ දක්වා ගමන් ගත්තේ සාක්කුව තුළ බරැති පිස්තෝලයක් තිබෙතියි යන හැඟීමෙනි.

ෂුක්රායි ගැන කිසිදු ආරංචියක් දැන ගැනීමට ඔහුට බැරි විය. නැවත ගෙදර යන ගමන් ඔහු වනාරක්ෂක නිලධාරියාගේ බංගලාව අසලදී ගමන් වේගය අඩු කළේය. නොපැහැදිලි බලාපොරොත්තුවකින් යුතුව ඔහු බංගලාවේ ජනේලයෙන් එබී බැලුවේය. එහෙත්, බංගලාවේ සහ වත්ත පාළු විය. බංගලාව පසු කර ගිය ඔහු පසු ගිය වසරේදී බිම වැටී දිරාපත් වූ කොළවලින් වැසී ගත් වත්තේ අඩි පාර දෙස බැලීය. සැලකිලිමත් ගෘහාධිපතිගේ අත් ඒවා අල්ලා නැති බව පෙනෙන්නට තිබිණි. පැරැණි විශාල ගෙයක් වූ මෙහි ජනයා රහිත වීම නිසල බව නිසා ඔහුගේ දොම්නස වැඩි විය.

ඔහු අවසාන වරට තෝන්යාගෙන් වෙන් වීම ඊට පෙර සිදු වූ එවැනි දේවල්වලට වඩා බරපතළ විණි. එය හිටිහැටියේ ම මීට මසකට පෙර සිදු වූවකි.

පිස්තෝලය සාක්කුවේ දමාගෙන නගරය දෙසට සෙමින්, සෙමින් පා තබන පාවෙල් එම වෙන්වීම ඇති වූ හැටි සිහියට නගා ගත්තේය.

මහ මඟදී අහම්බෙන් ඔහු හමු වූ තෝන්යා ඔහුට ගෙදර එන ලෙස ඇයද සිටියාය.

"අම්මයි තාත්තයි බල්ෂාන්ස්කිලාගේ ගෙදර උපන් දින උත්සවයට යනවා. මම ගෙදර තනියම. පව්ලූෂා, ඔයා ගෙදර එන්න. ලියොනීඩ් අන්දේරේයෙව්ගේ 'සාෂ්කා ගුල්යොව්' කියවමු. ඒක බොහොම හොඳ පොතක්. මම දැනටමත් එය කියවා ඉවර කළා. ඔයත් එක්ක මම ආයෙමත් කියවන්නම්. අපි හවස හොඳින් ගත කරමු. එනවද?"

සුදු පැහැති හිස්වැස්මකින් වැසී ඇති දුඹුරු පැහැති හිසකේ ගොමුවට යටින් වූ ලොකු දෙනෙත් කෝර්චාගින්

දෙස බලාපොරොත්තු සහගත ලෙස බැලීය.

"මම එන්නම්."

ඔවුහු විසිර ගියහ.

ඔහු යන්ත්‍ර සහිත කාමරයට ගියේ තෝන්යාගේ සමාග මය සහිත සැන්දෑව ගැන සිතමිනි. දුව දඬු වඩාත් පැහැදිලිව ගිනි ගන්නාක් මෙනි. ගිනි පුපුරු වඩාත් සොම්නස් ලෙස හඬ නැඟුවාක් මෙනි.

එදින සවස ඔහු ඇගේ බංගලාවේ ඉස්සරහ දොරට තට්ටු කළෙන් තෝන්යා දොර හැරියාය. ඈ තරමක් ලජ්ජාවෙන් යුතුව කතා කළාය.

"අපේ ගෙදරට අමුත්තෝ ඇවිල්ලා. මම ඒ ගොල්ලන්ව බලාපොරොත්තු වුණේ නැහැ. පව්ලූෂා ඔයා පිටවී යන්ට එපා. "

කොර්චාගන් පිට වී යාමට සුදානම් විය.

"යමු" ඈ ඔහුගේ කමිස අතින් අල්ලා ගනිමින් කීවාය.

"ඔයාව හඳුනාගැනීම ඒගොල්ලන්ට ප්‍රයෝජනවත් වේවි." ඈ ඔහුගේ අතක් අල්ලා ගනිමින් ආහාර කාමරය හරහා ඇගේ කාමරයට ගියාය.

ඇගේ කාමරයට ගිය ඈ, එහි වාඩි වී සිටි තරුණ පෙළ අමතා මඳහස පාමින් මෙසේ පැවසුවාය:

"ඔයගොල්ල හඳුනාගෙන නැතිද? මේ මගේ මිතුරා පාවෙල් කොර්චාගින් "

කාමරය මැද තිබූ කුඩා මේසයක් වටා ඔවුහු වාඩි වී සිටිය හ. ලීසා සුහර්කෝ තලෙළු පැහැති යස එකියකි. ඇගේ කුඩා මුව දඟකාර බවක් කියා පෑවාය. කාන්තා විදුහලක ඉගෙන ගන්නා කෙල්ලකගේ හුරතල් මෝස්තරයක් අනුව ඇගේ හිසකේ පීරා තිබිණි. ඈ අසල පාවෙල් නාඳුනන හීන්දැරි තරුණයෙකි. ඔහු කහ පැහැති පිරිසිදු කබායක් ඇඳ සිටියේ ය. පොමාද ගා හිස පීරීම නිසා ඔහුගේ හිසකේ දිලිසිණි. අළු පැහැති ඔහුගේ දෙනෙත් කාන්සිය මුසු බැල්මක් හෙළී ය. ඔවුන් දෙදෙනා අතර වාඩි වී සිටියේ, නවීන පන්නයේ විදුහල් කබායකින් සැරසුණු වික්ටර් ලෙෂින්ස්කිය. තෝන්යා දොර හැරිය විගසම පාවෙල් ඔහු දුටුවේය.

ලෙෂින්ස්කි වහාම කොර්චාගින්ව හඳුනා ගත්තෙන්, ඊ වැනි ඔහුගේ බැම සඟළ හැකිළිණි.

පාවෙල් දොර අසල තත්පර කීහිපයක් නිහඬව සිටගෙන, දවනසුලු බැල්මකින් වික්ටර් දෙස බැලුවේය. එම අසීරු

නිහඬතාව බිඳීමට, තෝන්යා යුහුසුලු වූවා, කාමරය තුළට එන ලෙස පාවෙල්ට ආරාධනා කොට, ලීසා දෙසට හැරී කතා කළාය.

"අඳුනාගන්න."

කාමරයට ආ පුද්ගලයා දෙස කුතුහලයකින් බැලූ ලීසා සුහර්කෝ අඩක් නැඟිට වාඩි වූවාය.

පාවෙල් තීරණාත්මක ලෙස ආපසු හැරී අඩක් ඇදිරි කෑම කාමරය හරහා ඉක්මනින් පිටතට ගියේය. පසුපසින් දිව ගිය තෝන්යා ඔහුගේ උරහිසින් අල්ලා ගත්තේ ආලින්දයේදීය. ඈ කැලඹීමෙන් යුතුව කතා කළාය.

"ඔයා ගියේ මොකටද? මම ඒගොල්ලන්ට ඔයාව හඳුන්වා දුන්නේ උවමනාවෙන්මයි."

එහෙත්, පාවෙල් ඇගේ ග්‍රහණයෙන් උරහිස මුදාගෙන දැඩි පිළිතුරක් දුන්නේය.

"ඔය හැත්ත ඉදිරියේ මාව ප්‍රදර්ශනය කරන්න වුවමනා නැහැ, ඔය කට්ටිය එක්ක එකට ඉන්නට මට බැහැ. ඔයාට ඒගොල්ලා ප්‍රියමනාප වෙන්න පුළුවනි. මම උන්ට වෛර කරනවා. මම දැන සිටියේ නැහැ ඔයා උන් එක්ක යාළුවෙලා ඉන්නා බව, දැන ගෙන හිටියා නම් ඔයා බලන්ට මම කවදාවත් එන්නෙ නැහැ."

තෝන්යා මැඩගත් කෝපයෙන් යුතුව ඔහුට බාධා කළාය.

"මා සමඟ ඔහොම කතා කරන්ට ඔයාට අවසර දුන්නේ කවුද? ඔයා කා සමඟ යාළුවෙලා ඉන්නවද, ඔයාව බලන්ට එන්නේ කවුද කියලා මම අහන්නෙ නැහැ නේද?"

පාවෙල් ගෙවත්තේ පියගැටපෙළ ඔස්සේ බසිමින් දැඩි ලෙස මෙසේ කීයඃ

"ඒගොල්ල ආපුවාවේ. මම මින් පසු කවදාවත් එන්නෙ නැහැ."ඔහු ගේට්ටුව දක්වා දිව ගියේය.

එදා සිට ඔහු තෝන්යා නොදිටීය. පාවෙල් විදුලිබල ශිල්පියා සමඟ එකතුව විදුලි බලස්ථානය තුළ යුදෙව්වන් සඟවා තැබූ නිසා, සංහාර කාලය තුළදී, ඔහුට තෝන්යා ගෙන් වෙන්වීම ගැන අමතක වුවද, අද ඇය දැකීමට ඔහු තුළ ආසාවක් උපන්නේය.

ෂුක්රායිගේ අතුරුදහන් වීමද, ගෙදරදී ඔහුට මුණ ගැසෙන හුදෙකලා බවද විසින් ඔහු පැහීමකට හසු කෙරිණි. වසන්තයේ මඩ ගොහොරු තවම වේළී නැති වතුර වළවල්වල දුඹුරු පැහැති මඩ සහිත අළු පැහැති මහමඟ දකුණට හැරිණි.

අශෝභන ලෙස මහමඟට යාබදව පිහිටි, තට්ටු ගැලවී ගිය, දුඹුරු පැහැති බිත්තිය සහිත නිවසේ සිටි මාර්ග දෙකක් දෙපැත්තට විහිදී ඇත.

මංසන්ධියේ විනාශ කළ කුඩා කඩයකි. එහි දොර බිඳ දමලාය. එහි දැන්වීම් පුවරුවක් උඩු යටිකුරු කොට තබා ඇත. 'බනිජ මිශ්‍ර වතුර විකුණන ස්ථානය' යනුවෙන් ලියා ඇති එම පුවරුව අසලදී වික්ටර් ලෙෂීන්ස්කි, ලීසාගෙන් සමුගත්තේය.

ඇගේ අතක් අල්ලාගත් ඔහු, හැඟීම්බර බැල්මකින් ඇගේ දෙනෙත් දෙස බලා මෙසේ ඇසී ය:

"ඔයා එනවාද? රවටන්නෙ නැතිද?"

ලීසා කොමළ පා පිළිතුරු දුන්නාය.

"එනවා, එනවා, බලා ඉන්න."

පිටවී යන ඔහු දෙස බලා තම දුඹුරු පැහැති මලානික නෙත්වලින් ඈ බලාපොරොත්තු සහගත බැල්මක් හෙළුවාය.

පියවර දහයක් පමණ තැබූ ලීසා වංගුවේ සිට මහමඟට බට මිනිසුන් දෙදෙනකු දුටුවාය. එකෙක් පුළුල් උරතල හා විශාල පපුවකින් හෙබි මිටි කම්කරුවෙකි. ඔහුගේ කබායේ බොත්තම් වසා නැත. ඉරි සහිත බැනියමක් කබාය අතරින් පෙනේ. ඔහුගේ හිස සහ නළල වසා ඇති 'කැප්' තොප්පිය කළු පැහැතිය. දෙනෙත්වල තද නිල් පැහැති ලේ පැල්ලම්ය.

ඔහු යම්තම් දෙපා නවමින් දැඩි ලෙස ගමන් කරයි. ඔහු කහ පැහැති කෙටි පාවහන් දමාගෙන සිටියේය.

පියවර තුනක් පිටුපසින් ඔහුගේ පිටට බයිනෙත්තුවක් එල්ල කර ගත් පෙත්ල්යූරාගේ සෙබළෙක් ගමන් කරයි. අළු පැහැති කබායක් හැඳ සිටි ඔහුගේ ඉණ වටා වූ පටියේ කුඩා මලු දෙකකි.

ලොමින් කළ හිස් වැස්මට යටින් සිරහාරයට ගත් මිනිසාගේ හිස දෙසට එන්නා වූ සිහින්, පරීක්ෂාකාරී ඇස් දෙකකි. දුම්කොළ නිසා කහ පැහැගත් ඔහුගේ උඩු රැවුළ දෙපැත්තට විහිදී ගොසිනි.

ලීසා ගමන් වේගය මඳක් අඩු කොට මහ මඟ හරහා ගියාය. ඇය පසු පසින් මහමඟට බටුයේ පාවෙල්ය.

නිවස දක්වා ඇති මඟෙහි දකුණට හැරුණු ඔහු සිරකරුවා හා සෙබළා දිටීය.

ඔහුගේ දෙපා මහ පොළොවට ඇලුණාක් මෙනි. ඔහු ඉදිරියෙන් යන ෂුක්රායි හැඳින ගත්තේය.

"ඔහු ගෙදර නොපැමිණි හේතුව මෙයයි!"

ෂුක්‌රායි ඔහුට ළං විය. කොර්චාගින්ගේ හදවත වේගයෙන් සැලෙයි. අදහස් එකිනෙකට ගලා එන්නට විය. ඒවා අල්ලා වර්ධනය කළ නොහැකිය. තීරණයක් ගැනීමට ඇති වේලාව ඉතා අඩුය. එකක් නම් පැහැදිලිය. ෂුක්‌රායි විනාශ වන්නේය.

"කළ යුත්තේ කුමක්ද?"

අවසාන මොහොතේදී ඔහුට මතක් විය. සාක්කුව තුළ පිස්තෝලයකි. තමා ළඟින් යත්ම රයිපල් තුවක්කුව අතැති සෙබළාට වෙඩි තැබිය යුතුය. එවිට ප්‌යොදර් දුවනු ඇතැයි පාවෙල් සිතීය. ඒ හදිසි තීරණය නිසා අදහස් ගලා යාම නැවැතිණි. කැක්කුම හැදෙන තුරු හේ දත්මිටි කෑවේය. ප්‌යොදර් ඔහුට මෙසේ කීවේ ඊයේය. "මේ වගේ වැඩකට නිර්භීත සහෝදරවරුන් ඕනෑ..."

පාවෙල් හණිකට ආපසු හැරී බැලුවේය. නගරය දක්වා වැටී ඇති මඟ ජනයාගෙන් හිස්ය. එකද මිනිහෙකුවත් පෙනෙන්නට නැත. ඉදිරියෙන් හදිසි ගමනකින් පියවර නඟන ගැහැනියක පමණකි. ඈ වසන්ත කෙටි කබායක් ඇඳ සිටියාය. ඇය බාධා නොකරනු ඇත. මංසන්ධියෙන් ඈත දෙවැනි වීදිය ඔහුට නොපෙනෙයි. ඈත දුම්රියපොළට යන මඟෙහි මිනිසුන්ගේ රූ දිස්වේ.

පාවෙල් කොර්චාගින් මඟෙහි සීමාවට ගියේය. කොර්චාගින් තමාට පියවර කීපයකින් ළං වෙත්ම ෂුක්‌රායි ඔහු දිටීය.

හේ එක් ඇසකින් එදෙස බැලීය. ඝනැති බැම සඟළ නැටිණි. ඔහු හඳුනාගත් ෂුක්‌රායි බලාපොරොත්තු රහිතව නැවතිණි. සෙබළාගේ බයිනෙත්තු තුඩ ඔහුගේ සිරුරෙහි වැදිණි.

"ඒයි තෝ, අඩිය තියාපිය, නැතිනම් එක වෙඩි පාරයි!" සෙබළා ඇද පැද කීය. ෂුක්‌රායි පුළුල් ලෙස අඩි තැබීය. ඔහු පාවෙල්ට යමක් කීමට සැරසුණු නමුදු, එසේ නොකොට සංඥා කරන්නාක් මෙන් අතක් වැනීය.

රතු උඩු රැවුළකින් හෙබි සෙබළාගේ අවධානය තමා වෙත යොමු වෙතැයි බිය ගත් පාවෙල් ෂුක්‌රායිට තමා අසලින් යාමට ඉඩ හැර පැත්තකට හැරුණේ, සිදුවන දේ ගැන තමා උදාසීනත්වයක් දක්වන්නාක් මෙනි.

එහෙත්, අවදානම් සහිත හැඟීමක් හිස තුළට කා වදින්නට විය. "මම සෙබළාට වෙඩි තියලා. ඒ වෙඩි පහර ඔහුට නොවැදුණහොත්, එය ෂුක්‌රායිට වැදෙන්ට පුළුවනි..."

පෙත්ල්‌යූරාගේ සෙබළා ළඟ සිටින විට කල්පනා කළ

හැකිද?

අනතුරුව මෙසේ සිදු විය. රතු උඩු රැවුළා පාවෙල්ට ළංවෙත්ම, කොර්චාගින් හිටි හැටියේම ඔහු වෙත කඩා පැන තුවක්කුව උදුරා එක්වරම එය පොළොවේ ගැසීය.

බයිනෙත්තුව හඬ නඟමින් පොළොවේ වැදිණි.

බලාපොරොත්තු රහිත පහරදීම නිසා සෙබළා මොහොතකට පසු බැස්සද, වහාම මුළු වෙර යොදා තුවක්කුව උදුරා ගන්නට ඉදිරිපත් විය. තම සිරුරේ බර යොදමින් පාවෙල් තුවක්කුව අල්ලාගෙන සිටියේය. මේ පොරය නිසා තුවක්කුවෙන් වෙඩි හඬ පිට විය. වෙඩි උණ්ඩය ගල් පොළොවට වැදී අසල වූ කානුවට වැටිණි.

වෙඩි හඬ නිසා ෂුක්රායි පසෙකට පැන ආපසු හැරුණේය. සිරකරු ගෙන ගිය සෙබළා තම තුවක්කුව උදුරා ගැනීම නිසා වියරු වී පාවෙල්ගෙන් එය ආපසු ගැනීමට යුනුසුලු විය. තුවක්කුව ගෙන සිටින පාවෙල්ගේ දෑත් ඇඹරෙන ලෙස ඔහු තුවක්කුව කරකැවීය. එසේ වුවද, පාවෙල් තුවක්කුව අත් නොහැරියේය. එවිට වඩාත් කෝප වූ සෙබළා පාවෙල් බිම පතිත කළේය. තුවක්කුව මුදා ගැනීමට කළ එම සටන අසාර්ථක විය. මහ මඟ වැතිර සිටි පාවෙල් සෙබළා තමා වෙත ඇද ගත්තේය. එවැනි මොහොතකදී තුවක්කුව ඔහුගෙන් උදුරා ගැනීමට තරම් සමත් ශක්තියක් නොවීය.

පිම් දෙකකින් ෂුක්රායි සෙබළා වෙතට ළං විය. ෂුක්රායි තම අයෝමය අත කවාකාර ලෙස පියාඹා යවා සෙබළාගේ හිසට ගැසීය. මොහොතක් ගතවත්ම, ෂුක්රායි මෙතෙක් මහ මඟ වැතිර සිටි පාවෙල් කොර්චාගින්ගෙන් වෙන් කොටගත් සෙබළාට තද පහරවල් දෙකක් ගැසූවෙන්, ඔහු බරැති මල්ලක් සේ කානුවට වැටුණේය.

එම අත් විසින්ම පාවෙල් උස්සා නැඟිටිණි.

★ ★ ★

මංසන්ධියෙන් අඩි සියයක් පමණ ඈතට ගමන් කළ වික්ටර් ලෙෂීන්ස්කි 'රූමතියගේ හදවත පාවා දීමට නැඹුරු වේ' යන ගීතය උරුවම්බාමින් පා නැඟීය. ඔහු තවමත් ලීසා හමුවීමේ බලපෑමට යටත්ව සිටියේය. හෙට ඔහු හමුවීමට ඇය පරණ කම්හලට එනු ඇත.

කෙල්ලන්ට සලකන විදුහල් සිසුන් අතර තරුණියකගේ

ආලය පිළිබඳ ප්‍රශ්නවලදී ලීසා සුහර්කෝ නිර්භීත බවට ආරංචි පැතිරිණි.

උද්දච්ච, උඩඟු සෙම්යොන් සිලිවානොව් තමා ලීසා යටත් කර ගත් බව වරක් වික්ටර් පැවසීය. සෙම්යොන්ගේ කතාව සම්පූර්ණයෙන්ම වික්ටර්ට ලෙෂීන්ස්කි, විශ්වාස නොකළද, ලීසා සිත් ඇදගන්නාසුලු, රවටනසුලු තරුණියක නිසා, සිලිවානොව් කීවේ ඇත්තක්දැයි හෙට දැන ගැනීමට ඔහු තීරණය කළේය.

"එයා ආවොත් එහෙම මම තීරණාත්මක ලෙස ක්‍රියා කරනවා. ඇගේ මුහුණ සිපගන්නට ඈ ඉඩ දෙනවා. සෙම්යොන් බොරු නොකීවේ නම්..." ඔහුගේ කල්පිත ලෝකයට බාධා ඇති විය. පෙත්ල්යූරාගේ සෙබළුන් දෙදෙනෙකු යන නිසා ඔහු මඟ අයිනට විය. එක් සෙබළෙක් කොට වලිගයක් ඇති අසකු පිට නැඟී නොතෙමෙන කැන්වස් රෙද්දකින් කළ බාල්දියක් වනමින් ගියේය. අසුට වතුර දීමට විය යුතුය. අනිකා කෙටි උඩු කබායක් සහ නිල් පැහැති පළල් කලිසමක් ඇඳ, අසු පිටින් යන එකාගේ දණහිස අල්ලා ගනිමින් සතුටු සිතින් යමක් කියමින් ගමන් කළේය.

ඔවුනට යන්නට ඉඩ දී, වික්ටර් ඉදිරියට පියවර තබන්ට සැරසෙත්ම මහමඟ වෙඩි හඬක් ඇසුණෙන් ඔහු නැවතුණේ ය. අසරු සෙබළා වෙඩි හඬ ඇසුණු දෙසට අසු පන්නන සැටි වික්ටර් දිටීය. අසිපතක් අල්ලාගෙන අනික් සෙබළාද ඔහු අසලින් දිව ගියේය.

වික්ටර් ලෙෂීන්ස්කිද ඔවුන් පසු පසින් දුවන්නට වූ විට, තවත් වෙඩි හඬක් ඇසිණි. වීදියේ කොනක සිටි අසරු සෙබළා වික්ටර් ඉදිරියට ආවේය. ඔහු අසුගේ බඳයට දෙපයින් ගැසීය. තම අත තිබුණු කැන්වස් බාල්දියෙන්ද ගැසීය. ඔහු වත්තට පැන ගෙවත්තේ සිටි සෙබළුන් අමතා කෑගැසීය.

"සෙබළුනි, අවි ගනිල්ලා, අපේ අයව මරනවා! "

විනාඩියක් ගතවන්නට පෙර තුවක්කු ගත් සෙබළු කීපදෙනෙක් දිව ගියහ.

වික්ටර් සිරභාරයට ගත්තේය.

මහ මඟ ගියවුන් කීපදෙනෙකු සෙබළු අල්ලා ගත්හ. සාක්කිකරුවන් වශයෙන් ගත් මේ මිනිසුන් අතර ලීසාද වූවාය.

ඈ අසලින් ෂුක්රායි හා පාවෙල් කොර්චාගින් දිව ගිය විට ඈ නැවතුණේ බිය වූ බැවිනි. පෙත්ල්යූරාගේ සෙබළාට

පහර දුන් තරුණයා අන් කිසිවකු නොව, තමාට තෝන්යා විසින් හඳුන්වා දෙන ලද තරුණයාම බව ලීසා මවිතයෙන් යුතුව හඳුනා ගත්තාය.

කිසිවකුගේ බංගලාවකට අයත් වැටකට උඩින් එකිනෙකා පැන්නෝය. එකෙණෙහිම මහ මඟ ඔස්සේ අසුරු සෙබළෙක් ආවේය. තුවක්කකුවක් රැගෙන දුවන ෂුක්රායි සහ පහර කා බිම වැටී සිට යළි නැඟිටීමට උත්සාහ කරන පෙත්ල්යූරාගේ සෙබළා දුටු අසරුවා, අසු වැට දෙසට පැන්නීය.

ෂුක්රායි ආපසු හැරී තුවක්කුවෙන් අසරුවාට වෙඩි තැබීය. අසරුවා සැණෙකින් අසු හරවාගෙන ආපසු ගියේය.

පෙත්ල්යූරාගේ සෙබළා යම්තමින් දෙතොල් සොලවමින් සිදු වූ දේ අසරුවාට කීවේය.

"නුඹ හැබෑ මෝඩයෙක්, අල්ලගත්ත හිරකරුව යන්ට හැරියද? දැන් ඉතින් නුඹේ පස්සා පැත්තට කස පහරවල් විසිපහක් ලැබේවි."

සිරභාරයට වැටුණු ෂුක්රායි ගෙන ගිය සෙබළා කෝපයෙන් කතා කළේය.

"මට පේනවා නුඹ හැබෑ නුවණක්කාරයෙක්. අතට අහුවුණු එකාව යන්ට ඇරියා. අර වගේ යකෙක් මගේ ඇඟට කඩා පනීවි කියලා මම දන්නෙ කොහොමද?"

ලීසාගෙන්ද ප්‍රශ්න කෙරිණි. ෂුක්රායි ගෙන ගිය සෙබළා කී දෙයම ඈද කී නමුදු, පහර දුන් පුද්ගලයා දන්නා බව නොකීවාය. ඔවුන් හැම දෙනාම යුද්ධ නිලධාරියාගේ කාර්යාලයට ගෙන යන ලදි.

හවස නිලධාරියාගේ අණ අනුව පමණක් ඔවුන් නිදහස් කළේය.

ලීසාව ගෙදර ගෙනගොස් ඇරලීමට පවා නිලධාරී තැන ඉදිරිපත් වූ නමුදු, ඈ එය ප්‍රතික්ෂේප කළාය. නිලධාරියා වෙතින් වොඩ්කා ගඳක් වහනය වූයෙන්, ඔහුගේ යෝජනාවෙන් කිසිදු යහපතක් වීමට ඉඩ නොතිබිණි.

ලීසා ගෙදර හැරලීමට වික්ටර් ආවේය.

දුම්රියපොළ කරා යාමට සෑහෙන දුරක් ගෙවිය යුතු බැවින්, ලීසාගේ අතක් අල්ලාගෙන ගමන් කළ වික්ටර් සිදු වූ දේ නිසා සතුටු විය.

"ඔබ දන්නවාද, හිරකරුවාව නිදහස් කළේ කවුදයි කියලා?" නිවසට ළං වන විට, ලීසා ඇසුවාය.

"නැහැ. මම කොහොම දැනගන්නටද!"

"ඔබට මතකද දවසක්දා හැන්දෑවක තෝන්යා අපට තරුණයකුව හඳුන්වා දෙන්ට හැදුවා?"

වික්ටර් නැවතුණේය.

"පාවෙල් කොර්චාගින්ව නේද?" ඔහු මවිතව ඇසීය.

"ඔව්, මටත් මතක හැටියට කොර්චාගින් තමයි ඔහුගේ වාසගම. මතකද එදා ඔහු පුදුම විදිහට වෙන් වී ගියා. එයා තමා"

වික්ටර් පුදුමයට පත්ව සිටගෙන උන්නේය.

"ඔබට වැරදුණේ නැතිද?" ඔහු ලීසාගෙන් ඇසීය.

"නැහැ. මට ඔහුගේ මුහුණ හොඳට මතකයි."

"එහෙනම් ඇයි ඔබ නිලධාරියාට ඒ ගැන නොකීවේ?" ලීසා කෝප වූවාය.

"එවැනි නීච වැඩක් මට කරන්න පුළුවන් කියලා ඔබ හිතනවද?"

"එය නීච වැඩක් වන්නෙ කොහොමද? සිරකරුවාව ගෙන ගිය සෙබළාට පහර දුන් පුද්ගලයා ගැන දැන්වීම ඔබ හිතන හැටියට නීච වැඩක්ද?"

"ඔබ හිතන හැටියට එය අවංක වැඩක්ද?" ඔවුන් කරන දේ ඔබට අමතක වෙලා. විද්‍යාලේ ඉගෙන ගන්න යුදෙව්වන් කී දෙනෙකුව ඔවුන් අනාත කළාද? ඔවුන්ට මම කොර්චාගින් ගැන කියනවට ඔබ කැමතිද? ඔය විදිහට මම ඔබ ගැන හිතුවේ නැහැ. බොහොම ස්තුතියි."

වික්ටර් ලෙෂීන්ස්කි එවැන්නක් බලාපොරොත්තු නොවීය.

ඔහු ලීසා සමඟ අමනාප වීමට සූදානම් නැත. ඔහු අන් දෙයක් ගැන කතා කිරීමට උත්සුක විය.

"ලීසා ඔබ තරහවෙන්ට එපා. මම විහිළු කළා. ඔබ ඔය තරම් ප්‍රතිපත්තිගරුක බව මා දැන සිටියේ නැහැ."

"ඔබගේ විහිළුව බොහෝම කැතයි." ලීසා වියළි ලෙස පිළිතුරු දුන්නාය.

සුහර්කෝලාගේ නිවස අසලටම පැමිණි වික්ටර් ඇගෙන් සමුගනිමින් විමසුවේය.

"ඔබ එනවාද ලීසා?"

"දන්නෙ නැහැ."

ඇගේ අස්ථිර පිළිතුර ඇසිණි.

නගරය දෙසට යමින් වික්ටර් කල්පනා කරන්නට විය. "තරුණ නෝනා ඔබ හිතනවා නම් එය නීච වැඩක් කියලා, මගේ හැඟීම් එයට සම්පූර්ණයෙන් වෙනස්. සත්තකින්ම

කවුරුත් කාව මුදාගත්තත් මට ඇති වැඩක් නැහැ."

ලෙෂීන්ස්කි පෝලන්ත රදල පෙළැන්තියෙන් පැවත එන වික්ටර්ට මේ දෙගොල්ලම එක සේ නොරිසි විය. කෙසේ වුවද ඉක්මනින්ම පෝලන්තයේ ලීජන් හමුදා මෙහි එනු ඇත.

එවිට සැබෑ රදලවාදී රෙච් පෝස්පෝලිට් රජයක් පිහිටවනු ඇත. එහෙත්, දැන් මේ මොහොතේදී තක්කඩි කොර්චාගින්ව විනාශ කර දැමීමට හොඳ අවස්ථාවක් පැමිණ තිබේ. ඔවුන් ඔහුගේ බෙල්ල කඩා දමනු ඇත.

වික්ටර් නගරයේ සිටියේ තනිවමය. ඔහුගේ නැන්දාගේ ගෙදරය. ඈ සීනි කම්හලේ උප අධ්‍යක්ෂගේ බිරිඳය. අම්මා, තාත්තා සහ නෙලී වොසෝ නගරයට ගොසින් දැන් බොහෝ කල්ය. සිග්ස්මූන්ඩ් ලෙෂීන්ස්කි එහි උසස් නිලයක් දරයි.

යුද්ධ නිලධාරියාගේ කාර්යාලයට ගිය ඔහු පුළුල් ලෙස විවර වූ දොරින් ඇතුළු විය.

ටික වේලාවකට පසුව ඔහු පෙත්ල්යුරාග් හමුදාවේ සෙබළුන් හතර දෙනෙකු කැටිව කෝර්චාගින්ලාගේ නිවෙස දෙසට ගමන් කළේය.

ආලෝකයක් සහිත කවුළුවක් පෙන්වූ ඔහු සෙමින් මෙසේ පැවසීය:

"මෙන්න මෙතන." අසල සිටි නිලධාරියකුගෙන් ඔහු විමසීය. "මට යන්න පුළුවනිද?"

"කරුණාකරලා යන්ට. අපට පුළුවනි තනිවම වැඩේ කරන්ට. කළ සේවයට බොහොම ස්තුතියි."

වික්ටර් ඉක්මනින් පදික වේදිකාව ඔස්සේ ගමන් කළේය.

පාවෙල් අවසාන පහර පිට හරහා කෑවෙන් තමා ගෙනත් දමා ඇති ඇඳිරි කාමරයේ බිත්තියට දෑත් එසවීය. බිත්ති ඇඳන් වැනි යමක් ඔහුගේ දෑතට දැනුණේන් ඔහු වාඩි විණි. ඔහු වධ හිංසාවලටද, ගුටි බැටවලටද, පෑගීම්වලටද භාජන විය.

ඔහු බලාපොරොත්තු නොවූ වෙලාවක, ඔහු සිරභාරයට ගත්තේය. "පෙත්ල්යූරාගේ සෙබළුන් ඔහු ගැන දැනගත්තේ කොහොමද? කිසිවෙක් ඔහු නොදුටුහ. දැන් ඉතින් මොනවා වේද? ෂුක්රායි කොහෙද?"

ඔහු නාවිකයාගෙන් සමුගත්තේ ක්ලීම්කාගේ ගෙදරදීය. පාවෙල්, සිරියෝෂා හමුවීමට ගිය අතර, නගරයෙන් පැන යනු වස් ෂුක්රායි හවස් වනතුරු බලා සිටියේය.

"කාක්කා කුඩුව ඇතුළේ මම පිස්තෝලය හංගපු

එක හොයාගත්තා නම් මම ඉවරයි. නමුත්, දැනගත්තේ කොහොමද?" එම ප්‍රශ්නය ඔහුගේ සිත සීමා රහිත ලෙස පීඩා කළේය.

පෙත්ල්යූරාගේ සෙබළුන්, කොර්චාගින්ලාගේ දේපළවලින් කොල්ලකෑවේ ටිකකි. ඇඳුම් කට්ටලය හා ඇකෝඩියනය අයියා ගමට ගෙන ගියේය. අම්මා කුඩා පෙට්ටගම ගෙන ගියාය. කාමරයේ අහුමුලුවල සෙවූ පෙත්ල්යූරාගේ සෙබළුන්ට සොයාගත හැකිවූයේ ඉතා සුළු සංඛ්‍යාවකි.

එසේ වුවද, පාවෙල්ට ගෙදර සිට යුද්ධ නිලධාරියාගේ කාර්යාලය දක්වා ගමන් ගත් මඟ අමතක නොකළ හැකිය. රැය කළුවරය. ඇහැට ඇන්නත් නොපෙනේ. අහස වලාකුළුවලින් පිරිලාය. ඔහු හැමැතැනින්ම ඇද්දේය. පස්සට පා පහර දුන්හ. ඔහු ගමන් කළේ හැඟීමෙන් තොරවය. ඔහු හැඟීම් රහිත තත්ත්වයක පසු විය.

දොරින් එහා කටහඬවල් ඇසිණි. අල්ලපු කාමරයේ නිලධාරියාගේ ආරක්ෂක කණ්ඩායමය. දොරට යටින් ආලෝකයකි. කොර්චාගින් නැඟිට බිත්තිය අත ගාමින් කාමරය වටේ ගමන් කළේය. බිත්ති ඇඳන්වලට විරුද්ධ පසින් ඇති ජනේලයට ශක්තිමත් යකඩ පොලු සවිකොට ඇත. එය දැති සහිත යකඩ වැටකි. අතගා බැලූ විට, එය ශක්තිමත් ලෙස සාදා ඇති බැව් පෙනිණි. මෙතැන මීට පෙර ගබඩාවක් වූ බැව් සිතිය හැකිය.

දොර ළඟට පැමිණි පාවෙල් කන් යොමා ගෙන විනාඩියක් නැවතී සිටියේය. ඉක්බිති ඔහු දොර සෙමින් තල්ලු කළේ ය. දොරින් අමිහිරි හඬක් පිට විය.

"කාලකණ්ණි සරනේරුවලට තෙල් දමා නැහැ!" පාවෙල් බැණ වැදුණේය.

ඇරුණු හිඩස්ස අතරින් ඔහු බිත්ති ඇඳක් අයිනේ ඇති කිසිවෙකුගේ කකුලක් දිටීය. එය ගොරහැඩිය, එහි ඇඟිලි හැම අතටම විහිදී ගොසිනි. තවත් වරක් දොර සෙමින් හැරිය විට එය වඩාත් ලොකු හඬක් නැඟීය. බිත්ති ඇඳක සිට නිදි-බර අවුලු හිසක් සහිත සේයාරුවක් පෙනිණි. ඔහු උකුණන්ගෙන් පිරි හිස දැඩි ලෙස කසා, වචන ගොඩක් ඇද බෑවේය. කම්මැළි ඒකතානමය හඬකින් කුණුහරුප ගොඩක් ඇද බෑ පසු, ඔහු හිස ළඟ ඇති තුවක්කුව අත ගා, අලස ලෙස මෙසේ කීවේය:

"දොර වහපිය. තෝ ආයෙමත් මා දිහා බැලුවොත් තොට

විදිවි..."

පාවෙල් දොර වැසීය. යාබද කාමරයේ මිනිස්සු හඬ නඟා සිනාසුණහ.

පාවෙල් එදින රැයෙහි බොහෝ සේ කල්පනා කළේය. සටන් කිරීමට දරු පළමුවැනි ප්‍රයත්නයේදීම කොර්චාගින් අවාසනාවට මුහුණ පෑවේය. මුල් පියවර තැබූ විගසම ඔහු මියකු අල්ලා කූඩුවට දමන්නාක් මෙන් සිර කෙරිණි.

ඔහු අවදානම් සහිත අඩ නින්දේ, අඩ සිහියෙන් පසු වන විට රැලි වැටුණු කෙට්ටු මුහුණද, හොඳින් අඳුනන දෙනෙත්ද, සහිත මවුගේ සේයාව ඔහු ඉදිරියේ මැවී පෙනිණි.

"ඇය නොසිටීම බොහොම හොඳා. දුක අඩුයි." යන අදහස ඔහුගේ මනසෙහි පාවෙන්නට විය.

කවුළුවේ සිට බිමට වැටුණු සේයාව අළු පැහැති හතරැස් කොටුවකට සමාන ඇඳිරි ආලෝකයක් ඇති කළේය.

අඳුර කෙමෙන් පසු බසින්නට වී අරුණෝදය ළං විය.

VI

විශාල, පැරණි ගෙයි, රෙදි තිරයකින් වැසූ එක් කවුළුවකින් පමණක් පහන් එළියක් පෙනිණි. ගෙවත්තේ බැඳ තබා ඇති බල්ලා - ට්‍රෙසෝර් ගොරෝසු හඬකින් බුරයි.

නින්දෙන් තෝන්යාට මවුගේ නොඇස් කට හඬ ඇසෙයි.

"නැහැ. ඈ තවම නිදි නැහැ. කාමරය ඇතුළට එන්න. ලීසා."

සැහැල්ලු ගමනද, යෙහෙළියන්ගේ සුරතල්, කෙටි වැලඳ ගැනීම්ද නිසා නිදිමත දුරු විය.

තෝන්යා විඩාපත් ලෙස මඳහස පෑවාය.

"හොඳයි, ලීසා ආපු එක. අපේ ගෙදර සතුටක්. ඊයේ තාත්තාගේ රෝගය හොඳ අතට හැරුණා. අද ඔහු මුළු දවස තිස්සේම සැපෙන් නිදාගන්නවා. දවස් කීපයක් නිදි මරලා මායි අම්මයි විවේක ගත්තා. ලීසා කියන්නකෝ මොනවද අලුත් ආරංචි" තෝන්යා තම යෙහෙළිය සෝපාවට ඇද ගත්තාය.

"ආරංචි මහ ගොඩක්. ඒවායින් කොටසක් මට කියන්ට පුළුවන් ඔයාට විතරයි." මෙසේ පැවසූ ලීසා දඟකාරී සිනාවකින් මුව සරසාගෙන යෙක්කැතරීනා මිහයිලොව්නා දෙස බැලුවාය.

තෝන්යාගේ මවු සිත් ඇදගන්නාසුලු කතකි. ඇගේ වයස

අවුරුදු තිස් හයක් වූවද,ක්‍රියාකාරීත්වය අනුව ඈ තරුණියකට සමානය. අළු පැහැති ඇගේ දෙනෙත් බුද්ධිමත් බවක් කියා පෑවාය. ලස්සන නොවන නමුදු, දකුම්කලු මුහුණේ මඳ සිනාවකි. "මම බොහොම සතුටින් නුඹලා දෙදෙනාට කතා කරගැනීමට ඉඩ දීලා යන්නම්. තව විනාඩි කීපයකට පස්සේ. දැන් ඉතින් පොදුවේ අහන්ට පුළුවන් ආරංචි කියාපල්ලා" මෙසේ විසුළු කළ තෝන්යාගේ මව සෝපාව සමීපයට පුටුව තල්ලු කළාය.

"පළමුවැනි ආරංචිය," අපි මීට වැඩියෙ ඉගෙන ගන්නෙ නැහැ. පාසලේ පාලක මණ්ඩලය හත්වැනි පන්තිය සමත් කළ අයට සහතික දීමට තීරණය කළා. මම නම් බොහොම සතුටුයි." ලීසා උනන්දුවකින් කතා කළාය. "ඔය වීජ ගණිතයයි, ජ්‍යාමිතියයි මට නම් එපා වෙලා!" ඕවා ඉගෙන ගන්නේ මොකටද? කොල්ලෝ නම් සමහර වෙලාවට තවත් දුර ඉගෙන ගනීවි. ඒ වුණාට කොහෙද කියලා ඒගොල්ලො දන්නෙ නැහැ. හැම තැනම යුද පෙරමුණු, සටන් භයානකයි. අපව දීග දේවි. අඹුවකගෙන් වීජ ගණිතය අහන්නෙ නැහැ නෙව." මෙසේ පැවසූ ලීසා හඬ නඟා සිනාසුණාය.

තරුණියන් සමඟ තරමක් වේලා වාඩි වී සිටි තෝන්යාගේ මව යෙක්කැතරීනා මිහයිලොව්නා තම වැඩවලට ගියාය.

ලීසා, තෝන්යාට තවත් ළං වූවා. ඇය වැලඳගෙන මංසන්ධියේ ඇති වූ සටන ගැන පහත් හඬින් විස්තර කළාය.

"දුවන තරුණයාව හඳුනාගන්නට පුළුවන් වුණ හැටියෙම, මම පුදුම වුණ හැටි ඔයා දන්නවා නම් තෝන්යා... කවුරු කියලද ඔයා හිතන්නෙ ?"

තෝන්යා මහත් කුතුහලයකින් යුතුව ඇගේ කතාව අසන්නී. කිසිවක් වටහාගත නොහී දෙවුර සෙලවූවාය.

"කොර්චාගින් !"ලීසා එක වර කීවාය.

තෝන්යාගේ කැලඹීම නිසා සතුටු වූ ලීසා වික්ටර් සමඟ ඇති වූ බහින්බස්වීම ගැන විස්තර කළාය.

කතාවට හිත කය දෙක යොමු කළ ලීසා, තෝන්යා තුමානොවාගේ මුහුණ මලානික වූ සැටිද, ඇගේ සිහින් ඇඟිලි නිල් හැට්ටය කඩින් කඩ අල්ලන සැටිද නොදුටුවා ය. තෝන්යාගේ හදවත අවදානමින් මිරිකෙන සැටිද, ඇගේ සුන්දර දෙනෙත්වලට ඉහළින් ඇති ඝනැති බැම සඟළ නොසන්සුන්ව හැකිළෙන්නේ මන්ද යන්න ගැනද ලීසා නොදත්තාය.

මැත්පැන් බීගත්, යුද්ධ නිලධාරියා පිළිබඳ කතාව තෝන්යාට නැසේ. ඇගේ හිතෙහි එකම අදහසකි: "පහර දීම ගැන වික්ටර් ලෙෂීන්ස්කි දන්නවා. ලීසා ඔහුට ඒ ගැන කීවේ මන්ද?" ඈ නොසිතාම අවසන් වැකිය හඬ නඟා කීවාය.

"මම මොනවද කීවේ?" ලීසාට තේරුම් ගැනීමට බැරි විය.

"ඔයා ඇයි ලෙෂීන්ස්කිට පව්ලූෂා ගැන, ඒ කියන්නෙ කොර්චාගින් ගැන කීවේ? ඔහු එයාව පාවා දේවි..."

ලීසා විරුද්ධ වූවාය.

"අනේ නැහැ! මා හිතන්නෙ නැහැ. ඔහු අවසාන වශයෙන් එවැනි දෙයක් කරන්නෙ මොකටද?"

තෝන්යා විටින් විට වාඩිවී, දෑත් රිදෙනතුරු මිට මෙළවූවාය.

"ලීසා ඔයාට මොනවාවත් තේරෙන්නෙ නැහැ! වික්ටර් කොර්චාගින්ගේ හතුරෙක්. ඒකට තවත් දෙයක් එකතු වෙලා තියෙනවා... පව්ලූෂා ගැන ඔයා වික්ටර්ට කීමෙන් කළේ බලවත් වරදක්."

තෝන්යාගේ කැලඹීම ලීසාට දැනුණේ මේ දැන්ය. පාවෙල් වෙනුවට 'පව්ලූෂා' යන ආදර වචනය අහම්බෙන් ඇගේ කටින් පිටවීම නිසා, මිට පෙර යම්තමින් අනුමාන වශයෙන් කළ නිගමනය පැහැදිලි විය.

තමා වරදකාරියෙකැයි යන හැඟීම ඉබේම ඇතිවීම නිසා ලීසා ලැජ්ජාවකින් නිහඬ වූවාය.

"එහෙනම් ඒක ඇත්ත තමා." ඕ සිතුවාය. "හිටි හැටියේ තෝන්යා ප්‍රිය සමාගම් පවත්වන්නේ කා සමඟද? සාමාන්‍ය කම්කරුවකු සමඟ..." ඇයට ඒ ප්‍රශ්නය කතා කිරීමට මහත් ඕනෑකමක් ඇති වූවද, මුදු හැඟීම් නිසා එය මැඩ පවත්වා ගත්තාය. තම වරද තුනී කර ගැනීමට වෑයම් කළ ඈ තෝන්යාගේ අතක් ගත්තාය.

"තෝන්යා ඔයා බොහොම කැලඹිලාද?"

තෝන්යා මඳ කල්පනාවකින් මෙන් පිළිතුරු දුන්නාය.

"මා ඔහු ගැන හිතනවාට වඩා වික්ටර් අවංක වේවි කියලා සමහර විට හිතන්නට පුළුවනි."

ඉක්මනින්ම ඔවුන් සමඟ එකම පන්තියක ඉගෙන ගන්නා චාම්, තරමක් අදක්ෂ දිමියානොව් පැමිණියේය.

ඔහු පැමිණෙන තුරුම තරුණියන් අතර කතාබහ නිසි ලෙස නොවිණි.

සගයන් හැර ලූ පසු තෝන්යා තනිව බොහෝ වේලාවක්

උන්නාය. ගෙවැටෙහි ගේට්ටුවට පිට දී සිට ගත් ඈ, නගරය දක්වා වැටී ඇති මහමඟ වූ අඳුරු පලස දෙස බලා ගෙන සිටින්නීය. රුස්තියාදුකාරයකු සේ හැමතැනම යන වසන්තයේ නැවුම් සුවඳ මුසු, ශීතල, තෙතමනය සහිත සුළඟ ඈ ආශ්වාස කළාය. ඈත පිහිටි නාගරික බංගලාවල කවුළු අහිතකර නොපැහැදිලි රතු එළියකින් ආලෝකවත් වී ඇත. තමන්ගේ නොවන ඒ කුඩා නගරය එතැන පිහිටියේය. ඒ නගරයේ එක් පියස්සක් යට, අවදානම ගැන නොදන්නා ඔහු, ඇගේ කැරැලිකාර මිතුරා සිටී. සමහරවිට ඔහු ඇය ගැන අමතක කොට ඇත. ඔවුන්ගේ අවසාන හමුවීමෙන් ඉනික්බිතිව දවස් කීයක් ගෙවී ගියේද? එදා ඔහු නිවැරැදි නොවීය. දැන් එය අමතක වී බොහෝ කල්ය. හෙට ඈ ගොස් ඔහු හමු වනු ඇත. එවිට කැලඹීගත්, සුහද මිත්‍රත්වය යළි ඇතිවන්නේය. එම මිත්‍රත්වය යළි ඇති වන බව තෝන්යා දනී. මේ රැය පමණක් පාවා නොදිය යුතුය. රැය යම් කිසි අහිතකර බවක්, සැඟවී ගත් බලා සිටින බවක් පෙන්වයි... එය ශීතලය.

අවසාන වරට මහමඟ දෙස බැලූ තෝන්යා ගෙදර ආවාය. ඇඳට වී උණුසුම් පොරෝණයක් පොරවාගෙන මෙසේ සිතමින් නිදන්නට වූවාය. මේ රැයෙහි දී පාවා දීම ඇති නොවේවා!...

අනික් අය ගෙදර නිදා සිටින විට, හිමිදිරි පාන්දර තෝන්යා අවදි වී ඇඳ ගත්තා ය. කිසිවකු අවදි නොකරන සේ හෙමිහිට, ගෙවත්තට පැමිණි ඈ ලොමින් වැසීගත් ට්‍රෙසෝර් නමැති බල්ලාවත් රැගෙන නගරයට ගියාය. කෝර්චාගින්ලාගේ ගේ ඉදිරිපිට ඈ මොහොතකට නැවතුණේ තීරණයක් නොගත හැකි බැවිනි. අනතුරුව ගෙවැටෙහි කඩුල්ල හැර ගෙවත්තට ආවාය. ට්‍රෙසෝර් වලිගය වනමින් ඉදිරියෙන් දිව්වේය...

එදිනම හිමිදිරි උදෑසනින් ගමේ සිට අර්ටියොම් ගෙදර ආවේය. ඔහු තමා වැඩ කරන කම්හල්කරු සමඟ පැමිණියේ ගැලකිනි. වැටුප් වෙනුවට ලබාගත් පිටි මිටියකුත් කර තබාගෙන අර්ටියොම් ගෙවත්තට ආවේය. ඔහු පසුපසින් කම්මල්කරුවා ඉතුරු දෑ ගෙනාවේය. විවර වී ඇති දොර අසල සිටගත් අර්ටියොම් පිටි මිටිය බිම තබා හඬ නැඟීය.

"පාව්කා !"

එහෙත් පිළිතුරක් නොලැබිණි.

"ගේ ඇතුළට ගෙනියපන්, බලා ඉන්නෙ මොකද!"

කම්මල්කාරයා කීය.

ගෙනා දෑ කුස්සියේ තැබූ අර්ටියොම් කාමරයට පිවිසියේය. එහි දී දුටු දේ නිසා ඔහු අන්දමන්ද විය. ගෙයි හැම දෙයක්ම උඩු යටිකුරු කොට පෙරළා ඇත. පරණ රෙදි කෑලි හැමතැනම විසි කරලාය.

"හරි යකෙක් නෙව!" කිසිවක් වටහා ගැනීමෙහි අපොහොසත් අර්ටියොම් කම්මල්කරු වෙත හැරී පැවසීය.

"ඔව්. අවුල් ගොඩක්." ඔහු පිළිතුරු වශයෙන් කීය.

"කොල්ලා කොහේ ගියාද?" අර්ටියොම් රොස්වෙමින් ඇසීය.

එහෙත් ගෙය හිස්ය. ඇසීමට කිසිවකු හිටියේ නැත. කම්මල්කරුවා සමුගෙන පිට විය.

අර්ටියොම් ගෙවත්තට විත් හැම තැනම බලන්නට විය.

"මොකක්ද මේකෙ තේරුම. මට නම් තෝරාගන්නට බැහැ. ගෙයි දොර ඇරලා. පාච්කා නැහැ."

ඔහුට පිටුපසින් අඩි ශබ්දයක් ඇසුණෙන් ඔහු හැරී බැලුවේය. ඔහු ඉදිරියේ දෙකන් උස්සාගත් ලොකු බල්ලෙකි. ගෙවැටෙහි කඩුල්ල සිට ගෙය දෙසට නාඳුනන තරුණියක් පා තබයි.

"මට පාවෙල් කොර්චාගින්ව හමුවෙන්ට ඕන." ඈ අර්ටියොම් දෙස බලමින් නොඇස් හඬින් කීවාය.

"මටත් ඕන ඔහුව හමුවෙන්ට තමා. ඔහු කොහේ ගියා ද කියලා කොයි යකාද දන්නෙ!" මම මේ ආවා විතරයි. ගේ දොර ඇරලා. ඔහු නැහැ. ඔබට ඔහුගෙන් වැඩක් කරගන්නට තියෙනවද?" අර්ටියොම තරුණියගෙන් ඇසීය.

පිළිතුරු වෙනුවට ප්‍රශ්නයක් ඇසුවාය.

"ඔබ කොර්චාගින්ගේ අයියා. අර්ටියොම්ද?"

"ඔවු, මොනවා වෙලාද?"

තරුණිය ඔහුට පිළිතුරු නොදී, අවදානම් ලෙස හැර තිබෙන දොර දෙස බැලුවාය. "මම ඇයි ඊයෙ නාවේ? එය සිදුවුණාද,..." ඇගේ සිතෙහි වූ බර තවත් වැඩි විය.

"ඔබ එන විට ගෙදර දොර ඇරලා. පාවෙල් හිටියේ නැහැ. එහෙමද? තමා දෙස බලා සිටින අර්ටියොම්ගෙන් ඈ ඇසුවාය. "

"ඔබට පාවෙල් හමුවීමට ඇති වුවමනාව කුමක්ද?"

තෝන්යා ඔහුට තවත් ළංවී වටපිට බලා කෙටියෙන් මෙසේ කීවාය:

"මම හරියට දන්නෙ නැහැ. පාවෙල් ගෙදර නැතිනම්, එයාව හිරභාරයට අරගෙන."

"මොනවාටද?" අර්ටියෝම් තිගැස්සී ඇසුවේය.

"කාමරය තුළට යමු" තෝන්යා කීවාය.

අර්ටියෝම් නිහඬව ඇයට සවන් දුන්නේය. ඈ සියලු පුවත් ඔහුට කී පසු ඔහු බලාපොරොත්තු රහිත තත්ත්වයකට ඇද වැටුණේය.

"මදෑ වෙච්ච දේ. හෙණ හතක් වදින්න ඕන! දුක මදිවට යක්ෂ වැඩක් නෙව..." බෙලහීනව ඔහු මිමිනුවේය. "ගෙදර බඩු මේ විදිහට විසි කරලා තියෙන්නේ මොකද කියලා දැන් තේරුම් ගන්ට පුළුවනි. යක්ෂ දිස්ටියක් මගේ මල්ලීව ඔය වැඩට සම්බන්ධ කළා... දැන් ඉතින් කොහෙන් හොයන්නටද? නෝනා මහත්මයා ඔබ කාගේ කවුද?

"මම වන පාලකයාගේ දුව. තුමානොවා. පාවෙල්ව මම අඳුනනවා."

"ආ....ආ...." අර්ටියෝම් ඇද පැද කීවේය. "මෙන්න මම පිටි ගෙනාවා. මල්ලීට කෑම හදලා දෙන්ට. මදෑ වුණු දෙයක හැටි..."

තෝන්යා සහ අර්ටියෝම් නිහඬව ඔවුනොවුන් දෙස බැලූහ.

"මම දැන් යන්නම්. ඔබට සමහර විට ඔහුව හොයාගන්ට පුළුවන් වේවි." අර්ටියෝම්ගෙන් සමුගත් ඈ පහත් හඬින් කීවාය. "හවසට ඔබ හමුවෙන්ට එන්නම්. ඔබ මට විස්තර කරන්න."

අර්ටියෝම් නිහඬව හිස වැනීය.

★ ★ ★

දිගු කලක් තිස්සේ හිම නින්දෙන් නිදා සිටි කෙට්ටු මැස්සෙක් අවදිව කවුළුව මුල්ලේ 'සූ' හඬක් නගන්නට විය. පැරණි ගෙවි ගිය සෝපාවක් මත වාඩි වුණු තරුණ ගෙවිළියක් දෑත් දණහිස් මත තබාගෙන අරමුණු රහිතව කිලිටි බිම දෙස බලන්නට වූවාය.

නගර පාලක නිලධාරියා සිගරට්ටුවක් කටේ කොනක ගසා ගනිමින් කොළයක අකුරු ලියමින් 'ෂෙපෙතෝව්කා නගරයේ පාලක නිලධාරියා' යන වැකියට යටින් සතුටු සිතින් අණ්ඩක් වැනි තොණ්ඩුවක් සහිත අත්සනක් තැබීය. දොර අසල සපත්තු අඬු ගැටෙන හඬක් ඇති වූයෙන් නගර

පාලක නිලධාරියා හිස ඔසවා බැලීය.

වෙළෑ අතක් සහිතව ඔහු ඉදිරියේ සලෝමීගා සිටගෙන සිටියේ ය.

"මේ පැත්තෙ ආවෙ මොකද?" නිලධාරියා ඔහු පිළිගෙන ඇසීය.

"හොඳකට තමා, අත කටුව ළඟට එනකල්ම කැපිලා."

ඔහු අසල සිටි කාන්තාවන් ගැන නොසලකා සලොමීගා නොසරුප් බසින් බැණ වදින්නට විය.

"නුඹ මෙහෙ ආවෙ සනීප ගන්නද?"

"අපි සනීප ගන්නෙ ඒ ලෝකෙට ගියායින් පස්සේ යුද පෙරමුණේ සටන් ඇවිළිලා."

නගර පාලක නිලධාරියා ඔහු නවත්වා හිසින් කතක් පෙන්වා මෙසේ පැවසීය:

"පසුව කතා කරමු."

සලොමීගා කුඩා පුටුවක් මත වාඩිවී සිය හිස්වැස්ම අතට ගත්තේය. උක්රයීන සමූහාණ්ඩුවේ රාජ්‍ය ලාංඡනය වන ත්‍රිශූලය එහි සටහන් කොට තිබිණි.

"මාව මෙහාට එව්වේ ගොලූබ්" ඔහු නොඋස් හඬකින් පටන් ගත්තේය. "ඉක්මනින්ම මෙහාට සැහැල්ලු අවි ගත් පාබළ හමුදාවක් ඒවි. පොදුවේ කියනවා නම් වැඩ සිද්ද වේවි. මාව මෙහාට එව්වේ නීතිය රකින්න. සමහර විට මහ එකා එන්නත් පුළුවනි. ඔහු සමඟ තවත් කවුරුහරි පිටරට ලොක්කෙක් එන්ටත් පුළුවනි. 'සැහැල්ලු කිරීම්' ගැන ඒ නිසා මෙතන කවුරුත් එහෙම කතා නොකළ යුතුයි. නුඹ මොනවද ඔය ලියන්නෙ?"

නගර පාලක නිලධාරියා කටේ එක් කොනක තිබුණු දුම්වැටිය අනික් කොනට ගත්තේය.

"මෙතන මගේ ළඟ එක මැරයෙක් ඉන්නවා. ඌ කොල්ලෙක්. දුම්රියපොළේදි ෂුක්රායි අල්ලගන්ට පුළුවන් වුණා. උඹට මතකද අපට විරුද්ධව දුම්රිය කම්කරුවන්ව උසි ගන්වාපු එකා."

"ඉතින්-ඉතින් ?" සැලකිල්ලකින් සලෝමීගා ළං විය.

"නුඹ දන්නවාද, දුම්රියපොළේ නිලධාරියා ඔමේල්වෙන්කෝ පල් මෝඩයා. ඔහු ෂුක්රායි එක සෙබළකුට භාර දුන්නා මෙහාට ගේන්න. මම සිර භාරයට ගත්තු කොල්ලා මහ දවල් ඒ සෙබළාට ගහලා හිරකාරයාව නිදහස් කළා. කොසාක් සෙබළාව නිරායුධ කරලා. ඔහුගේ දතුත් කඩලා දැම්මා.

හිරකාරයා ෂුක්‌රායි ආ ගිය අතක් නැහැ. කොල්ලාව අල්ලා ගත්තා, ඔන්න කියවාපන් ලියවිලි." ඔහු සලෝමීගාට ලියවිලි ඉදිරිපත් කළේය.

සලෝමීගා ඉක්මනින් කියවමින් තුවාල නොවූ වම් අතින් කොළ පෙරළීය. ඔහු කියවා නගර පාලකයා දෙස බැලිය.

"නුඹ මොකද කොල්ලාගෙන් කට උත්තර නොගත්තෙ?"

නගර පාලකයා ස්නායු කිපුණු කලෙක මෙන් හිස් වැස්මේ ඉදිරිපස කොටස අදින්නට විය.

"දවස් පහක් තිස්සේ උෆ එක්ක හටන් කරනවා. උෆ නිහඬව ඉන්නවා. "මම කිසිම දෙයක් දන්නෙ නැහැ. මා හිරකාරයෙකු නිදහස් කළේ නැහැ." කියලා කියනවා. මහ බැල්ලිගෙ පුතෙක්. පල්හොරෙක්. හිරකාරයාව ගෙනාව සෙබළා කොල්ලාව අඳුනාගත්තා. සෙබළා තව පොඩ්ඩෙන් කොල්ලාගේ බෙල්ල මිරිකනවා. නීචයා. මම බලෙන් සෙබළාව වෙන් කළා. ඔමේල්චෙන්කෝ හිරකාරයාව ගෙනාපු කොසාක් සෙබළාට ඔය වැඩේ නිසා කස පහර විසි පහක් නියම කළා. ඒ නිසා ඔහු මෙතන උෆට සෑහෙන්ට බැට දුන්නා. උෆව වැඩි දුර තියාගෙන ඉඳලා වැඩක් නැහැ. කොල්ලාව වෙඩි තබා මරන්ට අවසර ඉල්ලා මම සෙනවි මණ්ඩලයට ලියවිල්ලක් යවනවා."

සලෝමීගා ඔහු දෙස බලා අවඥා සහගත ලෙස කෙළ ගැසීය.

"උෆ මගේ ළඟ හිටියා නම් යසට කතා කරාවි. නුඹ වගේ පූජක පැටියකුට ඔය දේවල් කරන්ට බැහැ. පූජක සෙමිනේරියේ ඉගෙන ගත්තු අයට පාලක නිලධාරි වැඩ කරන්ට පුළුවන්ද? නුඹ උෆට කස පහරවල් දුන්නාද?"

පාලක නිලධාරියා කෝප වීය.

"නුඹ ඕනැවට වැඩියෙ හිතනවා? නුඹගේ උපහාසය නුඹම තියාගනින්. මම මේ නගරයේ පාලක නිලධාරියා. මගේ වැඩවලට අතදාන්ට එපා."

ආඩම්බරකම් පෙන්වන පාලක නිලධාරියා දෙස බැලූ සලෝමීගා හඬ නඟා සිනාසුණේය.

"හා..හා..! පූජක පැටියා පුම්බන්ට එපා. පුපුරයි. නුඹගේ වැඩ යකාට ගියාදෙන්. මේ පැත්තේ කසිප්පු බෝතල දෙකක් හොයාගන්න හැටි විතරක් කියාපන්?"

පාලක නිලධාරියා සතුටු ගතියක් පෑවේ.

"ඒක හොයා දෙන්ට පුළුවනි."

"මේ කොල්ලාව" කඩදාසියේ තිබූ ඔහුගේ වයස සටහන් ඉලක්කම් පෙන්වමින් සලෝමීගා කතා කළේය. "නුඹට ඕන නම් ඌව මරා දමන්නට අවුරුදු දහසය. දහ අට කරපන්. හයේ ඉලක්කම අට කරපන්. නැතිනම් මරණ දඬුවම නොදෙන්නට ඉඩ තියෙනවා."

★ ★ ★

ගබඩා කාමරෙහි තිදෙනෙක් සිටියහ. පරණ කබායක් හැඳ ගත් යටි රැවුළක් සහිත මහල්ලෙක් බිත්ති ඇඳ මත ඇලයකට වැතිර සිටියේය. හණ රෙද්දෙන් මැසූ පළල් කකුල් සහිත කලිසමක් හැඳ සිටි ඔහු තම සිහින් කකුල් නවා ගෙන උන්නේය. ඔහුගේ ගෙදර නවාතැන් ගෙන සිටි පෙත්ල්යූරාගේ සෙබළෙකුට අයිති අශ්වයා ඔහුගේ මඩුවේ දී නැති වූ නිසා ඔහු හිරභාරයට ගත්තේය. පහළ බිත්ති ඇඳේ වාඩි වී සිටියේ මහලු ගැහැනියකි. ඇගේ ඇස් කපටිය. ඒවායේ හොර බැල්මකි. ඇගේ නිකට උල්ය. ඈ කසිප්පු පෙරන්නියකි. ඈ ඔරලෝසු ඇතුළු වෙනත් දේ සොරා ගත්තාය යන චෝදනාව ලැබ සිටියාය. ජනේලය ඇති මුල්ලේ පොඩි වුණු තොප්පියක් මත හිස තබාගෙන අඩ සිහියෙන් කොර්චාගින් වැතිර සිටියේය.

ගබඩා කාමරයකට තරුණ ගැහැනියක ගෙනාවේය. ගෙවිලියක මෙන් ඈ මල් වැටුණු ලේන්සුවකින් හිස වසා සිටියාය. බිය පළ කරන ඇගේ දෙනෙත් විශාලය. ඈ විනාඩියක් නැවතී සිට කසිප්පුකාරිය අසලින් වාඩි වූණාය.

ඈ අලුත පැමිණි ගැහැනිය දෙස පිරික්සුම් බැල්මක් හෙළා ඉක්මනින් කතා කළාය.

"කෙල්ලෙ ඉඳන් ඉන්නවද?"

පිළිතුරු නොලැබුණද ඈ නිහඬ නොවුවාය.

"නුඹව මෙහාට ගෙනාවේ මොකටද? කසිප්පු හින්දාද?"

ගෙවිලිය නැඟිට ඇගේ එල්ලීමට මෙන් හැසිරෙන ගැහැනිය දෙස බලා සෙමින් පිළිතුරු දුන්නාය.

"නැහැ. වැඩිමහලු සහෝදරයා නිසා මා අල්ලා ගත්තා."

"ඔහු මොනවද කළේ" ගැහැනිය යළි ඇසුවාය.

මහල්ලා බාධා කරන්නට වීඃ

"නුඹ මොකටද ඇයව බය කරන්නෙ? කෙනෙකුට වටපිට බැලීම පවා අමාරුයි නුඹ දොඩවනවා."

ගැහැනිය හණිකට බිත්ති ඇඳන් දෙසට හැරුණාය.

"නුඹ මට අණ දෙන්නෙ මොන හේතුවකටද? නුඹ සමඟ

ද මම කතා කරන්නෙ?"

මහල්ලා කෙළ ගැසීය.

"ඒ මනුස්සයාගේ ඇඟේ එල්ලෙන්නෙ නැතුව ඉඳපන්"

ගබඩා කාමරයේ නිහැඬියාවකි. තරුණිය විශාල සළුවක් දිගහැර එළා හිස යට අතක් තබාගෙන වැතිර ගත්තාය.

කසිප්පුකාරිය ආහාර ගැනීමට පටන් ගත්තාය. මහල්ලා බිත්ති ඇඳෙන් පහළට කකුල් දමා කලබල නොවී කඩදාසියක් ඔතා දුම් වැටියක් සාදා ගෙන උරන්නට විය. දුගඳ හමන දුම්ගුළිවලින් කාමරය පිරිණි.

කට පුරා කෑම ඔබා ගත් කසිප්පුකාරිය මුමුනන්නට වූවා .

"නිවිහැනේ කන්ටවත් ඉඩක් නැහැ. නැවතීමක් නැතුව දුම් බොනවා. දුම් ගඳ පිරිලා."

මහල්ලා නපුරු ලෙස සිනාසුණේය.

"නුඹ කෙට්ටුවෙන්ට බයද? ඉක්මනින් අර දොරකොඩින් පවා යාමට බැරි වේවි. කොල්ලාටත් කෑම ටිකක් දීපන්. නුඹ විතරක් කන්නෙ නැතිව."

කසිප්පුකාරිය අමනාපයෙන් අතක් වැනුවාය.

"මම කොල්ලට කීවා. කාපන් කියලා. උෆට බැරිලු. නුඹ මා ගැන දොඩවන්ට එපා. මම කන්නෙ නුඹේ දේ නොවෙයි."

තරුණ ගැහැනිය කසිප්පුකාරිය වෙත හැරි කෝර්චාගින් දෙසට හිස වනා ඇසුවාය.

"ඔහු හිරහාරයට අරගෙන තියෙන්නෙ මොනවාටද කියලා දන්නේ නැතිද?"

කසිප්පුකාරිය තමා සමඟ කතා කිරීම නිසා සතුටු වී කැමැත්තකින් විස්තර කළාය.

"ඒ කොල්ලා මෙහෙ එකෙක්. කෝර්චාගින් කුස්සි අම්මගෙ බාල පුතා."

ඇඟේ කනට කට තබා කසිප්පුකාරිය කොඳුළාය.

"එයා බොල්ෂෙවික්කාරයෙකුව නිදහස් කළා. මගේ අසල්වැසි සසූලීහාලාගේ ගෙදර නාවිකයෙක් හිටිය."

තරුණ ගැහැනියට මතක් විය. "වෙඩි තබා මරා දැමීමට අවසර ඉල්ලා මා සෙනෙවි මණ්ඩලයට ලියවිලි යවනවා..."

★ ★ ★

සෙබළුන්ගෙන් පිරුණු දුම්රිය මැදිරි එකිනෙක දුම්රියපොළට පැමිණෙන්නට විය. සැහැල්ලු අවි රැගත් බැටැලියන්වලට අයත් සෙබළුන් අක්‍රමික ලෙස කාණ්ඩ

ගැසී එතැනින් පිට විය. වානේමය පන්නරයක් ලැබූ මැදිරි හතරකින් යුත් 'සපරෝෂට්ස්' යුද්ධ රථය දුම්රිය මඟ දිගේ සෙමින් ඉදිරියට ආවේය. දුම්රිය වේදිකාවේ සිට කාලතුවක්කු පිටතට ගත්තේය. බඩු ගෙන යන දුම්රිය මැදිරිවලින් අසුන් ද පිටතට ගත්තේය. එතැනදීම අසුන්ට සැදෑල බැඳ උන් පිට නැඟ ගත් අසුරු භටයෝ රංචු ගැසී සිටි පාබළ හමුදා භටයන් තල්ලු කරමින්, අසුරු හමුදාව පෙළ ගැසී සිට දුම්රියපොළේ වත්ත දෙසට ආහ.

යුහුසුලු වූ සුළු නිලධාරීහු තම සේනාංකවලට අයත් අංක හඬ නඟා කීහ.

දෙබරයකට ගල් ගැසූ කලෙක මෙන් දුම්රියපොළ නද දෙන්නට විය. ආකාර රහිත විවිධ කටහඬවලින් පිරි කුලප්පු වූ මිනිසුන් ගොඩකින්, ක්‍රම ක්‍රමයෙන් සේනාංක බෙදී වෙන් වී හැඩ ගැසිණි. සැණෙකින් අවි ගත් මිනිස්සු වැල නොකැඩී නගරය දෙසට ගියහ. නගරයට ඇතුළු වූ සැහැල්ලු අවි ගත් පාබළ ඩිවිෂන් හමුදාවලට අයත් ගැල්වල ශබ්දයෙන් හා පසු පස හමුදාවලින් මහමඟ හවස දක්වා පිරී පැවැතිණි. එම පෙරහැර අවසාන කරමින් එකසියවිසි දෙනෙකුගෙන් සමන්විත සෙනෙවි මණ්ඩලයේ සේනාංකය උස් හඬින් ගැයුවේය.

"ශබ්දයකුයි මහ හඬකුයි.
මොකද ඇති වුණේ ?
පෙත්ල්යූරා උක්රයීනේ
පෙනී හිටින්නේ..."

කොර්චාගින් ජනේලය දක්වා නැඟී සිට ගත්තේය. හවස ඇඳිරිය අතරින් මහමඟ යන රියවල රෝද ගැටෙන හඬද, දහසක් දෙනාගේ පා ගැටෙන හඬද, විවිධ ගීද ඇසිණි.

පිටුපසින් කිසිවෙක් හෙමින් කතා කළහ.

"යුද්ධ හමුදාව නගරයට එනවා වගෙයි."

කොර්චාගින් හැරී බැලුවේය.

එසේ කීවේ ඊයේ ගෙනෙනු ලැබූ තරුණිය විසිනි.

ඔහුට ඇගේ කතාව ඇසුණේය. කසිප්පුකාරිය සියකාරිය සපල කර ගත්තාය. ඇගේ ගම පිහිටියේ නගරයේ සිට හැතැප්ම හතක් ඈතිනි. ඇගේ වැඩිමල් අයියා ග්‍රිට්ස්කෝ රතු හමුදාවේ පාටිසන් සෙබළෙකි. සෝවියට් පාලන බලය කාලයේදී ඔහු දුප්පතුන්ගේ කොමිටියේ නායකයා විය.

රතු හමුදාව ගමින් පිට වී යන විට, බඳ වටා පතොරම්

පටි බැඳගත් ග්‍රීට්ස්කෝද ඔවුන් සමඟ ගියේය. දැන් එම පවුලට ජීවත් වීමක් නැත. ඔවුනට හිටි එකම අශ්වයාද පැහැර ගැනිණි. තාත්තාව නගරයට ගෙන ගොස් සිරභාරයේ තබා වධ දුන්නේය. ග්‍රීට්ස්කෝ ගම්භාර නායකයාට පහර දුන්නේය. ඊට පළිගැනීමක් වශයෙන් ගම්භාරයා, ග්‍රීට්ස්කෝලාගේ ගෙදරට නොයෙකුත් මිනිසුන් ගෙනාවේය. අවසානයේදී පවුල දුගී බවට පත් විය. රත්තන් වට කිරීම සඳහා ඊයේ ගමට පාලක නිලධාරියා පැමිණියේය. ගම්භාරයා ඔහු ග්‍රීට්ස්කෝලාගේ ගෙදරට කැඳවාගෙන ආවේය. පාලක නිලධාරියා තරුණිය දෙස ඕනෑකමින් බැලීය. පසුදා උදේ 'ප්‍රශ්න ඇසීම පිණිස' ඇය නගරයට ගෙන එන ලදී.

කොර්චාගින්ට නිදි නැති විය. විවේකය සේයා නොතබාම අතුරුදහන් විය. ඔහුට පැන යාමට බැරි ප්‍රශ්නයක් හිත තුළ බුර බුරා නැඟෙයි. 'ඉදිරියට වෙන්නේ මොනවාද?' ඔහු සිත තුළ යළිත් එයම පැන නඟී.

පහර ලත් ඔහුගේ සිරුර වේදනාවෙන් පිරී තිබිණි. සිරකරු ගෙන ගිය සෙබළා ඔහුට මෘගයකු ලෙස පහර දුන්නේය.

වෛරය උසි ගැන්වෙන අදහස්වලින් ඇත් වනු වස් ඔහු අසල්වැසියන්ගේ කසුකුසුවලට සවන් දුන්නේය.

පාලක නිලධාරියා තම සිත් ගැනීමට ආ සැටි ද, ඔහු ඇයව බිය ගැන්වූ සැටිද, චාටුබස් දෙඩවූ සැටිද, ඈ ප්‍රතික්ෂේප කළ පසු ඔහු මෘගයකු ලෙස හැසුරුණු හැටිද, තරුණිය කීවේ ඉතා පහත් හඬකිනි. 'බිම්ගෙට නුඹව දානවා. එතැනින් එළියට යන්ට නුඹට කවදාවත් ඉඩ ලැබෙන්නෙ නැහැ.'

ඇඳිරි වැටෙන්නට විය. ඉදිරියේ දී හුස්ම ගැනීම පවා අපහසු නොසන්සුන් රැයකි. නොදත් හෙට දවස ගැන නැවත කල්පනා වේ. හත්වැනි රැය, එසේ වුවද, මසක් ගෙවූවාක් මෙනි. වැතිර සිටීම පවා අසීරුය. වේදනාව නොසිඳිණි. ගබඩා කාමරයෙහි දැන් ඉන්නේ තිදෙනෙකු පමණකි. මහල්ලා ලිප් පඩිය උඩ නිදන්නාක් මෙන් බිත්ති ඇඳට වී ගොරවමින් නිදයි. මහලු සීයා බුද්ධිමත් ලෙස සන්සුන්ය. ඔහු රෑට සන්සුන්ව නිදා ගනී. නිලධාරියා කසිප්පු ලබා ගනු පිණිස කසිප්පුකාරිය නිදහස් කළේය. ක්‍රිස්තීනා සහ පාවෙල් ළං ළංව නිදා ගනිති. ඊයේ ඔහු කවුළුවෙන් සිරියෝෂා දුටුවේය. ඔහු මඟ සිටගෙන දොම්නසින් යුතුව බොහෝ වේලාවක් නගර පාලක කාර්යාල ගොඩනැඟිල්ල දෙස බලාගෙන සිටියේය.

"මම මෙතන බව ඔවුන් දන්නා හැටි පේනවා."

දවස් තුනක්ම කළු ඇඹුල් පාන් කෑල්ලක් බැගින් දුන් නමුදු, එය ඔහුට එච්චේ කවුදුයි නොකීවේය. දවස් දෙකක් තිස්සේ පාලක නිලධාරියා ප්‍රශ්න අසමින් අවදානම් ඇති කළේය. එහි තේරුම කුමක්ද?

ප්‍රශ්න අසද්දී ඔහු කිසිදු පිළිතුරක් නොදුන්නේය. ඔහු නිහඬව සිටියේ මන්දයි ඔහුම නොදනී. කියවා ඇති පොත්වල එන චරිත මෙන් ඔහු නිර්භය ශක්තිමත් කෙනෙකු වීමට කැමැති විය. අල්ලාගත් දවසේ දී රාත්‍රියෙහි ඔහු විශාල පිටි මෝලක් අසලින් ගෙන යද්දී සෙබළෙක් මෙසේ පැවසීය:

"නිලධාරීතුමනි, උගව ඇදගෙන යන්නෙ මොකටද? පිටට වෙඩි පාරක් තිබ්බා. වැඩේ ඉවරයි." ඔහු බිය විය. සැබැවින්ම දහසය වැනි අවුරුද්දේදී මිය යාම බියජනක දෙයකි. මරණය යනු හැමදා ජීවත් නොවීමය.

ක්‍රිස්තීනාද කල්පනා කරන්නීය. ඈ ඒ ගැටවරයාට වඩා බොහෝ දේ දනී. ඔහු සමහර විට, තවම නොදනී... එහෙත් ඈ අසා ඇත.

ඔහු නිදි නැත. රාත්‍රියේදී ඔහු පීඩා විඳී. ක්‍රිස්තීනා ඔහු නිසා කොතරම් කනගාටු වූයේද, එහෙත්, ඇයට තමාගේම දුකක් ඇත. ඈට පාලක නිලධාරියාගේ බිහිසුණු වචන අමතක කළ නොහැකිය. "මම හෙට නුඹට අපරාධයක් කරන්නම්. නුඹට මා සමඟ බැරි නම් මුර සෙබළුන් ළඟට නුඹව යවනවා. කසාක්වරු ප්‍රතික්ෂේප කරන එකක් නැහැ. නුඹම තෝරාගනින්."

"අහෝ කොතරම් භයානකද, කිසිම තැනකින් සහනයක් බලාපොරොත්තු විය නොහැකිය. ග්‍රීට්ස්කෝ රතු හමුදාව සමඟ ගිය නිසා ඈ වරදකාරියක් වන්නේ කෙසේද? අහෝ මෙලොව ජීවත් වීම කොතරම් අමාරුද!"

දැඩි පීඩනය උගුර හිර කරයි. උදව් රහිත බලාපොරොත්තු සුන් වූ බව, බිය, ඇය වෙළාගෙන ඇත. ක්‍රිස්තීනා ගොළු හඬින් කෙඳිරි ගෑවාය.

වියරු කාන්සියකින් හා බලාපොරොත්තු රහිත බවකින් තරුණ සිරුර ගැස්සෙයි.

බිත්තිය මුල්ලේ සේයාවක් සැලෙයි:

"නුඹට මක්වෙලාද?"

ක්‍රිස්තීනාගේ උණුසුම් පහත් හඬ විසින් ඇගේ කාන්සිය නිහඬ අසල්වැසියා වෙත ගෙන යන ලදී. ඔහු ඇයට සවන් දෙමින් නිහඬව සිටී. ඔහුගේ අත පමණක් ක්‍රිස්තීනාගේ අත

මත ඇත.

"ඒ කාලකණ්ණියෝ මට වධ දේවි." කදුළු පිස දමමින් නොදත් බියක් නිසා ඈ මිමිනුවාය. "මා විනාශයි. බලය උන්ගේ අතේ."

"මේ තරුණිය අස්වැසීම සඳහා පාවෙල්ට කිව හැක්කේ මොනවාද? වචනයෙන් විස්තර කළ නොහැකිය. කියන්ට දෙයක් නැත. ජීවිතය දඬු අඬුවකට අසුවූ කලෙක මෙනි. පණ යන තුරු පහර දේවි. නැතිනම් බෙල්ලට කඩුවෙන් ගහවි. දුක නිසා හෙම්බත් වී සිටින එම තරුණිය යම්තම්න්වත් සැනසීම පිණිස ඔහු ඇගේ අතක් ගෙන මුදු ලෙස පිරි මැද්දේ ය. ඇගේ සුසුම්ලැම් ඇසිණි. ඉඳහිට මුර සෙබළෙකුගේ කට හඬ ඇසිණි. "කවුද යන්නෙ?" නැවත නිසලතාවකි. සීයා තදින් නිදා සිටී. නොදැනෙන විනාඩි කීපයක් ගෙවී ගියේය. ඔහුගේ අත තදින් මිරිකා ඇය වෙත ඇදගත් විට පවා ඔහුට නොවැටහුණේය.

"මගේ හොඳ කොල්ලෝ" උණුසුම් දෙතොල් විසින් මැතිරිණි. "මා කොහොම හරි විනාශ වෙනවාමයි. නිලධාරියා නැතිනම් අර එවුන් මාව විනාශ කරයි. නුඹ මාව අරගනින්. නැතිනම් අර බල්ලන්ට මගේ කන්‍යාභාවය විනාශ කරන්නට දෙන්න බැහැ."

"ක්‍රිස්තීනා නුඹ කියන්නෙ මොනවාද?"

එහෙත්, ඇගේ ශක්තිමත් අත් ඔහු මුදා හැරියේ නැත. ඇගේ උණුසුම් ලොකු දෙතොල්, ඒවායින් ඉවත් වී යා නොහැකිය. තරුණියගේ වචන සරලය. මුදුය. එම වචනවලින් අදහස් කරන්නේ මොනවාදැයි ඔහු දනී.

ඔන්න අද දවසද ගෙවී ගියේය. දොර යතුරු ඉබ්බෙකු දමා වසා ඇත. රතු රැවුළැති කොසාක් සෙබළා, පාලක නිලධාරියා, පහර දීම්, හුස්ම ගැනීමට පවා බැරි, නිදි නැති, රාත්‍රී හතක්. මොහොතකට උණුසුම් දෙතොල් සහ කඳුළින් තරමක් තෙමුණු මුහුණක් ඔහුගේ නෙත් ඉදිරියේ අන් සියල්ල අබිබවා පෙනිණි.

හිටිහැටියේම පාවෙල්ට තෝන්යා මතක් විය.

"ඇය අමතක කරන්නේ කොහොමද...? අපූරු සුන්දර දෙනෙත්.!"

ඇගෙන් ගැලවීමට තරම් ඔහුට ශක්තිය ලැබිණි. වෙරි වූ මිනිසකු සේ, නැඟිට කවුළුවේ යකඩ වැට අල්ලා ගැනීමට ඔහුට හැකි විය. ක්‍රිස්තීනාගේ දෑත් ඔහු අල්ලාගත්තේය.

"නුඹට මක්වෙලාද?"

එම ප්‍රශ්නය කොතරම් හැඟීම්වලින් පිරී ඇතිද? ඔහු ඇය වෙත නැඹුරු වී ඇගේ දෑත් තදින් මිරිකමින් මෙසේ පැවසීය:

"එය කරන්නට මට බැහැ. ක්‍රිස්තීනා නුඹ ඉතා හොඳයි. ඔහු තවත් මොනවාදෝ කීවද, ඒවායේ තේරුම ඔහු නොදනී.

ඔහු සිරුර සෘජු කොට නැඟී සිටියේ ඉවසාගත නොහැකි නිහඬතාව බිඳීමටය. අනතුරුව හෙතෙම බිත්ති ඇඳන් දෙසට ගියේය. කොනක වාඩි වී සීයාට කතා කළේය.

"සීයේ, කරුණාකරලා දුමක් දෙන්න."

සළුවෙන් සිරුර පොරවාගත් තරුණිය මුල්ලට වී සුසුම් ලෑවා ය.

පසුදා පාලක නිලධාරියා සහ කොසාක් සෙබළු විත් ක්‍රිස්තිනාව ගෙන ගියහ. ඈ නෙතින් පාවෙල්ගෙන් සමු ගත්තාය. ඈ තම නෙත්වලින් ඔහුට දොස් පවරන බවකි. දොර වැසුණු විගස ඔහුගේ අධ්‍යාත්මය තවත් දුකින් පිරිණි. ඇඳිරි විය.

ඊයේ වනතුරු සීයාට තරුණයාගෙන් එකද වචනයක්වත් අසා දැනගත නොහැකි විය. මුර සේවය හා පාලක සේවකයන් වෙනස් කෙරිණි. හවස අලුත් හිරකරුවකුව ගෙනාහ.

ඔහු පාවෙල් හඳුනන, සීනි කම්හලේ වඩුවෙකු වන දොලීන්නික්ය. ශක්තිමත් මිටි මිනිහෙකු වූ ඔහු ඇඳ සිටි කහපාට කමිසය ගෙවී ගොසිනි. ඔහුගේ කබායද පැරණිය. ඔහු ගබඩා කාමරය දෙස විමසිල්ලෙන් බැලීය.

පාවෙල් ඔහු දුටුවේ 1917දී පෙබරවාරි විප්ලවය නගරයට පැමිණි දවසේදීය. එදින පැවැති සෝෂාකාරී පෙළපාළිවලදී ඔහුට අසන්නට ලැබුණේ එකම එක බොල්ෂෙවිකයෙකුගේ කතාවකි. ඒ කතිකයා දොලීන්නික්ය. මඟ අසල වූ වැටක් උඩ නැඟී ඔහු එම කතාව කළේය. කතාව අවසානයේදී ඔහු කී වචන පාවෙල්ට තවමත් මතක ඇත.

"සෙබළුනි! බොල්ෂෙවික්වරුන්ගේ පැත්ත ගනිල්ලා. ඔවුන් නුඹලාව පාවා නොදෙනු ඇත."

එදා සිට වඩුවාව ඔහු නොදුටුවේය.

මහල්ලා අලුත පැමිණි හිරකරු නිසා සතුටු විය. මුළු දවස තිස්සේම ඔහුට කතා නොකර නිහඬව සිටීම අමාරු කාරියක් බව පෙනිණි. දොලීන්නික් ඔහු සමඟ බිත්ති ඇඳ මත වාඩි වී දුම් බීවේය. හේ ඔහුගෙන් හැම දෙයක්ම විමසීය.

ඉක්බිති ඔහු කොර්චාගින් අසලින් වාඩි විය.

"නුඹ දන්නා ආරංචි මොනවාද?" ඔහු ගැටවරයාගෙන් ඇසීය. "මෙහෙට වැටුණේ කොහොමද?"

තම ප්‍රශ්නවලට 'ඔව්, නැහැ' වැනි පිළිතුරු පමණක් ලැබුණු නිසා ගැටවරයා තමා ගැන අවිශ්වාස කරන බව දොලීන්නික් වටහා ගත්තේය. ඔහු අඩුවෙන් කතා කළේ එබැවිනි. එහෙත්, අනතුරුව, ගැටවරයා ලබා ඇති චෝදනාව ගැන දැනගත් වඩුවා මවිතයට පත් වී කොර්චාගින් දෙස තම බුද්ධිමත් දෙනෙත් එල්ල කළේය. හේ ඔහු අසලින් වාඩි විය.

"ඉතින් නුඹ කියන්නෙ ෂුක්‌රායිව බේරගත්තා කියලද? ඔන්න වැඩක හැටි. නුඹව හිරභාරයට ගත් බව මා දැනගෙන හිටියෙ නැහැ."

හිටිහැටියේ පාවෙල් වැළමිට එස විය.

"මොන ෂුක්‌රායි කෙනෙක්ද? මම කිසි දෙයක් දන්නෙ නැහැ. උන් මට චෝදනා කළාට මට මොකද?"

එහෙත්, දොලීන්නික් මඳසිනා පා, ඔහුට ළං විය.

"යාළුවා ඔය වැඩේ නවත්වාපන්, මා ඉදිරියේ හැංගෙන්නට එපා. මම නුඹට වැඩියෙ දන්නවා."

මහල්ලාට නෑසෙන සේ ඔහු පහත් හඬින් මෙසේ පැවසීය. "මම ෂුක්‌රායි කැටුව ගියා. ඔහු මෙලහකටත් ගිහින් ඇති. ප්‌යොදර් මට ඒ බේරාගැනීම කීවා."

තරමක් නිහඬව, යමක් ගැන කල්පනා කොට, යළි මෙසේ පැවසීය:

"හාදයා, නුඹ සෑහෙන කෙනෙක්. නුඹ කළ වැඩේ ගැන හැමදෙනාම දන්නවා. නුඹේ කාරිය යකාට ගිහිල්ලා. එහෙම පිටින්ම විනාශයි කියල කියන්ට පුළුවනි."

ඔහු කබාය ගලවා බිම එළා, වාඩි වී, බිත්තියට පිට දී, දුම් වැටියක් උරන්නට විය.

දොලීන්නික්ගේ අවසාන වචනය නිසා පාවෙල්ට හැම දෙයක්ම පැහැදිලි විය. දොලීන්නික් අපේ කෙනෙකි. ෂුක්‌රායි කැටුව ගිය, එහි තේරුම...

පෙත්ල්යූරාගේ කොසාක් සෙබළුන් අතර උද්ඝෝෂණය කිරීමට ගිය නිසා දොලීන්නික් සිර භාරයට ගෙන ඇති බව හවස් වන විට කොර්චාගින් දැන ගත්තේය. යටත් වී රතු හමුදාවට බැඳී සටන් කරන ලෙස ඉල්ලන ගුබේර්නියාවේ විප්ලවවාදී කමිටුවේ ආයාචනය බෙදාහරින විට ඔහු අල්ලා ගැනිණි.

සුපරීක්ෂාකාරී දොලීන්නික් පාවෙල්ට සුළු වශයෙන්

තොරතුරු කීවේය.

"දන්නේ කවුරුද? හේ කල්පනා කළේය. "කොල්ලාට කස පහර දීමට පටන් ගනීවි. ඔහු තවම තරුණයි."

රෑ බෝ වී නිදාගන්නට යන විට, ඔහු තම අනතුරු හැඟ වීම් ගැන කෙටියෙන් පැවසීය.

"කොර්චාගින්, නුඹෙයි මගෙයි තත්ත්වය බොහොම සවුත්තුයි. මොනවා වේවිද කියලා බලමු."

පසු දින ඔවුන් ලැග සිටි ගබඩා කාමරයට අලුත් හිරකරුවකු ගෙනාවේය. ඔහු නගරයේ කවුරුත් දන්නා අඳුනන කරනැවැමියා වන ෂ්ලෙමා ලේට්සර්ය. ඔහුගේ දෙකන් විශාලය, බෙල්ල සිහින්ය. ඔහු රොස්වෙමින් හා අංග චලනය කරමින් දොලීන්නික්ට විස්තර කළේය.

"ඔන්න ඉතින් පුක්ස්. බිලූවුෂ්ටෙයින්, ට්රාහ්ටෙන්බර්ග් ඔහුට පානුයි ලුණුයි දීලා පිළිගන්ට සැරසෙනවා. මම ඒ ගොල්ලන්ට මෙහෙම කීවා. පිළිගන්ට කැමතිද, පිළිගනිල්ලා. මුළු මහත් යුදෙව් ජනතාව වෙනුවෙන් ඔවුන්ට අත්සන් තියන්නේ කවුද? කිව්වට සමාවෙන්න කිසිවෙකු නැහැ. ඒ ගොල්ලන්ට ගනුදෙනු තියෙනවා. පුක්ස්ට වෙළඳහලක් තියෙනවා. ට්රාහ්ටෙන්බර්ග්ට පිටි මෝලක් තියෙනවා. මට තියෙන්නේ මොනවාද? අනික් අය ළඟ, දුප්පතුන් ළඟ මොනවාවත් නැහැ. ආ, මා ළඟ මගේ වාචාල හැකර කට විතරයි. අද මම සාජන්ට් කෙනෙකුගේ රැවුළ බැවා. අටමාන් පෙත්ල්යූරා යුදෙව් සංහාරය ගැන දන්නවද නැතිද කියලා මම ඇහුවා. ඔහු යුදෙව් නියෝජිත මණ්ඩලය පිළිගන්නවද? අනේ, මගෙ කට හන්දා මම කී පාරක් අමාරුවේ වැටුණද! මම ඒ සාජන්ගේ රැවුළ බැවායින් පස්සේ ඔහු මොනවා කළාද කියලා ඔබ දන්නවද? පියරුදා ගත්තා. ඉස්තරම් වර්ගයේ සුවඳ විලවුන්වලින් ප්‍රයෝජන ගත්තා. මට මුදල් ගෙවනවා වෙනුවට ඔහු මා හිරභාරයට ගත්තා. මම ආණ්ඩුවට විරුද්ධ උද්ඝෝෂණය කළා කියලා මට චෝදනා කළා." සෙල්ට්සර් මිට මොළවූ අතින් පපුවට ගසා ගත්තේය.

"මොන උද්ඝෝෂණයක්ද? මම මොනවා හරි කීවාද? මම ඇහුවා විතරයි... ඒකට මාව හිරබාරයට ගත්තා..."

සේල්ට්සර් රොස්වී දෙලීනින්ක්ගේ කමිසයේ බොත්තමක් කැරකැවීය. ඔහු එක් අතකින්ද, තවත් අතකින්ද ඇද්දේය.

කෝප වූ ෂ්ලෙමාගේ කතාව අසමින් දොලීන්නික් ඉඹේටම මඳ සිනා පෑවේය. කරනැවැමියා නිහඬ වූ විට, දොලීන්නික්

බැරෑරුම් ලෙස මෙසේ පැවසීය:

අනේ, ෂ්ලේමා ඔන්න නුඹ නුවණැති ඉලන්දාරියෙක්, ඒ වුණාට මෝඩයෙක් වුණා. කට මැත දොඩවන්ට යස වේලාවක් හොයා ගත්තා. මෙහාට එන්ට මම නුඹට උපදෙස් දුන්නේ නැහැ."

සෙල්ට්සර් ඔහු අවබෝධ කර ගත්තාක් මෙන් ඔහු දෙස බලා, බලාපොරොත්තු රහිතව අතක් වැනීය. දොර හැරී පාවෙල් හඳුනන කසිප්පුකාරිය යළිත් සිරගෙට තල්ලු කර දැමීණි. ඇය කැටුව ආ කොසාක් සෙබළාට ඈ කෝපවී බැණ වැදුණාය.

"නුඹලටයි. පාලක නිලධාරියාටයි හෙණ වදින්නට ඕන. මගේ කසිප්පුවලින් එයා මකබෑවෙන්ට ඕන!"

මුර සෙබළා දොර වැසීය. ඔහු යතුර දමා වසන හඬ ඇසිණි.

කසිප්පුකාරිය බිත්ති ඇඳක් මත වාඩි වූවාය. මහල්ලා ඇය විසුළු ලෙස පිළිගත්තේය.

"නුඹ මොකද ආයෙමත් අප ළඟට ආවද, කට හැකරි? වරෙන් වාඩිවෙයන් අපේ අමුත්තෙක් වගේ."

කසිප්පුකාරිය මහල්ලා දෙස මිතුරු බවෙන් තොර වූ බැල්මක් හෙළා තම පොදියත් රැගෙන බිම දොලීන්නික් සමීපයෙන් වාඩි වූවාය.

ඇගෙන් කසිප්පු බෝතල කීපයක් ලබාගෙන ඇය නැවතත් සිරභාරයට ගත්තේය.

දොරින් එහා මුරපොළෙහි කෑ ගසන හඬක් ඇසිණි. ජංගමශීලී බවක් දැනිණි. ගබඩා කාමරයෙහි සිටි සියලු දෙනාම හිස් හරවා දොර දෙස බැලුහ.

★ ★ ★

පැරණි සීනු කණුවක් සහිත සිත් නොගන්නාසුලු දේවස්ථානය අසල වූ චතුරශ්‍රයේ සාමාන්‍යයෙන් නගරයේ නොසිදුවන සිද්ධියක් ඇති විය. චතුරශ්‍රයේ පැති තුනක හරි හතරස් කොටු සේ අවිගත් හමුදාවෝ සන්නාහ සන්නද්ධව සිට ගත්හ.

ඉදිරිපිට දේවස්ථානය අසලින් පටන් ගෙන පෙළ ගැසී පාසලේ වැට දක්වා දාන් ලැල්ලක කොටු සේ පාබළසේනාංක තුනක් සීරුවෙන් සිටියහ.

අළු පැහැති කහල ගොඩක් බඳු හමුදාවෝ අවි පා අසල

තබාගෙන වට්ටක්කා බෑයකට සමාන විකාර යකඩ තොප්පි වගයක් හිස ලා ගෙන, හැම තැනම පතොරොම් එල්ලාගෙන පෙත්ල්යූරාගේ සෙබළුන්ගෙන් අතිශයින්ම යුද්ධ දක්ෂයන් වන 'ඩිරැක්ටොරි' ඩිවිෂනයේ භටයෝ පෙළ ගැසී උන්හ.

හරි අඩකට වඩා කුලාක්වරුන්ගෙන් සමන්විත පැරැණි සාර් රුසියානු හමුදාවේ අතිරේකවලින් ඉතා හොඳට ඇඳ, සපත්තු දමාගෙන පන්ති හැඟීමකින් යුතුව සෝවියට් බලයට විරුද්ධව සටන් කරන මේ ඩිවිෂනය යුද්ධ උපක්‍රම අතින් අතිශයින්ම වැදගත් දුම්රිය මාර්ග මංසන්ධිය ආරක්ෂා කිරීම සඳහා පත් කළේය.

ෂෙපෙතෝව්කා නගරයේ සිට පස් පැත්තකට දුම්රිය මාර්ග විසිරි ගොස් ඇත. මේ මර්මස්ථානය නැති වීම පෙත්ල්යූරාට හැම දෙයක්ම නැතිවන්නාක් මෙනි. 'ඩිරැක්ටොරියට' අයත් වී තිබෙන්නේ පසු පස කුඩා පෙදෙසක් පමණකි. පෙත්ල්යුරාගේ බලපෑම යටතේ පවතින පෙදෙසෙහි අගනුවර චාම් වින්ට්ස්සා නගරයයි.

ප්‍රධාන අටමාන් තැන වූ පේත්ල්යුරා පෞද්ගලිකව පැමිණ හමුදා පිරික්සා බැලීමට තීරණය කළේය. හැම දෙයක්ම එම හමුවීම සඳහා සුදානම් කෙරිණි.

පසු පස පෙළෙහි පෙනෙන තෙක් මානයෙන් ඈතට චතුරශ්‍රයේ මුල්ලක අලුත හමුදාවට බඳවා ගත් නාවිකයෝ පෙළගැසී සිටියහ. එතැන පාවහන් රහිත විවිධ පාට හා වර්ගවලට අයත් ඇඳුම් ඇඳ ගත් තරුණයෝය. රාත්‍රී කාලයේ දී ගම් නියම්ගම් වට කොට ගෙවල්වල ලිප් උඩට වී සැප සේ නිදාගෙන සිටි සහ වීදිවලදී අල්ලාගෙන, බලෙන් හමුදාවට බඳවා ගත් ගම්බද තරුණ පෙළ යුද කිරීම ගැන කල්පනා නොකළහ.

"මෝඩයෝ නැහැ." ඔවුහු කීහ. පෙත්ල්යූරාගේ නිලධාරීන්ට කළ හැකි ලොකුම දේ වූයේ බලෙන් බඳවා ගත් තරුණයන් අවි ගත් සෙබළුන්ගේ ආරක්ෂාව යටතේ නගරයට ගෙන්වීම සහ ඔවුන් විවිධ සේනාංක හා කාණ්ඩවලට වෙන් කොට ඔවුනට අවි දීමය.

දවසකට පසු මෙසේ ගෙනා තරුණයන්ගෙන් තුනෙන් කොටසක් අතුරුදහන් විය. දිනපතාම ඔවුන්ගේ ගණන කෙමෙන් කෙමෙන් අඩු විය.

ඔවුනට පාවහන් ලබා දීම අන්ත ළාමක ක්‍රියාවක් වූ අතර, සෑහෙන තරම් පාවහන්ද නොතිබිණි. යුද සේවයට පාවහන්

දමාගෙන පැමිණිය යුතු යැයි අණ කෙරිණි. එම නියමය පුදුම සහගත ප්‍රතිඵල ඇති කළේය. හොයා ගත හැකි හැම තැනකින්ම ඉරුණු කැඩුණු, පරණ සපත්තු සොයා ගත්හ. ඒවා දමාගත්තේ වයර් කම්බි හා ලණුවල ආධාරයෙනි.

යුද්ධ පෙළපාළිවලට ඔවුන් පාවහන් රහිතව ගෙනාවේය.

පාබළ හමුදාවට පිටුපසින් ගොලූබිගේ අසරු හමුදාව විය.

අසරු භටයෝ කතුහලයෙන් යුතු සෙනඟ හැසිරවූහ. යුධ පෙළපාළිය බැලීමට හැමදෙනාම ආසා කළෝය.

ප්‍රධාන අටමානයා එනවාද! නගරය තුළ එවැනි සිද්ධියක් ඇති වූයේ කලාතුරකිනි. නොමිලේ ලැබෙන මේ දර්ශනය බැලීමට හැම දෙනාම ඉදිරිපත් වූහ.

දේවස්ථානයේ පිටගැටපෙළ මත කර්නල් ධුරය දරන නිලධාරිහුද, පූජකවරයෝ දෙදෙනාද, උක්‍රයීනයේ රදල ගුරුවරු කණ්ඩායමක්ද, 'නිදහස්' කොසක්වරුන්ගේ කණ්ඩායමක්ද, තරමක් කූදු වූ පිට කොන්දක් සහිත නගර සභාවේ සභාපතිවරයාද පොදුවේ 'සමාජ සේවකයන්ගේ' තෝරාගත් නියෝජිතයෝද, ඔවුන් අතර දිග උඩු කබායක් හැඳ ගත් පාබළ හමුදාවේ පරීක්ෂකවරයාද වූහ. හේ යුද්ධ පෙළපාළියට අණ දුන්නේය.

දේවස්ථානය තුළ වසීලි පූජක තැන පාස්කු මංගල ලෝගුවක් හැඳ සිටියේය.

පෙත්ල්යූරා පිළිගැනීම උත්සව සිරියක් ඉසළීය. කහ සහ නිල් පැහැති ධජයක් ගෙන එසවීය. නවකයෝ ධජය ඉදිරිපිට දිවුරුම් දිය යුතු වූහ.

ඩිවිෂනයේ අණ දෙන නිලධාරියා කබල් පෝඩ් මෝටරියක නැඟ පෙත්ල්යුරා පිළිගැනීමට දුම්රියපොළට ගියේය.

පාබළ හමුදාවේ පරීක්ෂක තැන කඩිසර, නවීන පන්නයට උඩු රැවුළ උඩට කරකැවූ රෙන්යාක් නමැති කර්නල්ට අඬ ගැසීය.

"නුඹ සහකාරයෙකුවත් අරගෙන ගිහින් පසු පස සහ පාලක නිලධාරි කාර්යාලය ගැන හොයා බලපන්. හැම දෙයක්ම සුද්ද පවිත්‍ර කරපන්. හිරකාරයෝ ඉන්නවා නම් හොයා බලාපන්. වැදගැම්මකට නැති එවුන් නම්, එළවා දමාපන්."

චෙර්න්යාක් සපත්තු අඩි ගැටෙන සේ ආචාර කොට, ළඟම සිටි සහකරුවකුද කැටුව අසකු පිට නැඟී ඌ පන්නමින් ගියේය.

පරීක්ෂක තැන ජ්‍යෙෂ්ඨ පූජකවරිය දෙසට හැරී ආචාරශීලී ලෙස ඇසීය.

"කොහොමද දවල් කෑම ලෑස්තිද?"

"ඔව්. එතැන නගර පාලක නිලධාරියා බොහොම මහන්සි ගත්නවා." පූජකවරිය ලස්සන පරීක්ෂක තැන දෙස බලා කීවාය.

හිටි හැටියේම හැම දෙනාම සෙලවුණහ. අසකුගේ ග්‍රීවයට තම උඩුකය ළං කරගත් අසරු හටයෙක් මහ මඟ දිගේ වේගයෙන් අසු පැන්නවීය. ඔහු අතක් වනමින් කෑගසන්නට විය."

"එනවා!"

"සීරුවෙන්!" පරීක්ෂක තැන කෑ ගැසීය.

සාජන්ට්වරු දිව ගොස් සීරුවෙන් පෙළ ගැසුණහ.

ෆෝඩ් මොටෝ රිය දේවස්ථානයට පැමිණෙත්ම, 'උක්රයීනය තවම මිය ගොස් නැත' ගීය වාදක කණ්ඩායම විසින් ගායන ලදි.

මොටෝරියෙන් ඩිවිෂනයේ අණ දෙන නිලධාරියාට පසුව, නුහුරු ලෙස එළියට බැස්සේ අන් කිසිවකු නොව, 'මහා අටමානයා වන පෙත්ල්යූරාය' ඔහු උසින් නම් නොමිටිය. නොඋස්ය. රතු පැහැති බෙල්ල මත ශක්තිමත් ලෙස ඇති ඔහුගේ හිස කෝණාකාරය. ඉතා හොඳ රෙදි වගයකින් මැසූ නිල උඩු කබායක් ඔහු හැඳ සිටියේය. බඳ වටා කහ පැහැති පටියකි. එහි සම් කොපුවෙක බ්‍රවුනින්ග් වර්ගයට අයත් ඉතා කුඩා පිස්තෝලයකි. හිසෙහි ආරක්ෂක වැස්මකි. එහි ත්‍රිශූලය සහිත ලාංඡනයකි.

සිමොන් පෙත්ල්යුරාගේ දේහයෙහි යුද්ධකාමී ගති කිසිවක් පෙනෙන්නට නොතිබිණි. ඔහුගේ පෙනුමද යුද්ධ නිලධාරියකුගේ මෙන් නොවීය.

යම් කිසිවක් නිසා අසතුටු වූ බවක් පෙන්වමින් ඔහු පරීක්ෂක තැනගේ කෙටි වාර්තාවට සවන් දුන්නේය. අනතුරුව ඔහු පිළිගෙන නගර සභාවේ සභාපති තැන කතාවක් කළේය.

පෙත්ල්යූරා මන්දෝත්සාහයෙන් එය අසන්නේ ඔහුගේ හිසට ඉහළින් පෙළ ගැසී සිටින සේනාංක දෙස බැලීය.

"හමුදා පිරික්සීම් පටන් ගනිමු." ඔහු පරීක්ෂක තැන දෙස බලා හිස වැනීය.

නොවිශාල වේදිකාව මතට නැඟ ගත් පෙත්ල්යූරා

සෙබළුන් අමතා විනාඩි දහයක කතාවක් කළේය.

එය ඒත්තු යන කතාවක් නොවීය. ඔහු ඒ කතාව කළේ වැඩි විශේෂ උනන්දුවක් නොදක්වමිනි. ගමන් මහන්සිය නිසා විය යුතුය "ජයවේවා! ජයවේවා" යන හඬ මැද එම කතාව අවසන් විය. ලේන්සුවකින් මුහුණ පිස දමාගෙන ඔහු වේදිකාවෙන් පහළ බැස්සේය. ඉනික්බිති ඔහු පරීක්ෂක සහ ඩිවිෂනයේ අණ දෙන නිලධාරීන් සමඟ එකතුව සේනාංකයෙන් සේනාංකය වෙත යන්නට විය."

නවකයන් පෙළක් පසුකර ගිය ඔහු, අවඥා සහගත ලෙස දෙනෙත් හකුළුවාගෙන, ස්නායු කිපුණු කලෙක මෙන් තොල් සපා ගත්තේය.

හමුදා පිරික්සා බැලීම් අවසානයේදී ඇද ලෙස පෙළ ගැසී සිටි නවකයන් සේනාංකයෙන් සේනාංකය පසු කොට බයිබලයකුත් අතැතිව වසීලි පූජක තැන අසල වූ ධජය වෙත පැමිණ එහි කොනක් සිපගන්නා විට, බලාපොරොත්තු රහිත දෙයක් සිදු විය.

කිසිවකුට විස්තර නොකළ හැකි අන්දමකින් පෙත්ල්යූරා වෙත නියෝජිත මණ්ඩලයක් පැමිණියේය. පාන් ගෙඩියක් සහ දියලුණු අතැතිව පොහොසත් දැවදඬු කර්මාන්තකරුවකු වන බ්ලූම්ෂ්ටෙයින්ද, ඔහු පිටුපසින් වෙළඳහලක අයිතිකරුවකු වන පූක්ස්ද, තවත් ලොකු වෙළන්දෝ තිදෙනෙක්ද ආවෝය.

බ්ලූම්ෂ්ටෙයින් සේවකයකු සේ හිස නමා ආචාර කරමින් පාන් සහ දිය ලුණු පෙත්ල්යූරාට පිළිගැන්වීය. පෙත්ල්යූරා අසල වූ සහායකයෙක් එය අතට ගත්තේය.

"යුදෙව් ජනතාව රජයේ නායකයා වන ඔබතුමාව අවංක ලෙස පිළිගන්නා අතර, ඔබ තුමාට ගරු කරති. ඔබ පිළි ගැනීමේ සන්දේශය මෙන්න."

එය ඉක්මනින් බැලූ පෙත්ල්යූරා 'හොඳා' යැයි කීවේය.

එහෙත්, මෙතැනදී පූක්ස් කතා කළේය. "යටත් වැසියන් වන අප ඔබතුමාගෙන් ඉල්ලා හිටිනවා. අපේ ව්‍යාපාර පටන් ගැනීමට ඉඩකඩ සලසා දෙන ලෙසත්, යුදෙව් සංහාරයෙන් හා කොල්ලකෑම්වලින් අපව ආරක්ෂා කරන ලෙසත්, සංහාරය නමැති වචනය පූක්ස් ඉතා අමාරුවෙන් පැවසීය.

පෙත්ල්යූරා කෝපව බැම සඟළ හකුළුවා ගත්තේය.

"මගේ යුද්ධ හමුදාව යුදෙව් සංහාරය කරන්නෙ නැහැ." ඒක තමුසෙලා දැනගන්ට ඕන."

පූක්ස් කිසිවක් කර කියාගත නොහී දෑත් වැනීය.

ස්නායු කිපුණු කලෙක මෙන් පෙත්ල්යූරා උරහිසක් සෙලවී ය. අවේලාවට පැමිණි නියෝජිත මණ්ඩල නිසා ඔහු කෝප විය. ඔහු ආපසු හැරී බැලීය. ගොලූබ් උඩු රැවුළ සපමින් ඔහු පිටුපසින් සිටියේය.

"කර්නල් මෙන්න තමුසෙගේ කොසාක් සෙබළුන්ට විරුද්ධව පැමිණිලි කරනවා. පැමිණිලි ගැන හොයා බලා නිසි පියවර ගන්නවා." පෙත්ල්යූරා පරීක්ෂක දෙස බලා අණ කළේය. "පෙළපාළිය පටන් ගනිමු."

අමාරුවට මූණ පෑ නියෝජිත මණ්ඩලය ගොලූබ් හමු වීමට කොහොමවත් හිතුවේ නැති අතර, ඉවත යාමට යුහුසුලු විය.

සියලු ප්‍රේක්ෂකයන්ගේ සැලකිල්ල යොමුවී ඇත්තේ උත්සවාකාර හමුදා පෙළපාළියේ පිළියෙල වීම දෙසටය. අණ දෙන දැඩි වචන හඬ නැගිණි.

ගොලූබ් බ්ලූම්ෂ්ටෙයින් වෙත ගොස් බාහිර වශයෙන් සන්සුන් මුහුණක් පෙන්වා පැහැදිලි පහත් හඬින් මෙසේ පැවසීය:

"ක්‍රිස්තියානි නොකරපු මිථ්‍යා දෘෂ්ටිකයනි. හණිකට දුවපියව්. නැතිනම් තුඹලාගේ ඇට කටු කුඩු කරනවා"

ගීත වාදනය පටන් ගැනිණි. පළමුවැනි සේනාංක චතුරශ්‍රය හරහා ගමන් ගත්හ. පෙත්ල්යූරා සිටින තැනට පැමිණෙන සේනාංක යාන්ත්‍රික ලෙස "ජයවේවා!" කියා කෑ ගසා මහමඟට හැරී පටු මංවලට ගියහ. ඉදිරියෙන්ම ගමන් ගත් සේනාංක අලුත් කාකි යුද ඇඳුමින් සැරසී උන්හ. එහි සාජන්ට්වරු නිදහසේ පා තබමින් නිදහසේ ගමන් කරමින් වේවැල් වැනි කෙටි පොලු වැනූහ. සොල්දාදුවන් තුවක්කු ශුද්ධ කිරීමට ගන්නා යකඩ රිටිවලට සමාන මේ පොලු ඇතිව ගමන් කිරීමේ අලුත් මෝස්තරය පළමුවැනි වරට අවි ගත් පාබළ හමුදා විසින් පෙන්වන ලදි.

අලුතෙන් හමුදාවට බැඳුණු නවකයෝ පසුපසට වී මිතුරු නොවන ආකාරයකින් අණ අනුව පා නොතබමින් එකිනෙකාගේ ඇඟේ හැප්පෙමින් ගමන් කළහ.

පාවහන් රහිත පා ගැටීම්වලින් හඬ පිට නොවිණි. සාජන්ට්වරු හැම වෑයමක්ම යොදමින් ක්‍රමානුකූල කිරීමට වෙහෙසුණහ. එහෙත්, එය නොකළ හැක්කක් විය. නවකයන්ගේ දෙවැනි සේනාංකය ගමන් කරන විට දකුණු අංශයේ හණ රෙදි කමිසයක් හැඳ සිටි තරුණයෙක් "මහා

අටමානයා" දෙස මවිතව කට ඇරගෙන බැලීය. මහ මඟ තුබුණු කුඩා ගලක ඔහුගේ පය වැදී ඔහුද ඇද වැටිණි.

ඔහුගේ තුවක්කුව බිම වැටී ගල් ගොඩේ පෙරළිණි. ඔහු නැඟිට සිටීමට තැත් කළද, ඔහුට පසු පසින් ආ එවුන්ගේ කකුල්වල හැපී යළි වැටුණේය.

ප්‍රේක්ෂකයන් අතරින් සිනා හඬක් නැඟිණි. එම සේනාංකය පෙළ ගැසීම කඩා දැම්මේය. එය ආවාට ගියාට චතුරශ්‍රය මැදින් ගමන් ගත්තේය. අවාසනාවට මුණ පෑ තරුණ ගැටවරයා තුවක්කුව අහුලාගෙන සිය සේනාංකය වෙත දිව ගියේය.

ඒ අමිහිරි දර්ශනය විසින් පෙත්ල්යූරාගේ දෙනෙත් අන් අතකට හැරවිණි. ඔහු අවසාන සේනාංකය චතුරශ්‍රයට පැමිණෙන තෙක් නොසිට මොටෝ රිය දෙසට පා නැඟීය. පරීක්ෂක තැන ඔහු පසු පසින් යමින් ඉතා ප්‍රවේසමෙන් මෙසේ විමසීය:

"අටමාන්තුමාණෙනි, දවල් කෑමට නවතින්නෙ නැතිද?"

"නැහැ." පෙත්ල්යූරා කෙටියෙන් පිළිතුරු සැපයීය.

දේවස්ථානයේ උසැති වැටට එපිට සෙනඟ ගොඩකට මැදි වී සිරියෝෂා බ්රැෂ්ෂාක්, වාල්යා සහ ක්ලීම්කා යුද පෙළපාළිය නැරඹූහ.

වැටේ කණු තදින් අල්ලා ගනිමින් සම්පූර්ණ වෛරයකින් යුතුව සිරියෝෂා පහළ ගමන් කරන සේනා දෙස බැලීය.

"වාල්යා යමු යන්ට. රඟපෑම ඉවරයි." සියලු දෙනාටම ඇසෙන සේ අභියෝග කරන්නාක් මෙන් ඔහු පවසන්නේ වැටෙන් මෑත් විය. මිනිස්සු ඔහු දෙස පුදුමව බැලූහ.

ඔහු කිසිවකු ගණන් නොගෙන ගේට්ටුව ළඟට ගියේ ය. ඔහු පිටුපසින් ඔහුගේ සොහොයුරිය වන වාල්යා සහ ක්ලීම්කාද පා තැබූහ.

★ ★ ★

නගර පාලක නිලධාරියාගේ කාර්යාලයට සහායක සමඟ ගිය කර්නල් චේර්න්යාක් අසු පිටින් බිමට පැන්නේය. අසුන් මෙහෙකරුට භාර දී දෙදෙනොම මුරපොළට ගියහ.

"නගර පාලකයා කොහෙද?" චේර්න්යාක් දැඩි ලෙස සේවකයාගෙන් ඇසීය.

"දන්නෙ නැහැ." ඔහු මිමිනුවේය. "කොහෙද ගිහිල්ලා."

කිලිටි අස්පස් කොට නැති මුරපොළෙහි ඇඳන් මත පොරෝන විසි කර දමා ඇත. මුරපොළට අයත් කොසාක් සෙබළු රිසි පරිදි ඇඳන් මත වැතිරී සිටිති. නිලධාරීන් පැමිණි විට සෙබළුන් නැඟිට සිටීමට පවා කල්පනා කළේ නැත.

"මොකක්ද? මෙතන හරක් මඩුවක්ද?" චෙර්න්යාක් උස් හඬින් කෑගැසීය. "මොකද තොපි උඟරෝ වගේ ලගිනවද?" ඇඳන් මත නිදාගෙන සිටි සෙබළුන්ට ඔහු බැණ වැදුණේය.

එක් කොසාකයෙක් ඇඳ මත වාඩි වී උගුරට එන තුරු බඩ පුරා කා සිටි නිසාදෝ මිතුරු නොවන හඬකින් කතා කළේය.

"තෝ කෑගහන්නේ මොකද? අපිටත් කෑ ගහන්න පුළුවනි."

"මොනවාද?" චෙර්න්යාක් පැන්නේය. "තෝ කා සමඟද බොල කතා කරන්නේ හරක් හොම්බා? මම කර්නල් චෙර්න්යාක්! බැල්ලිගෙ පුතා තෝ අහලා තියෙනවාද? නැඟිටපියව් ඔක්කෝම නැතිනම් තොපි ඔක්කොටම කස පහර!" කෝප වූ කර්නල් තැන මුරපොළ වටා යන්නට විය. "විනාඩියක් අතුළත දී කුණු අතු ගාලා, ඇඳන් පිළියෙල කරලා තොපේ හරක් හොම්බවල්වලට මිනිස් වෙසක් ආරූඪ කරපියව්. තොපි කවුරුන් වගේද? කොසාක්වරුන් වගේ නොවෙයි. මංපහරන පල්හොරු වගේ."

ඔහුගේ කෝපය සීමා රහිත විය. වියරු වැටුණකු සේ ඔහු මඟෙහි තිබුණු කුණු වතුර පීප්පය කකුලෙන් පෙරළා දැම්මේය.

ඔහුගේ සහායක ඔහුට දෙවෙනි නොවීය. ඇඳන්වල තිබුණු මෙට්ටවලට තම අත තිබූ කසයෙන් පහර දෙමින් කසය අශ්ව වලිග තුනකින් සෑදුවකි. එය වනමින් කුසීතව වැතිර සිටියවුන් පන්නා දැමීය.

"ප්‍රධාන අටමාන්තුමා යුද්ධ පෙළපාළිය පිළිගන්නවා. මෙහාට එන්නට පුළුවනි. ඉක්මන් කරපල්ලා!"

කාරිය බැරෑරුම් තත්ත්වයක් ගෙන තිබෙන සැටිද ඇත්තවශයෙන්ම කසපහර වැදීමට ඉඩ තිබෙන බවද දුටු කොසාක්වරු - චෙරන්යාක් කවුදැයි ඔවුහු දනිත් - දුවමින් කඩිසර ලෙස වැඩ කළහ.

හැම තැනම වැඩ කෙරිණි. "සිරකරුවන්ව බලන්ට ඕන" සහකරු යෝජනා කළේය. "මොන විදියේ එවුන්ව මෙතන හිර කර තියෙනවද කවුද දන්නෙ? මහ අටමාන්තුමා ඇවිත් බැලුවොත් නරකක් වීමට ඉඩ තියෙනවා."

"කා ළඟද යතුර?" චෙර්න්යාක් මුර සෙබළාගෙන් ඇසීය. "වහාම දොර අරිනවා."

ජ්‍යෙෂ්ඨ මුර සෙබළා වහා නැඟිට සිර කාමරයේ දොර හැරියේය.

"කොහෙද පාලක නිලධාරියා ? මම ඔහු එනතුරු බොහෝ වේලා ඉන්ටද? ඔහු හොයලා වහාම මා ළඟට එවාපන්." චෙර්න්යාක් අණ දුන්නේය. "මුර සෙබළුන්ව වත්තට ගෙනියලා පෙළ ගසා හිටවනු... ඇයි මේ තුවක්කුවලට බයිනෙත්තු නැත්තෙ?"

"අපිව මෙහාට මාරු කෙරුවෙ ඊයෙ." ජ්‍යෙෂ්ඨ මුර සෙබළා නිදහසට කරුණු කීය.

ඔහු පාලක නිලධාරියා සොයනු වස් දොර දෙසට ගියේය.

සහකාරයා පයින් ගසා සිරකරුවන් සිටි ගබඩාවේ දොර තල්ලු කළේය. එහි වූ සමහරු අඩ වශයෙන් නැඟිට සිටි අතර අන් සමහරු වැතිරගෙන උන්හ.

"දොරවල් ඇරපල්ලා. මෙතන එළිය මදි." චෙර්න්යාක් අණ දුන්නේය.

ඔහු සිරකරුවන් දෙස විමසිල්ලෙන් බැලීය.

"නුඹව සිරභාරෙට ගත්තෙ මොකටද?" ඔහු බිත්ති ඇඳේ වාඩි වී සිටි මහල්ලාගෙන් දැඩි ලෙස ප්‍රශ්න කළේය.

මහල්ලා නැඟිට කලිසම ඇඳ ගනිමින් තරමක් ගොත ගසමින් බිය ගත් තියුණු හඬකින් පිළිතුරු දුන්නේය.

"හේතුව මම දන්නෙ නැහැ. හිරභාරයට ගත්තා. මම මෙහාට වෙලා ඉන්නවා. ගෙවත්තේ හිටිය අස්පයා නැති වුණා. ඒකට මම වැරදිකාරයෙක් නොවෙයි."

"අස්පයා කාගේද?" සහකාරයා ඇසීය.

"ආණ්ඩුවේ මා ළඟ නවාතැන් අරගෙන හිටිය සෙබළු ඌව විකුණලා මත්පැන් බීවා. වරද මා පිට පවරලා."

චෙර්න්යාක් මහල්ලාගේ හිස සිට දෙපතුල දක්වා යුහුසුලු බැල්මක් හෙළා නොඉවසිල්ලෙන් උරහිස ඔසවා මෙසේ පැවසීය:

"නුඹගේ වැරහැලිත් අරගෙන මෙතැනින් ඉක්මනට පලයන්!" චෙර්න්යාක් කෑ ගසමින් කසිප්පුකාරිය වෙත හැරුණේය.

තමා නිදහස් කළහයි සිතීමට මැළි වූ මහල්ලා සහායක තැනට ආයාචනා කරමින් අන්ධයකු සේ ඉඟි මැරීය.

"මට ගෙදර යන්ට අවසර දෙනවාද?"

ඔහු හිස වැනීය. "පලයන් පලයන් ඉක්මනට."

මහල්ලා බිත්ති ඇඳට ගැට ගසා තිබූ තම පොදියත්

ලිහාගෙන උරහිසක් පෙරටු කරගෙන දොර වෙත ගියේය.

"නුඹව සිරභාරයට ගත්තේ මොකටද?" චෙර්න්යාක් කසිප්පු කාරියගෙන් ඇසීය.

ගෙදර සැදූ කෙක් කැල්ලක් කමින් ඈ පිළිතුරු දුන්නාය.

"අනේ හාමුදුරුවනේ මාව අසාධාරණ විදිහට හිරභාරයට ගත්තා. මම වැන්දඹුවක්. මගේ කසිප්පු බීලා, පස්සෙ මාව හිරභාරයට ගත්තා."

"නුඹ කසිප්පු ජාවාරම කරනවාද?" චෙර්න්යාක් ඇසීය.

"මොන වෙළඳාමක්ද?" ඈ අමනාපයෙන් කීවාය.

"පාලක නිලධාරියා මගෙන් බෝතල් හතරක් ගත්තා. තඹ දොයිතුවක්වත් දුන්නෙ නැහැ. ඔන්න ඔහොමයි, කසිප්පු බොනවා. සල්ලි ගෙවන්නෙ නැහැ. ඉතින් මොන වෙළඳාමක්ද?"

"ඇති. යන යකෙකුට පලයන් යන්ට."

ඔහුගේ නියමය දෙවරක් ඇසීමට කසිප්පුකාරිය සූදානම් නොවූවාය. වට්ටිය අතට ගත් ඈ හිස නමා ආචාර කරමින්, පස්සෙන් පස්සට අඩි තබමින් දොර වෙතට ගියාය.

"අනේ උතුමාණෙනි, ඔබට දෙව් පිහිටයි."

දොලීන්නික් දෙනෙත් මහත් කරමින් මේ හාස්‍යජනක නාටකය දෙස බලා සිටියේය. සිරකරුවන්ගෙන් එකෙක්වත් සිදුවන්නේ මොනවාදැයි නොදැන උන්හ. එක් කරුණක් පැහැදිලිය. මෙතැනට ඇවිත් සිටින නිලධාරීහු සිරකරුවන් පිළිබඳ බලය ඇති අය වෙත්.

"නුඹව හිර කළේ මොකටද?ඔහු දොලීන්නික්ගෙන් ප්‍රශ්න කළේය.

"කර්නල් තුමා ඉදිරිපිට නැඟිට හිටපිය!" සහායක තැන බිරුවේය.

දොලීන්නික් සෙමින් සහ ඇද පැද නැඟිට සිටියේය.

"මම අහන්නේ නුඹව හිරභාරයට ගත්තෙ මොකටද කියලා?" චෙර්න්යාක් යළි ප්‍රශ්න කළේය.

කර්නල්ගේ උඩුකරු කොට කරකවා ඇති උඩු රැවුළ දෙසද, සම සිනිඳු වන සේ රැවුළ බා ඇති කොපුල් දෙසද, අනතුරුව ලාංඡනය සහිත ඔහුගේ 'කැප්' තොප්පිය දෙසද තප්පර කීපයක් තිස්සේ බැලූ දොලීන්නික්ගේ සිතෙහි උනන්දු සහගත අදහසක් පහළ විය. "වැඩේ හරි ගියොත් මොකද?"

"මාව හිරභාරයට ගත්තෙ මම රෑ අටෙන් පස්සේ නගරය තුළ ඇවිද්දයි කියලා." දොලීන්නික් මුලින්ම හිතුණු දේ කීය.

වේදනා සහගත නොසන්සුන්තාවකින් යුතුව ඔහු බලාපොරොත්තු විය.

"මොකද නුඹ රෑ තිස්සෙ ඇවිදින්නෙ?"

"රෑ නොවෙයි, එකොළහට විතර."

ඔහු එසේ කීවද, සිය වාසනාව ගැන විශ්වාස නොකළේය.

"පලයන් යන්ට." යැයි අණ ඇසුණු විට, ඔහුගේ දණහිස් වෙවුලන්නට විය.

දොලීන්නික් සිය කබායද අමතක කර දමා දොර දෙසට යත්ම, සහාහක තැන ඊළඟ සිරකරුගෙන් ප්‍රශ්න කළේය. කොර්චාගින් අවසානයා විය. දුටු සියලු දේ වටහා ගැනීමට බැරිව ඔහු බිම වාඩි වී සිටියේය. දොලීන්නික් ගේ පිටව යාම අවබෝධ කරගැනීමට ඔහු අසමත් විය. සිදුවන දේ වටහා ගැනීමට බැරිය. හැම දෙනෙකුම මුදාහරියි. එහෙත්, දොලීන්නික් රෑ ඇවිද්ද නිසා සිරභාරයට පත් වූ බවයි. ඔහු කීවේ.. අවසානයේ දී ඔහුට අවබෝධ විය.

පුරුදු පරිදි කල්නල් තැන කෙට්ටු සිරුරකින් හෙබි සෙල්ටසර්ගෙන් ප්‍රශ්න කළේය.

"නුඹ මොකටද? හිරේට වැටුණේ.?"

ස්නායු දුර්වලත්වයෙන් යුත් සුදුමැලි කරනැවැමියා කෙටි පිළිතුරු දුන්නේය.

"මට කීවා. මම උද්ඝෝෂණය කළයි කියලා. උද්ඝෝෂණය මොකක්ද කියලා මට තේරුම් ගන්නට බැහැ.

චෙර්න්යාක් වඩාත් සුපරීක්ෂාකාරී විය. "මොනවාද? උද්ඝෝෂණය ද?! උද්ඝෝෂණය මොනවා ගැනද?"

සෙල්ටිසර් තේරුම්ගත නොහැකිව දෑත් වැනීය.

"මම දන්නෙ නැහැ. යුදෙව් ජාතිකයො එක්කහු වෙලා මහා අටමාන්තුමාට පෙත්සමක් දෙන්නට යනවයි කියලයි මම කිව්වේ."

"මොන විදියේ පෙත්සමක්ද?" චෙර්න්යාක් සහ සහායකයා සෙල්ටිසර් වෙත ළං වූහ.

"යුදෙව් සංහාරය නවත්වන්න කියලා පෙත්සමක් භාර දීම. ඔබතුමා දන්නවද අපේ මිනිසුන්ව මරලා, කොල්ලකෑවා. මිනිස්සු බය වෙලා."

"තේරුණා" චෙර්න්යාක් ඔහුට බාධා කළේය. "අපි නුඹට යස සමාවක් දෙන්නම් යුදෙව් ජාතික හොම්බා." ඔහු සිය සහායක තැන වෙත හැරී මෙසේ පැවසීය. "මේකාව වෙනින් තැනක හංගන්ට ඕන. අපි ඕකාව සෙනෙව් කාර්යාලයට

ගෙනියමු. එහිදි උඹ එක්ක පෞද්ගලිකව කතා කරන්නම්. පෙත්සම් ඉදිරිපත් කරන්නෙ කවුද කියලා දැනගන්නට හැකිවේවි."

සෙල්ට්සර් දැත් වනා තම විරුද්ධත්වය පෑමට ඉදිරිපත් වූ නමුදු, සහායක තැන කසයෙන් ඔහුගේ පිට කොන්දට පහර දී කෑ ගැසීය.

"කට වහපිය ජඩයා."

වේදනාව නිසා සෙල්ට්සර්ගේ කට ඇදවිණි. ඔහු මුල්ලකට ගියේ වැනෙමිනි. ඔහුගේ දෙතොල් වෙව්ලන්නට විය. ඔහු මහත් ආයාසයකින් සුසුම්ලෑම් හඬට පිටවීමට ඉඩ නොදුන්නේය.

අවසානයේදී පාවෙල් කොර්චාගින් නැඟිට සිටියේය. හිරකැරවන් අතර ඉතිරි වී සිටියේ ඔහුත් සෙල්ට්සරුත් පමණි.

වෙර්න්යාක් ඔහු ඉදිරි පිට සිට ගෙන තම කළුවන් දෙනෙත්වලින් ඔහු පිරික්සා බැලීය.

"ඉතින් නුඹව හිර කළේ මොකටද?"

කර්නල් තැනට, එම ප්‍රශ්නයට ක්ෂණික පිළිතුරක් ලැබිණි.

"මම සැදෑලයෙන් සපත්තුවට හම් කැබැල්ලක් කපා ගත්තා."

"මොන සැදෑලයෙන්ද?"

"අපේ ගෙදර කොසාක්වරු දෙදෙනෙක් නවාතැන් ගත්තා. අස්පයකුගේ පරණ සැදෑලයෙන් හම් කෑල්ලක් සපත්තුවට ඕන හින්දා කැපුවා. ඉතින් මාව හිරභාරයට අරගෙන මෙහාට ගෙනාව." නිදහස ලැබීමට ඇති වියරු ආසාව නිසා ඔහු මෙසේද කීය. "මම දැන හිටියේ නැහැ එය තහනම් කියලා..."

කර්නල් තැන නොසැලකිල්ලකින් කොර්චාගින් දෙස බැලීය.

"නගර පාලක නිලධාරියා මොනවා කළාද කියලා යකා තමා දන්නෙ. මදෑ හිරකාරයන් ගෙනා හැටි!" දොර වෙතට හැරුණු කල්නල් තැන කෑ ගැසීය. "ගෙදර යන්ට පුළුවනි. තාත්තාට කියාපන් නුඹට හොඳ බැටයක් දෙන්ට කියලා. පලයන් යන්ට."

ඔහු තමා ගැන විශ්වාසය නොතැබීය. ඔහුගේ හදවත දොට්ට පැනීමට සැරසෙයි. බිම තිබුණු දොලීන්නික්ගේ කබායක් රැගෙන කොර්චාගින් දොර දෙසට දිව ගියේය. මුර සෙබළා පසු කර ගිය ඔහු එළියට යමින් සිටි චෙර්න්යාක්ට පිටුපසින් වත්තටද, එතැනින් ගේට්ටුවටද, මහ පාරටද දිව ගියේය.

ගබඩා කාමරයෙහි ඉතිරි වී සිටියේ අවාසනාවන්ත සෙල්ට්සර් පමණකි. ඔහු වේදනා සහගත කාන්සියකින් බලන්නේ ඉවෙන් මෙන් පිටවීමේ දොර දෙසට පියවර නැඟීය. එහෙත්, මුරපොළට වන් මුර සෙබළා යතුරු දමා දොර වසා යතුර එල්ලා අසල තිබුණු බංකුවේ වාඩි විය.

ආලින්දයට පැමිණි චෙර්න්ක් ස්වයං තෘප්තියකින් සහායකයා දෙස බලා කතා කළේය.

"අපි මෙහෙ ඇවිල්ලා බලාපු එක හොඳයි. බලාපන් මෙතන ගොඩ ගැහිලා තිබුණු කුණු ගොඩවල්වල හැටි, නගර පාලකයාව සුමාන දෙකකට හිර ගෙට දමමු. ඉතින් අපි යමුද?"

ජ්‍යෙෂ්ඨ මුර සෙබළා සිය සේනාංකය සිරුවෙන් සිට විය. කල්නල්ව දුටු හෙතෙම දුව ගොස් වාර්තා කළේය.

"කල්නල්තුමාණෙනි, යසට පෙළ ගැසී සිටිමු.

චෙර්න්යාක් සෑදලයේ පා දමන වළල්ලට පය තබා සැහැල්ලු ලෙස අසු පිටට පැන සෑදලය මත වාඩි විය. සහායක තැන දඟකාරී අසකු මෙල්ල කිරීමට උත්සාහ ගත්තේ ය. අසු මෙහෙයවන පටි අතට ගත් චෙර්න්යාක් ජ්‍යෙෂ්ඨ මුර සෙබළාට කතා කළේය.

"පාලක නිලධාරියාට කියාපන්, එයා පුරවාගෙන හිටපු කුණු ගොඩ මම එළියට දැම්මයි කියලා. ඔහු මෙතන කරලා තියෙන වැඩවලට ඔහුව සුමාන දෙකකට හිර ගෙදර දානවයි කියලා කියාපන්. හිර ගෙදර දැන් ඉන්න එකාව කාර්යාලයට ගෙන්න ගන්න ඕන. මුර සේවය සූදානමින් තැබිය යුතුයි."

"එහෙමයි කල්නල්තුමනි!" ජ්‍යෙෂ්ඨ මුර සෙබළා පිළිතුරු දුන්නේය.

කල්නල් තැන සහ සහායකයා අසුන් පන්නමින් පෙළපාළිය අවසන් වී තිබුණු චතුරශ්‍රයට පැමිණියහ.

★ ★ ★

වැටවල් හතකින් පැන දිවූ කොර්චාගින් නැවතුණේය. වැඩි දුර දිවීමට ඔහු තුළ ශක්තියක් නොවීය.

ආහාර නැතිව සිටීමද, ගබඩා කාමරයෙහි පිරිසිදු වාතය නොතිබීමද නිසා ඔහු දුබල විය. ගෙදර යාම සුදුසු නැත. බ්‍රුෂ්ෂාක්ලාගේ ගෙදර ගිය බව දැනගතහොත් එම පවුල විනාශ කරනු ඇත. කොහේ යන්ටද?

කළ යුත්තේ කුමක් දැයි නොදැන කොර්චාගින් එළවළු කොටු හා බංගලාවල ගෙවතු පසු කරමින් දිව ගියේය. කිසිවකුගේ වැටක හැප්පුණු පසු ඔහුට යමක් මතක් විය.

ගෙවැට දෙස බැලූ පසු ඔහු බියෙන් ඇලළිණි. උසැති ලී පතුරුවලින් එපිට ප්‍රධාන වනාරක්ෂකයාගේ වත්ත පටන් ගැනෙයි. විඩාපත් ඔහුගේ දෙපා ඔහු ගෙනාවේ එතැනටය. ඔහු මෙතැනට පැමිණීමට සිතුවේද? නැත.

එහෙත්, වනාරක්ෂකයාගේ බංගලාවට ඔහු පැමිණියේ කුමක් නිසාද?

එයට පිළිතුරු සැපයීමට ඔහුට බැරි විය.

කොහොම නමුත්, තරමක් විඩා සංසිඳුවාගෙන කළ යුතු දේ ගැන කල්පනා කළ යුතුය. ගෙවත්තේ ගිම්හාන ලතා මණ්ඩපයක් ඇත. එතන සිටින විට පිටතට නොපෙනේ.

ලීයක කොනක් අල්ලාගෙන උඩ පැන්න කොර්චාගින් වැට උඩට නැඟ වත්තට පැන්නේය. ගස්වලින් එපිට යම්තමින් පෙනෙන ගෙය දෙස බලා ඔහු ලතා මණ්ඩපය වෙත ගියේය. එය හැම පැත්තකින්ම විවෘතව තිබිණි. ගිම්හානයේ දී එහි වල් මිදි හැම තැනම වැවී තිබුණද, දැන් එය ලතාවලින් තොර විය. ඔහු නැවත වැට දෙසට යාමට හැරුණද පමා වී ඇත. ඔහු පිටුපසින් බල්ලකුගේ බිහිසුණු බිරුම් හඬකි. නිවසේ සිට කොළවලින් වැසී ගත් අතු පාර ඔස්සේ ගෙවත්ත ගෙරවුම් හඬින් දෙවනත් කරමින් ඔහු දෙසට විශාල බල්ලෙක් දුව ආවේය.

පාවෙල් ආරක්ෂා වීමට සුදානම් විය.

පළමුවැනි පහර දීම වළකාලීමට ඔහු ඌට පයින් ගැසීය. බල්ලා දෙවැනි පහරට සූදානම් විය. පාවෙල්ට සුපුරුදු කටහඬක් විසින් කෑ ගැසුණේ නැති නම් එම පොරය කෙසේ අවසන් වෙතිදැයි කාහට නම් කිව හැකිද?

"ට්‍රෙසෝර් පස්සට!"

මඟ ඔස්සේ තෝන්යා දිව ආවාය. ට්‍රෙසෝර්ගේ කර පටියෙන් අල්ලා ඌ ඉවතට ඇදගත් ඈ වැට අසල සිටි පාවෙල් ඇමතුවාය.

"ඔබ මෙහාට ආවේ කොහොමද? බල්ලා ඔබව හපා කන්ට ඉඩ තිබුණා. හොඳා මම...

ඈ නිහඬ වූවාය. ඇගේ දෙනෙත් මහත් විය. පැමිණ සිටින නාඳුනන ගැටවරයා කොර්චාගින්ට කොතරම් සමානද! වැට අසල සිටි පුද්ගලයා සෙලවුණේය. ඔහු කතා කළේ පහත් හඬකිනි.

"ඔයා... ඔබ මාව හඳුනන්නෙ නැතිද?"

තෝන්යා කෑ ගසන්නී, කොර්චාගින් වෙත වේගයෙන්

ළං වූවාය.

"පව්ලූෂා ඒ ඔයාද?"

ට්‍රෙසෝර් බල්ලා ඇගේ කෑ ගැසීම පහර දීමට කළ සංඥාවක් සේ පිළිගත්තෙන් ලොකු පිම්මක් පැන ඉදිරියට දිව්වේය.

"පල අහකට!"

තෝන්යාගෙන් පා පහර කීපයක් කෑ ට්‍රෙසෝර් අමනාපයෙන් වලිගය වකුටු කරගෙන නිවෙස දෙසට ගියේය.

තෝන්යා කොර්චාගින්ගේ අතක් ගෙන තද කරමින් මෙසේ කීවාය:

"ඔයා නිදහස් වුණාද?"

"ඔයා ඒ ගැන දන්නවාද?" පාවෙල් ඇසීය.

තම කැලඹීම මැඩ ගැනීමට තෝන්යාට නොහැකි වූයෙන් ඈ වේගයෙන් පිළිතුරු දුන්නාය.

"මම හැම දෙයක්ම දන්නවා. ලීසා මට කතාව කීවා. ඒ වුණාට ඔයා මෙතනට ආවේ කොහොමද? ඔයාව නිදහස් කළාද?

කොර්චාගින් පිළිතුරු දුන්නේ විඩා ගතියකිනි.

"වැරැදීමකින් මාව නිදහස් කළා. මම පැනලා දිව්වා. දැනටමත් මාව හොයනවා ඇති. මම මෙහෙ ආවෙ අහම්බෙන්. ලතා මණ්ඩපය ළඟ විවේක ගන්න කල්පනා කළා." සමාව ඉල්ලන්නාක් මෙන් යළි මෙසේද පැවසීය.

"මට හොඳටම මහන්සියි."

මොහොතක් ඔහු දෙස බලා සිටින්නී, අනුකම්පාවත්, උණුසුම් මුදු බවත්, අවදානමත් සහ සතුටත් නිසා ඉපිල ගිය ඈ ඔහුගේ අතක් මිරිකමින් ආදර බස් තෙපලාය.

"ආදරණීය පව්ලූෂා, ආදරණීය පාව්කා මගේම හොඳ... මම ඔයාට ආලය කරනවා... ඇහුණද?... ඔයා මගේ මුරණ්ඩු කොලුපැටියා..., එදා අපේ ගෙදරින් පිට වුණේ මොකටද? දැන් ඔයා මා ළඟට එන්න ඕන. මම ඔයාට යන්ට ඉඩ දෙන්නෙ නැහැ. අපේ ගෙදර බොහොම සන්සුන්. ඔයාට ඕන තරම් කල් ඉන්න පුළුවනි."

කොර්චාගින් විරුද්ධත්වය පාමින් හිස වැනීය.

"ඔයගොල්ලන්ගෙ ගෙදරදි මාව අල්ල ගත්තොත් ඔයගොල්ලන්ට මොනවා වේවිද? මට ඒක කරන්ට බැහැ."

අත විසින් ඇඟිලි වඩාත් තදින් මිරිකිණි. බැම සඟළ සෙලවිණි. දෙනෙත් දිලිසිණි.

"ඔයා දැන් අපේ ගෙදරට නාවොත්, ඔයාට ආයෙත් කවදාවත් මාව දකින්නට ලැබෙන්නෙ නැහැ. අර්ටියොම්ව සෙබළ මුර යටතේ දුම්රිය එළවීමට අරගෙන ගියා. දුම්රිය කම්කරුවන් සියලු දෙනාවම යුද්ධ හමුදාවට බලෙන් බඳවා ගන්නවා. ඔයා කොහේ යන්නද?"

ඇගේ බිය ගැන කොර්චාගින්ට වැටහුණද, ඔහුට බොහෝ සෙයින්ම වටිනා තරුණිය පහරට ගොදුරු වෙතියි යන බිය නිසා ඔහු එයට අකැමැති විය. වින්ද දුක නිසා බඩගින්නද ඔහුට වධ දුන්නේය. ඔහු ඇයගේ ඉල්ලීමට එකඟ විය.

තෝන්යාගේ කාමරයේ සෝපාවක් මත ඔහු වාඩි වී සිටින විට, කුස්සියේ දී අම්මා සහ දුව අතර සාකච්ඡාවක් කෙරිණි.

"අම්මේ මම ඉල්ලා හිටිනවා මගේ කාමරයේ දැන් වාඩි වෙලා ඉන්නවා කොර්චාගින්. ඔහු ඔබට මතකද? මගේ සිසුවෙක්. මම අම්මාගෙන් කිසිවක් වසන් කරන්ට හදන්නේ නැහැ. බොල්ෂෙවික්කාර නාවිකයකුව බේරාගත්තු හන්දා ඔහුව හිරභාරයට ගත්තා. ඔහු හිර ගෙදරින් පැන ආවා. දැන් ඔහුට නැවතීමට තැනක් නැහැ." ඇගේ කටහඬ වෙවුලන්නට විය. "ඔහුව අපේ ගෙදර නවත්වාගැනීමට අම්මාගෙන් අවසරය මම ඉල්ලා හිටිනවා."

දුවගේ දෙනෙත් බැගෑපත්ව ආයාචනා කරමින් මව දෙස බැලුවාය.

මව බියගත් විලාසයකින් තෝන්යාගේ දෙනෙත් දෙස බැලුවාය.

"හොඳයි, මගේ විරුද්ධකමක් නැහැ. නුඹ ඔහුව නවත්වා ගන්නෙ කොහිද?"

තෝන්යා තිගැස්සී ලැජ්ජා සහගත කැලඹීමකින් යුතුව පිළිතුරු දුන්නාය.

"ඔහුට නිදාගැනීමට මම මගේ කාමරයේ සෝපාව ලැස්ති කරලා දෙන්නම්. තාත්තාට දැනට ඒ ගැන කියන්න එපා."

අම්මා තෝන්යාගේ දෙනෙත් දෙස එක එල්ලේ බැලුවාය.

"නුඹේ ඇඬු කඳුළුවලට හේතුව මේකද?"

"ඕව්."

"ඔහු තවම කොල්ලෙක් නොවැ."

තෝන්යා ස්නායු කෝපයකින් මෙන් හැට්ට අත ඇද්දාය.

"ඔව්. දැන් ඔහු පැනලා නොගියා නම්, ඔහුව ලොකු මිනිහෙකු වගේ වෙඩි තබා මරා දමාවි."

ගෙදර කොර්චාගින් නැවතී සිටීම නිසා යෙක්කැතරීනා

මිහායිලොව්නා-තෝන්යාගේ මවු කැලඹී සිටියාය. ඔහු හිරහාරයට අසුවීම සහ තෝන්යා ඔහු කෙරෙහි දක්වන සැක රහිත අනුකම්පාවද, ඇය ඔහු කොහෙත්ම නොදන්නා නිසා ඈ සන්සුන් වූවාය.

තෝන්යා ගෙදර වැඩ කෙරෙහි ඉමහත් උනන්දුවක් දැක්වූවාය.

"අම්මේ ඔහුට නාන්ට ඕන. මම වතුර උණු කරලා පිළියෙල කරන්නම්. ගිනි උදුන්වල වැඩ කරන කෙනෙකු වගේම ඔහු කුණු තවරාගෙන ඉන්නවා. කොතරම් කල් ඔහු නාන්නෙ නැතුව හිටියාද?"

ඈ හැමතැනම දුවමින් යුහුසුලු වෙමින් වතුර උණු කළා ය. යට ඇඳුම් පිළියෙල කළාය. ඈ කාමරයට දුවමින්, කිසිදු විස්තරයක් නොකර පාවෙල්ගේ අතක් අල්ලා ගනිමින් නාන කාමරයට ඇදගෙන ගියාය.

"ඔයා ඔය කුණු තට්ටු ඔක්කොම සුද්ද කරන්න ඕන. මෙන්න අලුත් ඇඳුමක්. ඔයාගේ ඇඳුම් ඔක්කොම හෝදන්න ඕන. නෑවායින් පස්සේ මෙන්න මේක ඇඳගන්න ඕන." ඉරි පටි සහිත කර වාටියක් ඇති නාවික කමිසයක් සහ නාවික කලිසමක් ද පෙන්වමින් තෝන්යා කීවාය. එම ඇඳුම් කට්ටලය මනා ලෙස මැද නවා තිබිණි.

පාවෙල් මවිතයෙන් බැලූ අතර, තෝන්යා මඳහස පැවාය.

"මේක මම කානිවල් එකට මහපු ඇඳුම් කට්ටලය. ඔයාට හරි යාවි. ඉතින් හොඳට නාගන්න. මම ඔයාට ඉඩ දීලා යන්නම්. ඔයා නාන කල් මම කෑම පිළියෙල කරන්නම්."

ඈ නාන කාමරයේ දොර වසා පිටතට ගියාය. කෝර්වාගන්ට අකීකරු විය නොහැකිය. ඔහු ඇඳුම් උනා තබා වතුර ටැංකියට පැන්නේය.

පැයකට පසු තිදෙනාම, අම්මා, දුව සහ කෝර්වාගින් කුස්සියෙහි වාඩි වී ආහාර ගත්හ.

දින කීපයක් කුසගින්නේ සිටි පාවෙල්, තමාටම නොදැනුවත්ව ආහාර පිඟන් තුනක්ම හිස් කළේය. පළමුව ඔහු යෙක්කැතරීනා මිහයිලොව්නා නිසා ලැජ්ජා වුණද, ඇගේ මිතුරු ලීලාව දැක හැඟීම් දුරලා ආහාර ගත්තේය.

දවල් ආහාරයෙන් පසු ඔවුන් තෝන්යාගේ කාමරයෙහි රැස්වූ විට, යෙක්කැතරීනා මිහයිලොව්නාගේ ඉල්ලීම පිට පාවෙල් තම වේදනා සහගත අත්දැකීම් ගැන විස්තරයක් කළේය.

"ඉදිරි කාලයේදී මොනවා කරන්ට අදහස් කරනවද?" යෙක්කැතරීනා මිහයිලොව්නා ඔහුගෙන් විමසුවාය.

පාවෙල් කල්පනාකාරී විය.

"අර්ටියොම්ව හමුවෙන්ට ඕන. ඊට පස්සේ මෙහෙන් පැනලා යනවා."

"කොහාටද?"

"උමාන්වලට හරි කීයෙව් නගරයට හරි පැනලා යන්ටයි කල්පනාව. කොහේ යන්ට ඕනද කියලා මම දන්නෙ නැහැ. මෙතැනින් නම් පැනලා යන්ට ඕන."

මෙතරම් ඉක්මනින් මේ හැම දෙයක්ම වෙනස්වීම ගැන පාවෙල් විශ්වාස නොකළේය. අද උදේ හිර දොර හිටි අතර දැන් තෝන්යා අසලය. පිරිසිදු ඇඳුමින් සැරසී සිටී. ප්‍රධාන දෙය නිදහසය.

සමහර විට ජීවිතය පෙරළෙන්නේ මේ ලෙසටය. වරෙක අවුල් සහිත අඳුර මෙනි. තවත් වරෙක දීප්තිමත් හිරු රැස්වලට සමාන මඳ සිනාවකි. නැවත හිරභාරයට ගැනීමේ තර්ජනය ඔහු වෙත එල්ල වී නැති නම්, ඔහු වාසනාවන්ත් ගැටවරයකු වනු ඇත.

එහෙත්, දැන් ඔහු මෙතැන ඉන්නා විට, මේ විශාල නිසල නිවසෙහි ඉන්නා විට, ඔහු වැටලීමට ඉඩ ඇත.

කොහේ හෝ යා යුතු නමුදු මෙතන නම් නොසිටිය යුතුය.

එහෙත්, මෙතැනින් නම් පිට වී යාමට හිත නොදෙයි. යක්ෂ වැඩක් නොවැ! ගැරිබෝල්ඩි වීරයා ගැන කියවීමට ඇත්නම් කොතරම් හොඳද! කොරචාගින් ඔහුට කොතරම් ඉරිසියා කරන්නේද, ගැරිබෝල්ඩිගේ ජීවිතය වඩාත් අසීරු විය. හැම නගරයකින්මත්, ගමකින්මත් ඔහු එළෙව්වේය. පාවෙල් බියජනක වධ හිංසාවලට මූණ පාමින් කල් ගත කළේ දවස් හතක් පමණි. එහෙත්, අවුරුද්දක් ගෙවී ගියාක් මෙන් ඔහුට දැනෙයි.

පාවෙල් කොහෙත්ම නොවැදගත් වීරයකු වන හැටියකි.

"ඔයා හිතන්නෙ මොනවා ගැනද?" ඔහු දෙසට නැඹුරු වූ තෝන්යා ප්‍රශ්න කළාය. නිල්මිණි වැනි ඇගේ දෙනෙත් ගැඹුරු රහිත බවකි, ඔහුට දැනෙන්නේ.

"තෝන්යා මම ඔයාට ක්‍රිස්තීනා ගැන කියන්නම්, ඔයා අහන්ට කැමතිද...?"

"කියන්න" තෝන්යා උනන්දුවකින් කීවාය.

"...ඊට පසු ක්‍රිස්තීනා ආවේ නැහැ." හිරගෙදරදී හමු වූ ක්‍රිස්තීනා පිළිබඳ විස්තර කී ඔහු අවසාන වචන කීපය කීවේ හිතේ වේදනාවකිනි.

ඔරලෝසු බට්ටා වේලාව කිරන හැටි කාමරය තුළට ඇසෙයි. තෝන්යා හිස පැත්තකට නමාගෙන සුසුම් ලෑමට සූදානම් වන්නී, වේදනා දැනෙන තුරු දෙතොල් සපා ගත්තාය.

පාවෙල් ඇය දෙස බැලීය.

"අදම මම මෙතැනින් පිටවෙලා යන්ට ඕන." පාවෙල් දැඩි අදිටනකින් කීවේය.

"නැහැ. නැහැ. අද ඔයා කොහේවත් යන්නෙ නැහැ!"

ඇගේ සිහින් උණුසුම් ඇඟිලි සෙමින් ඔහුගේ මුරණ්ඩු හිසකෙස් අතරින් ගොස් ඒවා, සුරතල් ලෙස අදින්නට විය...

"තෝන්යා ඔයා මට උදවු කරන්නට ඕන. දුම්රිය ඩිපෝවට ගිහිල්ලා අර්ටියොම් ගැන හොයන්න. සිරියෝෂාට ලියුම් කෑල්ලක් ගෙනියන්න. අපේ ගේ ළඟ කපුටු කුඩුවේ පිස්තෝලයක් මම හැංගුවා. මම එහි යන්ට නරකයි. සිරියෝෂාට පුළුවනි එක ගෙනත් දෙන්ට. ඔයාට මේ වැඩ කරන්ට පුළුවනිද?"

තෝන්යා නැගිට සිටියාය.

"මම දන් යන්නම් ලීසා සුහර්කෝලාගේ ගෙදරට. ඇයත් එක්ක ඩිපෝවට යන්නම්. ඔයා ලියන්ට ලියුම් කෑල්ල. මම සිරියෝෂාට ගෙනිහින් දෙන්නම්. ඔහු ඉන්නේ කොහිද? ඔහු එන්න කැමති නම්, ඔයා ඉන්න තැන ඔහුට කියන්නද?"

පාවෙල් මඳක් කල්පනා කොට පිළිතුරු දුන්නේය.

"සිරියෝෂාට කියන්න රෑ වුණාම පිස්තෝලය ගෙනත් මට දෙන්ට කියලා."

තෝන්යා ගෙදර ආවේ හවස ඇඳිරි වූ පසුය. පාවෙල් තද නින්දක වැටී සිටියේය. ඇගේ අත වැදුණු හැටියේම ඔහු අවදි විය. ඈ සතුටු සිතින් මඳ සිනා පෑවාය.

"අර්ටියොම් දැන් ඒවි. ඔහු දුම්රියක වැඩ කරලා ආවා විතරයි. ලීසාගේ පියාගේ ඇපය පිට අර්ටියෝම්ට පැයකට නිවාඩු දුන්නා. දුම්රිය ඩිපෝවේ නවත්වලා තියෙනවා. ඔයා මෙහේ බව මට ඔහුට කියන්ට බැරි වුණා. බොහොම වැදගත් පණිවුඩයක් කියන්න තියෙනවා කියලා මම ඔහුට කීවා. ඔන්න ඔහු ඇවිල්ලා."

තෝන්යා ගෙදර දෙසට දිව ගියාය. තම ඇස් ඉදිරිපිට ඇති දෙය විශ්වාස නොකළ අර්ටියොම් ගල් ගැසුණාක්

මෙන් දොර ළඟ සිටියේය. උණ සන්නිපාත රෝගයෙන් පෙළෙමින් කාර්යාල කාමරයේ වැතිර සිටින තෝන්යාගේ පියාට අර්ටියොම්ගේ කටහඬ නැසෙන ලෙස තෝන්යා අයියයි මල්ලියි සිටි කාමරයේ දොර වැසුවාය.

අර්ටියොම්ගේ දෑත් පාවෙල් බදා ගත් විට, පාවෙල්ගේ ඇට කටු 'කිටි කිටි' ගාන හඬක් නැගිණි.

"මල්ලියේ! පාව්කා!"

★ ★ ★

තීරණය මෙසේ විය. පාවෙල් හෙටම පිටවී යනු ඇත. කසාටින් බලා යන දුම්රියේ බ්රුෂ්ෂාක් සමඟ වැඩ කිරීමට පාවෙල්ට පැවරීම අර්ටියොම් භාරගත්තේය.

සාමාන්යයෙන් දැඩි චරිතයක් ඇති අර්ටියොම් මල්ලී නිසා බොහෝ වෙහෙස මහන්සි වූ අතර, ඔහුගේ වැඩ ගැන නොදත්තේ සිය තුලනාත්මක හැසිරීම දිගටම පවත්වා ගැනීමට අපොහොසත් විය. ඔහු මල්ලී නිසා සීමාරහිත ලෙස සන්තෝෂ විය.

"එහෙනම් උදේ පහට නුඹ දුම්රියපොළේ බඩු ගබඩාවට වරෙන්. දුම්රියට දර පටවාවි. නුඹ දුම්රියට නැඟපන්. නුඹ සමඟ කතා කිරීමට මා කැමතියි. නමුත්, මට ආපසු යන්ට වේලාව හරි. නුඹව ඇරලන්ට හෙට එන්නම්. අපව බලෙන් හමුදාවට අරගෙන දුම්රිය සේනාංක හදනවා. ජර්මානුන් හිටිය කාලයේදී වගේ මුර සෙබළුන්ගේ ආරක්ෂාව යටතේ වැඩ කරන්ට වෙලා තියෙනවා."

අර්ටියොම් සමුගෙන පිට විය.

ඉක්මනින්ම ඇඳිර පැතිරිණි. සිරියෝෂා ගෙවත්තේ වැට ළඟට පැමිණිය යුතුය. ඔහු පැමිණෙන තුරු ඇඳිරි කාමරයක් තුළ කෝර්චාගින් ඔබ මොබ සක්මන් කරන්නට විය. තෝන්යා ඇගේ මවු සමඟ තුමානොව්ගේ කාමරයට ගොසිනි.

පාවෙල් ඇඳිරි ස්ථානයේදී සිරියෝෂා හමු වී අතට'තදී ආචාර කළේය. ඔහු සමඟ වාල්යාද පැමිණියාය. ඔවුහු පහත් හඬින් කතා කළහ.

"මට පිස්තෝලය ගෙනෙන්ට බැරි වුණා. නුඹලාගේ ගෙවත්ත පෙත්ල්යූරාවරුන්ගෙන් පිරිලා. කරත්ත නවත්වලා තියෙනවා. ගිනිමැලවල් පත්තු කරලා. ගහට නඟින්ට කොහොමටවත් බැහැ. හරිම අවාසනාවක්." සිරියෝෂා කීවේ තම අතපසු කිරීම සාධාරණ යැයි පෙන්වීමට මෙනි.

"ඒකට කමක් නැහැ. පාවෙල් ඔහු සන්සුන් කළේය."

නොගෙනා එක වඩාත් හොඳයි. මහ පාරෙදි හෝදිසි කරලා අහුවුණොත් බෙල්ල කඩලා දාවි. නොවරද්දාම නුඹ ඒක පස්සේ අරගනින්."

වාල්යා, පාවෙල් වෙත ළං විය.

"නුඹ යන්නෙ කවදාද?"

"හෙට උදේට වාල්යා, හිමිදිරි පාන්දර"

"නුඹ හිරගෙදරින් පැනලා ආවේ කොහොමද? කියපන්, කියපන්කෝ." වාල්යා ඇවිටිලි කළාය.

පාවෙල් තමා අත්දුටු දුක් ගැහැට සියල්ලක්ම පහත් හඬින් විස්තර කළේය.

ඔවුහු සුහද මිතුරන් ලෙස සමුගත්හ. විහිළු නොකළ සිරියෝෂා කැලඹුණේය.

"සුබ ගමන් පාවෙල්. අප අමතක කරන්ට එපා." වාල්යා කීවේ ආයාසයකිනි.

අඳුරෙහි අතුරුදහන් වුවාක් මෙන් ඔවුහු ගියහ.

නිවස තුළ නිසලතාවකි. ගෙවී යන කාලය පෙන්වමින් ඔරලෝසුව පමණක් 'ටික් ටික්' හඬක් නගයි. නිදාගැනීමට තරම් හිතක් දෙදෙනාටම නැත. තව පැය හයකින් ඔවුන් දෙදෙනා වෙන්වී යා යුතුය. සමහර විට එය සදහටම විය හැකිය. ඔවුන් දෙදෙනාගේම සිත් තුළ ඇති කෝටි සංඛ්‍යාත අදහස් හා වචන සියල්ලක්ම ඒ කෙටි කාලය තුළ දී පැවසිය හැකිද?

තියුණු හැඟීම් හරි හැටි අවබෝධ නොවන, හදවත ඉක්මනින් ගැහෙන නිසා නොපැහැදිලි ලෙස පමණක් හැඟෙන තරුණ බව, සීමාරහිත සුන්දර තරුණ බව: තම යෙහෙළියගේ පපුවට අහම්බෙන් අත වැදෙන විට, අත බිය වී තිගැස්සෙන විට හා පැත්තකට දිව යන විට, තරුණ බවේ මිත්‍රත්වය අවසානය දක්වා රැකගන්නා විට, ගෙල වැලඳගන්නා විට, විදුලිය සැරයක් බඳු ගිනි ගෙන දැවෙන සිප ගැනීම් කරන විට, ආදරවන්තයන්ගේ දැස් තරම් සුන්දර දෙයක් තවත් තිබේද?

මුළු මිත්‍රත්වයටම එය දෙවැනි චුම්බනය විය. මවු හැර කෝර්චාගින්ව කිසිවකු හුරතල් කළේ නැහැ. එහෙත්, ඔහුට බොහෝ දෙනා පහර දුන්හ. එබැවින් සුරතල් කිරීම වඩාත් වැඩියෙන් දැනිණි.

පහර කෑ, කුරිරු ජීවිතය නිසා ඔහු එවැනි සතුටක් ඇතැයි නොදත්තේය. ඔහුට මුණ ගැසුණු මේ තරුණිය විශාල

වාසනාවකි.

ඔහුට ඇගේ හිසකේවල සුවඳ දැනේ. ඇගේ දෙනෙත් පෙනෙන බව ඔහුට හැඟේ.

"තෝන්යා, මම ඔයාට කොතරම් ආලය කරනවද?" ඒ ගැන කීමට මා දන්නෙ නැහැ. දක්ෂකමක් නැහැ."

ඔහුගේ අදහස්වලට බාධා ඇති වෙයි. නැමෙනසුලු සිරුර කොතරම් කීකරුද?.... එහෙත්, තරුණ බවේ මිත්‍රත්වය හැමටම වඩා උසස්ය.

"තෝන්යා මේ කරදර සියල්ල ඉවර වුණායින් පස්සේ මම කාර්මික ශිල්පියකු වෙනවා. ඔයා මාව ප්‍රතික්ෂේප කරන්නේ නැති නම්, අපේ මිත්‍රත්වය බැරෑරුම් දෙයක් මිස සෙල්ලමක්, නොවේ නම්, මම ඔයාට හොඳ ස්වාමි පුරුෂයකු වෙනවා. කිසි දවසක ඔයාට පහර දෙන්නෙ නැහැ. ඔයාව කිසිම දවසක අමනාප කරන්නෙ නැහැ."

වැලඳගෙන සිටින විට, නින්ද ගියොත්, ඇගේ මවු දකිති යන බිය නිසාත්, ඇය අයහපත් ලෙස සිතීමට ඉඩ ඇති නිසාත්, ඔවුහු විසිර ගියහ.

එකිනෙකා අමතක නොකරන බවට, දැඩි මිතුරු ගිවිසුමක් ඇති කරගත් ඔවුන් දෙදෙනාට නින්ද ගියේ අරුණෝදය ළං වූ විටය.

හිමිදිරි පාන්දර යෙක්කැතිරීනා මිහයිලොව්නා, කෝර්චාගින් අවදි කළාය.

ඔහු හණිකට නැඟිට සිටියේය.

ඔහු නාන කාමරයට වී තම ඇඳුම් ඇඳගෙන, සපත්තු දමාගෙන, දොලීන්නික්ගේ කබාය ඇඳගන්නා විට, තෝන්යාගේ මවු ඇය අවදි කළාය.

තෙත මීදුමක් ඇති එම උදෑසන ඔවුහු ඉක්මනින් දුම්රියපොළ වෙත ගියහ. අනතුරුව ඔවුහු අතුරු මඟකින් දුම්රිය ගබඩාව වෙත ගියහ. දර පැටවූ දුම්රිය යන්ත්‍රය අසල වූ අර්ටියෝම් ඔවුන් එනතුරු නොඉසිලිමත්ව බලා සිටියේය.

වාෂ්ප ගුළි පිට කරමින් "ෂුකා" නමැති බලගතු දුම්රිය යන්ත්‍රය හෙමින් ආවේය.

යන්ත්‍රයේ කවුළුවකින් බ්‍රුෂ්ෂාක් පිටත බැලීය.

ඔවුහු හණිකට සමු ගත්හ. කෝර්චාගින්, ඇතුළු වන දොරටුව අසල ඇති යකඩ අත් තදින් අල්ලා ගෙන, දුම්රිය පදවන කාමරයට නැඟ ගත්තේය. අනතුරුව හේ හැරී බැලීය. මංසන්ධිය අසල හඳුනන දෙදෙනෙක් සිටගෙන උන්හ. උසැති

යෝධයා අර්ට්යොම්ය. ඔහු අසල සිහින් කුඩා තෝන්යාය. ඇගේ හැට්ට කර පටියද දුඹුරු පැහැති හිසකේ වලටද, සුළං කෝපයෙන් පහර දුන්නේය. ඈ අතක් වැනුවාය.

සුසුම්ලෑම් පිට නොකර තදින් මැඩ ගෙන සිටින තෝන්යා දෙස බැලූ අර්ට්යොම් හුස්ම පහත හෙළීය.

"එක්කෝ මම පල් මෝඩයෙක් වෙන්ට ඕන. නැතිනම් අර මුරිච්චි හරි තැන නැහැ. පාච්කා නුඹ තමා මිනිහා!"

දුම්රිය වංගුවෙන් හැරී ගිය පසු අර්ට්යොම් තෝන්යා දෙසට හැරී කතා කළේය.

"අන්න හොඳයි, අපි මිතුරෝ වෙමුද?" ඔහුගේ යෝධමය අත්ල මත වූ ඇගේ කුඩා අත සැඟවුණාක් මෙනි.

වේගය වැඩි කරමින් දුවන දුම්රියේ හඬ ඇතින් ඇසෙයි.

VII

යුද අගල්වලින් වට කළ මකුළු දැලක් සේ කටු කම්බිවලින් වෙළූ නගර ජනතාව, පුරා සතියක් තිස්සේ උදෑසන අවදි වූයේද, රැයෙහි නින්දට ගියේද කාලතුවක්කු හඬ හා රයිපල් තුවක්කු හඬ අසමිනි. මැදියම් රැයෙහිදී පමණක් නිහඬතාව ඇති විය. කාලතුවක්කු හඬ ඉඳහිට නිහඬතාව බිඳීය. එමඟින් සේනා රොක් වී සිටි තැන් සෙවීමට තැත් කළහ.

අරුණෝදය ඇති වෙත්ම, දුම්රියපොළ අසල වූ කාලතුවක්කු වටා රැස්වන සෙබළු යුහුසුලු වෙති. කාලතුවක්කුවේ කළු පැහැති කට යකෙකු මෙන් කුරිරු ලෙස හා බියජනක ලෙස 'කැස්සේය'. සෙබළු ඉක්මනින් කාලතුවක්කුවට ඊයම් වෙඩි උණ්ඩ පැටවිය. සෙබළෙක් කාලතුවක්කුවේ ලණුව අදිත්ම මහ පොළොව කම්පනය විය. නගරයට හැතැප්ම තුනක් ඈතින්, රතු හමුදාව අල්ලාගෙන සිටින ගමට ඉහළින් පියාඹා යන වෙඩි උණ්ඩ හඬ නඟමින්, දෙකන් බිහිරි කරවමින් ගොස් බිම වැටී පස් ගොඩවල් ඉහළට වීසි කරයි.

ඉපැරණි පෝලන්ත පූජකාරාමයේ මිදුලෙහි රතු හමුදාවේ කාලතුවක්කු සේනාංකය කඳවුරු ලා ගෙන සිටී. ගමේ උසැති කන්දක පූජකාරාමය පිහිටියේය.

කාලතුවක්කු සේනාංකයේ අණ දෙන්නා වන සමෝස්තින් කාලතුවක්කු කඳට හිස තබා නිදා සිට හණික නැඟිට සිටියේය. බරැති 'මවුසර්' පිස්තෝලයක් සහිත බඳපටිය වඩාත් තද වන සේ බැඳ ගත් ඔහු, පියාඹා ගිය වෙඩි උණ්ඩය යන අත බලමින් එහි පිපිරීම බලාපොරොත්තුවෙන් සිටියේය.

ඔහුගේ පණැති කටහඬ මිදුල පුරා පැතිරිණි.

"ඉතිරි ටික හෙට නිදාගනිමු. සහෝදරවරුනි. නැඟිටපල්ලා!"

අනිකුත් සෙබළුද කාලතුවක්කු අසලම නිදා උන්හ. ඔවුන්ද හණිකට නැඟිට සිටියේ තම අණ දෙන්නා අනුකරණය කරමිනි. සිදෝර්වුක් පමණක් සෙමින් වැඩි කැමැත්තක් නැතිව හිස ඔසවා බැලීය.

"මුන් හැබෑ නීචයෝ, යම්තම් එළිය වැටුණා විතරයි. බුරන්ට පටන් අරගෙන. මොකුන්ද මේ අධමයෝ!"

සමොස්තින් හඬ නඟා සිනාසුණේය.

"සිදෝර්වුක්, ඔවුන් පන්ති හැඟීම් නැති එවුන්, නුඹට නිදා ගන්ට ඕන බව ගණන් ගන්නෙ නැහැ."

කාලතුවක්කු සෙබළා අසතුටකින් දොඩවමින්, නැඟිට සිටියේය.

විනාඩි කීපයක් ගත වෙත්ම, පූජාකාරාම මිදුලෙහි වූ කාලතුවක්කු හඬ දුන්නේය. නගරය තුළ කාලතුවක්කු වෙඩි උණ්ඩ පිපිරිණි. සීනි කම්හලේ උසැති බටය මත වානේ තැටි උඩ පෙත්ල්යූරාගේ නිලධාරියෙක් හා ටෙලිෆෝන් යන්ත්‍ර ක්‍රියාකරන සෙබළෙක් සිටියයේය.

බටය තුළ ඇති යකඩ හිණිපෙළ දිගේ ඔවුහු උඩට නැඟගෙන සිටියෝය.

මුළු නගරයම ඔවුන්ට හොඳින් පෙනෙයි. බටය මත වූ නිලධාරියාගේ අණ අනුව ඔවුහු කාලතුවක්කු ප්‍රහාරය මෙහෙය වූහ. නගරය වට කොට සිටින රතු හමුදාවේ හැම චලනයක්ම ඔවුනට පෙනේ. අද බොල්ෂෙවිකයන් අතර විශාල ප්‍රාණවත් ගතියක් පෙනෙන්නට තිබේ. බොල්ෂෙවික් සේනාංක ඉදිරියට එන සැටි "සෙයිසේ" වර්ගයේ දුරදක්නයෙන් පෙනෙයි. දුම්රිය මග ඔස්සේ පදෝල්ස්ක් දුම්රියපොළ දක්වා සෙමින් යුද්ධ රථයක් පැමිණියේ, වෙඩි තැබීම නොනවත්වමිනි. එය පිටුපසින් පාබළ හමුදාවෝ ඉදිරියට ගියහ. රතු හමුදාවෝ නගරය අල්ලා ගැනීමට කීප වරක්ම පහර දුන්හ. නගරය අවට ආරක්ෂක කපොලුවල සැඟවී සිටි ප්‍රතිවිප්ලවාදීහු පෙරළා පහර ගැසුහ. කපොලුවලට පහර පිට පහර වැදිණි. හැමතැනම වෙඩි තබන උමතු හඬ ඇසිණි. එම හඬ බියජනක ගෙරවීමක් දක්වා වැඩි වී, පහර ගසන විට, එය උපරිම අංශය දක්වා උත්සන්න විය. වරුසාවක් මෙන් පතිත වන වෙඩි උණ්ඩ මැද, මිනිසුන්ට ඔරොත්තු දිය නොහැකි, ආතතිය

නිසා බොල්ෂෙවිකයන්ගේ රතු හමුදාවේ සේනාංක, මියගිය හා බරපතළ ලෙස තුවාල ලැබූ සෙබළුන් යුද පිටියේ දමා පසු බැස ගියහ.

අද රතු හමුදාවෝ වඩාත් දැඩි ලෙසත්, වඩාත් වැඩියෙනුත්, නිතර, නිතර පහර දෙති. කාලතුවක්කු වෙඩි උණ්ඩ නිසා සුළඟ නොසන්සුන් ලෙස වැනෙයි. මහ පොළොවට වැටී, ගාටමින් සියලු බාධා මැඩ බොල්ෂෙවික් සේනාංක ඉදිරියට එන සැටි සීනි කම්හලේ උසැති බටය උඩ සිට බලන විට පෙනෙයි. ඔවුහු මුළු දුම්රියපොළම පාහේ අල්ලා ගත්හ. පෙත්ල්යූරාගේ ප්‍රතිවිප්ලවවාදී සේනා සිය අතිරේක බලය යොදවා සටන් කළ නමුදු, දුම්රියපොළ අසලදී බිඳුණු පෙරමුණ යළි යථා තත්ත්වයට ගෙන ඒමට ඔවුහු අසමත් වූහ. දැඩි අදිටනකින් යුතුව සටන් කරන බොල්ෂෙවික් සේනාංක දුම්රියපොළට තදාසන්න වීදිවලට වැදුණහ. නගරාසන්න වතුවල හා ගෙවතුවල කඳවුරු ලා සටන් කළ පෙත්ල්යුරාගේ තෙවැනි රෙජිමේන්තුවේ සෙබළුන්ට බෝල්ෂෙවිකයන්ගේ කෙටි, බිහිසුණු පහරවලට ඔරොත්තු දිය නොහැකි වූයෙන්, ඔවුහු අසංවිධානාත්මක ලෙස, කාණ්ඩවලට කැඩෙමින් නගරයට පසුබැස ගියහ. පසු බසිනා සතුරාට යළි සංවිධාන වීමට ඉඩක් නොතබා මුර කපොලුවලට බයිනෙත්තු ප්‍රහාර එල්ල කරමින්, රතු හමුදාවේ සේනාංක වීදිවලට වැදුණෝය.

සිරියෝෂා බ්රුෂ්ෂාක් තම පවුලේ සාමාජිකයන් හා අනිකුත් කිට්ටු නෑයන් සමඟ ගෙදර බිම් ගෙයි සැඟවී සිටියද, දැන් ඔහු නවත්වාලීමට කිසිම බලයක් සමත් නොවීය. ඔහු ඉහළට ඇදිණි. අම්මාගේ විරුද්ධත්වය නොකතා ඔහු ශීත බිම්ගෙයි සිට එළියට ආවේය. "සගායිදාච්නී" නමැති යුද්ධ මොටෝ රථය හඬ නංවමින් හැම අතට වෙඩි තබමින් ගෙය අසලින් ගියේය. පෙත්ල්යූරාගේ සෙබළ පිරිසක් බිය වී රථය පිටුපසින් සීසීකඩ දුවන්නට විය. සිරියෝෂාලාගේ ගෙදර ගෙවත්තට අවි ගත් එක් සෙබළෙක් දුව ආවේය. ඔහු ලහි ලහියේ පතරොම් පටියද, යකඩ තොප්පිය සහ රයිපල තුවක්කුවද විසිකොට වැටට උඩින් පැන ගෙවත්තෙහි සැඟවුණේය. මහ මඟ දෙස බැලීමට සිරියෝෂා තීරණය කළේය. මඟ ඔස්සේ නිරිතදිග දුම්රියපොළ දක්වා පෙත්ල්යූරාගේ භටයෝ පසු බැස්සාහ. ඔවුන්ගේ පසු බැසීමට යුද රියක් විසින් ආවරණය සලස්වා දෙන ලදි. නගරය දක්වා වැටී ඇති මහ මඟ දැන් ජනායාගෙ

න් හිස්ය. මහමඟට රතු සෙබළෙක් දිව ආවේය. ඔහු බිම දිගා වී මහ මඟ දිගේ වෙඩි තැබීය. ඔහු පිටුපසින් තවත් රතු සෙබළෙකි, අනතුරුව තවත් එකෙක්... සිරියෝෂාට ඔවුන් පෙනේ. ඔවුහු දෙකට නැවී පා තබන ගමන්ම වෙඩි තබති. රත් පැහැති ඇස් ඇති, හිරුරැස්වලට පිලිස්සුණු හමක් ඇති චීන ජාතිකයෙක් නොසැඟවී දුවයි. යට කමිසයක් ඇඳ සිටි ඔහුගේ බඳ වටා මැෂින් තුවක්කු පතරොම් පටියකි. ඔහුගේ දෑතෙහි අත් බෝම්බ දෙකකි. අත් මැෂින් තුවක්කුවක් එල්ල කරගෙන හැමටම ඉදිරියෙන් ගැටවරයෙකියි කිව හැකි රතු සෙබළෙක් දුවයි. නගරයට කඩා වැදුණු රතු හමුදාවේ පළමුවැනි සේනාංකය එයයි. සිරියෝෂා සතුටින් පිනා ගියේය. ඔහු මහමඟට බැස මුළු වෙර යොදා කෑ ගැසීය.

"සහෝදරවරුනි ජයවේවා!"

රුදුරු ලෙස සිරියෝෂා මත කඩා පනින්ට ඔහුට සිතුණද, තරුණයාගේ ආස්වාදකාමීත්වය දුටුවෙන්, ඔහු නැවතුණේය.

"පෙත්ල්යූරා පැන දිව්වේ කොහාටද?" හතිලමින් චීන ජාතිකයා කෑ ගැසීය.

එහෙත්, සිරියෝෂාට එය නෑසිණි. ඔහු ඉක්මනින් ගෙවත්තට දිව ගොස් පෙත්ල්යූරාගේ සෙබළා විසි කළ රයිපල් තුවක්කුව හා පතොරම් රැගෙන සේනාංකයට ළං වීමට දිව ගියේය. රතු හමුදාව නිරිත දිග දුම්රියපොළට කඩා වැදුණු පසු පමණක් සිරියෝෂා කෙරෙහි අවධානය යොමු විය. වෙඩි උණ්ඩ, වෙඩි බෙහෙත් හා පතරොම් සහිත දුම්රිය පෙට්ටි කීපයක් කපා හැර, සතුරු සේනා කැලෑව දෙසට පන්නා දමා, විවේක ගැනීමට හා ප්‍රතිසංවිධානය වීමට රතු සේනා නැවතුණාහ. මැෂින් තුවක්කුකාර තරුණයෙක් සිරියෝෂා ළඟට විත්, මවිතයෙන් මෙසේ ඇසුවේය.

"සහෝදරයා නුඹ කොහේ ඉඳලද?"

"මම මේ නගරයේ කෙනෙක්. නුඹලා එනතුරු මම බලාගෙන හිටියා."

රතු සෙබළු සිරියෝෂා වටකර ගත්හ.

"මම එයා දන්නවා. චීන ජාතිකයා සතුටු සිතින් මඳ සිනා පෑවේය. එයා කෑ ගැසුවා."ජයවේවා! සහෝදරවරුනි! කියලා එයා බොල්ෂෙවික්කාරයෙක්. අපේ කෙනෙක් තරුණයා, හොඳයි" ප්‍රීතියෙන් සිරියෝෂාගේ උරහිසට තට්ටු කළ චීන ජාතිකයා බිඳුණු රුසියන් බසින් කීවේය.

සිරියෝෂාගේ ප්‍රීතිය නිමිහිම් නැති විය. ඔහු තමන්ගේම කෙනෙකු ලෙස පිළිගැනිණි. රතු සෙබළුන් සමඟ එක් වූ සිරියෝෂා බයිනෙත්තු ප්‍රහාරයක් එල්ල කොට දුම්රියපොළ අල්ලා ගත්තේය.

නගරය යළි පණ ලැබීය. බිම් ගෙවල්වල හා බිම් ගබඩාවල සැඟව දුක් විඳි ජනතාව තම ගෙවල්වල වැටවල් අසල රොක් වී නගරයට ඇතුළු වන රතු සේනාංක සිරියෝෂාව අන්තොනීනා වසිල්යෙව්නා සහ වාල්යා හඳුනා ගත්තෝය. හිස්වැසුමක් රහිතව, බඳ වටා එතූ පතරොම් පටි සහිතව, උරහිසින් රයිපලයක් ගෙන සිරියෝෂා ගමන් කළේය.

කෝපයට පත් අන්තොනීනා වසිල්යෙව්නා දැත් වැනුවාය.

ඇගේ පුතා සිරියෝෂා සටනට සහභාගි වී ඇත. අහෝ! එයට වන්දි ගෙවීමට ඔහුට සිදු වනු ඇත. කල්පනා කර බලන්න. මුළු නගරයටම පෙනෙන ලෙස ඔහු තුවක්කුවත් අරගෙන යනවා. පසුව මොනවා වේද?

එම හැඟීම ඇතිව අන්තොනීනා වසිල්යෙව්නා, තමා පාලනය කරගත නොහී, කෑ ගැසුවාය.

"සිරියෝෂා වහාම ගෙදර පලයන්! මම නුඹට යස පාඩමක් උගන්වනවා, තක්කඩියා. හිටපිය යුද්ධ කරන හැටි පෙන්වන්ට!" ඈ තම පුතු ඉදිරියට ගියේ ඔහු නවත්වන අදහසිනි.

එහෙත්, සිරියෝෂා, ඉස්සර ඇය විසින් කීප වරක්ම කනින් අදිනු ලැබූ සිරියෝෂා දැඩි ලෙස මවු දෙස බැලුවාය. ලජ්ජාවට හා අමනාපයට පත් ඔහු මෙසේ කීවේය:

"කෑගහන්ට එපා! මෙතැනින් මම කොහේවත් යන්නෙ නැහැ." ඔහු නොනැවතී ඇය අසලින් ගමන් කළේය.

අන්තොනීනා වසිල්යෙව්නා කෝපය පළ කළාය.

"ආ නුඹ ඔහොමද අම්මාත් එක්ක කතා කරන්නෙ! මීට පස්සෙ නුඹ ගෙදර එහෙම එන්නෙ නැහැ."

"මම එන්නෙම නැහැ!" ආපසු හැරී නොබලාම සිරියෝෂා පිළිතුරු ලෙස කෑගැසීය.

අන්දමන්ද වූ අන්තොනීනා වසිල්යෙව්නා පාර මැද සිටගෙන සිටියාය. ඉර අව්වට තලෙළු පැහැ ගත්, දූවිලි සහිත රතු සෙබළු ඇය ළඟින් ගමන් ගත්හ.

කිසිවකුගේ ශක්තිමත්, උපහාසාත්මක හඬක් ඇසිණි.

"අනේ අම්මේ අඬන්ට එපා! නුඹේ පුතණ්ඩියාව කොමිසර් පදවියකට පත් කරන්නම්."

සේනාංකයේ සෙබළු ප්‍රීතියෙන් සිනාසුණාහ. ඉදිරිපසින් යන්නෝ උස් හඬින් එක්වර ගායනා කළහ.

බිය නොවව්, සෝයුරනි පා තබව්
මරුට බියනොවි, සටන පණ පොවව්
නිදහස් රජයට පාර කපන්නට
සටන පණ පොවව්!

ගීතය අනිකුත් සෙබළුද බලවත් ලෙස ගැයූහ. එම ගායකයන් අතර සිරියෝෂාගේ කටහඬ නද දෙයි. ඔහු අලුත් පවුලක් සොයා ගෙන ඇත. බයිනේත්තු සමූහයකින් යුත් එම පවුලේ, එක් බයිනෙත්තුවක් සිරියෝෂාගේය.

★ ★ ★

ලෙෂින්ස්කිලාගේ බංගලාවේ ගේට්ටුවෙහි සුදු පැහැති කාඩ්බෝඩ් පුවරුවකි. එහි කෙටියෙන් මෙසේ ලියා තිබිණි. "රෙව්කොම්" (එය විප්ලවවාදී කමිටුව හැඳින්වෙන වචනයකි.)

පුවරුව අසල චිත්‍රයක් සහිත සටන් පාඨයකි. රතු සෙබළෙක් කියවන්නාගේ පපුවට ඇඟිල්ලක් එල්ල කොට ඇත. ඔහුගේ ඇස් කියවන්නාගේ නෙත් සමඟ ගැටෙයි.

"නුඹ රතු හමුදාවට බැඳුණාද?" යන පාඨය එහි ලියා ඇත.

රතු හමුදාවේ දේශපාලන අංශයේ සේවකයෝ පසු ගිය රෑයෙහි දී ඒ උද්ඝෝෂණ පත්‍රිකා ඇලවූහ. ෂෙපෙතෝව්කා නගරයේ වැසියන් වෙත කරන පළමුවැනි ආයාචනය එහි විය.

"සහෝදරවරුනි! නිර්ධන පන්තික සෙබළු නගරය අල්ලාගෙන ඇත. සෝවියට් ආණ්ඩු බලය යළි පිහිටුවා තිබේ. සන්සුන් වන ලෙස ජනතාවට අපි ආයාචනා කරමු. මිනීමරුවන් හා මංකොල්ලකරුවන් පන්නා දමා ඇත. ඔවුන්ට නැවත කිසි දිනෙක මෙහි පැමිණීමට ඉඩ නොතබනු සඳහාත්, ඔවුන් සඳහටම විනාශ කරනු සඳහාත් රතු හමුදාවට බැඳෙන්න. වැඩ කරන ජනතාවගේ ආණ්ඩුවට හැම අතින්ම ආධාර කරන්න. නගරයේ යුද්ධමය පාලනය හමුදා ප්‍රධානියාට අයත්ය. පුරවැසි පාලනය විප්ලවවාදී කමිටුව සතුය.

දොලීන්නික්
විප්ලවවාදී කමිටුවේ සභාපති.

★ ★ ★

ලෙෂින්ස්කිලාගේ බංගලාවට අලුත් මිනිස්සු ආහ. ඊයේ වනතුරු 'සහෝදරයා' යන වචනයට ජීවිතය පවා ප්‍රදානය

කිරීමට සිදු වුණාද, දැන් එය පියවරක් පාසාම ඇසිණි. තව'කෙකුට ඇගවීමට බැරි සිත් කැලඹෙනසුලු වචනයකි.

'සහෝදරයා!'

දොලීන්නික්ට නිදාගැනීම හා විවේක ගැනීමට අමතක විය. වඩු කම්කරුවා විප්ලවාදී ආණ්ඩු බලය තහවුරු කළේය.

බංගලාවේ කුඩා කාමරයක දොරෙහි කඩදාසි කැල්ලක් අලවා ඇත. 'පක්ෂ කමිටුව' නමැති වචනය පැන්සලකින් එහි ලියා තිබේ. උප ශාන්ත, ඔරොත්තු දෙනසුලු ගතියකින් යුත් ඉග්නාතියෙවා සහෝදරිය එම කාමරයේ වැඩ කරන්නීය. සෝවියට් ආණ්ඩු බලය සංවිධාන කිරීමේ කාර්යය ඇයට හා දොලීන්නික්ට භාර දෙනු ලැබ ඇත්තේ රතු හමුදාවේ දේශපාලන අංශය විසිනි.

දවසක් ගෙවිණි. කාර්යාල සේවකයෝ වැඩ පටන් ගත්හ. යතුරු ලියනයක් ක්‍රියාකාරී විය. ආහාර බෙදාහැරීමේ අංශයක් සංවිධාන කෙරිණි. ආහාර බෙදා හැරීමේ කොමසාරිස් තිෂ්ටිස්කි ක්‍රියාශීලීය. ඔහු ස්නායු කිපුණු කෙනෙකි. යාන්ත්‍රික ශිල්පියාගේ සහකරුවකු ලෙස තිෂ්ටිස්කි සීනි කම්හලේ වැඩ කළේය. බොල්ෂෙවික්වාදය කෙරෙහි සැඟවුණු වෛරයකින් පෙළෙමින් සිටින කම්හලේ පරිපාලනයේ වංශක්කාර උඩ කොටස විනාශ කර දැමීමට, සෝවියට් ආණ්ඩු බලය පිහිටවූ මුල් දවස්වල සිටම පෝලන්ත ජාතික තිෂ්ටිසික් දැඩි සේ තම ජාතියට ආවේණික වූ මුරණ්ඩු ගතියකින් ක්‍රියා කළේය.

කම්හලේ රැස්වීම් වාරයේදී කතා මණ්ඩපයේ මේසයට මිටින් ගැසූ තිෂ්ටිස්ක් තමා වටා සිටි කම්කරුවන් අමතා දැඩි, නොසෙල්වෙනසුලු වචනවලින් පෝලන්ත බසින් කතා කළේය.

"අවසානයි. ඉස්සර තිබුණු දේ නැවත ඇති වන්නේ නැහැ. පතෝට්ස්කිලා වෙනුවෙන් අපේ තාත්තලාත්, අපත් වැඩ කළා ඇති. අපි ඔවුන්ට මාලිගා හදලා දුන්නා. ඒ වෙනුවට අපේ රදල හාම්පුතා, යම්තම් අපේ බඩගිනි නිවාගෙන වැඩට එන්ට අපට සොච්චමක් දුන්නා.

පතෝස්කි රදලයයි. සන්ගුෂ්කි කුමාරයයි අවුරුදු කීයක් අපේ කර උඩ නැඟලා යන්ටද? රුසියන් හා උකරයින් කම්කරුවන්ව මෙන්ම, කොතරම් පෝලන්ත ජාතික කම්කරුවන්ව පතෝට්ස්කි පාගාගෙන හිටියාද? රදල හාම්පුතාගේ මෙහෙකරුවෝ දැන් ප්‍රචාරයක් ගෙන යනවා මේ පෝලන්ත කම්කරුවන්ව සෝවියට් ආණ්ඩු බලය යකඩ

අතකින් පාගා දමාවි කියලා.

"සහෝදරවරුනි, මෙය අමූලික බොරු ප්‍රචාරයක් නොයෙක් ජාතීන්ට අයත් කම්කරුවන්ට අද තරම් නිදහසක් ඉස්සර තිබුණේ නැහැ.

"නිර්ධන පන්තියට හැම දෙනෙක්ම සහෝදරවරු, රදල ධනපතියන්ව අපි කොහොම හරි පාගන්නම්. ඒ ගැන විශ්වාසය තබන්න." ඔහුගේ අත කවයක් අඳින්නාක් මෙන් කරකැවී නැවත කතා මණ්ඩපයේ මේසය මත පතිත විය." අපිව ජාතීන් හැටියට බෙදුවේ කවුද? සහෝදරවරුන්ගේ ලේ හලන්නට බල කරන්නේ කවුද? රජ ගොල්ලොයි, රදලයොයි. ඉස්සර කාලේ ඉඳලා පෝලන්ත ගොවීන්ව තුර්කි ජනතාවට විරුද්ධව සටන් කිරීමට යැව්වා. හැමදාම එක් ජනතාවක් තවත් ජනතාවක් මත කඩා පැනලා උන්ව විනාශ කළා. කොතරම් විශාල සංඛ්‍යාවක් ජනතාව විනාශකර තිබේද? කෙතරම් අවාසනාවන්ත සිද්ධීන් ඇති වී තිබේද? මේවා අවශ්‍ය වූයේ කාටද, අපටද? නමුත්, ඉක්මනින්ම මේ සියල්ල අවසන් වනු ඇත. එම නීචයන්ගේ අවසානය ළං වෙලා. ධනපතීන්ට බිය ගෙන දෙන වචනයක් බෝලෂෙවික්වරු ලෝකයේ හැම ජනතාවකටම ඉදිරිපත් කරලා තියෙනවා. "සියලු රටවල නිර්ධනයනි, එක්වව්!" කම්කරුවා කම්කරුවකුට සහෝදරයකු වීමත්, ප්‍රීතිමත් ජීවිතයක් ගැන අපේ බලාපොරොත්තුවත්, අපේ ගැලවීමත් එම උද්යෝග පාඨයේ රැඳී තිබෙනවා. සහෝදරවරුනි, කොමියුනිස්ට් පක්ෂයට බැඳෙන්න.

පෝලන්ත රජයක් ඇති වනු ඒකාන්තය. එය පතෝට්ස්කිලාගෙන් තොර වූ සෝවියට් ජනරජයක් වනු ඇත. පතෝට්ස්කිලාව අපි සමූල ඝාතනය කරන්නෙමු. සෝවියට් පෝලන්ත ජනරජයේ සැබෑ අයිතිකාරයෝ අපි වන්නෙමු. අප අතරින් බ්‍රෝනික් ප්තෂීන්ස්කිව කවුද අඳුනන්නේ නැත්තේ? අපේ කම්හලේ විප්ලවවාදී කමිටුවේ කොමසාරිස් ධුරයට ඔහුව පත් කර තිබෙනවා. කිසිදු අයිතියක් නැති අයට හැම අයිතියක්ම ලැබෙනු ඇත. අපිට ජය ලැබෙනු සහතිකය. හැංගිලා ඉන්න දුෂ්ට සර්පයින්ගේ කතාවලට සවන් දෙන්න එපා. අපේ කම්කරු විශ්වාසය අපට ආධාර කරන්නේ නම්, ලෝකයේ සියලු ජනතාව අතර සහෝදරත්වය අපි ගොඩනගමු!"

වාට්ස්ලාව් තිෂීට්ස්කි එම අලුත් වචන කීවේ චාම් කම්කරු හදවතක පතුලේ සිට පැන නැඟුණු බැවිනි.

ඔහු වේදිකාවෙන් බැස යන විට, තරුණ කම්කරුවෝ ඔහු දෙස බලා හැඟීමකින් යුතුව හඬ නැඟුහ. මහලු කම්කරුවෝ තම හැඟීම් පැවසීමට බිය වූවෝය. දන්නේ කවුද? සමහර විට හෙට වනවිට බොල්ෂෙවිකයන්ට පසු බැස යාමට සිදු වනු ඇත. එවිට හැම වචනයක් වෙනුවෙන්ම වන්දි ගෙවීමට සිදු වෙයි. එල්ලුම් ගහට නියම නූනොත් වැඩපළෙන් පන්නා දමනු ඒකාන්තය.

අධ්‍යාපන කොමසාරිස් තැන්පත් චෙර්නොජීස්කි වෘත්තියෙන් ගුරුවරයෙකි. ඔහු සිහින්ය. කෙට්ටුය. නගරයේ ගුරුවරුන් අතර බොල්ෂෙවික්වරුන්ට පක්ෂපාත එකම ගුරුවරයා ඔහු පමණකි. විප්ලවාදී කමිටුව ඉදිරිපිට විශේෂ කාර්යභාර සේනාංක ලැගුම් ගත්තේය. එම සේනාංකයේ රතු සෙබළු විප්ලවවාදී කමිටුව මුර කරති. හවස කමිටුවේ ඇතුළු දොරටුව ඉදිරිපිට ඔවුහු 'මක්සිම්' නමැති මැෂින් තුවක්කුව තබති. අමුත්තන් පිළිගන්නා කාමරය තෙක් දිගැති එහි පතොරොම් පටි නයෙකුට සමානය.

විප්ලවාදී කමිටුවට ඉග්නාතියෙවා ඇතුළු වූවාය. ගැටවරයකු වන රතු සෙබළා කෙරෙහි ඈ අවධානය යොමුකොට ප්‍රශ්න කරයි.

"සහෝදරයා නුඹේ වයස කීයද?"

"දහහතට ලබලා"

"නුඹ මෙහේ නගරේ කෙනෙක්ද?"

රතු සෙබළා මඳ සිනා පෑවේය.

"ඔව්. පෙරේදා සටන්වලදී තමා, මම රතු හමුදාවට බැඳුණේ."

ඉග්නාතියෙවා ඔහු දෙස පිරික්සුම් බැල්මක් හෙළුවාය.

"නුඹගේ තාත්තා කවුද?"

"දුම්රිය ඇන්ජිම පදවන්නාගේ අත් උදව්කාරයා."

වැටේ ගේට්ටුව අසලට දොලීන්නික් තවත් යුද්ධ සෙබළකු සමඟ ආවේය. ඉග්නාතියෙවා ඔහු දෙසට හැරී මෙසේ පවසයි.

"තරුණ කොමියුනිස්ට් සංවිධානයේ වැඩවලට මම කෙනෙකුව හොයා ගත්තා. ඔහු මේ නගරයේ කෙනෙක්"

දොලීන්නික් හණිකට සෙර්ගේයි (සිරියෝෂා) බ්‍රුෂ්ෂාක් දෙස බැලීය.

"කාගෙද?"

"ආ, සහාර්ගේ පුතා නෙව! හොඳයි. තරුණයන්ව

සංවිධානය කරපන්."

සිරියෝෂා ඔවුන් දෙස විමතියෙන් බැලීය.

"මගේ සේනාංකය ගැන කොහොමද?"

පියගැට පෙළ දිගේ යමින් සිටි දොලීන්නික් පිළිතුරු දුන්නේය.

"ඒක අපි බලාගන්නම්."

දෙවැනි දින හවස්වන විට, උක්රයීනයේ තරුණ කොමියුනිස්ට් සංවිධානයේ කමිටුවක් පිහිටුවා ගැනිණි.

නව දිවිය බලාපොරොත්තු රහිත ලෙස හා ඉක්මන් ලෙස ඇතුළු විය. එය හැම දෙයක්ම පුරවාලීය. නව දිවිය හැම දෙයක්ම සිය ජල ප්‍රවාහයට හසු කළේය. තම දෙමාපියන් සහ නෑයන් ළඟ සිටියද ඔහුට ඔවුන් ගැන අමතක විය.

හේ - සිරියෝෂා බ්රුෂ්ෂාක් - බොල්ෂෙවික්වාදියෙකි. උක්රයීනයේ කොමියුනිස්ට් පක්ෂය (බොල්ෂෙවික්) යන සිරස් තලය මුද්‍රණය කර ඇති සුදු පැහැති කඩදාසි කොළය ඔහු දසවැනිවරටත් සාක්කුවෙන් එළියට ගෙන බැලීය. සිරියෝෂා කොමියුනිස්ට් තරුණ සංවිධානයේ (කොම්සොමොල්) සාමාජිකයකු බවත්, නගර කමිටුවේ ලේකම් බවත් එම කඩදාසියෙහි සටහන් කොට ඇත. කිසිවකු ඔහුගේ මේ තත්ත්වය ගැන සැක කරත් නම්, සෙබළ කබායෙහි ඇති පටියෙහි, වැහි කබා රෙට්ටුවකින් කපා සාදාගත් කොපුවක 'මැන්ලීහර්' වර්ගයේ පිස්තෝලයක් ඇත්තේය. දකින්නන් මවිත කරවන එය ආදරණීය පව්කාගේ තිළිණයකි. එය ඒත්තු ගන්වනසුලු නියෝජිත බලයෙකි! පව්ලූෂා නැති වීම ලොකු කනගාටුවක්.

සිරියෝෂා මුළු දවස තිස්සේම විප්ලවවාදී කමිටුවේ වැඩ සඳහා දුව පැන ඇවිද්දේය. ඉග්නාතියෙවා ඔහු එනතුරු බලා සිටින්නීය. ඔවුන් දැන් දුම්රියපොළෙහි පිහිටි රතු හමුදාවේ දේශපාලන අංශයට යනු ඇත. එහිදී ඔවුනට අවශ්‍ය සාහිත්‍ය හා පුවත්පත් ආදිය තෝරා ගනු ඇත. ඔහු ඉක්මනින්ම මහ මගට දුවයි. දේශපාලන අංශයේ සේවකයෙක් ඔවුන් එනතුරු මෝටෝරියෙහි බලා සිටී.

දුම්රියපොළ ඈතය. පළමුවැනි සෝවියට් උක්රයීන රතු හමුදා ඩිවිෂනයේ සෙනෙවි මණ්ඩලය හා දේශපාලන අංශය දුම්රිය මැදිරිවල ලැගුම් ගෙන තිබිණි. ඉග්නාතියෙවා සිරියෝෂා සමඟ මොටෝ රියෙන් යන අතර, ඔහුගෙන් ප්‍රශ්න කරයි.

"නුඹගේ තරුණ අංශයේ වැඩවලින් මොනවාද කරලා තියෙන්නෙ? සංවිධානයක් හැදුවද? නුඹගේ මිතුරන් අතරයි, කම්කරු දූ පුතුන් අතරයි නුඹ උද්ඝෝෂණ වැඩ කරන්ට ඕන. ඉක්මනින්ම කොමියුනිස්ට්වාදී තරුණ කණ්ඩායමක් හදන්ට ඕන. කොම්සොමොල් සංවිධානයේ ආයාචනය අපි හෙට මුද්‍රණය කරමු. පසුව රඟහලේදී තරුණයන් ගෙන්වලා රැස්වීමක් පවත්වමු. දේශපාලන අංශයේදි මම නුඹට උස්තිනෝව්චිව හඳුන්වා දෙන්නම්. ඈ තරුණ සමිති වැඩ කරනවා වෙන්ට ඕන."

කොටට කැපූ කළු පැහැති හිසකෙස් ඇති උස්තිනෝව්චි දහඅට හැවිරිදි තරුණියකි. ඈ කාකි රෙදිවලින් මැසූ අලුත් සෙබළ කබායක් ඇඳ, බඳ වටා සිහින් පටියක් බැඳ සිටියාය. ඇය සමඟ කතා කළ සිරියෝෂා බොහෝ දේ දැන ගත්තේය. ඔහුගේ වැඩවලට ආධාර කරන බවටද ඈ පොරොන්දු වූවාය. ඔහු සමුගෙන පිට වී යන විට, ඈ ඔහුට පොත්, සඟරා, පුවත්පත් තොගයක්ද, විශේෂයෙන් තරුණ කොමියුනිස්ට් සංවිධානයේ ව්‍යවස්ථාව අඩංගු කුඩා පොතක්ද දුන්නාය.

ඔහු රැ වූ පසු විප්ලවවාදී කමිටුවේ කාර්යාලයට ආවේය. ඔහු එනතුරු වත්තට වී වාල්යා බලාගෙන සිටියාය. ඈ සෙර්ගේයිට (සිරියෝෂාට) දොස් පවරමින් කතා කළාය.

"නුඹට ලජ්ජ නැතිද! නුඹ සදහටම ගෙදරින් පිට වුණාද? අම්මා නුඹ හන්දා හැමදාම අඬනවා. තාත්තා තරහා වෙලා සණ්ඩුවක් ඇති වේවි."

"වාල්යා, ඒ කිසිවක් වෙන්නෙ නැහැ. ගෙදර එන්න මට වෙලාවක් නැහැ. සත්තකින්ම ඇත්ත. අදත් ගෙදර එන්න වේලාවක් නැහැ. නුඹ සමඟ කතා කරන්න ඕන. වරෙන් මා ඉන්නා තැනට."

වාල්යාට තම සොහොයුරා හඳුනාගැනීම පවා අපහසු විය. ඔහු සම්පූර්ණයෙන්ම වෙනස් වෙලාය. කිසිවකු ඔහුගේ ගතට විදුලිය සැර යැවුවාක් මෙනි. සොහොයුරිය පුටුවක වාඩි කරවූ සිරියෝෂා එක එල්ලේම කතාව පටන් ගත්තේය.

"මේකයි යෝජනාව. කොම්සොමොල් එකට බැඳියන්. තේරෙන්නෙ නැතිද? කොමියුනිට්ස්වාදී තරුණ සංගමයට බැඳියන්. මම ඒ අංශයේ සභාපති වගේ වැඩ කරනවා. විශ්වාස කරන්නෙ නැතිද? මෙන්න කියවාපන්."

වාල්යා ලියවිල්ල කියවා බලා කුළැටි ගතියකින් සිය සොහොයුරා දෙස බැලුවාය.

"කොම්සොමොල් එකට බැඳිලා මම කරන්නෙ මොනවාද?

සිරියෝෂා දෑත් වැනීය.

"මොනවද? වැඩක් නැත්ද? ආදරණීය නංගියේ! මම රෑට නිදාගන්නේ නැහැ. උද්ඝෝෂණය පටන් ගන්ට ඕන. ඉග්නාතියෙවා මෙහෙම කියනවා. තරුණ කට්ටියව රඟහලට කැඳවලා සෝවියට් ආණ්ඩුව ගැන ඔවුන්ට කියා දෙමු. මට කතාවක් කරන්ටයි කියලා ඈ කිව්වා. මට ඔය ගැන අවබෝධයක් නැති නිසා මා හිතන හැටියට කතාවක් කිරීම නම් වැදගැම්මකට නැහැ. ඇයට මේ ගැන කියන්නේ කොහොමද කියලා මම දන්නෙ නැහැ. මා කතාවක් කළොත් පල් වේවි. දැන් ඉතින් කියාපන් කොම්සොමොල් එකට බැඳෙනවද?"

"මම දන්නෙ නැහැ. එතකොට අම්මා බොහොම තරහා වේවි.

"වාල්යා නුඹ අම්මාගෙන් අහන්ට එපා" සිරියෝෂා හරස්ව කීය. "අම්මාට ඒවා ගැන තේරුමක් නැහැ. ඇගේ ළමයි ඈ සමඟ ඉන්ට ඕන කියලා විතරයි ඈ බලන්නෙ. සෝවියට් ආණ්ඩු බලයට ඈ විරුද්ධ නැහැ. අම්මා හැබෑවටම සෝවියට් ආණ්ඩුවට පක්ෂයි. ඒ වුණාට පෙරමුණට ගිහිල්ලා යුද්ධ කරන්නට ඕන ඇගේ පුත්තු නොවෙයි. වෙනත් අය. ඒක සාධාරණද? ෂුක්රායි අපට කියා දීපු හැටි නුඹට මතකද? ඔන්න බලපන්. පාවිකා, අම්මාගේ අදහස් විමසන්ට ගියේ නැහැ. දැන් අපේ හිතට එකඟ විදිහට ජීවත් වීමට අපට අයිතියක් තියෙනවා. වාල්යා නංගියේ ඇත්තටම නුඹ ප්‍රතික්ෂේප කරනවද? බැඳෙනවා නම් කොතරම් හොඳද? නුඹට කෙල්ලන් අතරයි. මට කොල්ලන් අතරයි වැඩ කරන්ට පුළුවනි. රතුපාට හිසකෙස් ඇති ක්ලීම්කාව අදම බඳවා ගන්නවා. වාල්යා නුඹ අප සමඟ එක් වෙනවාද, නැත්ද? ඔය ගැන විස්තර කරන පොත් පිංචක් මා ළඟ තියෙනවා.

ඔහු පොත් පිංච ගෙන නංගි අත තැබීය. වාල්යා අයියා දෙස බලාගත්වනම පහත් හඬින් ප්‍රශ්න කළාය.

"පෙත්ල්යූරාගේ භටයන් ආපසු ආවොත් මොනවා වේවිද?"

සිරියෝෂා පළමුවැනි වරට එම ප්‍රශ්නය ගැන කල්පනා කළේය.

"මම නම් සත්තකින්ම හමුදාවත් එක්ක යනවා. නුඹ ගැන මොනවා කරන්ටද? එතකොට අම්මා හැබෑටම

අවාසනාවන්තියක් වේවි." ඔහු නිහඬ විය.

"නුඹ මාව බඳවාගනින් සිරියෝෂා, අම්මයි වෙන අයයි ඒ ගැන දැනගත යුතු නැහැ. නුඹයි මමයි විතරයි ඒ ගැන දැනගත යුත්තේ. මම නුඹට හැම අතින්ම උදවු කරන්නම්. ඒක තමා හොඳම විදිහ."

"වාල්යා නුඹ හරි."

කාමරයට ඉග්නාතියෙවා ආවාය.

"ඉග්නාතියෙවා සහෝදරිය, මේ මගේ නංගී වාල්යා. කොම්සොමොල් සංවිධානයට බැඳීම ගැන මම නංගී සමඟ කතා කළා. ඈ බැඳෙන්ට කැමතියි. නමුත්, අපේ අම්මා බොහොම සැරයි. වෙන කාටවත් නොදැනගන්නට ඇයව බඳවාගන්ට පුළුවන්ද? අපිට සිද්ද වුණොත් පසු බසින්ට මම තුවක්කුවත් අරගෙන හමුදාව සමඟ යනවා. ඇයට අම්මා ගැන දුකයි."

ඉග්නාතියෙවා මේසයේ කොනක් අසල වූ පුටුවක වාඩි වී ඕනෑකමින් සවන් දී සිටියාය.

"හරි!ඒ විදිහ තමා වඩාත් හොඳ."

★ ★ ★

නගරය පුරාම රැස්වීම පිළිබඳ දැන්වීම් පත්‍ර ඇලවීම නිසා, රඟහල තරුණයන්ගෙන් පිරී ඉතිරී තිබිණි. ඔවුහු කතා කිරීමෙහි රුසියෝය. සීනි කම්හලේ කම්කරුවන්ගේ වාදක මණ්ඩලය වැයීය. රඟහලට පැමිණි වැඩි දෙනා පාසල්වල සිසුවෝය.

ඔවුන් හැම දෙනාම මෙහි ආවේ රැස්වීම නිසාම නොවේ රඟපෑම් බැලීමටය.

අවසානයේ දී තිරය එසවූයෙන්, රඟහලේ වේදිකාවට ප්‍රාදේශීය කමිටුවේ ලේකම්වර රාසින් සහෝදරයා පැමිණියේය.

මිටි, සිහින් සිරුරකින් හා තියුණු නාහයකින් හෙබි ඔහු කාගේත් සැලකිල්ලට යොමු විය. ඔහුගේ කතාව හැම දෙනෙක්ම විශාල අවධානයකින් යුතුව ඇසූහ. මුළු මහත් රටම අසු වී සිටින සටන ගැන කතා කළ ඔහු, කොමියුනිස්ට් පක්ෂය වටා එක්රැස් වන ලෙස තරුණයන්ට ආයාචනය කළේය. ඔහු සැබෑ කතිකයකු මෙන් කතා කළේය. එහෙත්, ඔහුගේ කතාවේ 'සාධර්මික මාක්ස්වාදීන්' 'සමාජ ෂෝවිනිට්ස්වරුන්' ආදී වචන බොහොමයක් ගැබ්වී තිබුණු අතර, අසා සිටින්නන්ට ඒවායේ තේරුම් නොවැටහිණි.

ඔහුගේ කතාවට බොහෝ දෙනා අත්පොළසන් දුන්හ. ඔහු සිරියෝෂාට ඊළඟ කතාව භාර දී රඟහලින් පිට විය.

සිරියෝෂා බිය වූ දෙයම සිදු වූයේය. කතාව කටින් පිට නොවෙයි. "කතා කරන්නේ මොනවාද?" මොනවා ගැනද සුදුසු වචන සොයමින් ඒවා සොයා ගැනීමට අපොහොසත්ව ඔහු වේදනා වින්දේය.

ඉග්නාතියෙවා ඔහුට සහාය පිණිස පැමිණියාය. මේසයට එහා සිටි ඈ සෙමින් කොඳුළාය.

කොම්සොමොල් ශාඛාව සංවිධානය කරන හැටි ගැන කියාපන්."

සිරියෝෂා වහාම ක්‍රියාකාරී වැඩ ගැන කතා කිරීමට පටන් ගත්තේය.

"සහෝදරවරුනි, තමුන්නාන්සේලා හැම දෙයක් ගැනම අසා සිටියා. දැන් අපි ශාඛාවක් හැදිය යුතුයි. එම අදහසට පක්ෂ උදවිය කවුද?"

රඟහල නිහඬ විය.

උස්තීනොව්ච් ඔහුට ආධාර පිණිස ඉදිරිපත් වූවාය. මොස්කව් නගරයේ කොමියුනිස්ට් තරුණ සංවිධානය පිළිබඳ විස්තර ඈ කියන්නට වූවාය. ලජ්ජාවට පත් සිරියෝෂා පසෙකට වී සිටියේය.

ශාඛාව සංවිධානය කිරීම පිළිබඳ ඔවුන් දැක් වූ ආකල්පය නිසා ඔහු කැලඹුණේය. ඔහු සතුරු ලෙස අසන්නන් අසුන් ගෙන සිටි ශාලාව දෙස බැලීය. සලිවානොව් උපහාසාත්මක ලෙස උස්තීනොව්ච් දෙස බලා ලීසා සුහර්කෝගේ කනට යමක් කොඳුළේය. ඉස්සරහ පුටු පෙළෙහි වාඩි වී සිටි උසස් විදුහල්වල, ඉහළ පන්තිවල ඉගෙන ගන්නා සිසුවියෝ දිලිසෙන ඇස්වලින් හැම දෙයක්ම බලමින් කසු කුසු ගැහ. ඔවුන්ගේ මුහුණු පුයරවලින් සරසලාය. වේදිකාවට ඇතුළු වන මුල්ලේ තරුණ රතු සෙබළුන්ගේ කණ්ඩායමකි. ඔවුන් අතර තමා හඳුනන මැෂින් තුවක්කුකාර තරුණයාව සිරියෝෂා දුටුවේය. ආලෝකවත් කළ වේදිකාවේ කෙළවරක වාඩි වී සිටි ඔහු ස්නායු කිපුණු විටෙක මෙන් නොසන්සුන් වී නවීන පන්නයට ඇඳ පැලඳ සිටී. ඔහු ලීසා සුහර්කෝ හා ආන්නා අද්මෝව්ස්කායා දෙස කෝපයකින් යුතුව බැලීය. මේ තරුණියන් දෙදෙනා කිසිදු බිය සැකක් නැතිව තමන් සමඟ පැමිණි තරුණයන් සමඟ කතා කරමින් උන්හ.

තමාට සවන් නොදෙන බව වටහා ගත් උස්තිනෝව්ච්

කතාව අවසන් කොට, ඉග්නාතියෙවාට ඉඩ දුන්නාය. ඉග්නාතියෙවාගේ සන්සුන් කතාව අසන්නන්ගේ සිත් ගති.

"තරුණ සහෝදරවරුනි."යි ඈ රැස්වීම ඇමතුවාය.

"මෙතැනදී ඇසූ කතා ගැන ඔබ හැම දෙනෙකුටම කල්පනා කළ හැකිය. මට හොඳටම විශ්වාසයි ඔබ අතරින් සමහරුන් විප්ලවයේ නිරීක්ෂකයන් හැටියට නොව, එහි ක්‍රියාශීලීන් හැටියට එයට එක්කාසු වන බව, විප්ලවයේ දොරටු ඔබ ඉදිරියේ විවෘතව ඇත. නැවතී ඇත්තේ ඔබගේ වුවමනා නිසාය. ඔබේ අදහස් ඔබම කියනු ඇසීමට අපි කැමැත්තෙමු. සිය අදහස් පැවසීමට කැමැති අයට ආරාධනා කරමු."

රැගුම්හලේ නැවත නිහඬතාවකි. පසු පස පුටු පෙළෙන් හඬක් නැඟිණි.

"මා කැමතියි කතා කරන්න.!"

වලස් පැටියකුට සමාන කෙනෙක් වේදිකාවට නැංගේය. ඔහුගේ ඇසක් යම්තමින් වපරය. ඔහු මීෂා ලෙච්චුකොච්ය.

"කාරිය එහෙම නම්, බොල්ෂෙවික්වරුන්ට උදව් කළ යුතුයි. මම ප්‍රතික්ෂේප කරන්නේ නැහැ. සිරියෝෂා මාව දන්නවා. මම කොම්සොමොල් සංවිධානයට බැඳෙන්නම්."

සිරියෝෂා තුටු ලෙස මඳ සිනා පැවේය.

"ඔන්න පේනවා නේද සහෝදරවරුනි!" සිරියෝෂා වේදිකාව මැදට පැන්නේය. මම කීවා නොව. මීෂ්කා අපේ කොල්ලෙක්. එයාගේ තාත්තා දුම්රිය මාර්ගයේ වැඩ කරනවා. ඔහුගේ තාත්තා දුම්රිය මැදිරියකට යට වුණා. ඒ නිසා මීෂාට ඉගෙනීමක් ලබාගන්ට බැරි වුණා. උසස් විදුහලකට නොගියාට අපේ වැඩ ගැන ඔහුට නියම දැනීමක් තියෙනවා."

ශාලාව තුළ හඬ නැඟීම් හා කෑ ගැසීම් ඇති විය. මෙවර කතා කිරීමට අවසර ඉල්ලුවේ නගරයේ බෙහෙත් කලවම් කරන්නෙකුගේ පුතකු වන විදුහල් සිසු ඕකුෂෙච්ය. ඔහුගේ හිසකේ මැදින් ගෙන කෘත්‍රිම ලෙස කැරැලි කරලාය. උඩ කබාය හරිගස්සා ගෙන ඔහු කතාව පටන් ගත්තේය.

"සහෝදරවරුනි, මට සමාවෙන්න. අපෙන් උවමනා මොනවද කියන එක ගැන මට තේරුමක් නැහැ. අපි දේශපාලනයට බැසිය යුතුද? එහෙම නම් ඉගෙනගන්නෙ කවදාටද? අපි විදුහල අවසාන කළ යුතුයි. මොනවාහරි ක්‍රීඩා සමාජයක්, සමාජ ශාලාවක් නම් වෙනිත් දෙයක් එතැන අපට රැස්වෙලා කියවන්නට පුළුවනි. දේශපාලන වැඩ

කරන්ට ගියොත්, පසුව එල්ලලා මරා දමාවි. සමාවෙන්න. ඔය යෝජනාවට කවුරුත් එකඟ වෙන්නෙ නැහැ."

අසන්නෝ හඬ නඟා සිනාසුණහ. ඕකුෂෙව් වේදිකාවෙන් පැන තම අසුනෙහි වාඩි විය. ඔහුගේ තැන ගත්තේ මැෂින් තුවක්කුව ක්‍රියා කරවන තරුණ සෙබළාය. කෝපව හිස් වැස්මෙන් නළල වසා ගත් ඔහු උතුරා යන කෝපයෙන් යුත් දෙනෙතින් අසන්නන් දෙස බැලීය. ඔහු හඬ නගා කෑ ගැසීය.

"නීචයනි, තොපි හිනාවෙනවාද?"

ඔහුගේ දෙනෙත් ගිනි පුලිඟු මෙනි. දිගු ලෙස ආශ්වාස කළ ඔහු වියරුවෙන් වෙවුලමින් කතා කළේය."මගේ නම ෂාර්කි, ඉවාන් මගේ දෙමාපියන් මා දන්නේ නැහැ. මම අනාථයෙක්, හිඟන්නකු ලෙස අගුපිල්වල කාලය ගත කළා. බඩගින්නේ හිටියා. ඉන්ට ගෙයක් තිබුණේ නැහැ. බල්ලකුටත් වඩා අන්ත ජීවිතයක් මම ගත කළේ නුඹලට වගේ හුරතල් ජීවිත මට තිබුණේ නැහැ. සෝවියට් ආණ්ඩු බලය පැමිණියා. රතු සෙබළු මට පිහිට වුණා. සේනාංකයක් මාව ඔවුන්ගේ පුතා හැටියට භාර ගත්තා. ආහාර, ඇඳුම්, සපත්තු දුන්නා. අකුරු උගැන්නුවා. ප්‍රධාන දෙය මිනිස් හැඟීම් ඇති කළා. ඔවුන් නිසා බොල්ෂෙවික්වාදියකු බවට පත් වුණා. මැරෙන තුරු මම බොල්ෂෙවික්වාදියෙක්මි. මේ සටන මොන කාරණයක් නිසාද කියන එක මම හොඳට දන්නවා. දුප්පතුන් සඳහා, කම්කරු පන්ති බලය සඳහා. නුඹලා ගොන්නු වගේ තප්පුලනවා. නමුත්, දන්නේ නැහැ. මේ නගරාසන්නයේ එක සටනකදී සහෝදරවරු දෙසීයකට වැඩිය ජීවිත පූජා කළ බව..." ෂාර්කිගේ කටහඬ වීණාවක තතක් ඇද්ද කලක මෙන් විය. "කල්පනා නොකර අපේ ප්‍රීතිය සඳහා අපේ කාරිය සඳහා ඔවුන් ජීවිත පූජා කළා... රට පුරාම මැරෙනව. පෙරමුණුවල මැරෙනවා. නුඹලා මෙතැනට වෙලා ඉඳගෙන වාචාලකම් දොඩවනවා. සහෝදරවරුනි, ඔන්න ඔවුන්ට ආයාචනා කරන්නට" හිටිහැටියේම ඔහු සභාපති මණ්ඩලයේ මේසය දෙසට හැරුණේය. "ඔන්න අරුන්ට" ඔහු ශාලාව දෙසට ඇඟිල්ලෙන් පෙන්වීය. "ඔවුන්ට තේරුම් ගන්ට පුළුවන්ද? බැහැ! බට කට පුරා කාපු එකා බඩගින්නේ ඉන්න එකාගේ සහෝදරයකු නොවෙයි. මෙතැන එක්කෙනෙක් පමණයි එකඟ වුණේ. ඔහු දුප්පතෙක්. නුඹලා නැතිව අපට පුළුවනි." වියරු කෝපයෙන් ඔහු රැස්වීම ඇමතීය. "නුඹලාගෙන් ල්ලන්නේ නැහැ. නුඹලා යකෙකුටවත් උවමනා නැහැ! මේ

වගේ එවුන්ට මැෂින් තුවක්කුවෙන් වෙඩි තියන්ට ඕන." ඔහු හති දමා කෑ ගසා වේදිකාවෙන් පැන කිසිවකු දෙස නොබලා පිටවීමේ දොරටුව දෙසට ගියේය.

සභාපති මණ්ඩලයේ කිසිවෙක් හවස වැඩසටහනට සහභාගි නොවූහ. විප්ලවවාදී කමිටුවේ කාර්යලය දෙසට යමින් සිටි සිරියෝෂා බලාපොරොත්තු රහිතව මෙසේ පැවසීය:

"මදෑ වෙච්ච වැඩක හැටි! ෂාර්කි නිවැරැදියි. උසස් විදුහල් සිසුන්ගෙන් කිසිම වැඩක් නැහැ. යකා ඇවිස්සෙන එක විතරයි."

"පුදුම වෙන්ට දෙයක් නැහැ."ඉග්නාතියෙවා කීවාය. "මේ නගරයේ නිර්ධන පන්තික තරුණයෝ ඇත්තෙම නැහැ. වැඩි දෙනා සුළු මැද පන්තියටයි. බුද්ධිමත්, දේශපාලන හැඟීමක් නැති කොටසටයි අයිති. කම්කරුවන් අතර වැඩ කරන්ට ඕන. ලී ඉරන කම්හලෙයි, සීනි කම්හලෙයි අය අතර නමුත්, රැස්වීමෙන් කොහොමහරි ප්‍රයෝජනයක් තියෙනවා. පාසල්වල ඉගෙන ගන්නා අය අතර හොඳ සහෝදරවරුන් ඉන්නවා." උස්තීනෝව්ච් ඉග්නාතියෙවාගේ අදහසට පක්ෂ වූවාය.

"සිරියෝෂා, අපේ අදහසුත් අපේ සටන් පාඨත් හැම කෙනෙකුගේම සංවිඥානයට ඇතුළු කරවීම අපේ කාරියයි. හැම අලුත් සිද්ධියක්ම කෙරෙහි පක්ෂය වැඩ කරන ජනතාවගේ සැලකිල්ල යොමු කරනවා. අපි රැස්වීම් සාකච්ඡා සම්මේලන ආදිය තබමු. දුම්රියපොළෙහි පිහිටි දේශපාලන අංශය, ගිම්හාන නැටුම් හලක් විවෘත කරන්නට යනවා. ළඟදීම උද්ඝෝෂණ දුම්රිය මෙහාට ඒවි. හැම තැනම වැඩ පටන් ගනිමු. ලෙනින්ගේ වචන මතකද, වැඩ කරන ජනතාවට අයත් කෝටි සංඛ්‍යාත ජනකාය සටනට ඇද ගන්නේ නැතිනම් අපට ජය ගත නොහැකිය.

රෑ වූ පසු සිරියෝෂා, උස්තීනෝව්ච්ව දුම්රියපොළට ගෙනගොස් ඇරලුවේය. ඇගෙන් සමුගත් ඔහු ඇගේ අතක් ගෙන ආචාර කරන්නේ එය ඔහුගේ අත්ලෙහි තත්පරයක් පමණ රඳවා ගත්තේය. උස්තීනෝව්ච් යම්තමින් මඳ සිනා පෑවාය.

නගරයට පැමිණි සෙර්ගෙයි තම ගෙදරට ගියේය.

අම්මාගේ ප්‍රහාරයට ඔහු මුහුණ දුන්නේ විරුද්ධත්වය ප්‍රකාශ නොකොට නිහඬව ඉවසීමෙනි. තාත්තා බැණ වැදීමට

පටන්ගත් විට සිරියෝෂා ක්‍රියාශීලී වී සහාර් වසීලවිච්ව අසීරු තත්වයකට පත් කළේය.

"තාත්තේ මේ අහන්න. ජර්මන්නු නගරය අල්ලාගෙන සිටි කාලේදීත්, වැඩ නැවැත්වූ විටදීත් දුම්රිය ඇන්ජිමේ සිද්ධියේදී ජර්මන් සෙබළාව මරා දමන විටදීත්, දරු පවුල ගැන කල්පනා කළාද? කල්පනා කළා. ඒ වුණත් ඒ වැඩේ කළා. මන්ද, තාත්තාගේ කම්කරු පන්ති හැඟීම බල කළ හන්දා මමත් දෙමාපියන් ගැන කල්පනා කළා. මම දන්නවා. රතු හමුදාව පසු බැස්සොත් මා නිසා දෙමාපියන්ට, නංගිට කරදර සිදුවේවි. නමුත්, අපි ජයගතහොත් අපට හරියාවි. ගෙදරට වෙලා නිකම් ඉන්ට මට බැහැ. තාත්තාට මේ කාරණාව හොඳට තේරුම් ගත හැකියි. ඕන නැති තර්ක ඉදිරිපත් කරන්නේ මොකටද? මම හොඳ වැඩකට සහභාගි වෙනවා. තාත්තා මට පක්ෂපාත වෙන්ට ඕන. උදව් දෙන්ට ඕන. ඒ වුණාට තාත්තා මට බණිනවා. තාත්තේ අපි සමාදාන වෙමු. එතකොට අම්මා මට කෑ ගැසීම නවත්වාවි." සිරියෝෂා පිරිසිදු නිල් පැහැති දෙනෙතින් සොම්නස් ලෙස මඳ සිනා පාමින්, තම නිවැරැදි බව ගැන විශ්වාස කරමින් පියා දෙස බැලීය.

සාහාර් වසීලෙවිච් නොසන්සුන් ලෙස බංකුව මත වාඩි වී ඝනව වැඩුණු උඩු රැවුළ හා බූගා නොදැමූ යටි රැවුළ අතරින් කහ පැහැති දත් පෙන්වමින් මඳ සිනා පෑවේය.

"පන්ති හැඟීම උසි ගන්වන්ට හදනවද? තක්කඩියා නුඹ පිස්තෝලයක් එල්ලාගෙන හිටියට නුඹ හිතනවද බඳ පටියෙන් නුඹට තළන්නෙ නැතැයි කියලා?"

එහෙත්, ඔහුගේ කටහඬෙහි තර්ජනයක් නොතිබිණි. කරගැට සහිත ඔහුගේ අත තීරණාත්මක ලෙස පුතා වෙත දිගු කළ පියා චකිතයකින් යුතුව මෙසේ පැවසීය:

"කරගෙන යන වැඩ දිගටම කරපන්, සිරියෝෂා බාධා කරන්නෙ නැහැ. නුඹ ගෙදර නැවිත් විතරක් ඉන්න එපා."

★ ★ ★

රැය, යම්තමින් ඇර ඇති දොරක හිඩැස්සෙන් වැටෙන පටු තීරයක් බඳු ආලෝකය පියගැටපෙළ මත වැටී ඇත. පුලුන් පුරවා සැදූ මෘදු සෝපා සහිත විශාල කාමරයක අධි නීතිඥයාගේ විශාල මේසය වටා පස්දෙනෙක් වාඩි වී සිටියහ. විප්ලවවාදී කමිටුවේ

රැස්වීමකි. දොලීන්නික්, ඉග්නාතියෙවා "චෙකා"[1] පරීක්ෂක කමිටුවේ සභාපති තිමොෂෙන්කෝ, - කිර්ගීස් ජාතිකයකුට සමාන ඔහු කුබාන් කබායක් ඇඳ සිටියේය. දුම්රිය කම්කරුවකු වන දික් සහ පෙතැලි නහයක් සහිත ඩිපෝ කම්කරුවකු වන ෂුඩික් සහ ඔස්තාප්චුක් - මේ දෙදෙනා විප්ලවවාදී කමිටුවේ සාමාජිකයෝය. වාඩි වී සිටියහ.

දොලීන්නික් මේසයට නැඹුරු වී දඟකාරී ලෙස ඉග්නාතියෙවා දෙස බලන්නේ බැරැඬි හඬකින් වචනයෙන් වචනය කතා කළේය.

"යුද පෙරමුණට ආහාරපාන ඕන. කම්කරුවන්ට කෑම අවශ්‍යයි. අපි නගරය අල්ලාගත් හැටියේම වෙළෙන්දොයි, කළුකඩකාරයොයි මිල වැඩි කළා. සෝවියට් මිල මුදල් පිළිගන්නේ නැහැ. පරණ නිකොලායිගේ සල්ලිවලටයි, කෙරන්කිවලටයි විතරයි වෙළඳාම් කරන්නේ. අදම අපි මිල පාලනය පටන් ගනිමු. පාලන මිල අනුව කළුකඩකාරයෝ වෙළඳාම් නොකරන බව අපි බොහොම හොඳින් දන්නවා. උන් බඩු හංගාවි. එවිට අපි සඟවපු බඩු හොයලා ඒවා ජනසතු කරමු. මෙතැන දියාරු විදිහට වැඩ කරන්න බැහැ. තව දුරටත් කම්කරුවන් බඩගින්නේ තබන්ට ඉඩ දෙන්න අපිට බැහැ. ඉග්නාතියෙවා සහෝදරිය කියනවා අපි දැඩි ලෙස බලය පාවිච්චි නොකළ යුතුයි කියලා. ඒක ඇගේ බුද්ධිමත් මෘදුකමක්. සෝයා ඉග්නාතියෙවා නුඹ අමනාප වෙන්නට එපා. මා කියන්නේ හැබෑ තත්ත්වය. මෙතැන ප්‍රශ්නය පුංචි වෙළෙන්දන් ගැන නොවෙයි. බොරීස් සොන් නමැති කඩකාරයාගේ ගෙදර රහස් බිම් ගෙයක් තියෙන බව මට අද දැනගන්නට ලැබුණා. පෙත්ල්යූරාගේ හමුදාව එන්න ඉස්සෙල්ලා ලොකු වෙළෙන්දෝ එම රහස් බිම් ගෙයි විශාල බඩු තොග ගබඩා කළා." ඔහු නපුරු උපහාසයකින් යුතුව තිමොෂෙන්කෝ දෙස බැලීය.

"නුඹ දැනගත්තෙ කොහෙන්ද?" තිමොෂෙන්කෝ ව්‍යාකුල ලෙස ප්‍රශ්න කළේය. ඔහුට පෙර හැම පුවතක්ම දොලීන්නික්ට ලැබෙන නිසා ඔහු පීඩා වින්දේය. එහෙත්, අන් හැමටම පෙර ඒ ගැන දැනගත යුත්තේ තිමොෂෙන්කෝය.

"හා - හා" දොලීන්නික් සිනාසුණේය. "මල්ලි මට හැම දෙයක්ම පේනවා. මම ඔය රහස් බිම් ගෙය ගැන විතරක් නොවෙයි දන්නෙ." ඔහු දිගටම කීවේය. "ඩිවිෂන්

1 චෙකා - පුරා විප්ලවීය ක්‍රියා මඬින විශේෂ කමිටුවක්.

නායකයාගේ රිය පදවන්නා සමඟ නුඹලා ඔහු ළඟ තිබුණු කසිප්පු බෝතල බාගය උදුරාගෙන බීපු හැටිත් මම දන්නවා."

අසුනෙහි වාඩි වී සිටි තිමොෂෙන්කෝ නොසන්සුන් ලෙස ඇඹරෙන්නට විය. කහ පැහැති ඔහුගේ මුහුණ රත් පැහැ ගති.

"නුඹ හැබෑ හපනා!" තිමොෂෙන්කෝ කීවේ ආස්වාදයකිනි. අනතුරුව බුම්බාගෙන සිටි ඉග්නාතියෙවා දෙස බැලූ ඔහු නිහඬ විය. "මේ වඩුවා හරිම යකෙක්. ඔහුට ඔහුගේම චෙකා පරීක්ෂක සේවයක් තියෙනවා." විප්ලවවාදී කමිටුවේ සභාපති දෙස බැලූ තිමොෂෙන්කෝ නිහඬව කල්පනා කළේය.

"මම ඔය රහස දැනගත්තේ සෙර්ගේයි බ්රුෂ්ෂාක්ගෙන්." දොලීන්නික් පැවසීය. "ඔහුගේ යාළුවෙක්ද කවුදෝ තේ කඩේ වැඩ කළා. ඕන කරන ආහාරපාන අඩුවක් නැතිව තමන් සපයා දීපු බව කෝකියෝ ඔහුගේ යාළුවට කියලා තියෙනවා. ඊයේ සිරියෝෂා සිකුරටම ඔත්තුව හොයා ගත්තා. රහස් ගබඩාවක් තියෙනවා. එය කොතැනද කියලා සොයගන්නට ඕන. තිමොෂෙන්කෝ නුඹ, නුඹේ හමුදාවයි සිරියෝෂාවයි අරගෙන එතැනට පලයන්. අදම ඒවා සොයා ගත යුතුයි. වැඩේ හරි ගියොත් අපි කම්කරුවන්ටයි, හමුදාවේ විශේෂ ආහාර කමිටුවටයි ආහාර සපයමු."

පැය භාගයක් යත්ම, අවි ගත් සෙබළු අට දෙනෙක් අවන්හල අයිතිකරුගේ ගෙට අතුළු වූහ. දෙදෙනෙක් ගෙට ඇතුළු වන දොරටුව මුර කළහ.

ගෙදර අයිතිකරු රා පීප්පයක් සේ තරුබාරුය. ඔහුගේ මුහුණේ රැවුළු ගස් රත් පැහැතිය. ලී කකුල ගසා පැමිණියවුන් ඉදිරිපිට බිය පළ කොට, බැරැඩි, ගොරෝසු හඬකින් හේ කතා කළේය.

"සහෝදරවරුනි, මොකද හේතුව! රෑ දෙගොඩ හරියෙ ආවේ මොකටද?"

සොන්ගේ සිරුරට මුවාවෙමින්, ගවුම් ඇඳගෙන තිමොෂෙන්කෝගේ විදුලි පන්දමේ ආලෝකය නිසා නෙත් අඩවන් කරගෙන ඔහුගේ දුවරු බලා සිටියහ. ආහ්! යන හඬ නඟමින් යාබද කාමරයේ ඔහුගේ බිරිඳ ඇඳුම් ඇඳ ගත්තාය.

තිමොෂෙන්කෝ තමා කරුණ වචන තුනකින් විස්තර කළේය.

"පරීක්ෂා කරන්ට ආවා."

ගෙදර හැම කොටසක්මත් පිරික්සුමට භාජන කෙරිණි. ඉරූ දූව දඬු පුරවා ඇති විශාල මඩුවද, ගබඩා කාමරද,

කුස්සියද, සෑහෙන ගබඩාවක් වන බිම් ගෙයද ඉතා දැඩි ලෙස පිරික්සුමට භාජන විය. එසේ වූවද, රහස් බිම්ගෙයි හෝඩුවාවක් හෝ හොයා ගැනීමට බැරි විය.

අවන්හල් අයිතිකරුගේ ගෙදර මෙහෙකාරිය කුස්සිය අසල කුඩා කාමරයක නිදාගෙන සිටියාය. ඈ කොතරම් තද නින්දක වැටී සිටියාද යත්, සෙබළුන් කාමරයට ඇතුළු වනවා පවා ඈ නොදත්තාය. සිරියෝෂා ප්‍රවේසමින් ඇය අවදි කළේය.

"නුඹ මේ ගෙදර වැඩ කරනවද?"

ඔහු, නිදිමතින් සිටි තරුණියගෙන් ඇසීය.

පොරෝනයෙන් උරහිස් වසාගෙන විදුලි ආලෝකය නිසා අතකින් මුහුණ වසාගෙන කිසිවක් තේරුම් ගත නොහී, ඈ විමතියෙන් පිළිතුරු දුන්නාය.

"වැඩ කරනවා. නුඹලා කවුද?"

සිරියෝෂා කරුණු විස්තර කර දී ඇයට ඇඳුම් ඇඳ ගැනීමට කියා පිට විය.

විශාල ආහාර කාමරයෙහිදී තිමොෂෙන්කෝ අවන්හල් අයිතිකරුගෙන් ප්‍රශ්න කළේය. අවන්හල් අයිතිකරු කැලඹීමකින් යුතුව හඬ නගමින්, කෙළ පිට කරමින් කතා කළේය.

"ඔබට ඕන මොනවාද? මා ළඟ වෙනත් බිම් ගෙයක් නැහැ. ඔබ නිකරුණේ කාලය නාස්ති කරනවා. මා ඔබට ස්ථිර ලෙස කියනවා කාලය නාස්ති කිරීමක් කියලා. මට කඩයක් තිබුණා. නමුත්, දැන් මම දුප්පතෙක්. පෙත්ල්යුරාගේ සෙබළු මාව කොල්ල කෑවා. මාව උන් නොමැරුවා විතරයි. මම සෝවියට් ආණ්ඩුවට පක්ෂපාතයි. මට ඉතිරි වෙලා තියෙන්නේ මෙපමණයි. ඔබට පේනවා නේද?" ඔහු තම දෑතේ කෙටි මහත ඇඟිලි පෙන්වීය. රත් පැහැති ඔහුගේ දෙනෙත් වරෙක චෙකා පරීක්ෂක කමිටුවේ සභාපති වෙතද, තවත් වරෙක සිරියෝෂා වෙතද, ගෙයි මුල්ලකටද ගෙයි සීලිම වෙතද බැලුම් හෙළීය.

ස්නායු කිපුණු කලෙක මෙන් තිමොෂෙන්කෝ දෙතොල් සැපීය.

"එහෙමනම් තමුසේ දිගටම ඇත්ත නොකියා ඉන්නවද? රහස් බිම් ගෙය තියෙන තැන පෙන්වන්න කියලා අවසාන වරට යෝජනා කරනවා."

"අනේ, යුද්ධ හමුදාවේ සහෝදරයා" අවන්හල්කරුගේ බිරිඳ කතාවට මැදිහත් වූවාය. "අපි හැබෑටම බඩගින්නේ

ඉන්නවා! අපේ දේ සියල්ල උදුරා ගත්තා." ඈ කඳුළු වගුරුවා අඬන්නට සුදානම් වුවද, එය සාර්ථක නොවීය.

"බඩගින්නේ ඉන්නවා, නමුත්, වැඩකාරියක් තියාගෙන ඉන්නවා."සිරියෝෂා කීවේය.

"අනේ, මොන වැඩකාරියක්ද! දුප්පත් කෙල්ලක්. අපේ ගෙදර නැවතිලා ඉන්නවා. ඇයට යන එන තැනක් නැහැ. ඔන්න ක්‍රිස්තීනාම කියාපුදෙන්." ඈ කීවාය.

"හොඳයි." ඉවසීම සිඳී ගියෙන් තිමොෂෙන්කෝ කෑ ගැසීය. "වැඩ පටන් ගනිල්ලා!"

ගෙවත්තෙහි හිරු එළිය වැටුණද, අවන්හල් අයිතිකරුගේ ගෙදර හැම දෙයක්ම පිරික්සුමට භාජන කළේය. පැය දහතුනක් තිස්සේ නොකඩවා කළ ඵල රහිත පිරික්සා බැලීම්වලින් පසුව කෝපයට පත් තිමොෂෙන්කෝ එය නැවැත්වීමට සැරසෙත්ම මෙහෙකාරියගේ කුඩා කාමරයේ සිටි සිරියෝෂාට ඈ මුමුනන සැටි ඇසිණි.

"සමහර විට කුස්සියේ ලිප යට වෙන්නට ඇති."

විනාඩි දහයකට පසු රුසියානු ගිනි උදුන කඩා දැමුවෙන් රහස් උමං ගබඩා කාමරයට යන යකඩ දොර සොයාගෙන එය අරින ලදි. ඊට පැයකට පසු අවන්හල් අයිතිකරුට අයත් ආහාර මලු හා පීප්ප රැස් කකා සිටි මිනිස්සු විසින් වට කරන ලද ටොන් දෙකක් බරැති ලොරියකට පටවන ලදී.

★ ★ ★

උණුසුම් දවසක කුඩා ගමන් මල්ලකුත් අතැතිව දුම්රියපොළේ සිට මාරියා යාකොව්ලෙව්නා ආවාය. පාවෙල් පිළිබඳ අර්ටියොම්ගේ කතාවට සවන් දුන් ඈ සුසුම්ලමින් ඇඬුවාය. ඇගේ කාලය ඇදිරිය. ජීවිකාව සඳහා මාරියා යාකොව්ලෙව්නා රතු සෙබළුන්ගේ යට ඇඳුම් සෝදා දීමට ඉදිරිපත් වූයෙන්, ඇයට යුද සෙබළෙකුගේ සලාකය ලැබිණි.

අර්ටියොම් එක් දවසකදී හවස වෙනදාට වඩා ඉක්මන් ගමනින් ගෙදර විත් හණික දොර හැර එළිපත්ත උඩ සිටගෙන මෙසේ කීය.

"පාවෙල්ගෙන් ලියමනක්"

"ආදරණීය අර්ටියොම් අයියේ" පාවෙල් ලියුවේය. "එතරම් සනීපයෙන් නොවුණද, මා ජීවත් වන බව ආදරණීය සහෝදරය ඔබට දන්වා සිටිමි. මගේ කකුලේ උඩ කොටසට වෙඩි පාරක් වැදුණා. නමුත්, දැන් මම සුවය ලබමින් ඉන්නවා.

ඇටකටු තුවාල නොවූ බව දොස්තර කීවා. අයියේ නුඹ මා ගැන කලබල වෙන්ට එපා. මට සුවය ලැබෙවි. ප්‍රතිකාරවලින් පසුව සමහර විට මට නිවාඩු ලැබේවි. අම්මා බලන්ට ගියා ඇය හිටියේ නැහැ. දැන් මම කතොව්ස්කි සහෝදරයාගේ නමින් ඇති රතු හමුදාවේ අසරු කණ්ඩායමක සෙබළෙක්. මේ රතු හමුදාවේ වීර ක්‍රියා ගැන ඔබ අසා ඇති. මේ වගේ මිනිසුන්ව මම මීට පෙර කවදාවත් දැකලා නැහැ. අප කණ්ඩායම මෙහෙයවන සහෝදරයාට මම බොහොම ගරු කරනවා. අපේ ආදරණීය අම්මා ගෙදර ආවාද? ගෙදර ඇවිල්ලා නම් බාල පුතාගෙන් ඇයට උණුසුම් ආදර සුබ පැතුම් පිරිනමන්න. කලබල කළාට සමාව ඉල්ලමි. මීට මල්ලී.

අර්ටියොම්, කැලෑ පාලකයාගේ ගෙදරට ගොස් මේ ලියුම ගැන කියන්න.

මාරියා යාකොව්ලෙව්නා බොහෝ සේ අඬා වැලපුණා ය. අකීකරු පුතා ඔහු නැවතී සිටි රෝහලේ ලිපිනය පවා දන්වා නැත.

★ ★ ★

දුම්රියපොළේ කොළ පැහැති උද්ඝෝෂණ ප්‍රචාරක මැදිරිය වෙත යාම සිරියෝෂා සිරිතක් කොට ගත්තේය. මෙහි කුඩා කාමරයක උස්තිනෝව්ච් හා මෙද්වියෙදවා වැඩ කරති. මෙද්වියෙදවාගේ දෙතොලේ නිතරම පැපිරෝස් නමැති සිගරට්ටුවකි. ඈ කට කොනකින් නිතර මඳ සිනා පාන්නීය.

ප්‍රාදේශීය කොම්සොමොල් සංවිධානයේ ලේකම්වර සිරියෝෂා සහ උස්තිනොව්ච් අතර සබඳකම් නොදැනුවත්ම ළං විය. සාහිත්‍ය පොත් හා පුවත් හැරුණු විට, ඔහු ඇය හමුවීම නිසා දෝ දුම්රියපොළෙන් පිට වී යන විට, නොපැහැදිලි සතුටුදායක හැඟීමක්ද ගෙන ගියේය.

රතු හමුදාවේ උද්ඝෝෂණ අංශය පැවැත්වූ එළිමහන් රඟහලට දිනපතා කම්කරුවෝද, රතු සෙබළුද පැමිණියහ. 12 වැනි රතු හමුදාවට අයත් උද්ඝෝෂණ පෝස්ටර් දුම්රිය වසා අලවා තිබිණි. උද්ඝෝෂණ දුම්රිය පැය විසි හතර තිස්සේම යුහුසුළුව වැඩ කරයි. එහි මුද්‍රණාලය පුවත්පත්, පත්‍රිකා, ආයාචන ආදිය මුද්‍රණය කළේය. යුද පෙරමුණ අත ළඟය. දවසක්දා අහම්බෙන් සිරියෝෂා රඟහලට ගියේය. ඔහු රතු හමුදා සෙබළුන් අතර උස්තිනෝව්ච් දුටුවේය.

දේශපාලන අංශයේ සේවකයන් පදිංචිව සිටි දුම්රිය පොළ දක්වා උස්තිනෝවිච් හැරලීමට රැගෙන ගිය සිරියෝෂා තමාටම බලාපොරොත්තු රහිත ලෙස ඇගෙන් මෙසේ ඇසීය:

"රීතා සහෝදරිය, මට ඔබ හැමදාම දැකීමට ආසා හිතෙන්නේ මන්ද?" ඔහු යළි මෙසේද පැවසීය: "ඔබ සමඟ ඉන්න විට කොතරම් හොඳද! ඔබ හමුවුණායින් පස්සේ ප්‍රීතිය වැඩියි. අවසානයක් නැතිව වැඩ කරන්ට හිතෙනවා."

උස්තිනෝවිච් නැවතුණාය.

"බ්රුෂ්ෂාක් සහෝදරයා මා කියන දේ අහපන්. මීට පස්සේ නුඹ කාව්‍ය ලෝකයට නොයන බවට පොරොන්දු වෙයන්. මම ඒවාට කැමැති නැහැ."

දඬුවම් ලැබූ පාසල් කොල්ලෙකු සේ සිරියෝෂා රතු විය.

"මම කිව්වෙ මිතුරෙකු හැටියටයි." ඔහු පිළිතුරු දුන්නේය. "නමුත්, ඔබ මට... මම ප්‍රතිවිප්ලවවාදී කතාවක් කීවාද? උස්තිනෝවිච් සහෝදරිය මීට පස්සේ සත්තකින්ම ඒ වගේ දේ කියන්නෙ නැහැ!"

ඔහු ඇයට ඉක්මනින් අත දී, ඉක්මන් ගමනින් නගරයට ගියේය.

පිට පිට දවස් කීපයක්ම සිරියෝෂා දුම්රියපොළට නාවේය. ඉග්නාතියෙවා ඔහුට අඬ ගැසූ විට, ඔහු වැඩ තිබෙන බව කියා එහි නොගියේය. සැබවින්ම ඔහුට වැඩ තිබිණි.

★ ★ ★

සීනි කම්හලේ උසස් නිලධාරීන්ගෙන් බහු සංඛ්‍යාව වන පෝලන්ත ජාතිකයන් පදිංචිව සිටි මඟක් ඔස්සේ රෑ වී ගෙදර එමින් සිටි ෂුදික්ට දවසක් දා වෙඩි වැදිණි. මේ හේතුව නිසා ගෙවල් හෝදිසි කෙරිණි. 'ස්ට්‍රෙලෙට්ස්' නමැති පිල්සුඩ්සිකිගේ සංවිධානයට අයත් අවි ලියවිලි සොයා ගැනිණි.

විප්ලවවාදී කමිටුවේ රැස්වීමට උස්තිනොවිච් පැමිණියා ය. සිරියෝෂා පැත්තකට අඬ ගැසූ ඈ සන්සුන් ලෙස මෙසේ විමසුවාය:

"මොකද නුඹේ මැද පන්තික මමත්වයට පහර වැදුණ ද? පුද්ගලික කතාබහ වැඩවලට බලපෑමට ඉඩ හරිනවද? සහෝදරයා ඒ වැඩේ කොහෙත්ම වටින්නෙ නැහැ."

නැවත අවස්ථාවක් ලත් විගසම සිරියෝෂා දුම්රියපොළේ පිහිටි කොළ පැහැති මැදිරියට යාමට පටන් ගත්තේය.

ඔහු ප්‍රාදේශීය සාකච්ඡාවට සහභාගි විය. දවස් දෙකක් තිස්සේ උණුසුම් වාද විවාද මෙහෙයවීය. තෙවැනි දවසේදී පූර්ණ රැස්වීමට සහභාගි වූ සියලු සාමාජිකයන් සමඟ එකතු වී පෙත්ල්යූරාගේ සුළු නිලධාරියකු වූ සරුද්නිගේ පල් හොරු කාණ්ඩායම ලුහුබඳිමින් දවසක් තිස්සේම ගඟින් එගොඩ ඇති කැලයේ අවි ගෙන සටන් කළේය. නැවත නගරයට පැමිණි සිරියෝෂාට ඉග්නාතියෙවාගේ කාමරයේදී උස්තිනෝව්ච් හමුවිය. ඇය දුම්රියපොළට ගෙන ගොස් හැරලූ සිරියෝෂා ඇගේ අතක් තදින් මිරිකා සමු ගත්තේය.

උස්තිනෝව්ච් තරහයෙන් අත ඇද ගත්තාය. අනතුරුව ඔහු නැවත බොහෝ කලක් උද්ඝෝෂණ දුම්රිය දෙසට නොගියේය. වුවමනා අවස්ථාවලදී පවා ඔහු රීතා උස්තිනෝව්ච් හමුවීමට නොගියේය. ඔහුගේ හැසිරීම ගැන පැහැදිලි කරන ලෙස ඇය දැඩි ලෙස ඉල්ලා සිටි විට, ඔහු අව කැපෙන සේ මෙසේ පැවසීය.

"නුඹ සමඟ මට කතා කරන්ට තියෙන්නෙ මොනවාද? ආයෙමත් පාරක් නුඹ කියාවි මොකක් හරි මැද පන්තික හැඟීමක් ගැන නැතිනම් කම්කරු පන්තිය පාවාදීමක් ගැන."

★ ★ ★

කොකේසියානු රතු ධජ ඩිවිෂනයේ සෙබළුන් රැගත් දුම්රියක්, දුම්රියපොළට පැමිණියේය. විප්ලවවාදී කමිටුව වෙත තලෙළු අණ දෙන නිලධාරීන් තිදෙනෙක් ආහ. උසැති, කෙට්ටු, බඳපටියක් ඉණ වටා තදට බැඳ සිටි නිලධාරියෙක් දොලීන්නික්ට මෙසේ කීය:

"නුඹ මට කිසි දෙයක් කියන්ට එපා. පිදුරු කරත්ත සීයක් දීපන්. නැතිනම් අශ්වයෝ මැරිලා යාවි."

පිදුරු ලබාගැනීම සඳහා රතු සෙබළුන් දෙදෙනෙකු සමඟ සිරියෝෂා යැවීය. එක් ගමකදී ඔවුන්ට කුලාක්වරුන්ගේ කණ්ඩායමකට මුහුණ පෑමට සිදු විය. රතු සෙබළුන් දෙදෙනා නිරායුධ කොට පණ යන-නොයන තරමට ඔවුන්ට පහර දුන්හ. සිරියෝෂාට තරමක් අඩුවෙන් පහර වැදුණේ ඔහු ගැටවරයකු වූ බැවිනි. දුප්පතුන්ගේ කමිටුවට අයත් සාමාජිකයන් විසින් ඔහු නගරයට ගෙනෙන ලදි.

එම ගමට සේනාංකයක් යවා ඊළඟ දවසේදී පිදුරු ලබාගත හැකි විය.

ගෙදර උදවිය නොසන්සුන් කිරීමට නොසිතූ සිරියෝෂා තුවාල සුවවන තුරු ඉග්නාතියෙවාගේ කාමරයේ වැතිර සිටියේය. උස්තිනෝව්චි පැමිණියාය. ඈ ඔහුගේ අතක් ගෙන සුරතල් ලෙස තදින් මිරිකූ හැටි එදින සවස ඔහුට පළමුවැනි වරට හැඟිණි. එවැන්නක් කිරීමට ඔහු කිසි දිනක තීරණය නොකරනු ඇත.

★ ★ ★

සැරට ඉර පායන මද්දහන් වේලාවේදී දුම්රියට පැමිණි සිරියෝෂා, රීතා උස්තිනෝව්චිට කොර්චාගින්ගේ ලිපිය කියවා ඔහු ගැන විස්තරයක්ද කළේය. පිට වී යන විට ඔහු මෙසේ පැවසීය:

"කැලෑවට ගිහිල්ලා පොකුණෙන් නානවා."

උස්තීනෝව්චි වැඩ කිරීම නවත්වා, "නැවතියන්, දෙදෙනාම යමු"යි කීවාය.

කණ්ණාඩියක් සේ විනිවිද පෙනෙන ජලය සහිත පොකුණ අසල ඔවුහු නැවතුණහ. උණුසුම් ජලය මායාකාරී බලපෑමක් ඇති කළේය.

"නුඹ පාලම ළඟ නැවතිලා ඉඳපන්. මම පොකුණට බැහැලා නාන්නම්." උස්තිනෝව්චි අණ කළාය.

පාලම අසල ගලක් මත වාඩි වූ සිරියෝෂා හිරුට මුහුණ දී සිටියේය.

ඔහුට පිටුපසින් ජලය කැලැත්තෙන හඬ ඇසිණි.

ගස්වලට එපිට මඟ ඔස්සේ තෝන්යා තුමානොවා සහ උද්සෝෂණ දුම්රියේ යුද්ධ කොමසාරිස් චුෂානින් එන සැටි සිරියෝෂා දුටුවේය. රුවැත්තෙකු වූ ඔහු නවීන පන්නයේ කබායක් ඇඳ සිටියේය. පටි කීපයකින් යුත් පිස්තෝල කොපුවක් පැලඳ, හඬ නඟන පාවහන් දෙකක් දමාගෙන සිටි ඔහු තෝන්යාගේ අතින් අල්ලාගෙන කිසිවක් ගැන විස්තර කරමින් ගියේය.

සිරියෝෂා තෝන්යා හැඳිනගත්තේය. පාවෙල්ගෙන් ලියුමක් අරගෙන පැමිණියේ ඇයය. ඈ වුවමනාවෙන් ඔහු දෙස බැලුවාය. ඔහු හඳුනාගත්තාක් මෙනි. ඔවුන් සිරියෝෂාට ළං වූ විට, ඔහු සාක්කුවෙන් ලියුමක් එළියට ගෙන තෝන්යා

නැවැත්වීය.

"සහෝදරිය, විනාඩියක් නවතින්න. ඔබට අඩ වශයෙන් සම්බන්ධ ලියුමක් මා ළඟ තියෙනවා."

ඔහු, ඇයට ලියූ කොළයක් දුන්නේය. අත නිදහස් කරගත් තෝන්යා ලියුම කියැවූවාය. ඇගේ අතෙහි වූ කොළය යම්තම් සෙලවෙන සැටි පෙනේ. තෝන්යා සිරියෝෂා අතට ලියුම ආපසු දෙමින් විමසුවාය.

"ඔබ මීට වඩා යමක් ඔහු ගැන දන්නෙ නැත්ද?"

"නැහැ." සෙර්ගෙයි පිළිතුරු දුන්නේය.

පසු පස උස්තිනෝව්චිගේ දෙපාවලට යටින් කුඩා ගල් කැට හඬක් නැඟීය. චුෂානින් රීතා උස්තිනෝව්චි දැක තෝන්යා දෙසට හැරි මිමිනුවේය.

"අපි යමු."

උස්තිනෝව්චිගේ උපහාසාත්මක හා අපහාසාත්මක කට හඬ විසින් චුෂානින් නැවැතිණි.

"චුෂානින් සහෝදරයා! උද්සෝෂණ දුම්රිය තමුසෙව මුළු දවස තිස්සේම හොයනවා."

චුෂානින් අමිතුරු ලීලාවෙකින් පිළිතුරු දුන්නේය.

"කමක් නැහැ. මා නැතුවාට වැඩ කළ හැකියි."

තෝන්යා හා යුද්ධ කොමසාරිස් යන හැටි බලා සිටි උස්තිනෝව්චි,

"ඔය බොරු මෝස්තරකාරයාව පන්නා දමන්නෙ කවදාදැ?"යි ඇසුවාය.

යෝධමය ඕක් ගස්වල මුදුන් වැනෙමින් කැලයෙහි හඬක් නැඟීය. පොකුණ සිය උණුසුම් බවෙන් මායාකාරී සිත් ඇද ගැනීමක් කළේය. සිරියෝෂාට නෑමට සිත් විය.

නාගත් පසුව ඔහු උස්තිනොව්චි කපා හෙළූ ඕක් ගහක් අසලදී හමු විය.

දෙදෙනා කතා කරමින් කැලය මැදට ගියහ. උසට වැඩුණු තණකොළ සහිත කුඩා පිටියක දෙදෙනා විවේක ගැනීමට තීරණය කළහ. වනය නිහඬය. ඕක් ගස් කිසිවක් ගැන මුමුනන්නාක් මෙනි. නවා ගත් අතක් මත හිස තබා ගත් උස්තිනෝව්චි තණ බිමෙහි වැතිර ගත්තීය. පරණ පාවහන් දමා ඇති ඇගේ දෙපා උසට වැඩුණු තණකොළ අස්සේ සැඟ විණි. සිරියෝෂා අහම්බෙන් ඇගේ කකුල් දෙස බලන්නේ ඇගේ පාවහන් ඉතා අගනා ලෙස අලුත්වැඩියා කර තිබෙන සැටි දුටුවේය. විශාල හිල් සහිත තම 'බූට්ස්'සපත්තු දෙස

බැලූ ඔහු ඒවා පෙනෙන පා ඇඟිලි දැක සිනාසුණේය.

"නුඹට මක්වෙලාද?"

සිරියෝෂා තම සපත්තු පෙන්වීය.

"මේ වගේ සපත්තු දාගෙන යුද්ධ කරන්නෙ කොහොමද?"

රීතා පිළිතුරු නොදුන්නේය. තණ ගසක් විකමින් ඈ වෙනත් දෙයක් ගැන කල්පනා කළාය.

"චුෂානින් නරක කොම්යුනිස්ට්වාදියෙකි." ඈ අවසානයේ දී පැවසුවාය. "දේශපාලන අංශයේ වැඩ කරන හැම දෙනෙක්ම වැරහැලි ඇඳගෙන යනවා. චුෂානින් එයා ගැන විතරයි සලකන්නේ. ඔහු අපේ පක්ෂයට අහම්බෙන් ආපු මිනිහෙක්... යුද පෙරමුණේ තත්ත්වය නම් හැබෑටම බරපතළයි. රට තුළ දරුණු සටන්වලට දිගු කලක් තිස්සේ මූණ පෑමට සිදු වෙනවා." නිහඬව ඈ යළි මෙසේ පැවසුවාය. "සෙර්ගෙයි අපට සිද්ද වෙනවා තුවක්කුව අතින් අරගෙන ක්‍රියා කරන්ට. කොම්සොමොල් සංවිධානයෙන් හතරෙන් කොටසක් යුද පෙරමුණට යැවීමට මධ්‍යම කාරක සභාව තීරණය කර තිබෙන බව ඔබ දන්නවද? සෙර්ගෙයි මගේ අදහස අපි මෙතැන වැඩි කලක් ඉන්නේ නැති බවයි."

සිරියෝෂා ඇයට සවන් දෙමින්, ඇගේ කටහඬෙහි කිසියම් අසමාන ගතියක් තිබෙන බව මවිතයෙන් යුතුව දැනගත්තේය. විනිවිද පෙනෙන ඇගේ කළු පැහැ දෙනෙත් ඔහු දෙස එල්ල වී තිබිණි.

ඇගේ දෙනෙත් කණ්ණාඩියක් මෙන් විනිවිද පෙනෙන බවත්, එයින් හැම දෙයක්ම පෙනෙන බවත් කීමට තරම් ඔහු පෙලඹුණද, සිය අදහස් කටින් පිට නොකළේය.

රීතා වැළමිටිවලින් නැඟී සිටියාය.

"නුඹේ පිස්තෝලය කොහිද?"

සෙර්ගෙයි බලාපොරොත්තු රහිත ලෙස බඳ පටියේ කොපුව අතගෑවේය.

"ගමට ගිය වේලාවේදී කුලාකයන්ගේ හොරු රැළ ඒක උදුරා ගත්තා."

රීතා සෙබළ කබායේ සාක්කුවට අත දමා දිලිසෙන සුළු වූ බ්‍රවුනින්ග් පිස්තෝලයක් ඇදගත්තාය.

"සෙර්ගේයි නුඹට අර ඕක් ගහ පේනවාද?" ඔවුන්ට පියවර විසිපහක් පමණ ඈතින් පිහිටි කඳෙහි ගැට සහිත ඕක් ගහක් පිස්තෝලයෙන් පෙන්නුවාය. ඉක්බිති ඈ ඇගේ මට්ටමට අත දිග හැර පිස්තෝලය එල්ල කොට, ඉලක්කය

නොබලාම පාහේ වෙඩි තැබුවාය. ඕක් ගස් කඳේ පොත්ත බිඳී විසිර ගොස් බිම වැටිණි.

"නුඹට පේනවද?" සතුටු සිතින් පැවසූ ඈ නැවත වෙඩි තැබුවාය. නැවත ගහේ පොතු තණ බිමට වැටිණි.

"ඉඳා" ඔහු අත පිස්තෝලය තැබූ රීතා උපහාසාත්මක ලෙස, "නුඹ වෙඩි තියන හැටි බලමුකෝ යි පැවසුවාය.

සිරියෝෂා තැබූ වෙඩි පහරවල් තුනෙන් එකක් කඳට නොවැදිණි. රීතා මඳහස පෑවාය.

"මා හිතුවෙ නුඹ ඔයිට වැඩිය නරක ලෙස වෙඩි තියයි කියලා."

ඈ පිස්තෝලය බිම තබා තණ බිස්සෙහි වැතිර ගත්තා ය. උඩ කබායට යටින් ඇති ඇගේ දෙතනෙහි හැඩය කැපී පෙනිණි.

"සෙර්ගෙයි මෙහෙ වරෙන්." ඈ සෙමින් පැවසුවාය.

ඔහු ඇය වෙත ආවේය.

"නුඹට අහස පේනවද? නිල් පාටයි අහස. නුඹේ ඇසුත් නිල් පාටයි. එය හොඳ නැහැ. නුඹේ ඇස් වානේ මෙන් අළු පාටට තියෙන්න ඕන. නිල්පාට ඇස් ඕනෑවට වැඩියෙන් මෘදුයි."

රන්වන් හිසකෙස් ඇති ඔහුගේ හිස හිටිහැටියේම බදා අල්ලාගත් ඈ බලපාමින් ඔහුගේ දෙතොල් සිපගත්තාය.

★ ★ ★

දෙමසක් ගෙවෙත්ම, සරත් සමය පැමිණියේය. නොදැනුවත්ම රැය වැඩි වූයේ, තුරුලතා කළු පැහැති සියුම් මීදුමකින් වසා ගනිමිනි. ඩිවිෂන් කාර්යාලයේ විදුලි පණිවුඩ යවන්නා මෝස්ගේ සංඥා ක්‍රමය අනුව පණිවුඩ දෙන යන්ත්‍රයෙන් පිටවන පටු නාගයකු බඳු පටිය ඇඟිලි අතරින් යැවීය.

ඔහු තිත් සහ කුඩා ඉරි කැබැලි සහිත සංඥා බසට පෙරළමින් සටහන් කළේය.

"එහි ඩිවිෂනයේ අණ දෙන නිලධාරියා වෙත විදුලි පණිවුඩයකි. පිටපතක් ෂෙපෙතෝව්කා නගරයේ විප්ලවවාදී කමිටුවේ සභාපතිටයි. මේ විදුලි පණිවුඩය ලැබී පැය දහයක් ගත වෙත්ම, නගරයේ සියලු ආයතන අත් තැනකට ගෙන යා යුතු බවට අණ කරමි. නගරයේ බැටෑලියන් හමුදාවක්

තැබිය යුතුය. යුද පෙරමුණේ කොටසක අණ දෙන, 'එන්' රෙජිමේන්තුවේ නිලධාරියාට එය යටත් විය යුතුය. ඩිවිෂන් කාර්යාල මණ්ඩලයේද, දේශපාලන අංශයද, අනිකුත් සියලු යුද්ධායතනද, බරාන්චේව් දුම්රියපොළ දක්වා පසු බැස යා යුතුය. කාරිය ඉටු කළ පසු ඩිවිෂනයේ ප්‍රධානියාට වාර්තා කළ යුතුය. (අත්සන)."

විනාඩි දහයක් ගත වෙත්ම, නිහඬ වීදි ඔස්සේ, දිලිසෙන විදුලි ආලෝකයක් සහිත මොටෝ බයිසිකලයක් පදවන්නෙක් මඟ ඔස්සේ වේගයෙන් පැමිණ හතිලමින් විප්ලවවාදී කමිටු කාර්යාලය අසල නැවතිණි. විප්ලවවාදී කමිටුවේ සභාපති දොලීන්නික්ට පණිවුඩකරුවා විදුලි පණිවුඩය භාර දුන්නේය. මිනිස්සු දිව ආහ. විශේෂ සේනාංකයක් පෙළ ගැසිණි. පැයකට පසු විප්ලවවාදී කමිටුවේ බඩු බාහිරාදිය රැගත් ගැල් නගර වීදි ඔස්සේ ගමන් කරන්නට විය. සදෙල්ස්ක් දුම්රිය පොළේදී ඒවා දුම්රියට පටවන ලදි.

විදුලි පණිවිඩය ගැන දැනගත් සිරියෝෂා මොටෝ බයිසිකල්කරු ළඟට දුවගෙන ආවේය.

"සහෝදරයා නුඹත් සමඟ දුම්රියපොළට යන්ට පුළුවන්ද?" ඔහු පණිවුඩකරුගෙන් විමසීය.

"පිටිපස්සෙන් වාඩිවෙයන්. හයියෙන් අල්ලගනින්."

දුම්රියට ඇඳා තිබුණු මැදිරියට පියවර දහයකට ඇතින් සිරියෝෂා රීතාගේ උරහිසින් අල්ලා ගත්තේය. මිල නොකළ හැකි යම් කිසි වටිනා දෙයක් නැතිවෙතියි යන හැඟීම් ඇතිව ඔහු මුමුනන්නට විය.

"රීතා, මගේ ආදරණීය සහෝදරිය, ආයුබෝවන්! අපි නැවත හමුවෙමු. නුඹ මාව අමතක කරන්ට එපා." තමා දැන් දැන් සුසුම්ලනු ඇතැයි ඔහුට දැනුණේ බියත් සමඟය. පිට වී යා යුතුය. කතා කිරීමට තරම් ශක්තියක් නැතිව ගියෙන් ඔහු ඇයට වේදනාවක් දැනෙනතුරු ඇගේ අතක් මිරිකීය.

★ ★ ★

පසුදින උදෑසන නගරය හා දුම්රියපොළ හිස් වූ, අනාත වූ තත්ත්වයක පැවැතිණි. නගරයෙන් සමු ගන්නාක් මෙන්, අවසාන දුම්රියද හඬ නගමින් පිටත් විය. නගරයේ නැවතුණු බැටැලියන් හමුදාවේ ආරක්ෂක වළල්ල දුම්රියපොළ දෙපැත්තෙන් පිහිටුවීය. කහ පැහැති කොළ හලමින් ගස්

නිරුවත් වූවන් සේ විය. බිම වැටුණු සුළඟට හසුව සෙමින් මඟ ඔස්සේ විසිරිණි.

පතොරොම් දැමීම සඳහා වූ සාක්කු කිහිපයක් සහිත රතු හමුදා උඩ කබායක් හැඳ ගත් සිරියෝෂා රතු සෙබළුන් කීප දෙනෙකු සමඟ සීනි කම්හලේ මංසන්ධිය මුර කළේය. ඔහු පෝලන්ත හමුදා බලාපොරොත්තුවෙන් සිටියහ.

අව්තෝනොම් පෙත්රෝව්විච්, තම අසල්වැසියා වන ගෙරාසිම් ලියොන්තියෙව්විච්ගේ ගෙහි දොරට තට්ටු කළේය. තවම ඇඳ නොගත් ඔහු දොර හැර බැලීය.

"මොනවා වුණාද?"

සටන් කිරීමට මෙන් දිගු කොට අල්ලාගත් තුවක්කුව ඇතිව මඟ ඔස්සේ ගමන් ගත් රතු සෙබළුන් පෙන්වූ අව්තෝනොම් පෙත්රොව්විච් තම අසල්වාසියා දෙස බලා ඉඟි මැරීය.

"පිටවෙලා යනවා."

ගෙරාසිම් පෙත්රෝව්විච් ඔහු දෙස කනස්සල්ලකින් යුතුව බැලීය.

"පෝලන්ත හමුදාවල ලකුණ මොකක්ද කියලා තමුසේ දන්නෙ නැතිද?"

"එක ඔළුවක් ඇති රාජාලියා වෙන්නට ඕන"

"ඒක කොහෙන් හොයා ගන්ටද? අව්තෝනොම් පෙත්රෝව්විච් කෝපයෙන් හිස කැසීය.

"උන්ට කමක් නැහැ." මඳ වේලාවක් කල්පනා කළ ඔහු පැවසීය."ගත්තා ගියා. නගරේ ඉන්න අපට සිද්ද වෙනවා. අලුත් පාලකයන්ට ගැළපෙන විදිහට වැඩ කරන්නේ කොහොමද කියලා හිසට වධ දෙමින් කල්පනා කරන්නට."

"නිහඬතාව බිඳිමින්, මැෂින් තුවක්කුව විටින්, විට හඬ නැඟීය. හිටිහැටියේම දුම්රියපොළේ දුම්රිය ඇන්ජිමක් හඬ නැඟීය. එහි සිට මහ කාලතුවක්කු හඬක් පැතිරිණි. බරැති වෙඩි උණ්ඩය බිම පතිත වෙත්ම, ඉන් පැන නැඟුණු දුම් වලා අහසේ පා විය. වැඩපොළට පිටුපසින් පිහිටි මඟ මත වැටුණු වෙඩි උණ්ඩය අවට පඳුරු නිල් පැහැති දුම් වලාවකින් එතීය. බුම්මාගත් රතු හට සේනාංක නිහඬව වටපිට බලමින් නගරයෙන් පිටව පසු බැස ගියහ.

සිරියෝෂාගේ කොපුලක් දිගේ ගලා ගිය කඳුළු කැටය ශීත බවක් ගෙන දිණි.ඔහු හණිකට එය පිස දමා සගයන් දෙස බැලීය. නැත, කිසිවකු එය දුටුවේ නැත.

සිරියෝෂා අසලින් ගමන් කළේ දැව දඬු ඉරන කම්හලේ

උසැති, සිහින් අන්තෙක් ක්ලොපොතොව්ස්කිය. ඔහුගේ අතේ ඇඟිලි තුවක්කුවේ කොකා ගෙන සිටී. අන්තෙක් බුම්මාගෙන, නොසන්සුන්ව සිටී. ඔහුගේ දෙනෙත් සිරියෝෂාගේ දෙනෙත් සමඟ ගැටිණි. අන්තෙක් තම හැඟීම් එළිපිට කියා පෑවේය.

"අපේ අයව ලුහු බඳිවි, විශේෂයෙන්ම මගේ අයව. 'පෝලන්ත ජාතිකයෝ, පෝලන්ත ලීජන්වලට විරුද්ධව සටන් කළා.' කියලා කියාවි. මගේ මහලු පියාව කම්හලින් පන්නා දමාවි. ඔහුට කස පහර දේවි. අප සමඟ එන්ට කියලා තාත්තාට කීවා. පවුල අතහැරලා යන්ට එයාට දහිරියක් තිබුණේ නැහැ. අනේ, යක්ෂයනි, තොප සමඟ ඉක්මනින්ම සටන් කිරීමට ඉඩක් ඇත්නම්!" මෙසේ කී අන්තෙක් තම දෙනෙත් දක්වා පහළට ලිස්සා වැටෙමින් තිබූ රතු හමුදා හිස්වැස්ම ඉහළට ඇද්දේ ස්නායු කිපුණු කලක මෙනි.

"චාම්, කුණු සහ දූලි සහිත අවලස්සන කුඩා ගෙවල් සහ සමතලා නැති ගොරෝසු මාවත් සහිත ආදරණීය නගරය නුඹෙන් සමුගනිමි. නෑ මිතුරනි ආයුබෝවන්. වාල්යා ආයුබෝවන්. සැඟවී වැඩ කිරීමට තීරණය කළ සගයනි. ආයුබෝවන්! සමාව නොදෙන නපුරු, විදේශීය සුදු පෝලන්ත ප්‍රතිවිප්ලවීය හමුදා නගරය වෙත එමින් සිටී"

දුම් හා අඟුරු දූලි සහිත කමිස ඇඳගෙන සිටි ඩිපෝ කම්කරුවෝ කනස්සලු බැල්මකින් යුතුව පසු බසින රතු සෙබළුන් දෙස බැලූහ.

"සහෝදරවරුනි, අපි නැවත එන්නෙමු"යි කැලඹුණු සිතින් යුතුව සිරියෝෂා කෑ ගැසීය.

VIII

අරුණෝදයට පෙරාතුව ඇති වන මීදුම, ගඟේ දිය විසින් නොපැහැදිලි දීප්තියක් ඇති කෙරෙයි. වටකුරු කුඩා ගල් නදී තීරයේ හඬක් නඟයි. ගං ඉවුරේ සිට මැද දක්වා ගඟ නිහඬ ය. සිනිඳුය. එය නොසෙල්වී සිටිනා සැටියකි. එය අළු පැහැති ය. දීප්තියක් ඇති කරවනසුලුය. ගඟ මැද නොසන්සුන්ය. ජලය ඉක්මනින් පහළ බැස යන සැටි නෙතට පෙනෙයි. නදිය සුන්දරය, උදාරය, ගෝගොල් "පුදුමයි ද්නීයපරය..." යන සිය අසමසම කෘතියෙහි එසේ ලියුවේය. උසැති දකුණු ඉවුර ගඟ අසලදී කෙළවර වන්නේ ගැඹුරු පල්ලමකිනි. එය

කන්දක් මෙන් ද්නියපරයට කඩා වැදුණේ පුළුල් නදිය ඉදිරියේ නැවතුණාක් මෙනි. වම් ඉවුර වැලි තලාවකින් යුක්තය. වසන්තයේදී ගඟ උතුරා යන විට වැලි, ඉවුරේ නවතී.

ගඟ අසල කැපූ පටු අගලක් තුළ පෙතැලි නහයක් ඇති "මක්සීමිකා" මැෂින් තුවක්කුවක් ළඟ සෙබළු පස්දෙනෙක් මිතුරු ලෙස වැතිර සිටිත්. හත්වැනි පාබළ ඩිවිෂනයේ 'රහස්' පෙරමුණු බළඇණිය එයි. මැෂින් තුවක්කුව අසල, ගඟට මුහුණ ලා සිරියෝෂා බ්රූෂ්ෂාක් වැතිර සිටී.

ඊයේ පෝලන්ත ජාතිකයන්ගේ ප්‍රචණ්ඩ කුණාටුවක් වැනි කාලතුවක්කු වෙඩි පහරවලින්ද, ඉමක් නැති සටන්වලින්ද බෙලහීන වූ රතු හමුදාව කීයෙව් නගරය අතහැර පසුබැස ගොස්, ද්නීපරයේ වම් ඉවුරට විත්, කඳවුරලා ගත්තේය.

එහෙත්, පසු බැසීම්ද, විශාල වශයෙන් සේනා හානියද, අවසානයේදී කීයෙව් නගරය සතුරාට දීමද නිසා රතු සෙබළුන්ගේ තත්ත්වය බරපතළ විය. වීරෝදාර ලෙස වටලෑම් බිඳගෙන සටන් කළ හත්වැනි ඩිවිෂනය කැලෑ මැදින් ගමන් කොට මාලින් දුම්රියපොළ අසලදී, දුම්රිය මඟට විත්, දුම්රියපොළ අල්ලාගෙන සිටී. පෝලන්ත සේනාංකවලට රුදුරු ලෙස පහර දී, ඔවුන් කැලෑවට පන්නා දමා, කීයෙව් නගරයට යන මඟ මුදාගත්තේය.

දැන් ඉතින් අලංකාර කීයෙව් නගරය සතුරාට දුන් පසු රතු සෙබළුන්ගේ මනෝභාවය ඇඳිරි විය.

රතු හමුදාවේ සේනාංක දාර්නිට්සාවලින් පන්නා දැමූ පෝලන්ත හමුදාවෝ උතුරු ඉවුරේ දුම්රිය පාලම අසල විශාල නොවූ මුර කපොල්ලක් අල්ලා ගත්හ.

දැඩි ප්‍රති ප්‍රහාරවලට මුහුණ දීමට සිදු වූ නිසා, දැරු සියලු ප්‍රයත්නයන් නොතකා ඔවුනට තවත් දුර ඉදිරියට යා නොහැකි විය.

නදිය ගලා බසින සැටි බලන සිරියෝෂාට ඊයේ දවස ගැන කල්පනා නොකර සිටිය නොහැකිය.

ඊයේ මද්දහන් කාලයේදී පොදු කෝපාන්විත හැඟීම්වලින් යුතුව ප්‍රතිවිප්ලවවාදී, සුදු පෝලන්ත හමුදාවලට ප්‍රති ප්‍රහාර ගැසීය. ඊයේ පළමුවැනි වරට ඔහු රැවුළ නැති පෝලන්ත ලීජන් භටයකුට එදිරිව මුහුණ ලා සටන් කළේ ය. දිගැති කඩුවක් වැනි ප්‍රංශ බයිනේත්තුවක් එල්ල කරමින් පෝලන්ත ජාතිකයා ඔහු වෙත කඩා පැන්නේ පිම් පනිමින්, එකිනෙකට සම්බන්ධ නොවූ යමක් කෑගසමිනි. කෝපය

නිසා මහත් වූ ඔහුගේ දෙනෙත්, මොහොතක් පමණ සෙර්ගේයි දුටුවේය. ඊළඟ නිමේෂයේදී සෙර්ගේයි පෝලන්ත ජාතිකයාගේ බයිනෝක්තුවට, තම බයිනෝක්තුවෙන් පහර දුන්නේය. දිලිසෙන ප්‍රංශ බයිනෝක්තුව පැත්තකට තල්ලු කර දැම්මේය.

පෝලන්ත ජාතිකයා බිම වැටුණේය.

සෙර්ගේයිගේ අත බියෙන් වෙවුලුවේ නැත. තමාට තව තවත් මිනී මැරීමට සිදුවන බව සෙර්ගේයි දන්නේය. මුදු ලෙස ආලය කිරීමට හා හැඩි දැඩි ලෙස මිතුදම් රැකීමට පුළුවන් තමා ඔහු මරන බව සෙර්ගෙයි දන්නේය. තමාගේ ආදරණීය ජනරජයට එදිරිව මෘග වෛරයකින් යුතුව, ලෝකයේ පරපෝෂිතයන් විසින් රවටන ලද හා කුරිරු විෂ පොවන ලද සෙබළුන් එවා ඇති බව නපුරකු නොවන, කුරිරු නොවන ගැටවරයකු වූ ඔහු දන්නේ ය.

එකිනෙකාට විරුද්ධව මරා ගැනීම් අවසාන කරන දවස ළං කර ගනු වස් තමාට මරන්නට සිදු වී ඇති බව සෙර්ගේයි දන්නේය.

පරමෝන්නොව් ඔහුගේ උරහිස් අල්ලා කතා කළේය.

"පසු බසිමු සෙර්ගේයි, ඉක්මනින්ම අපව හඳුනාගනීවි.

★ ★ ★

මැෂින් තුවක්කුවක් මැනූ ගැලක් පදවමින්ද, කාලතුවක්කුවක් ක්‍රියාකරවමින්ද, කනක් කපා දැමූ අළු පැහැති අසකු මෙහෙයවමින්ද පාවෙල් කොර්චාගින් පුරා අවුරුද්දක්ම තම රට තුළ සටන් කළේය. වැඩුණු ඔහු ශක්තිමත් විය. දුක හා පීඩනය තුළින් ආභාසය ලැබුවේය.

බරැති පතොරොම් පිරුණු සාක්කු නිසා හමෙහි හැදුණු ලේ පැහැගත් තුවාල සුව විය. එහෙත්, තුවක්කු පටිය නිසා හටගත් කරගැට නොමැකිණි.

එම වසර තුළදී පාවෙල් බොහෝ බියජනක දේ දැක ඇත. පාවෙල් ඔහු මෙන්ම, වැරැහැලි ඇඳගත්, පාවහන් රහිතව සිටි තවත් දහස් ගණනක් රතු සෙබළුන් මෙන්ම, තම පන්තියේ බලය සඳහා නොනිමෙන ආලෝකයක් බඳු ධෛර්යයකින් යුතුව සටන් කළේය. ඔහු තම මවුබිමේ ඉදිරියට හා පසුපසට පයින්ම ගමන් කළේය. ප්‍රචණ්ඩ කුණාටු නිසා ඔහු දෙවරක් පමණ නැවතුණේය.

පළමුවර කකුලේ උඩ කොටස තුවාල වූ බැවිනි. දෙවැනි වර 1920 පෙබරවාරි මාසයේ අධික ශීත සමයේදී උණ සන්නිපාතයට ගොදුරු වූ බැවිනි.

12 වැනි රතු හමුදාවට අයත් ඩිවිෂන් හා රෙජිමේන්තු සේනාංකවල බියජනක මාරාන්තික සතුරා වූයේ පෝලන්ත මැෂින් තුවක්කුවලට වඩා උණ සන්නිපාත රෝගයය. මුළු මහත් උතුරු උක්‍රයීනයට අයත් හමුදාව පෝලන්ත හමුදාවේ වැඩිදුර ඉදිරි ගමනට බාධා කළේය. යම්තම් සුවය ලැබූ පාවෙල් සිය හමුදාවට හැරී ආවේය.

කසාටින් නගරයේ සිට උමාන් දක්වා විහිදී ඇති දුම්රිය පාරේ ප්‍රොන්තෝච්කා දුම්රියපොළ අසල ඔහුගේ සේනාංක කඳවුරු ලා ගත්තේය.

දුම්රියපොළ කැලෑව අසලය. එහි ගොඩනැගිල්ල විශාල නැත. එහි අසල්වැසියන් අතහැර ගිය, විනාශ වුණු කුඩා ගෙවල්ය. මෙවැනි තැන්වල ජීවත් විය නොහැකිය. අවුරුදු තුනක්ම දිග්ගැස්සී ඇති මේ යුද්ධය වරෙක නිහඬ වී, තවත් වරෙක ඇවිළෙයි. මේ කාලය තුළදී ප්‍රොන්තෝච්කා දුම්රියපොළ නොදුටුවේ කව්ද?

යළි විශාල සිද්ධීන් මෝරන්ට පටන් ගෙන ඇත. පෝලන්ත යුද්ධ හමුදාවල පහර දීම යටතේ 12 වැනි රතු හමුදාව විශාල වශයෙන් අලාභ හානි විඳිමින්, අඩ වශයෙන් අසංවිධානාත්මකව කීයෙව් නගරය දක්වා පසු බැස්ස අතර, ජය නිසා මත් වී සිටි ප්‍රතිවිප්ලවවාදී සුදු පෝලන්ත හමුදාවන්ට අවසාන පහර දීමට නිර්ධන පන්තික ජනරජය සූදානම් විය.

යුද්ධ ඉතිහාසයේ මින් පෙර නොවූ විරූ දුරක් ගෙවමින් උතුරු කොකේසියාවේ ඈත සිට පළමුවැනි අසරු හමුදාවට අයත් සටන්වලදී පන්නරය ලැබූ ඩිවිෂන්, උක්‍රයීනයට ආවේය. හතරවැනි, හයවැනි, එකොළොස්වැනි සහ දහහතර වැනි අසරු ඩිවිෂන් හමුදා උමාන් පෙදෙසට විත් අපේ පෙරමුණ පසු පස කඳවුරු ලා ගත්හ. ස්ටෙප්ස් තණ බිම්වලදී පදම් වූ සටන්කාමී සෙබළුන් දහසය දාස් පන්සියයක්, අසිපත් ඇතිව තීරණාත්මකව සටන් කිරීම සඳහා අතරමඟදී මහ්නෝ නම් වූ පල්හොරාගේ හමුදාව සමූල ඝාතනය කොට පැමිණියහ.

මේ තීරණාත්මක පහර සඳහා පිළියෙල වීම පෝලන්ත හමුදාවන්ට කොහෙත්ම නොඳුනගැනීමට රතු හමුදාවේ උසස් නිලධාරී මණ්ඩලය සහ නිරිතදිග පෙරමුණේ සෙනෙවි

මණ්ඩලය හැම දෙයක්ම කළහ. එම අසරු හමුදා කඳවුරු ලාගෙන සිටින තැන් ඉතා සැලකිලිමත් ලෙස ජනරජයේ සහ පෙරමුණු සෙනෙවි මණ්ඩල විසින් ආරක්ෂා කරන ලදි.

උමාන් පෙදෙසේ ක්‍රියාකාරී පහර දීම් නැවැත්විණි. මොස්කව් සිට යුද පෙරමුණේ ප්‍රධාන කාර්යාලය වන හාර්කොව් නගරයට ද, එතැන සිට 12 වැනි සහ 14 වැනි හමුදාවල සෙනෙවි මණ්ඩලවලටද පණිවුඩ යැවිණි. පටු දිගැති ටේප් පටිවල මෝස් සංඥා ක්‍රමය අනුව අණ කිරීම් යැවී ය."අසරු හමුදාව කඳවුරු ලා සිටින බව පෝලන්ත හමුදා කොහෙත්ම දැනගත යුතු නැත." කිසියම් තැනක ක්‍රියාශීලී සටන් ඇති විණි නම්, බුඩිඔනිගේ අසරු හමුදාව යුද්ධයට ඇදගැනීමේ තර්ජනය ඇති තැන්වල පමණක් එවැන්නක් සිදු විය.

ගිනි ගොඩේ රතු පැහැති ගිනි සිළු නැටවෙයි. දුන්නක් සේ සෑදුණු වළලු වැනි දුම් වලා අහසට නඟි. මදුරුවන්ට දුම් අහිතකරය. උහු හඬ නඟමින් ඉක්මනින් ඉවත පියාඹති. ගිනිගොඩ වටේට ඈතින් සෙබළු රැස් වූහ. ගිනිදලු නිසා ඔවුන්ගේ මුහුණු තඹ පැහැයක් ගෙන ඇත.

ගිනි ගොඩේ ළා නිල් පැහැති අළු මත කේතලයක් රත් විය. එහි වතුර, බුබුළු මතු කරමින් නටයි. ගිනිගෙන දෑවෙන දඬුවට යටින් හදිසියෙන්ම ගිනි සිළුවක් මතු වී කිසිවකුගේ හිස කෙස් කැරැලි සිපගත්තෝය. සෙබළා ඈත් වී අසතුටින් බැණ වැදුණේය.

"ඕං යක්ෂයා!"

වටව සිටි අය සිනාසුණහ.

හණ රෙදිවලින් මැසූ සෙබළ කබායක් හැඳ සිටි මැදවියේ සෙබළෙක්-ඔහුගේ උඩු රැවුළ කොටට කපලාය. ගිනිමැලය දෙස තම තුවක්කු බටයෙන් බලා බැරැඩි හඬින් කතා කළේය.

"ගැටවරයා විද්‍යාවට කැපවෙලා. ගින්න දැනෙන්නේ නැහැ."

"ඒයි කොර්චාගින්, නුඹ ගිනිමැලය ළඟට වෙලා මොනවාද කියෙව්වේ."

ගින්නට පිලිස්සුණු හිසකේ අත ගෑ රතු හමුදාවේ තරුණ සෙබළා මඳ සිනා පෑවේය.

"ඇත්තටම පොතක් තමයි. අන්ද්‍රෝෂුක් සහෝදරයා, පොත කියවන්නට පටන් ගත්තු වෙලාවෙ ඉඳලා නවත්වන්ට හිතෙන්නෙ නැහැ."

කොර්චාගින්ගේ අසල්වැසියා වන පෙතැළි නහයක් ඇති තරුණයා පටියක් සහිත මල්ලක් මහත් වුවමනාවකින් අලුත්වැඩියා කරමින්, ගොරෝසු නූලක් සපමින් කුතුහලයෙන් යුතුව විමසීය.

"කා ගැනද ඔය පොත්වල ලියන්නේ?" ඉඳිකටුවට නූලක් දමා ඔතා එය හිස් වැස්මේ මසා ඔහු යළි මෙසේද පැවසීය. "ආලය ගැන නම් මම බොහොම උනන්දුවක් දක්වනවා."

වටේ සිටි අය හඬලමින් සිනාසුණාහ. මත්වේයිචුක් ඉත්තෑ කුරු වැනි හිසකේ සහිත තම හිස ඔසවා කපටි ලෙස දෙනෙත් හකුළුවාගන තරුණයා ඇමතීය.

"ඉතින් මොකෝ, ආලය හොඳ දෙයක්. සෙරෙදා. තරුණයා නුඹ නම් ලස්සනයි පිංතූරයක් වගෙයි! කොහේ ගියත් කෙල්ලො එනවා නුඹ ළඟට. හැබැයි ඒ වුණාට නුඹේ පොඩි පරහක් තියෙනවා. නහය බොත්තමක් වගෙයි. ඒක හදාගන්ට පුළුවනි. නුඹේ නහයේ එල්ලන්ට ඕන රාත්තල් දහයක් බර නොවිට්ස්කිගේ[1] අත් බෝම්බයක්. එක රැයකදී නහය දික් වේවි."

නැඟුණු සිනා හඬ නිසා මැෂින් තුවක්කු සහිත ගැල්වලට බැඳ සිටි අශ්වයෝ බිය වී හේෂාරාවය කළහ.

සෙරෙදු කම්මැලියකු සේ හැරී බැලීය.

"කාරණාව ලස්සන ගැන නොවෙයි. ඔළුගෙඩිය ගැනයි." ඔහු අදහස් පැහැදිලි කරන ආකාරයකින් තම නළලට තට්ටු කළේය. "නුඹේ දිවේ කහඹිලියා. නුඹ පල්ම පල් මෝඩයා, නුඹේ කන් හරිම හීතලයි."

පොරකෑමට සූදානම් වූ සගයන් දෙදෙනා කණ්ඩායමේ නායක තනාරිනොව් විසින් දෙපැත්තට ඇද දමන ලදි.

"ඒයි, කොල්ලනේ මොකද හපාකන්ට හදන්නෙ."

කියවන්නට හොඳ දෙයක් නම්, කෝර්චාගින් කියවාපුදෙන්.

"කියවාපන්. පව්ලූෂා කියවාපන්!" හැම පැත්තෙන්ම හඬ ඇසිණි.

කොර්චාගින් ගිනිමැලය ළඟට සෑදලය ගෙනැවිත් එහි වාඩි වී විශාල නොවන මහතැති පොතක් දිග හැර දණහිස් මත තබාගත්තේය.

"සහෝදරවරුනි, මේ පොතේ නම 'ඕවෝද්', බැටැලියනයේ ප්‍රධාන යුද්ධ නිලධාරියාගෙනුයි මම එය ලබා ගත්තේ. මේ

1 කොවිට්ස්කිගේ අත් බෝම්බය කිලෝග්‍රෑම් හතරක් බරය. එය කටු කම්බි බාධක විනාශ කිරීම සඳහා පාවිච්චි කරයි.

පොත මා කෙරෙහි බොහොම බලපානවා. නුඹලා නිහඬව ඉන්නවා නම් මම කියවන්නම්"

"ඔකත් වැඩක්ද! එකෙකුවත් බාධා කරන්නෙ නැහැ."

රෙජිමේන්තුවේ අණ දෙන නිලධාරී තැන්පත් සහෝදර පුසිර්යෝව්ස්කි, කොමසාරිස් සමඟ කිසිවකු නොහැඟෙන පරිදි ගිනිමැලය අසලට පැමිණි විට සෙබළුන් එකොළොස් දෙනෙකුගේ නෙත් කියවන්නා දෙස නොසැලී බලා සිටින සැටි දුටුවේය.

පුසිර්යෝව්ස්කි හිස හරවා කොමසාර් දෙසට හැරී අතක් දිගු කොට කාණ්ඩය පෙන්වීය.

"මෙතැන රෙජිමේන්තුවේ ඔත්තු බලන අයගෙන් භාගයක්ම ඉන්නවා. මගේ ළඟ ඒගොල්ල හතර දෙනෙක්. පළපුරුදු නැති කොම්සොමොල් සාමාජිකයෝ. නමුත් ඒගොල්ල හැම එකෙක්ම හොඳ සෙබළෙක්. අන්න අතන කියවන හාදයයි, අතන අනික් හාදයයි පේනවද? එයාගේ ඇස් හරියට වෘක පැටියෙකුගේ වගේ, එක්කෙනෙක් කෝර්චාගින් අනිකා ෂාර්කී. ඒගොල්ල යාළුවො. ඒ වුණත් ඒ දෙදෙනා අතර ඇති ගුප්ත ඉරිසියාව අඩු වෙලා නැහැ. ඉස්සර කෝර්චාගින් තමා මා ළඟ හිටිය හොඳම ඔත්තු සෙබළා. දැන් ඔහුට විරුද්ධව භයානක තරගකරුවෙක් ඉදිරිපත් වෙලා ඉන්නවා. දැන් බලාපන් කැපී පෙනෙන විදිහට දේශපාලන වැඩ කරනවා. නමුත්, බලපෑම බොහොම විශාලයි. ඒගොල්ලන්ට සෑහෙන හොඳ වචනයක් කල්පනා කරලා තියෙනවා. " යෞවන ආරක්ෂකයෝ"

"ඔත්තු බලන කණ්ඩායමේ දේශපාලන නායකයාද පොත කියවන්නේ" කොමිසාර් ඇසීය.

"නැහැ. දේශපාලන නායකයා ක්රාමර්."

පුසිර්යෙව්ස්කි ඉදිරියට අසු මෙහෙයැවීය.

"ආයුබෝවන් සහෝදරවරුනි!" ඔහු මහ හඬින් කෑ ගැසීය.

හැමදෙනාම හැරී බැලූහ. සෑදලයෙන් පහසුවෙන් බිමට පැන ගත් අණ දෙන නිලධාරී තැන වාඩි වී සිටියවුන් දෙසට ආවේය.

"මිත්‍රවරුනි උණුසුම් වෙනවද?" ඔහු පුළුල් ලෙස මඳ සිනා පාමින් ඇසීය. මොන්ගෝලියානුවකුට තරමක් සමාන දෙනෙත් සහිත ඔහුගේ නිර්භය මුහුණෙහි දැඩි බව අතුරුදහන් විය.

හොඳ සගයකු පිළිගන්නාක් මෙන් සගයෝ ආචාරශීලී

ලෙසත්, මිතුරු ලෙසත් ඔහු පිළි ගත්හ. යුද්ධ කොමිසාර් තැන තවත් දුර යනු පිණිස අසු පිටින් නොබැස සිටියේය.

පූසිර්යෙව්ස්කි බඳ පටියේ පිස්තෝලය කොපුව පසුපසට හරවාගෙන, කොර්චාගින් ළඟින් සෑදලය අසල වාඩි වී, යෝජනාවක් ඉදිරිපත් කළේය.

"දුමක් බොමුද? මා ළඟ බොහොම හොඳ දුම්කොළ තියෙනවා."

සිගරට්ටුවක් බීමට ඔහු කොමිසාර්ට කතා කළේය.

"දොරෝනින් යන්න. මම මෙතැන නවතින්නම්. සෙනෙවි කාර්යාලයට මා ඕනෑ නම් දන්වන්න."

දොරෝනින් ගිය පසු, පූසිර්යෙව්ස්කි කොර්චාගින් අමතා මෙසේ පැවසීය:

"දිගටම කියවාපන් මාත් අහගෙන ඉන්නම්."

පොතේ අවසාන පිටුව දක්වා කියවූ පාවෙල් එය දෙදණ මත තබාගෙන කල්පනාකාරී ලෙස ගිනිමැලය දෙස බැලීය.

විනාඩි කීපයක් යනතුරු කිසිවෙක් වචනයකුදු කතා නොකළහ. හැම කෙනෙක්ම ඔවොද්ගේ මරණය නිසා කම්පා වූ සිත් ඇතිව සිටියහ.

පූසිර්යෙව්ස්කි දුම් වලා පිට කරමින් සාකච්ඡාව ඇති වන තුරු බලා සිටියේය.

"බොහොම බැරෑරුම් කතාවක්" සෙරෙදා නිහඬතාව බින්දේය."ඒ වගේ මිනිස්සු මේ ලෝකෙ ඉන්නවා. මිනිහෙකුට එතරම් වධ විඳින්නට බැහැ. අදහස් සඳහා සටන් කළ නිසා තමා ඔහුට හැම අතින්ම හරි ගියේ."

ඔහු කැලඹුණු සිතින් කතා කළේය. එම පොත ඔහු කෙරෙහි විශාල හැඟීමක් ඇති කළේය.

බියලයා - ට්සේර්කොව් නමැති නගරයෙන් පැමිණි න්ද්රූෂා පොමීචේව් - පොමීචේව් සපතේරුවකුගේ අත්උදවුකාරයකු විය - කෝපයෙන් කෑ ගැසීය.

"පූජකයා මගේ අතට අහු වුණා නම් කුරුසෙන් ගහලා උගේ දත් කඩනවා. ඒ ජඩයාව මම එකපාරටම මරලා දානවා!"

අන්ද්රොෂුක් කෝටුවකින් කේතලය ගිනිමැලයට ළං කොට, ඒත්තු ගිය ලෙස කතා කළේය.

"මැරෙන්නේ මොනවාටද කියලා දන්නවා නම් ඒක විශේෂ කාරණාවක්. එතකොට මිනිහට ලොකු ශක්තියක් ඇතිවෙනවා, මැරෙනවා නම්, අනිවාර්යෙන්ම ඔහු ඉවසීමෙන් යුතුව එසේ කළ යුතුයි. ඒත් ඔබ හරි යැයි හැඟෙනවා

නම්, එතනින් තමයි වීරත්වය ඇතිවෙන්නේ. මම එක් ගැටවරයෙකුව දැන හිටියා. ඔහුගේ නම පොරෙයිකො. ඔඩෙස්සා නගරයේ දී සුදු හමුදාව ඔහුව අල්ලා ගත්තු වේලාවෙදි, ඔහු බය නැතිව උන්ගේ සේනාංකයක් ඉදිරියට ගියා. හතුරා ඔහුට බයිනේත්තුවෙන් අනින්ට ඉස්සෙල්ලා ඔහු අත් බෝම්බයක් දෙපා ළඟ අත හැරියා. ඔහු කෑලි කෑලිවලට වෙන් වුණා. වටේ හිටිය සුදු සෙබළුන් ගොඩක්ම මළා. නමුත්, මිනිහා දිහා බලන කොට නම්, ඔහුගේ පෙනුම වැදගැම්මකට නැහැ. ඔහු ගැන කිසිවෙක් පොතක් ලියන්නේ නැහැ. නමුත්, ලියන්නට ඕන. අපේ ජනතාව අතර ඒ වගේ අය බොහොම ඉන්නවා."

කේතලය හැදි ගා දෙතොල් දිගු කොට, තේ හැන්දක රස බලා ඔහු නැවත දිගටම කතා කළේය.

"බල්ලෙක් වගේ මැරෙන වේලාවලුත් තියෙනවා. ගෞරවයක් නැති අඳුරු මරණය. ඉස්යස්ලාව්ල් නගරය සඳහා අපි සටන් කළා. කුමාරවරුන්ගේ කාලෙදි හදාපු පැරැණි නගරයක් ඒක. නගරය තියෙන්නේ ගොරින් ගඟ අසල. එහි තියෙනවා, පෝලන්ත කතෝලික පල්ලියක් හරියට ඇතුළු වෙන්ට බැරි බළකොටුවක් වගේ. අපි ඔය පල්ලිය දිහාට ගියා. අපේ සෙබළු පෙළ ගැහිලා පාරවල් හා අතුරු පාරවල් දිගේ ඉදිරියට යනවා. අපේ දකුණු අංශය ලැට්වියානු සහෝදරවරු ගෙන හිටියා. අපි මහ පාර දිගේ දුවගෙන ගිහිල්ලා බලනකොට, සෑදල දාපු අශ්වයන් තුන් දෙනෙකුව ගෙවත්තේ වැටකට බැඳලා තියෙන හැටි දැක්කා.

ඔන්න ඉතින් අපි හිතුවා පෝලන්තකාරයන්ට බැටේ දෙන්න. අපි දහදෙනෙක් විතර ගෙවත්තට පැන්නා. ඉස්සරහට ආවා ලතීෂ් සේනාංකයේ ලොක්කා. මවුසර් පිස්තෝලයකුත් අතට අරගෙන.

අපි ගේ ළඟට දුවගෙන ගියා. දොර ඇරලා. අපි ගේ ඇතුළට ගියේ එතැන පෝලන්ත ජාතිකයෝ ඉන්නවායි කියලා හිතාගෙනයි. ලතීෂ් සහෝදරවරු අපට ඉස්සෙල්ලා එතැනට ඇවිත් එතැන තත්ත්වය හොඳ නැහැ. වැඩේ අතට ම අනුවෙලා. ගෑනියක් දූෂණය කරලා. ඒ ගෙදර පෝලන්ත නිලධාරියෙකුයි ඔහුගේ පවුලයි ඉඳලා තියෙනවා. ලතීෂ් සෙබළු ඒ ගෑනිට බලහත්කාරකම් කරලා. ලතීෂ් නායකයා මේක දැකලා තමන්ගේ භාෂාවෙන් මොනවාද කියලා කෑ ගැහැව්වා. අපරාධය කරපු තුන්දෙනා ගෙවත්තට ගෙන

ආවා. ඒ සේනාංකයේ හිටියේ අපි රුසියන්වරු දෙදෙනෙක් විතරයි. අනික් අය ලතිෂ්වරු. සේනාංක නායකයාගේ නම බ්‍රෙඩිස්, බාසාව නොතේරුණාට මට කාරණය තේරුණා. අපරාධකාරයන්ට දඬුවම් දෙන්ටයි සූදානම. ලැට්වියානුවෝ බොහෝම ශක්තිමත් ජාතියක්. බොරලු වගේ අපරාධකරුවන්ව ඒගොල්ල අස්ව ඉස්තාලේ ගල් කණුවට තියලා බැන්දා. දැන් මරා දමනවා සහතිකයි කියාලා මට හිතුණා. එක අපරාධකරුවෙක් උස මහතැති යෝධ තරුණයෙක්. ඔහු අම්මා ආච්චි පරම්පරා හතක් මතක් කරලා අමු කුණුහරුපෙන් බණිනවා. ගෑනියක් හන්දා අපව මරා දමන්ට හදනවද! නමුත්, අනික් දෙන්නත් සමාව ඉල්ලනවා.

මේක දැකලා මට හීන් දාඩිය දම්මා. බ්‍රෙඩිස් ළඟට දුවගෙන ගිහිල්ලා මම මෙහෙම කිව්වා. "සේනාංකයේ ප්‍රධාන සහෝදරය උන්ව යුද්ධාධිකරණයට ඉදිරිපත් කරන්න උන්ගේ ලේවලින් තමුන්ගේ අත කිලිටි කරගන්නේ මොකටද? නගරයේ සටන් තවම ඉවර වෙලා නැහැ. 'අපි මුන්ට දඬුවම් දෙන්ට යනවා.' බ්‍රෙඩිස් මා දිහා හැරිලා බැලුවා විතරයි මගේ කටින් පිට වුණ වචන නිසා මටම කනගාටු හිතුණා. බ්‍රෙඩිස්ගේ ඇස් හරියට කොටියෙකුගේ වගේ. ඔහු මගේ කට ළඟට පිස්තෝලය දික් කළා. අවුරුදු හතක් යුද්ධ කළා. ඒ පාර නම් මම බයවුණා. නිගමනයක් නැතුව මරා දමන්නට යන හැටි පේනවා. හිටිහැටියේම බ්‍රෙඩිස් මට රුසියන් බසින් කෑ ගැසුවා. ඔහුගේ වචන මට යම්තමින් තමා තේරුණේ. 'අපේ ධජය ලේවලින් තමා රතුපාට වුණේ. මේ පල් හොරු යුද්ධ හමුදාවට නින්දාවක්. ඔවුන් මරණයෙන් වන්දි ගෙවිය යුතුයි.'

මට උහුලාගෙන ඉන්ට බැරි වුණා. මම ගෙවත්තේ ඉඳලා මහ පාරට දුව ගියා. පිටු පසින් වෙඩි තියනවා. සත්තකින්ම වැඩ ඉවරයි කියලා කල්පනා කළා. අපේ සේනාංකය සමඟ යනකොට නගරය අය අල්ලාගෙන ඉවරයි. ඔන්න ඔහොමයි සිදුවුණේ. අපරාධකාරයන්ට බල්ලන් වගේ මරණයට මූණ පෑමට සිදුවුණා. ඔය අපරාධය කළේ මෙලිටොපෝල්ගෙන් අප ළඟට ආපු අය. ඉස්සර උන් මග්නෝගේ හමුදාවේ හිටියා. ඔවුන් නොහික්මුණු උදවිය."

කේතලය පාමුල තබාගෙන අන්ද්‍රොෂුක් පාන් මල්ලේ ගැටය ලිහන්නට විය.

"අප අතර ඒ වගේ ජඩයොත් ඉන්නවා. හැම එකාවම හොයලා බලන්ට බැහැ. උනුත් විප්ලවය සඳහා සටන්

කරනවා වගෙයි. නමුත්, ඔවුන් නිසා හැම එකාටම නරක නාමයක් ලැබෙනවා. ඒ වුණත් ඒක දිහා බලන්න ලේසි වුණේ නැහැ. තවමත් අමතක කරන්ට බැහැ." ඔහු කතාව අවසන් කොට තේ බොන්නට පටන් ගත්තේය.

රෑ බෝ වූ පසු ඔත්තු බලන අසරු සෙබළු නින්දට ගියහ. නිදා සිටි සෙරෙදා නහයෙන් හඬ පිට කරමින් ගෙරවීය. සෑදලය මත හිස තබා ගත් පූසිර්යොවිස්කි නිදා ගත්තේය. සේනාංකයේ දේශපාලන නායකයා වන ක්‍රාමර් සටහන් පොතෙහි කිසිවක් ලියුවේය.

පසුදින ඔත්තු බැලීමෙන් ඉක්බිති පැමිණි පාවෙල් තම අසු ගහකට බැඳ, තේ බී ඉවර කළ ක්‍රාමර් තමා වෙත කැඳවා මෙසේ කීවේය:

"දේශපාලන නායකයා මේ අහනවා, මම මේ හමුදාවේ ඉඳලා පළමුවැනි අසරු හමුදාවට මාරු වෙන්ට කැමතියි. ඒ ගැන නුඹේ අදහස කොහොමද, ඉක්මනින්ම ඒගොල්ලන්ට ගිනිරාමෙට වැඩ හිටීවි. ඒ ගොල්ලා මෙතන කඳවුරු ලාගෙන ඉන්නේ සිදාදියේ නොවෙයි නෙව. අපට සිද්ද වෙනවා එක තැනකට වෙලා ඉන්ට"

ක්‍රාමාර් ඔහු දෙස විමතියෙන් බැලීය.

"මාරුවෙන්ට, ඒ කොහොමද? රතු හමුදාව නුඹට චිත්‍රපටියක්ද? ඔය අදහස මොනවා වගේද? අපි ඔක්කොම එක අංශයක ඉඳලා තවත් අංශයකට දුවන්ට ගියොත් යසට හිටීවි!"

"කොහේ යුද්ධ කළත් මොකද?" පාවෙල් ක්‍රාමර්ට හරස් කපමින් පැවසීය.

"අතන සටන් කළත්, මම පසුපසට පැනලා යන්නෙ නැහැ නොව." ඔහු කීවේය.

ක්‍රාමර් දැඩි ලෙස විරුද්ධත්වය ප්‍රකාශ කළේය.

"විනයගරුක බව, නුඹ හිතන්නේ මොනවා කියලාද? පාවෙල් නුඹ හැම අතින්ම හොඳයි. නමුත්, ආරාජිකවාදී හැඟීම් නුඹේ ඔළුවේ තියෙනවා. හිතුවා, කළා. අපේ පක්ෂයත්. කොම්සොමොල් තරුණ සංවිධානයත් හදලා තියෙන්නේ අයෝමය විනයක් අනුව. පක්ෂය සියලු දේටම වැඩියෙ උසස්. හැම කෙනෙකුම වැඩ කරන්ට ඕන. ඔහුට කැමැති නැහැ නොවෙයි. ඔහු අවශ්‍ය තැන නුඹේ මාරුවීමේ ඉල්ලීම පූසිර්යෙව්ස්කි ප්‍රතික්ෂේප කළා නේද? කතාව එතැනින් ඉවරයි."

කහ පැහැති මුහුණක් ඇති උස හීන්දරී ක්‍රාමර් කැලඹීම නිසා කහින්නට විය. මුද්‍රණාලයේ ඊයම් මුසු දූවිලි ඔහුගේ පෙණහලු දැඩි ලෙසම බදාගෙන ඇත. රෝගී බව කියා පාන රතු ලප ඔහුගේ කම්මුල්වල නිතර උණුසුම් ලෙස මතු විය.

ක්‍රාමර් සන්සුන් වූ පසු පාවෙල් නොඋස් හඬින් එහෙත් දැඩි ලෙස කතා කළේය.

"නුඹේ කතාව හරි. නමුත්, කොහොම වුණත් මම බුඩිඔනිගේ හමුදාවට බැඳෙනවාමයි. ඒක ඇත්ත."

ඊට පසුදින හවස පාවෙල් කොර්චාගින් ගිනිමැලය අසල නොසිටියේය.

★ ★ ★

අල්ලපු ගමේ කඳුගැටයක් මත වූ පාසලක් අසල අශ්ව හමුදාව කවාකාරව වාඩි වී උන්හ. මැෂින් තුවක්කුවක් සහිත ගැලක පිටුපස වාඩි වී, හිස් වැස්මෙන් හිසෙහි පිටුපස වසාගත් බුඩිඔනි හමුදාවේ යෝධමය සෙබළෙක් ඇකෝඩියනයක් වාදනය කළේය. ඔහුගේ තූර්ය භාණ්ඩය කාලය කඩමින් හඬ නැඟීය. කවය වටා උම්මත්තකයකු සේ අසරු හමුදාවේ සෙබළෙක් ගොපාක් නැටුම නැටීය. ඔහු පළල් රතු සරුවාලයක් ඇඳ සිටියේය.

තම ගමට මේ දැන් පැමිණි අසරු සෙබළුන්ගේ දක්ෂ නැටුම් බැලීමට අවට ගම්වලින් ගොවි තරුණියෝ සහ තරුණයෝ මැෂින් තුවක්කුව සහිත ගැල දෙසට පැමිණියහ.

"තොජතාලො නටපන්! තාලය අල්ලාපන්. මල්ලී හරි හොඳයි. වාදකයා හොඳට වයපන්!"

අශ්ව ලාඩමක් වුවද, නැමිය හැකි යෝධමය ඇඟිලි සහිත ඇකෝඩියන් වාදකයාට තූර්ය භාණ්ඩයේ යතුරු නිසි ලෙස ක්‍රියා කළ නොහැකි විය.

"අපනාසි කුල්‍යාබ්කාව මග්නෝ මරා දැම්මා." දොම්නසින් යුතුව තලෙළු පැහැති අසරු සෙබළෙක් පැවසීය. "කුල්‍යාබ්කා පළමුවැනි පන්තියේ වාදකයෙක්. අසරු හමුදාවේ දකුණු අංශයේ සටන් කළා. ඔහු ගැන දුකයි. හොඳ සටන්කාමියා. ඇකෝඩියන් වාදනයට ඔහු ඊට වැඩියෙ හොඳයි."

පාවෙල්ද කවයේ සිටියේය. අවසාන වචන කිහිපය ඇසූ ඔහු සෙනඟ පීරමින් ගැල අසලට විත්, ඇකෝඩියනයට අත තැබීය. තූර්ය භාණ්ඩය නිහඬ විය.

"නුඹට මොකද?" වාදකයා ඇසීය.

තොප්තාලෝ නැවතුණේය. හැමතැනින්ම අසතුට පළ කරන හඬ ඇසිණි.

"මොකද වුණේ? නැවතුණේ මොකද?"

පාවෙල් තූර්ය භාණ්ඩයේ පටිය දෙසට අත යැවීය.

"පොඩ්ඩකට දීපන්!"

බුඩ්ඔනි අසරු හමුදාවේ සෙබළා අවිශ්වාසයකින් යුතුව නාඳුනන රතු සෙබළා දෙස බැලුවේ අස්ථිර ලෙස උරහිසින් ඇකෝඩියනයේ පටිය ගලවමිණි.

පාවෙල් පුරුදු ලෙස ඇකෝඩියනය දණහිස් මත තබා ගත්තේය. ඔහු ඇකෝඩියනය දිග හැර යතුරුවලට අතේ ඇඟිලි තබා මහ හඬින් වාදනය කළේය.

ඇපල් ගෙඩිය, ඇපල් ගෙඩිය
උඩ පැන පැන යන්නේ කොහිද?
කටට වැටෙන තුරු
පැන පැන යනවද

සුපුරුදු ගීතය තොප්තාලෝ එකවරම හඳුනාගත්තේ දැත් වනමින් කුරුල්ලකු සේ වට රවුමේ නටන්නට විය. ඔහු නොයෙකුත් අපූරු රැඟුම් පාමින් විළුඹටද, දණහිස්වලටද, හිසේ පසුපසටද, නළලටද තට්ටු කරමින්ද, විළුඹට හා කටට අත්ලෙන් ගසමින් මහත් වූ හඬක් නංවමින්ද නැටුවේය.

ඇකෝඩියනය හඬ නගමින් වේගවත් රිද්මයක් ඇති කළේ ය. වටේට දුවන වෘකපැටියෙකු සේ තොප්තාලෝ දෙපා දිගහරිමින් කැරකැවී නටමින් හඬ නැඟීය.

"ඉහ් ආහ්, ඉහ් ආහ්!"

★ ★ ★

1920 ජූනි මස පස්වැනිදා කෙටි, රුදුරු සටන්වලින් ඉනික්බිතිව බුඩ්ඔනිගේ පළමුවැනි අසරු හමුදාව 3 සහ 4 වැනි පෝලන්ත යුද්ධ හමුදා අතරින් පෙරමුණ බිඳ සවීට්ස්කි ජනරාල්ගේ අසරු හමුදාව විනාශ කොට, රුෂින් නගරය බලා ඉදිරියට ගියේය.

පෙරමුණ බිඳ ඉදිරියට ආ සතුරු සේනා විනාශ කරනු වස් පෝලන්ත සෙනෙවි මණ්ඩලය ලහි ලහියේ ප්‍රහාරක සේනාවක් සංවිධානය කළේය. පග්රෙබීෂේ දුම්රියපොළින් ඉක්මනට ගොඩබෑ යුද්ධ ටැංකි පහක් සංග්‍රාම භූමියට

වේගයෙන් ළඟා විය.

එහෙත්, පෝලන්ත හමුදා පහර ගැසීමට සුදානම් වූ සරෑඩ්නිට්සා නගරයට ඇතින් ගමන් ගත් රතු අසරු හමුදාව පෝලන්ත හමුදාවේ පසුපසට කඩා වැදුණේය.

පළමුවැනි රතු අසරු හමුදාවේ පසුපසට පහර දීමට පෝලන්ත සෙනෙවි ජනරාල් කොර්නීට්ස්කිගේ අසරු හමුදාවට නියම කළෙන්, එම හමුදා ගිය මඟ දිගේ ඔවුහු ගමන් ගත්හ. පෝලන්ත සෙනෙවි මණ්ඩලයේ නිගමනය වූයේ රතු අසරු හමුදාව උපක්‍රමීය අතින් වැදගත්ම ස්ථානයක් වූ කසාටින් කරා යන බවය. එහෙත්, පෝලන්ත සුදු හමුදාවල තත්ත්වයට ඉන් පිහිටක් නොවීය. යුද පෙරමුණේ ඇති වූ හිඩැස්ස මකා දැමීමට පසු දින පෝලන්ත හමුදා සමත් වුවද, රතු අසරු හමුදාවට පිටුපසින් පෙරමුණ වැසුණද, පෝලන්ත හමුදාවල පසු පස කඳවුරු හා මධ්‍යස්ථාන විනාශ කොට දමා කීයෙව් නගරය අරක්ගෙන සිටින පෝලන්තයන්ට පහර දීමට යා යුතුව තිබිණි. ඉදිරියට ගිය රතු අසරු හමුදාව කුඩා පාලම් සහ දුම්රිය මාර්ග විනාශ කර දැම්මේය. එමඟින් පෝලන්ත හමුදාවලට පසු බැසීමේ මාර්ග නැති කර දැමිණි.

පෝලන්ත හමුදාවේ අණ දෙන සෙනෙවි මණ්ඩලය ෂීටෝමීර් නගරයේ සිටින බව යුද්ධ සිරකරුවන්ගෙන් දැන ගත් ඉනික්බිති - ඇත්ත වශයෙන්ම එම නගරයේ යුද පෙරමුණ මෙහෙයවන සෙනෙවි මණ්ඩලය විය. රතු අසරු හමුදාවේ මහ සෙනෙවියා ෂීටෝමීර් හා බෙර්දිචෙව් නගරවල දුම්රිය මර්මස්ථාන හා පරිපාලක මධ්‍යස්ථාන අල්ලා ගැනීමට තීරණය කළේය. ජූනි හත්වැනිදා අරුණෝදය වත්ම, රතු අසරු හමුදාවේ හතරවැනි අසරු ඩිවිෂනය ෂීටෝමීර් දෙසට ගියේය.

එහි එක් අසරු සේනාංකයක, සටනකදී මිය ගිය කුල්යාබ්කෝගේ තැන ගෙන දකුණු කෙළවරින් අසු මෙහෙයැවූයේ පාවෙල් කොර්චාගින්ය. එතරම් දක්ෂ ඇකෝඩියන්වාදකයෙකු අහිමි කර ගැනීමට අකැමැති වූ එම සේනාංකයේ සාමූහික ඉල්ලීම අනුව කොර්චාගින් සේනාංකයට බඳවා ගැනිණි.

රතු අසරු හමුදාවෝ ළැව් ගින්නක් සේ ෂිටෝමීර් නගරය දෙසට කඩා වැදුණහ. උණුසුම් අසුන් නොනවත්වා වේගයෙන් පැන්නූ ඔවුන්ගේ අසිපත් හිරු රැස් නිසා රිදී පැහැයෙන් බැබළිණි.

මහ පොළොව කම්පනය විය. අශ්වයෝ හති දැමුහ. අසරුවෝ සෑදල පා පටිවලට තබා නැඟිට සිටියහ.

අශ්වයෝ වේගයෙන් දුව ගියහ. මල්වතු සහිත විශාල නගරයකට අසරු සේනාව ළං විය. පළමු මල්වතු පසු කර දිව ගොස් අසරු සෙබළු නගරය මැදට කඩා වැදුණහ. මරණය මෙන් බියජනක, අගෝහන "අල්ලා ගනිමු!" යන හඬින් අවට වාතය ඇලළිණි.

අන්දමන්ද වූ පෝලන්ත සේනා පෙරළා පහර ගැසීමට පවා ඉදිරිපත් නොවූහ. නගරයේ යුද්ධ හමුදාව පාගා දැමුවේය.

තම අසුගේ දිගැති බෙල්ල බදා ගනිමින් කොර්චාගින් ඉගිළෙන්නාක් මෙන් අසු මෙහෙයැවීය. ඔහු අසලින් සිහින් පාද ඇති අසකු තොප්තාලෝ මෙහෙයැවීය.

තුවක්කු උරහිසට ගැනීමට අසමත් වූ පෝලන්ත සෙබළුකුගේ හිස බුඩ්ඔනිගේ අසරුවෙක් විසින් දැඩි පහරකින් දෙපළු කරන ලද්දේ පාවෙල් කොර්චාගින්ගේ දෙනෙත් ඉදිරිපිටදීය.

මඟ දිගේ දුවන අසුන්ගේ ලාඩම් ගල්වල වැදී හඬක් මතු විය. හිටිහැටියේම මංසන්ධියක් මැද මැෂින් තුවක්කුවකි, එයට නැඹුරු වී සිටියවුන් ඇද සිටියේ නිල් පැහැති යුද ඇඳුම් ය. හතරැස් තොප්පි වගයක් ඔවුහු හිස දමා සිටියහ. කර පටියෙහි නයකුට සමාන රන් වලිගයක ලාංඡනයක් පැලඳ සිටි හතරවැනියා අසරු සෙබළුන් දැක පිස්තෝලය දිගු කොට ඉලක්කය ගත්තේය.

තෝප්තාලෝට හෝ පාවෙල්ට හෝ තම අසුන් නැවැත්වීමට නොපුළුවන් විය. මැෂින් තුවක්කුවේ මාර කටට ම ඔවුහු ගියහ. පෝලන්ත නිලධාරියා පාවෙල් කොර්චාගින්ට වෙඩි තැබීය... ඉලක්කය වැරැදිණි. වෙඩි පහර වී කුරුල්ලකු සේ හඬ නඟමින් පාවෙල්ගේ කම්මුල ළඟින් ගියේය. පාවෙල්ගේ අශ්වයාගේ පපුවට හැප්පුණු පෝලන්ත ඔපිසරයා උඩුබැලි අතට බිම වැටුණෙන් ඔහුගේ හිස ගලකට වැදිණි.

ඒ මොහොතේම මැෂින් තුවක්කු හඬ නැඟීය. සිහින් කකුල් ඇති අසුත් සමඟ තොප්තාලෝ බිම ඇද වැටුණේය. උගේ ඇඟට කා වැදුණු මැෂින් තුවක්කු පතොරොම් ගණන දසකයකි.

පාවෙල්ගේ අසු පසු පස කකුල්වලින් නැඟී සිටියේ, බිය වී හේෂාරවය කරමිනි. අසරු සෙබළා වැටී සිටියවුන්ට ඉහළින් අසු පන්නා මැෂින් තුවක්කු අසල සිටි හටයන් දෙසට

ගියේය. පාවෙල් අතැ'ති අසිපත දිලිසෙන කවයක් අඳිමින් පෝලන්තයෙකුගේ නිල් පැහැති තෝප්පිය මත පතිත විය.

අසිපත අහසෙහි ලෙළ දුන්නේ ඊළඟ හිස මත පතිත වීමටය. එහෙත්, උණුසුම් අශ්වයා අහකට පැන්නේය.

ගලා බසින ගඟක් සේ අසරු සේනාංකයක් මංසන්ධියට කඩා වැදුණේය. අසිපත් බොහෝ ගණනක් ලෙළ දුන්නේය.

★ ★ ★

සිරගෙදර පටු දිගැති කොරිඩෝරයේ කෑ ගැසීම් ඇසිණි.

වධ විඳි කෙට්ටු මුහුණු ඇති මිනිසුන්ගෙන් සිරගෙදර කාමර සම්පූර්ණයෙන්ම පිරී පැවැතිණි. නගරය තුළ සටන් පවතින විට නිදහස ගැන විශ්වාසය තැබිය හැකිද? තමන්ගේ සේනා කොහේදෝ සිට පැමිණි බව විශ්වාස කළ හැකිද?

හිරගෙදර මිදුලේ වෙඩි තැබීම් පටන්ගෙන ඇත. කොරිඩෝර දිගේ මිනිස්සු දුවති. හිටිහැටියේම තමන්ට සුපුරුදු වචන ඇසිණි. "සහෝදරවරුනි, එළියට වරෙල්ලා!"

පාවෙල් කුඩා කවුළුවක් ඇති දොරක් දෙසට දිව ගියේ ය. කවුළුව දෙස බොහෝ දෙනෙක් බලා සිටිති. හේ තුවක්කු මිටින් දොරෙහි ඉබ්බාට ගැසීය. තව තවත් ගැසීය!

"නැවතියන් මම යතුරු ඉබ්බාට බෝම්බයක් ගහන්නම්."පාවෙල් නැවැත්වූ මිරෝනොව් සාක්කුවෙන් බෝම්බයක් ඇද ගත්තේය.

සේනාංකයේ ටිසිගාර්චෙන්කෝ අත් බෝම්බයේ ඇණය ගැලවීය.

"නැවතියන්, පිස්සා, නුඹට ඔල්මාදෙද? දැන් යතුරු ගෙනේවි. කඩන්න බැරි නම් යතුරුවලින් අරිමු."

පටු කොරිඩෝරය දිගේ හිර ගෙදර මුරකරුවන් පිස්තෝලවලින් තල්ලු කරමින් ගෙනාවේය. දොරවල් හැරියෙන් වැරහැලි හැඳගත්, සිරුරු නොසේදූ, අතිවිශාල ප්‍රීතියකින් ප්‍රමෝද වූ මිනිසුන්ගෙන් කොරිඩෝරය පිරිණි.

පුළුල් දොරවල් හැර දැමූ පාවෙල් හිර කාමරය තුළට දිව ගියේය.

"සහෝදරවරුනි, තමුන්නාන්සේලා නිදහස්! අපි බුඩිඕනිගේ අසරු හමුදාව. අපේ ඩිවිෂනය නගරය අල්ලා ගත්තා."

කඳුළු පිරි දෙනෙතින් යුත් එක් කාන්තාවක් තමන්ගේ එකෙකු මෙන් පාවෙල් තදින් වැලඳගෙන සුසුම් ලෑවාය.

ප්‍රතිවිප්ලවවාදී සුදු පෝලන්ත හමුදා විසින් ගලින් තනන ලද හිර කාමරවලට දක්කනු ලැබූ බොල්ෂෙවික්වාදීන් පන්දාස් හැත්තෑ එක් දෙනෙකුද, රතු හමුදාවේ දේශපාලන ක්‍රියාකාරී දෙදාහක්ද වෙඩි තබා මරා දැමීමෙන් සහ එල්ලුම් ගහෙන් නිදහස් කර ගැනීමෙන් රතු අසරු ඩිවිෂනය ලැබුවේ සියලුම තිළිණවලට වඩා වටිනාතම තිළිණයකි. සියලු ජයග්‍රහණවලට වඩා වටිනා ජයග්‍රහණයකි. විප්ලවවාදීන් දහසකට ඇදිරි රෑය හිටි හැටියේම, ජූනි මස උණුසුම් දවසක දීප්තිමත් සූර්යාලෝකය බවට පරිවර්තනය විය.

ඉදුණු දෙහි ලෙල්ලක් වැනි කහ පැහැති මුහුණක් ඇති එක් සිරකරුවෙක් ප්‍රීතියෙන් යුතුව පාවෙල් බදා ගත්තේය. ෂෙපෙතෝව්කා නගරයේ මුද්‍රණාලයේ අකුරු අමුණන්නකු වූ ඔහු සැමුවෙල් ලේහෙර්ය.

★ ★ ★

සැමුවෙල්ගේ කතාවට පාවෙල් සවන් දුන්නේය. ඔහුගේ මුහුණ අළු පැහැ ගැන්විණි. සැමුවෙල් තම නගරයේ සිදු වූ බේදවාචකය ගැන කියන විට ඔහුගේ හදවතට වේදනාවක් ඇති විය. උණු ලෝහ මෙන් වූ එම වචන හදවතට වැටෙන්නාක් මෙන් විය.

"එකම රෑයක දී අපි ඔක්කොමන්ව හිර භාරයට ගත්තා. එක ප්‍රකෝපකාරයෙක් අපිව පාවා දුන්නා. යුද්ධ පොලිස්කාරයන්ගෙ මාර කටට අප එකවර වැටුණා. පාවෙල් අපට භායනක විදිහට උන් පහර දුන්නා. මම අනික් අයට වඩා අඩුවෙන් දුක් වින්දා. මුලින්ම ගහපු පහර දෙක තුන නිසා මම මළාක් වගේ බිම ඇද වැටුණා. අනික් අයට හුඟාක් ගැහුවා. අපට හංගන්නට කිසිවක් තිබුණේ නැහැ. පොලීසිය අපට වඩා හොඳින් හැම දෙයක්ම දන්නවා. අපේ හැම පියවරක් ම ඔවුන් දැන හිටියා.

අප අතර පාවා දෙන්නෙක් ඉන්න කොට උන්ට හංගන්නට දෙයක් තියෙනවද? ඒ දවස් ගැන නුඹට කියන්ට බැහැ. පාවෙල් නුඹ බොහෝ දෙනෙකුව දන්නවා. වාල්යා බ්‍රැෂ්ෂාක්ව, ප්‍රාදේශීය නගරයේ රෝසා ග්‍රිට්ස්මාන්ව. ඇගේ වයස දහහතයි. ඇගේ දෙනෙත්වල බොහෝම දැඩි විශ්වාසයක්

තිබුණා. අපේ අකුරු අමුණන්නෙකු වූ සාෂා බුන්ෂාප්ට්ව නුඹ දන්නවා ඇති. හොඳ හාදයා. හැමදාම අයිතිකරු ගැන විකට චිත්‍ර ඇන්දා. විදූහල් සිසුන් දෙදෙනෙක් නොවොසෙල්ස්කි හා තුෂ්ට්ස්. නුඹ ඒ අයවත් දන්නවා. ඉතුරු අය ප්‍රාදේශීය නගරයක සහ ගම්වල කට්ටිය. ඔක්කොම විසි නව දෙනෙකුව හිරභාරයට ගත්තා. ඒ අය අතර හයදෙනෙක් ගැහැනුය. ඔවුන්ට දස වධ දුන්නා. වාල්යාවයි, රෝසාවයි පළමුවැනි දවසේදීම දූෂණය කළා. ඒ නීචයෝ ඔවුන්ට අපහාස කළා. ඒ දෙදෙනාම හිර කාමරවලට දැම්මේ බාගෙට මරලයි. රෝසා ඉන් පසු දොඩන්නට පටන් ගත්තා. කීප දවසකට පස්සෙ ඈට පිස්සු හැදුණා.

ඈට පිස්සු කියලා විශ්වාස කළේ නැහැ. බොරු පිස්සු කියලා හිතාගෙන ප්‍රශ්න කරන කොට ඈට හැමදාම වධ දුන්නා. ඈව වෙඩි තබා මරා දමන්ට ගෙන ගියා. ඈ දිහා බැලීමට පවා බියජනකයි. ඈට ගුටිබැට දීපු නිසා ඇගේ මුහුණ පැල්ලම්වලින් කළු වෙලා තිබුණා. ඇගේ ඇස් සතකුගෙ වගෙයි. ඈ පිස්සු හැදුණු නාකි ගැනියක් වගේ.

වාල්යා බ්රූෂ්ෂාක් අවසානය දක්වාම හොඳට හිටියා ඒගොල්ල නියම සටන්කාමියෝ වගේ මළා. ඒගොල්ලන්ට ඔය තරම් ශක්තිය ලැබුණේ කොහින්ද කියලා මම දන්නෙ නැහැ. පාවෙල්, ඇත්ත වශයෙන්ම ඒ ගොල්ලන්ගෙ මරණය ගැන කියන්ට පුළුවන්ද? එය කියන්නට බැහැ. ඔවුන්ගේ මරණය වචනවලට වැඩියෙ බියජනකයි... වාල්යා බ්රූෂ්ෂාක් ඉතාම භයානක වැඩකට අහුවුණා. ඈ පෝලන්ත සෙනෙවි කාර්යාලයේ රේඩියෝ-ටෙලිෆෝන් පණිවුඩකරුවන් සමඟ සම්බන්ධකම් පවත්වා ගෙන හිටියා. එහෙම සම්බන්ධකම් පවත්වාගැනීමට ඇය ප්‍රදේශයට යැව්වා. ඇයව හෝදිසි කරන කොට ඈ ළඟ අත් බෝම්බ දෙකකුයි, බ්‍රවුනිංග් පිස්තෝලයකුයි තිබිලා අහුවුණා. ඈට අත් බෝම්බ දුන්නේ පොලිස් ඔත්තුකාරයා. සෙනෙවි කාර්යාලය පුපුරවා හැරීමට කුමණ්ත්‍රණය කළාය කියන චෝදනාවට ගැළපෙන විදිහට උන් කරුණු සූදානම් කළා.

අනේ පාවෙල් අවසාන දවස් ගැන කියන්ට මට බැහැ. නුඹ ඉල්ලා හිටිනවා නම් මම කියන්නම්. පෝලන්ත යුද්ධාධිකරණය මෙහෙම තීන්දු කළා. වාල්යා සහ තවත් දෙදෙනෙකු එල්ලා මරා දැමීමට. ඉතිරි අය වෙඩි තබා මරා දැමීමට.

අපේ දේශපාලන වැඩ කටයුතුවලට සම්බන්ධ වෙලා හිටි පෝලන්ත සෙබළුන්ගේ නඩු ඊට දවස් දෙකකට කලින් ඇහුවා.

යුද්දෙට ඉස්සෙල්ලා ලොඩ්ස් නගරයේ විදුලි කාර්මාන්ත ශිල්පියකු හැටියට වැඩ කළ රේඩියෝ විදුලි පණිවුඩකරුවකු වන තරුණ ස්නෙගුර්කෝ කෝපරලව් දේශද්‍රෝහියකු හැටියටත්, සෙබළුන් අතර කොමියුනිස්ට් ප්‍රචාරය ගෙන ගිය කෙනෙකු හැටියටත් නම් කර ඔහුට විරුද්ධව නඩු අහලා ඔහුව වෙඩි තබා මරා දැමීමට තීරණය කළා. ඔහු සමාව ඉල්ලා පෙත්සමක් දුන්නේ නැහැ. පැය විසි හතරක් ඇතුළත දී ඔහුව වෙඩි තබා මරා දැම්මා.

වාල්යාව ඒ නඩුවේ සාක්කිකරුවකු හැටියට කැඳවලා තිබුණා. ස්නෙගුර්කෝ කොමියුනිස්ට්වාදී ප්‍රචාරය කළ බවට පිළිගත්තයි කියලා අපට වාල්යා කිව්වා. තමා දේශද්‍රෝහියකු නොවන බව ඔහු කෙළින්ම කියා හිටියා. "මගේ මවුබිම පෝලන්ත සෝවියට් සමාජවාදී ජනරජයයි. ඔව්, මම පෝලන්ත කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයෙක්. මාව සෙබළකු කළේ බලහත්කාරයෙන්. යුද පෙරමුණට දක්වපු මා වැනි සෙබළුන්ගේ ඇස් මම පැදුවා. නුඹලාට පුළුවනි මාව මරා දමන්න. නමුත්, මගේ මවුබිමට මම ද්‍රෝහිකම් කරලත් නැහැ. කරන්නෙත් නැහැ. මගෙයි නුඹලාගෙයි මවුබිම එකිනෙකට වෙනස්. නුඹලාගේ මවුබිම රදලවාදීය. මගේ මවුබිම කම්කරු- ගොවිකරුයි. මට හොඳටම විශ්වාසයි මගේම මවුබිමක් ඇති වන බව. අන්න ඒ මවුබිම මාව කිසි දිනක ද්‍රෝහියකු හැටියට හඳුන්වන්නේ නැහැ."

අවසාන තීන්දුව දුන්නායින් පස්සේ අපි ඔක්කොම එකට දමලා තිබුණා. මරා දමන්ට ඉස්සෙල්ලා හිර ගෙදරට ගෙන ගියා. එක රැයකදී හිර ගෙය ඉදිරිපිට එල්ලුම් ගහ හැදුවා. රෝහල ළඟ, කැලෑව ළඟින්ම ටිකක් ඈතින් ගල් වළ තියෙන පාර අයිනේ ස්ථානය වෙඩි තබා මරා දැමීමට තෝරා ගත්තා. එතැන අප වෙනුවෙන් පොදු මීනි වළක් කැපුවා.

"මේ මරණ දඬුවම ගැන දැන්වීම් නගරයේ අලවා තිබුණා අපව මරා දැමීම ජනතාවට පාඩමක් හැටියට උගන්වන්ට පෝලන්ත හමුදාව තීරණය කළා. උදේ හිටන්ම මිනිසුන්ව එල්ලුම් ගහ ළඟට ගෙනාවා. සමහරු කුතුහලය නිසා ආවා. බැලීම බිය ජනක වුණාට බලන්ට ආවා. එල්ලුම් ගහ ළඟ මහ ගොඩක් සෙනඟ රැස්වුණා. බැලූ බැලූ හැමතැනම

මිනිස්සු. හිරගෙයි වැට ලී දඬුවලින් හදලා තියෙන බව නුඹ දන්නවා නොවැ. හිරගෙය ළඟ එල්ලුම් ගස් හදලා තිබුණා. අපට කටහඬ ඇසුණා. පිටුපසින් මහ පාරේ මැෂින් තුවක්කු තියල. ප්‍රදේශයේ හැම තැනම ඉඳලා අසරු හමුදා, පාබළ පොලිස් හමුදා එතැනට ගෙනාවා. බැටැලියන් හමුදාවක් ගෙවතුයි පාරවලුයි කොටු කළා. එල්ලා මරන අයට එතැනම එල්ලුම් ගස් ළඟම විශේෂ වළක් හැරුවා. අපි අවසානය බලාපොරොත්තුව නිහඬව හිටියා. කතා කළේ ඉඳ හිටලා. සමුගන්නා විට හැම දෙයක් ගැනම කතා කරගත්තා. රෝසා විතරක් කාමරයක මුල්ලේ ඉඳගෙන තේරුම් නැති වචන දොඩවන්ට පටන් ගත්තා. දුෂණය කළ නිසාත්, ගුටිබැට කෑ නිසාත් වාල්යාට ඇවිදීමට ශක්තියක් තිබුණේ නැහැ. ඈ වැඩි වෙලාවක් වැතිර හිටියා. පළාතේ කොමියුනිස්ට්වාදී කාන්තාවෝ සොයුරියන් සේ වැලඳගෙන සමුගත්තා. උහුලාගන්ට බැරිව සුසුම්ලැවා. පොලිස්කාරයන් දෙදෙනෙකුට ගහලා තුවාල කරපු මල්ලව පොරකරුවකු වගේ ශක්තිමත්, තරුණ ස්තෙපානොව් සෝයුරියන්ගෙන් දඩි ලෙස ඉල්ලා හිටියා "සහෝදරියනි, පෝරකය ඉදිරිපිට අඬන්ට එපා. අඬනවා නම් මෙතැනදී අඬන්න. මිනී කන බල්ලන්ව සතුටු කරවන්නට එපා. අපට සමාව ලැබෙන්නේ නැහැ. කොහොමත් මැරෙන්නට සිද්ධ වෙනවාමයි. ඒ නිසා අපි හොඳින් මැරෙමු. බියගුල්ලන් වගේ දණ ගා යන්නට ඕන නැහැ. සහෝදරවරුනි, මතක තබා ගන්න, හොඳින් මැරෙන්නට ඕන.

ඔන්න ඉතින් අපව ගෙන යන්නට ආවා. ඉස්සරහින් ප්‍රති චරපුරුෂ සේවයේ ලොක්කා ෂ්වර්කොව්ස්කි පරපීඩා කාමුකයා. පිස්සු බල්ලා. ඔහු ස්ත්‍රීන්ව දුෂණය නොකළා නම් පොලිස්කාරයන්ට ඒ කාරිය භාර දෙනවා. දීලා බලාගෙන ඉන්නවා. සිරගෙදර ඉඳලා එල්ලුම් ගස් දක්වා පෙළට පොලිස් කාරයන්ව සිටෙව්වා. උන්ගේ කහපාට ඇග්ලට් නිසා උන්ව හැඳින්වූයේ 'කහ කුරුල්ලන්'හැටියටයි. උන් එකිනෙකාට ළංවෙලා පෙළ ගැහිලා හිටියේ. එළියට ඇද ගත් කඩු අතේ ඇතිවයි.

තුවක්කු මිටිවලින් අනිමින් අපව හිරගෙදර මිදුලට ගෙන ගියා. හතරදෙනා බැගින් පෙළ ගැස්සුවා. හිරගෙදර දොරවල් ඇරලා මහ පාරට ගෙන ගියා. සහෝදරවරුන්ව මරන හැටි අපට පෙන්වන්ට. ඊට පස්සේ අපේ වාරය ආවා. එල්ලුම් ගහ

උසයි, මහත ලී දඬුවලින් හදලා තියෙන්නෙ එල්ලුම් ගහේ මහත කඹවලින් හදාපු තොණ්ඩු තුනක් තියෙනවා. ඉණිමඟ ක් සහිත කුඩා මැස්ස වීසි කරන කොටයට හේත්තු කරලා තියෙනවා. මහ සෙනඟ හඬ නඟන හැටියි, හෙළවෙන හැටියි ඇහෙනවා. හැම කෙනෙක්ම අප දිහා බලාගෙන ඉන්නවා. අපේ අය ඔවුන් අතුරෙන් හඳුනා ගැනීමට පුළුවනි.

ගොඩනැඟිල්ලට ඇතුළු වන තැන, උඩ ඈත දුර දක්නයක් ඇතිව පෝලන්ත රදල සාමිවරු සහ උන් අතර යුද්ධ නිලධාරී රැස්වෙලා හිටියා. බොල්ෂෙවික්වරුන්ව එල්ලා මරා දමන හැටි බලන්නට ඇවිල්ලා.

හිම වැටිලා කකුලට පැගෙන විට සිනිඳුයි. හිම කැට නිසා කැලෑව සුදු පාටයි. ගස්වල කපු පුලුන් පුරවලා වගේ. හිම පියලි කරකැවෙනවා. හෙමින් පහත වැටෙනවා. අපේ උණුසුම් මුහුණුවලට වැටිලා හිම දිය වී යනවා. ඉණිමඟේ පා පුවරුව හිමවලින් පිරිලා. අපි හැමදෙනෙක්ම නිරුවතින් වගේ. නමුත්, කිසිවෙක් ඒ ගැන හිතන්නේවත් නැහැ. ස්තෙපානොව්, සපත්තු නැතිව මේස් විතරක් දමාගෙන ඉන්න බව ඔහුට ගණන් නැහැ.

එල්ලුම් ගහ ළඟ ප්‍රධාන චෝදකයයි, උසස් නිලධාරිනුයි. හිරගෙදර ඉඳලා ගෙනාව මරන්නට යන අයව, වාල්යාවයි, සහෝදරයන් දෙදෙනෙකුවයි එල්ලා මරන්ට නියම කරලා තිබුණා. තුන්දෙනාම අත්වැල් බැඳ ගත්තා. වාල්යා මැද්දේ. ඈට පයින් යාමට පවා හයිය නැහැ. සහෝදරවරු ඇයට උදව් කරනවා. "හොඳින් මැරෙන්නට ඕන" ස්තෙපානොව්ගේ වචන මතක් කරගෙන ඈ කෙළින් යාමට උත්සාහ කරනවා. ඈට හිම කබායක් නැහැ. ගොතපු ගවුමක් ඇඳලා හිටියා.

තුන්දෙනාම අත්වැල් බැඳගෙන යාම ෂ්වර්කොව්සික්ගේ හිතට ඇල්ලුවේ නැහැ. ඔහු ඔවුන්ව තල්ලු කළා. වාල්යා මොනවාදෝ කීවා. ඒ වචනයට පොලිස් අසරුවා කසයෙන් ඈට ගැහුවා.

සෙනඟ අතරේ හිටි ගැනියක් මහ හඬින් කෑ ගැසුවා. ඈ පිස්සියක් මෙන් කෑගසමින් සෙබළ පෙළ බිඳගෙන තුන්දෙනා වෙත යාමට තැත් කළා. නමුත්, ඇයව අල්ලාගෙන කොහාටදෝ ගෙන ගියා. මා හිතන හැටියට ඈ වාල්යාගේ අම්මා වෙන්ට ඕන. එල්ලුම් ගහ ළං වුණාම වාල්යා සින්දුවක් කියන්ට පටන් ගත්තා. ඒ වගේ කටහඬක් මම කවදාවත් අහලා නැහැ. මරණය කරා යන අයට විතරයි ඒ වගේ ගයන්නට

පුළුවන්. ඈ 'වර්ෂව්යාන්කා' නමැති ගීතය ගායනා කළා. අනික් සහෝදරවරුත් ගායනා කළා. පොලිස් අසරුවෝ කසවලින් ගැහුවා. පිස්සු බල්ලන් වගේ ඔවුන්ට ගැහුවා. එහෙත් ඔවුන්ට ගණනක්වත් නැහැ. ගුටිකාලා වැටුණයින් පස්සේ මිටි වගේ ඒගොල්ලන්ව එල්ලුම් ගහ ළඟට ඇදගෙන ගියා. උන් ඉක්මනින් තීන්දුව කියෙව්වා. තොණ්ඩු දමන්ට පටන් ගත්තා. එතකොට අපි ගයන්ට පටන් ගත්තා.

සාදුකින්, පෙළෙන්නෝ....

අපට හැම පැත්තෙන්ම ගහන්ට පටන් ගත්තා පා පුවරුව අසල කොටයට සෙබළෙක් තුවක්කු මිටෙන් පහර දුන්නා විතරයි තොණ්ඩු බෙලිවලට හිරවුණා...

අපි දහ දෙනෙකුව වෙඩි තබා මරන්ට බිත්තිය ළඟටම ගෙන ගිහිල්ලා, එතැනදී අපට දැන්නුවා මරණ දඬුවම වෙනස් කරලා විසි අවුරුද්ද බැගින් හිරගෙට නියම කරන බව. අනික් දහසය දෙනාව වෙඩි තියලා මරා දැම්මා."

සැමුවෙල් කමිස කර ඉරා දැම්මේ හරියට එය ඔහුගේ ගෙල මිරිකුවාක් මෙනි.

දවස් තුනක්ම එල්ලපු අයව එහෙම තියෙන්නට ඇරියා. එල්ලුම් ගහ ළඟ උදේ රෑ මුර කළා. පස්සේ අපේ හිරගෙදරට අලුත් හිරකරුවන්ව ගෙනාවා. හතරවෙනි දවසේ දී එල්ලා මරා දමාපු තරබාරු සහෝදරයා තොබොල්දින්ගේ සිරුර කඹෙන් කඩා වැටිලා තියෙනවා. ඊට පස්සේ අනික් අයවත් ගලවලා එතැනම වළලා දමාපු බව අලුත් හිරකරුවෝ කීවා.

ඒ වුණාට එල්ලුම් ගහ හැම තිස්සේම එතන තිබුණා. අපි මෙහාට ගෙනෙන්ට පිට වන විට අපි එය දැක්කා. අලුත් බිලි බලාපොරොත්තුවෙන් තොණ්ඩු ඇතිව එල්ලුම් ගහ තියෙනවා. නොසැලී ඇත බලාගෙන සිටි සැමුවෙල් නිහඬ විය. කතාව අවසන් වූ බව පාවෙල්ට නොදැනිණි.

ඔහුගේ මනැසෙහි එල්ලා ඇති සිරුරු තුනක් දිස් විය. නිහඬව වැනෙන එම සිරුරුවල බෙලි බියජනක ලෙස පැත්තකට ඇල වී තිබිණි.

මහමග උස් හඬකින් නළාවක් පිම්බේය. එම හඬ විසින් පාවෙල් අවදි කැරිණි.ඔහු යම්තම්න් ඇසෙන සේ මෙසේ පැවසීය:

"සැමුවෙල් අපි මෙතැනින් යමු!"

මහමඟ දිගේ රතු අසරු සෙබළුන්ගේ රැකවල යටතේ සිර භාරයට පත් පෝලන්ත භටයෝ ගමන් කළහ. රෙජිමේන්තුවේ

කොමිසාර් තැන වැට අසල සිටගෙන සටහන් පොතේ ලියූ 'අණ දීමක්' අවසන් කරමින් සිටියේය.

"ඇන්ටීපොව් සහෝදරයා මේක අරගන්න." ඔහු සටහන් කළ කොළයක් පුළුල් උරතලවලින් යුතු සේනාංකයේ ප්‍රධානියාට දුන්නේය. "නොවොග්රාද්-වොලින්ස්කිවලට සිරකරුවන්ව පිටත් කරන්න. තුවාලකරුවන්ව වෙළලා ගැල්වලට දමලා ඒ පාරේම යවන්න. නගරයෙන් හැතැප්ම විස්සක් විතර ඈතට ගෙන යන්න. ඔහේ ගියදෙන්. අපට ඒ ගොල්ලෝ ගැන හොයා බලන්නට වෙලාවක් නැහැ. හිරකරුවන්ට රළු වීදියට නොසැලකීමට වග බලා ගන්න."

අසුගේ සෑදලය මත වාඩි වූ පාවෙල්, සැමුවෙල් දෙසට හැරුණේය.

"උඹට ඇහුණද? උන් අපේ අයව එල්ලා මරා දමනවා. අපි උන්ට රළු කම් නොකර කැඳවාගෙන යන්ට ඕනලු! උහුලාගෙන ඉන්නේ කොහොමද?

රෙජිමේන්තුවේ කොමිසාර් තැන හිස හරවා ඔහු දෙස බැලීය. තමාටම කියා ගන්නාක් මෙන් කොමිසාර් තැන දැඩි, වියළි වචන කියන සැටි පාවෙල්ට ඇසිණි.

"අවි නැති යුද හිරකරුවන්ට නපුරු විදිහට සැලකුවොත් වෙඩි තබා මරා දමනවා. අපි සුදු හමුදා නොවෙයි!"

රෙජිමේන්තුව ඉදිරිපිට කියවූ යුද්ධ විප්ලවවාදී කමිටුවේ නියමයේ අවසාන වචන කීපය, ගේට්ටුවෙන් පිට වී යන පාවෙල්ට මතක් විය.

"කම්කරු-ගොවිකරු රට සිය රතු හමුදාවට ආදරය කරයි. හමුදාව නිසා රට ආඩම්බර වෙයි. රතු හමුදා ධජයේ එකද කැළලක්වත් නෙතිබිය යුතු බව මවුබිම ඉල්ලා සිටී."

"එකද කැළලක්වත් නොතිබිය යුතුය." පාවෙල් තොල් මැතිරීය.

★ ★ ★

හතරවැනි අසරු ඩිවිෂනය ෂිටෝමිර් නගරය අල්ලා ගත් අවස්ථාවේ, ඔකුනිනොවෝ ගම්මානය අසල පෙදෙසකින් ගෝලිකොව් සහෝදරයාගේ හත්වැනි පාබළ හමුදාවේ 20 වැනි බ්‍රිගේඩ් සේනාව ද්නීපර් ගඟ තරණය කළේය.

විසිපස්වැනි පාබළ ඩිවිෂනයට අයත් කණ්ඩායම්වලට සහ බෂ්කීර් අසරු බ්‍රිගේඩ් හමුදාවට අයත් කණ්ඩායම්වලට ද්නීපර් ගඟ තරණය කොට ඉර්ෂ් දුම්රියපොළ අසල කීයෙව්-කොරොස්ටෙන් දුම්රිය මඟ කපා හැරීමට නියම කළේය. කීයෙව් නගරයේ සිට පසුබැසීමට පෝලන්ත හමුදාවලට අයත් එකම මාර්ගයද මේ නිසා කැපී යනු ඇත. මේ ගඟ තරණය කිරීමේදී ෂෙපෙතෝව්කා කොම්සොමොල් සංවිධානයේ සාමාජිකයකු වන මීෂා ලෙව්චුකොව් මිය ගියේය.

ගඟ හරහා යාමට සැදූ තාවකාලික පාලම ඔස්සේ දුවගෙන ගිය මීෂාගේ හිසට උඩින් හෙණ හඬ මෙන් වෙඩි බෝම්බයක් පුපුරා එහි කැබැලි ජලය සමඟ කැලැතී විසි විය. බෝම්බ කැබැල්ලක් මීෂාගේ හිසට වැදුණෙන් ඔහු ගඟට වැටිණි. ගඟ ඔහු ගිලගත්තේ, නැවත දිය පිට මතු නොවීය. කැඩී ගිය හිස් වැස්මක් දමා සිටි රන් පැහැ හිසකේ ඇති යකිමෙන්කෝ රතු සෙබළා මවිත වී කෑ ගැසීය.

"මොකද නුඹ මළාද? මීෂ්කා ගඟට වැටුණා. හරියට මාර කටට වැටුණා වගේ සෙබළා අතුරුදහන් වුණා"ඇඳිරි ගඟ දෙස බියෙන් බලා ඔහු නැවතීමට සැරසුණද, පිටුපසින් පැමිණි සෙබළු ඔහු තල්ලු කළහ.

"මෝඩයා නුඹ කට ඇරගෙන මොකද? ඉදිරියට පලයන්!"

සගයා ගැන හිතා බැලීමට වේලාවක් නැත. ගඟේ දකුණු ඉවුර අල්ලාගත් අයගෙන් කණ්ඩායම දැනටමත් ඈත් වී සිටී.

බූඨා දුම්රියපොළ අල්ලාගෙන, පෙරමුණක් සේ කීයෙව් නගරය දෙසට යමින්, කොරොස්ටෙන්වලට කඩා වැදීම පිණිස දැඩි සටන්වල යෙදුණු පෝලන්ත හමුදාවලට පහර දුන් පසු, දවස් හතරකට ඉනික්බිතිව සිරියෝෂාට මීෂාගේ මරණය ගැන දැනගන්නට ලැබිණි.

සෙර්ගේයි අසලින් යකිමෙන්කෝ වැතිර ගත්තේය. ඉමහත් වේගයකින් කරගෙන ගිය වෙඩි තැබීම නැවැත්වූ යකිමෙන්කෝ, තුවක්කුවේ කොකා යවට මෙන් රත්ව තිබුණෙන් එය අමාරුවෙන් ගලවා දමා මහ පොළොවට හිස තබා සිරියෝෂා දෙසට හැරුණේය.

"තුවක්කුව නිවාඩු ඉල්ලනවා. ගින්දර වගේ!" හෙණ හඬ මෙන් පිට වදින වෙඩි හඬ නිසා සිරියෝෂාට එය නැසිණි. වෙඩි හඬ තරමක් අඩු වූ පසු යකිමෙන්කෝ යම්තමින් මෙසේ පැවසීය:

"නුඹගේ සගයා ද්නීපර් ගඟේ ගිලුණා. ඔහු වතුරට

පැන්නා. මට හරියට හොයා බලන්ට බැරි වුණා." යකිමෙන්කෝ කතාව නවත්වා තුවක්කුවේ කොකා අත ගා බලා සාක්කුවෙන් පතොරොමක් ගෙන එය තුවක්කු මැගසින් පෙට්ටියට දැම්මේය.

★ ★ ★

බෙද්දීචෙව් නගරය අල්ලගැනීමට ගිය එකොළොස් වැනි ඩිවිෂනයට නගරය තුළ සිටි පෝලන්ත හමුදාවල දැඩි ප්‍රහාරයට මුණ පෑමට සිදු විය.

නගර විදි ඔස්සේ ලේ වැගිරෙන මහ සටන් පැන නැඟිණි. අසරු හමුදාවට බාධා කරමින් පාර හරහා මැෂින් තුවක්කු කපොලු සාදා තිබිණි. එහෙත්, නගරය අල්ලා ගැනිණි. ඉතිරි වූ පෝලන්ත හමුදාවෝ පැන ගියහ. දුම්රියපොළේ දී දුම්රිය මැදිරි අල්ලා ගැනිණි. එහෙත්, පෝලන්ත හමුදා ලැබූ විශාලතම පහර වූයේ පෝලන්ත යුද පෙරමුණේ වෙඩි උණ්ඩ ගබඩාවේ තිබූ කාලතුවක්කු වෙඩි උණ්ඩ දස ලක්ෂයක් පුපුරා යාමය. නගරයේ වීදුරු ජනේල ඉතා කුඩා කැබැලිවලට කැඩිණි. නිවාස හා ගොඩනැඟිලි කාඩ්බෝඩ් ගෙවල් මෙන් පිපිරීම් නිසා කම්පනය විය.

ෂිටෝමීර් නගරයට හා බෙර්දීචෙව් නගරයට පහර දීම පෝලන්ත හමුදාවල පසුපසට පහර දීම වැනි විය. ඔවුහු කාණ්ඩ දෙකකට බෙදී කියෙව් නගරය අතහැර පසු බැස යමින් වියරු වැටුණවුන් සේ අයෝමය වළල්ල බිඳ ගැලවී යාමේ මාර්ගය පාදා ගැනීමට සටන් කළහ.

ඒක පුද්ගල, පෞද්ගලිකත්වය පිළිබඳ හැඟීම් පාවෙල්ගෙන් තුරන් විය. මේ දවස්වලදී බිහිසුණු සටන්වලට ඔහු මුහුණ පෑවේය. පාවෙල් කොර්චාගින් ජනතාව අතර දිය වී ගියේය. හැම සෙබළෙකුටම මෙන්ම 'මම' යන වචනය අමතක විය. ඒ වෙනුවට ඉතිරි වූයේ 'අපි' යන වචනය පමණකි. අපේ රෙජිමේන්තුව, අපේ එස්කද්රෝනය, අපේ බ්‍රිගේඩිය, ආදී වශයෙනි.

කුණාටුවක වේගයෙන් සිද්ධීන් හට ගත්තේය. හැම දවසකදීම අලුත් සිදුවීම්ය.

පෝලන්ත හමුදාවේ පසු පස පිහිටි හැම දෙයක්ම විනාශ කරමින්, සමූල ඝාතනය කරමින් බුඩිඔනිගේ අසරු හමුදාව ඉමහත් වේගයෙන් නොනැවතී පහර පිට

පහර ගැසීය. ජයෙන් මත් වී සිටි අසරු ඩිවිෂන් සේනා පෝලන්ත හමුදාවල පසුපසෙහි හදවත වන නොවොග්රාද්-වොලින්ස්කිවලට පහර දීමට ඉදිරියට ගියහ.

වේගයෙන් වෙරළට වැදෙන රැලි පසු බැස යළි බියජනක ලෙස නැඟී සිටින්නාක් මෙන් ඉදිරියට ගියේය. 'අල්ලා ගනිමු!'යන හඬ නඟමිනි.

පෝලන්ත හමුදාවලට බේරීගත නොහැකි විය. කටු කම්බි බාධක, නගරයේ සිටි සේනාවල දැඩි පහර ගැසීම්, ආදියෙන් කිසිදු පිහිටක් නොවීය. ජූනි මස 27 දා උදැසන ස්ලුච් ගඟ තරණය කරමින් බුඩිඔනිගේ අසරු සෙබළු කොරේට්ස් නමැති සුළු නගරය ඔස්සේ පෝලන්ත හමුදා ලුහුබඳිමින්, නොවොග්රාද්- වොලින්ස්ක් නගරයට කඩා වැදුණාහ. මේ වේලාවේදීම යකීර්ගේ හතළිස් පස්වැනි ඩිවිෂනය නව මිරෝපොල් අසලදී ස්ලුච් ගඟ තරණය කළ අතර, කොතොව්ස්කිගේ අසරු බ්‍රිගේඩ් හමුදාව ලූබාර් සුළු නගරය දෙසට ගියහ.

පෙරමුණේ අණ දෙන මහ නිලධාරියාගේ නියමය පරිදි පළමුවැනි අසරු හමුදාවේ විදුලි පණිවුඩ ස්ථානය විසින් භාර ගන්නා ලදී. සියලු අසරු හමුදා රොව්නෝ නගරය අල්ලා ගැනීම සඳහා යෙදවිය යුතු බව එම නියමයෙන් කියැවිණි.

රතු ඩිවිෂන් හමුදාවල නොවැළැක්විය හැකි ප්‍රහාරයන් ඉදිරියේ කැඩී, බිඳී පරාජිත බවට පත් පෝලන්ත හමුදා ගැලවීම සොයන කාණ්ඩවලට කැඩිණි.

බ්‍රිගේඩ් හමුදාවේ නායකයා විසින් වරක් පාවෙල් යුධ රිය නවතා ඇති දුම්රියපොළට යවන ලදි. තමා බලාපොරොත්තු නොවූ කෙනෙකු මෙහිදී පාවෙල්ට හමු විය. පාවෙල්ගේ අශ්වයා වේල්ල දිගේ දුවයි. අළුපාටින් පාට කළ මුලින් තිබෙන දුම්රිය මැදිරිය ඉදිරියේදී පාවෙල් අසුගේ පටි ඇද නැවැත්වීය. මෙල්ල නොකළ හැකි බියජනක කළු පැහැති අවි වසා ඇති කුලුනු සහිත යුද්ධ රිය නවතා තිබිණි. ඇන්ජිම් තෙල් තවරා ගත් පුද්ගලයෝ කීප දෙනෙක් බරැති වානේ අවාරණයක් රෝද අසලදී ඔසවමින් සිටියහ.

"යුද්ධ රියේ ප්‍රධානියාව හමුවන්නේ කොහොමද?" වතුර බාල්දියක් ගෙන යමින් සිටි සම් කබායකින් සැරසී උන් රතු සෙබළාගෙන් පාවෙල් විමසීය.

"අන්න අතන" ඔහු ඇන්ජිම පෙන්වමින් අතක් එසවීය.

ඇන්ජිම අසල නැවතුණු පාවෙල් කොර්චාගින්, ප්‍රධානියා

කවුද? යි ඇසීය.

හිස සිට දෙපා දක්වා සමින් කළ ඇඳුම් ඇඳ සිටි පුද්ගලයා ඔහු දෙසට හැරුණේය. ඔහුගේ මුහුණේ වසූරිය කැළැල්ය.

"මම!"

පාවෙල් සාක්කුවෙන් පැකැට්ටුවක් එළියට ගත්තේය.

"මෙන්න බ්‍රිගේඩ් හමුදාවේ නායකයාගේ අණ කවරයේ අත්සන් කරන්න."

යුද රියේ නායකයා ලියුම් කවරය දණහිස මත තබා අත්සන් කළේය. ඇන්ජීමේ මැද රෝදය අසල තෙල් තවරාගත් කිසිවකුගේ රුවක් පෙනිණි. ඔහුගේ පුළුල් උරතල පමණක් පාවෙල් දුටුවේය. සමින් කළ ඔහුගේ කලිසම් සාක්කුවකින් පිස්තෝල මිටක් දොට්ට පැන තිබේ.

"මෙන්න අත්සන සහිත කවරය අර ගනින්!" සමින් කළ ඇඳුම් ඇඳ සිටි මිනිසා අත දිගු කරමින් කීවේය.

පාවෙල් තම අසුනේ පටි ගෙන ගමනට සැරසුණේය. දුම්රිය අසල සිටි මිනිසා නැඟිට සිට හැරුණේය. එකෙණෙහිම පාවෙල් කුණාටුවකට හසු වූ කලෙක මෙන් අසු පිටින් බිමට පැන්නේය.

"අර්ටියොම් අයියේ!"

ඇඟ පුරා ඇන්ජින් තෙල් තවරාගෙන සිටි දුම්රිය පදවන්නා තෙල් බඳුන පසෙක තබා තරුණ රතු සෙබළාව වලසකුගේ ග්‍රහණයකින් බදා අල්ලා ගත්තේය.

"පාව්කා! තක්කඩියා! ඇත්තටම ඒ නුඹ නොවැ!" අර්ටියොම් ඇසින් දකින දේ විශ්වාස නොකර පැවසීය.

එම ජවනිකාව දෙස විමතියෙන් යුතුව යුද රියේ ප්‍රධානියා බලන්නට විය. රතු හමුදාවේ කාලතුවක්කු සෙබළු හඬ නඟමින් සිනාසුණහ.

"පේනවා නේද අයියලා මල්ලිලා හමුවෙලා."

★ ★ ★

අගෝස්තු දොළොස්වෙනිදා ල්වොව් අසලදී ඇති වූ දරුණු සටනකදී පාවෙල්ගේ හිස් වැස්ම නැති විය. ඔහු අසු නැවත්වීය. එහෙත්, පෝලන්ත හමුදා රතු ස්කොඩ්රන් හමුදා සමඟ සටනට වන්හ. පඳුරු අතරින් දෙමිදොව් අසු පැන්නවීය. ගඟ දෙසට ඔහු වේගයෙන් යමින් කෑ ගැසීය.

"ඩිවිෂන් නායකයාව මරලා!"

පාවෙල් තිගැස්සිණි. ඔහුගේ වීරයා වන ලෙතුනොව් මිය ගොසිනි. ඔහු අසීමිත ලෙස නිර්භය සොහොයුරෙකි. පාවෙල් කෝපයෙන් වියරු විය.

වේදනා විඳ, ලේ සහිත කටකලියාව කටින් ගෙන සිටි ග්නෙදොක් නමැති තම අසුගේ ගෙල කඩු මිටෙන් කැසූ පාවෙල් උෆ පන්නමින් සටන් බිමට වැදුණේය.

"නීචයන්ව කාපියව්! උන්ව කපාපියව්! පෝලන්ත රදලයන්ට ගහපියව්. උන් ලෙතුනොව්ව මරා දැම්මා. "දැඩි කෝපයක් නිසා අන්ධ වූ නෙත් ඇති පාවෙල් මරන්නේ කාවදැයි නොදැන ඉදිරියේ සිටි කොළ කබාකාරයාගේ හිස දෙපළු කළේය. තම නායකයාගේ මරණය නිසා ඉමහත් ලෙස කෝපයට පත් අසරු භටයෝ පෝලන්ත ලීජනයේ සෙබළුන් කැපූහ.

පෝලන්ත සෙබළුන් පහර දෙනු වස් කාලතුවක්කුවලින් වෙඩි තැබූහ. කාලතුවක්කු වෙඩි උණ්ඩ පුපුරමින් මරණය ගෙනාවේය.

පාවෙල්ගේ නෙත් ඉදිරිපිට කොළ පැහැති ගිනි මතු විය. හෙණ පහරක් වැදුණු කලක මෙන් දෙකන් බිහිරි විය. ගිනි ගත් යකඩයක් ඔහුගේ හිසට වැදිණි. බියජනක ලෙසත්, තේරුම් නොගත හැකි ලෙසත් මහ පොළොව භ්‍රමණය විය. එය පැත්තකට හැරිණි.

පිදුරු ගසක් මෙන් පාවෙල් අසුගේ සෑදලයෙන් විසි වී ගියේය. ග්නෙදොක් නමැති සිය අසුගේ ඔළුවට උඩින් කරකැවී විසිවී ගිය පාවෙල් බිම වැටුණේය.

එක වර රෑ අඳුර ඇති විය.

XI

අඬු අටක් ඇති බූවල්ලාගේ ඇස් දොට්ට පැන ඇත. උගේ ඔළුව බළලෙකුගේ මෙනි. ඇස් ගෙඩි බොර රතු පැහැතිය. මැද කොටස කොළ පැහැතිය. උගේ පාද රාශියකි. ඒවා දරණ ගැසුණු නයි පැටවුන් මෙනි. අප්‍රිය ලෙස කොරපොතු නටවමින් උෆ හැකිළෙයි. බූවල්ලා යයි. උෆ තම නෙත් අසලට වී ඇති බව ඔහුට දැනෙයි. උගේ කුඩා පාද සිරුර හැමතැනම දුවයි. ඒවා ශීතලය, කහඹිලියා මෙන් කසනසුලුය. බූවල්ලා දෂ්ට කර කුඩැල්ලකු මෙන් හම විද මසට වැද ලේ

උරා බොයි. තම සිරුරේ ඇති ලේ බූවල්ලා උරා බොන බව ඔහුට දැනෙයි. බූවලු හිස මසට කාවැදී ඇති තැන ඉවසිය නොහැකි වේදනාවකි.

කොහේදෝ බොහෝ ඈත. මිනිස් කට හඬක් ඇසෙයි.

"ඔහුගේ නාඩි වැටීම කොපමණද?"

ගැනු කටහඬක් වඩාත් සෙමින් පිළිතුරු දෙයි.

"එකසිය තිස්අටයි. උණ 104.5 හැම තිස්සේම උණ විකාරයෙන් දොඩවනවා."

බූවල්ලා අතුරුදහන් විය. දෂ්ට කළ වේදනාව ඉතිරිව පවතී. කිසිවෙකු තම අත්ලට ඉහළින් ඇඟිලිවලින් අතගාන බවක් පාවෙල්ට දැනෙයි. ඔහු දෙනෙත් හැර බැලීමට වෑයම් කරයි. ඇසිපිය කොතරම් බරදැයි කිවහොත් ඒවා හැර ගැනීමට ඔහුට ශක්තියක් නැත. මෙතරම් රස්නය මොකද? අම්මා ගෙදර උදුන රත් කළා විය යුතුය. එහෙත්, යළිත් කොහේදෝ සිට මිනිස්සු කතා කරති.

"දැන් නාඩි වැටීම එකසිය විසි දෙකයි."

ඔහු ඇසිපිය එසවීමට මහන්සි ගනී. සිරුර තුළ ගිනි ගත් කලෙක මෙනි, හුස්ම ගැනීම අපහසුය.

පිපාසය, වතුර බීමට ඇති පිපාසය! දැන් ඔහු නැඟිට වතුර බොනු ඇත. එහෙත්, ඔහු නොනැඟිටින්නේ මන්ද? අත් පා සෙලවීමට මහන්සි ගත්තද, සිරුර පිට එකෙකුගේ මෙනි, එය ඔහුට අකීකරුය. එය ඔහුගේ සිරුර නොවේ. අම්මා දැන් වතුර ගෙනෙනු ඇත. ඔහු අම්මාට මෙසේ කියයි. "මට වතුර දෙන්න." ඔහු අසල කිසිවක් සෙලවෙයි. එය ආයෙමත් අර බූවල්ලා නොවේද? ඔන්න ඌ, ඔන්න උගේ රතු පාට ඇස්...

ඈත පහත් හඬින් කිසිවෙක් කතා කරති.

"ප්‍රෝස්ය වතුර ගෙනෙන්න!"

"ඒ නම කාගෙද?" මතක් කිරීමට පාවෙල් වෙර දරයි. පරිශ්‍රමය නිසා ඔහු යළිත් අඳුරට වැටිණි. අඳුරේ සිට නැවත මතකය එළියට එයි."වතුර දෙන්න!"

කඩ හඬ ඇසේ.

"ඔහුට සිහිය ලැබෙන හැඩයි."

මුදු කටහඬක් වඩාත් පැහදිලිව ළඟම ඇසෙයි.

"රෝගියා, නුඹට බොන්න වතුර ඕනද?"

"හැබෑටම මම ලෙඩ වෙලාද, ඒ කියන්නෙ මට නොවෙයි නේද? ඇත්තටම මට උණ සන්නිපාතේ හැදිලා. ඔන්න කාරණය" ඔහු තෙවැනි වරටත් ඇසි පිය එසවීමට වෙර

දරයි. අවසානයේදී ඔහු සමත් වෙයි. පළමුවරට ඇරිය ඇසි පිය අතරින් ඔහුට පෙනෙන්නේ මොනවාද? හිසට උඩින් රතු ගෝලයකි. එහෙත්, එය විශාල කළු ලපයකින් වැසිලා ය. කළු ලපය ඔහුට නැඹුරු වෙයි. දෙතොල් වීදුරුවේ තද ගැට්ටේ පහස ලබයි. ජීවමය දියර ගතියක් දැනෙයි. ඇතුළේ හටගත් ගින්න නිවී ගියේය.

සතුටකින් මිමුනුවේය.

"ඔන්න දැන් හොඳයි."

"රෝගියා නුඹට මාව පේනවාද?"

ඔහු ඉදිරියේ ඉන්න කිසියම් කළු ලපයක් එසේ අසයි. නිදි සයුරේ ගිලෙන ඔහු කෙසේ හෝ පිළිතුරු දීමට සමත් වෙයි.

"පෙන්නෙ නැහැ. නමුත් ඇහෙනවා."

"එයා ජීවත් වේවි කියලා සිතුවේ කවුද? පේනවා නේද ඔහු ජීවතුන් අතරට ආවා. පුදුම විදිහේ ශක්තිමත් ශරීරයක්. නීනා ව්ලදීම්රෝව්නා ඔබට ආඩම්බර වීමට පුළුවනි. ඔහුගේ එලොවට ගිය පණ ඔබ මෙලොවට ඇදලා ගත්තා. "

කාන්තාවගේ කට හඬ කැලඹිලාය.

"මම, බොහොම සතුටුයි!"

දහතුන් දවසක් තිස්සේ සිහි නැතිව සිටි පාවෙල් කෝර්චාගිනට යළි සිහිය ලැබිණි.

තරුණ සිරුර මිය යාමට අකැමැති විය. ඔහුට ශක්තිය කෙමෙන් ලැබිණි. ඔහු දෙවැනිවර උපත ලැබීය. හැම දෙයක්ම අලුත් නොපුරුදු ඒවා මෙනි, ඉසිලිය නොහැකි බරකින් යුතු වූ හිස ජිප්සම් වෙළුම්පටි සහිත පෙට්ටියක බහා තිබිණි. එය සෙලවීමට පවා ශක්තියක් ඔහුට නොතිබිණි. සිරුරට පහස දැනීමේ ශක්තිය ලැබී ඇත. දැතේ ඇඟිලි නැමීමට හා දිග හැරීමට පුළුවන.

★ ★ ★

යුද හමුදාවට අයත් චිකිත්සාගාර රෝහලේ කනිෂ්ඨ දොස්තරවරිය වූ නීතා ව්ලදීම්රෝව්නා, හරි හතරැස් කොටුවක් බඳු වූ තම කුඩා කාමරයෙහි, කුඩා මේසයක් අසල වාඩි වී නිල් පාට කවරයක් සහිත මහත කොපි පොතක් පෙරළන්නට වූවාය. එම පොතෙහි පැත්තකට නැඹුරු වූ කුඩා අත් අකුරුවලින් යුතු කෙටි සටහන් කීපයකි.

1920 අගෝස්තු 26 දා.

අද අපේ සුව සේවා දුම්රියේ, බරපතළ ලෙස තුවාල ලැබූ සෙබළුන් කණ්ඩායමක් ගෙනාවා. හිස බිඳී ගිය රතු සෙබළෙකුව මුල්ලේ ජනේලය අසල ඇඳක දැම්මා. ඔහුගේ වයස අවුරුදු දහ හතක් විතර ඇති. ඔහුගේ සාක්කුවල තිබුණු ලියවලි මිටියකුයි, දොස්තරගේ නිගමනයයි මට භාර දුන්නා. ඔහුගේ නම පාවෙල් අන්ද්‌රෙයෙවිච් කොර්චාගින්ය. ඔහු උක්‍රයීනයේ කොමියුනිස්ට් තරුණ සංගමයේ සාමාජිකයෙකි. කොමියුනිස්ට් තරුණ සංගමයේ සාමාජික අංක 967 දරන පොඩි වුණු කාඩ් පතද, ඉරුණු රතු හමුදා අත්පොතද, රෙජිමේන්තුවේ අණ සටහන් කර ඇති ලිපියක්ද එහි විය. ඔත්තු බැලීමේ කාර්යයන් ඉතා හොඳින් ඉටු කිරීම ගැන රතු සෙබළ කොර්චාගින්ට කෘතඥතාව පළ කොට ඇති බව එම ලිපියේ සටහන් වී තිබේ. පොත අයිතිකරු විසින් කරන ලද සටහනක්ද ඇත. එය මෙසේය.

"මා මළහොත් මගේ සහෝදරයාට ඒ බව දැනුම් දෙන ලෙස සගයන්ගෙන් ඉල්ලා සිටිමි. ලිපිනය: අර්ටියොම් කොර්චාගින්, මිකැනික් තැන, දුම්රිය ඩිපෝව, ෂෙපෙතෝව්කා නගරය."

වෙඩි උණ්ඩයක කොටසක් හිසට වැදුණු දා එනම්, අගෝස්තු 19 දා සිට, තුවාල ලැබූ ඔහු සිහිසන් නැතිව සිටියේය. අනටෝලි ස්තෙපානොවිච් හෙට ඔහු පිරික්සා බලනු ඇත.

අගෝස්තු 27 දා.

කොර්චාගින්ගේ තුවාලය අද පිරික්සා බැලීය. තුවාලය ගැඹුරුය. හිස් කබල පුපුරලාය. ඒ නිසා හිසෙහි දකුණු පැත්ත ක්‍රියා විරහිත වෙලාය. දකුණු ඇස තුළ ලේ වැගිරීමකි. ඇහැ ඉදිමිලාය. දාහය නැවැත්වීම පිණිස දකුණු ඇස ගලවා දැමිය යුතු බව අනටෝලි ස්තෙපානොවිච් කීවා. ඉදිමුම අඩුවෙතැයි බලාපොරොත්තු විය හැකි නිසා එය නොකිරීමට මම ඔහු කැමති කරවා ගතිමි. ඔහු එකඟ විය.

සෞන්දර්ය විද්‍යාත්මක හැඟීම නිසා මට එසේ කිරීමට සිත්විණි. තරුණයා සුවය ලබන්නේ නම්, අපි ඔහුගේ ඇහැක් ගලවා ඔහු කණෙකු කරන්නේ කුමටද?

තුවාලය ලැබූ රෝගියා සිහිසන් නැතිව දොඩවයි, දඟලයි, ඔහු ළඟට වී නිතර මුර කිරීමට සිදු වී ඇත. මගේ වෙලාවෙන්

බොහොමයක් ඔහු සඳහා මිඩංගු කරමි. ඔහුගේ තරුණ බව මගේ අනුකම්පාව දිනාගෙන ඇත. මට හැකි වූවොත් මම ඔහු මරණයෙන් ගලවා ගනිමි.

මගේ වැඩ අවසාන වීමෙන් පසු මම ඊයේ පැය කීපයක් වාට්ටුවේ ගත කළෙමි. බරපතළම රෝගියා ඔහුය. ඔහු සිහිසන් නැතිව දොඩවන විට මම අසා සිටිමි. ඔහු කතාවක් කියවන්නාක් මෙන් දොඩවයි. ඔහුගේ ජීවිතයේ බොහෝ දේ මම දැන ගතිමි. සමහර විට ඔහු තිත්ත වචනවලින් බැණ වදී. ඒ බැණ වැදීම් භායානකය. ඔහු එතරම් නරක වචනවලින් බැණ වදින විට, ඒවා අසන මම දුක්වෙමි. ඔහු සුවය නොලබන බව අනතෝලි ස්තෙපානොවිච් කියයි. මහල්ලා තරහෙන් මුමුනයි. "මට තේරෙන්නෙ නැහැ ළමයින් වැනි ළාබාල අය යුද හමුදාවට ගන්නෙ කොහොමද? කියලා. එය නින්දා සහගතයි."

අගෝස්තු 30 දා.

කොර්චාගින්ට තවම සිහිය ලැබී නැත. පණ අදින රෝගීන්ව දමන වාට්ටුවට ඔහු දමා ඇත. ඔහුගෙන් ඇත් නොවී, ඔහු අසල ප්‍රෝස්යා වාඩි වී සිටී. ප්‍රෝස්යා ඔහු හඳුනන බවකි. මේ දෙදෙනා ඉස්සර එකට වැඩ කොට ඇත. ඇය කොතරම් උණුසුම් සැලකිල්ලකින්ද ඒ රෝගියාට සාත්තු කරන්නේ! ඔහුගේ තත්ත්වය බලාපොරොත්තු රහිත බව දැන් මට හැඟෙනවා.

සැප්තැම්බර් 2 දා.

වේලාව රාත්‍රී එකොළහයි. අද මට සැලකිය යුතු දවසකි. මගේ රෝගියා කොර්චාගින්ට හොඳ සිහිය ලැබුණා. ඔහු බාධාවෙන් මඟ හැරියා. පසුගිය දවස් දෙකේ මා ගෙදර ගියේ නැහැ.

තවත් එක් රෝගියෙක් බේරා ගත් නිසා මගේ සතුට කියා නිම කරන්නට බැහැ. අපේ වාට්ටුවේ මැරෙන අයගෙන් එක් කෙනෙකු අඩුවේවි. මගේ අමාරු රස්සාවේ ඉතාම ප්‍රීතිමත් දෙය ලෙඩුන් සුවය ලැබීමයි. ඔවුන් මට බැඳී සිටින්නේ ළමයින් වගේය.

ඔවුන්ගේ මිත්‍රත්වය අවංකයි, චාම්, වෙන් වන විට සමහර විට මට ඇඬෙනවා. එය තරමක් හාස්‍යජනකයි. නමුත්, ඇත්ත.

සැප්තැම්බර් 10 දා.

අද මම කොර්චාගින්ගේ පවුලේ අයට යවන පළමුවැනි ලියුම තැපැල් කළා. ඔහු සුළු තුවාල ලැබූ බවත්, ඉක්මනින් සුව වී ගෙදර එන බවත් ඔහු ලියුවා. එහෙත්, ඔහුගේ සිරුරෙන් බොහෝ ලේ ගලා ගියා. ඔහු පුලුන් මෙන් සුදුමැලිය. බොහෝම දුබලය.

සැප්තැම්බර් 14 දා.

කොර්චාගින් පළමුවැනි වරට මඳ සිනා පෑවා. ඔහුගේ මඳ සිනාව අපූරුය. ඔහු වයසට වඩා දැඩියි. පුදුම වේගයකින් ඔහු සුවය ලැබුවා. ඔහු ප්‍රෝස්යාගේ මිතුරෙකි. ඇය නිතර ඔහුගේ ඇඳ ළඟ ඉන්නවා මා දැක ඇත. ඈ මා ගැන ඔහුට කී බව පෙනෙනවා. වුවමනාවට වඩා මා ගැන හොඳ කියා ඇත. දැන් රෝගියා මා පිළිගන්නේ මඳ සිනාවකිනි. ඊයේ ඔහු මෙහෙම ඇහුවා.

"දොස්තර සහෝදරිය, ඔබේ අතේ කළු පැල්ලම් ඇති වූණේ කොහොමද?"

ඔහු සිහිසන් නැතිව දොඩවන දවස්වලදී මට වේදනා ඇතිවන තරමට මගේ අත් මිරිකූ බව මම ඔහුට කීවේ නැහැ.

සැප්තැම්බර් 17 දා.

කොර්චාගින්ගේ නළලේ කැළල හොඳයි. තුවාල ලැබූ ඔහු කොතරම් දැඩි ලෙස වේදනාව ඉවසා ගෙන ඉන්නවද? වෙළුම් පටිවලින් වෙළන වෙලාවට එය වෙදුන් වන අපේ විමතියට කරුණක්.

මෙවැනි තුවාල ලැබූ අය බොහෝ විට සුසුම්ලනවා. දඟ කරනවා. ගැඹුරු තුවාලයට අයඩින් දමන විට ඔහු වීණාවෙක තතක් වගේ ඇදෙනවා. නිතර පාහේ ඔහුගේ සිහිය නැති වී යනවා. එහෙත්, මුළු කාලය තුළදීම එකම වරක්වත් සුසුම් ලෑවේ නැහැ.

කොර්චාගින් සුසුම්ලනවා නම්, කොර්චාගින් සිහි නැතිව ගිය බව හැම දෙනාම දන්නවා. මේ දැඩිගතියක් ඔහුට කොහින්ද? මා දන්නේ නැහැ.

සැප්තැම්බර් 21 දා.

රෝහලේ ලොකු සඳලුතලයට කොර්චාගින්ව රෝද සහිත පුටුවක තබාගෙන ගියා. පළමුවැනි වරට ඔහු කොතරම්

පුදුම ලෙස වත්ත දිහා බැලුවද, කොතරම් ගිජු ලෙස වාතය ආශ්වාස කළාද! වෙළුම් පටිවලින් බැඳ ඇති ඔහුගේ හිසෙහි පෙනෙන්නට ඇත්තේ එක ඇහැකි. ඒ ඇහැ දිලිසෙනවා. ජංගමශීලියි. ඔහු බැලුවේ ලෝකය පළමුවරට දැක්කා වගෙයි.

සැප්තැම්බර් 26 දා.

අද මා පිළිගන්නා කාමරයට කැඳවූවා. එහිදී තරුණියන් දෙදෙනෙකු මට මුණ ගැහුණා. එක තරුණියක් බොහොම ලස්සනයි. ඒගොල්ල කෝර්චාගින් හමුවෙන්නට අවසර ඉල්ලා හිටියා. තෝන්යා තුමානොවා සහ තත්යානා බුරනොව්ස්කායා ඒ ගොල්ලන්ගේ නම්. තෝන්යා ගැන මා අහලා තියෙනවා. කෝර්චාගින් සිහි නැතිව දොඩවන විට, සමහර විට ඇගේ නම කියනවා. රෝගියා බැලීමට මම ඔවුන්ට අවසර දුන්නා.

ඔක්තෝබර් 8 දා.

කෝර්චාගින් පළමුවැනි වර තනිවම මල් වත්තේ ඇවිදින්නට ගියේය. ඔහුව රෝහලින් පිට කරන්නේ කවදාදැයි ඔහු මගෙන් කීපවරක් ඇසුවා. ඉක්මනින් එසේ කරන බව මම කිව්වා. ලෙඩුන් බැලීමට අවසර ඇති දවස්වලදී තරුණියන් දෙදෙනාම ඔහු බැලීමට එනවා. ඔහු සුසුම් නොලෑවේත්, පොදුවේ සුසුම් නොලන්නේත් මන්දැයි මා දන්නවා. මගේ පැනයට ඔහු පිළිතුරු දුන්නේ මෙහෙමයි.

"ඔවොද්" නමැති නව කතාව කියවන්න එවිට දූනගන්නට පිළිවනි.

ඔක්තෝබර් 14 දා.

කෝර්චාගින් සුවය ලැබ රෝහලින් පිට විය. අපි උණුසුම් ලෙස සමු ගත්තෙමු. හිසෙහි වෙළුම් පටිය ගලවලාය. නළලේ පමණක් වෙළුම් පටි ඇත. එක ඇසක් අන්ධය. එහෙත්, පිටතින් ඒ බව නොපෙනේ. ඒ හොඳ සගයාගෙන් සමුගැනීම නිසා මා තුළ කනගාටුවක් උපනි.

හැමදාම ඔහොමයි. සුවය ලැබ පිටවී යනවා. සමහර විට නැවත කිසිම දවසක හමු නොවන්ට. සමුගෙන පිටවී යන විට ඔහු මෙහෙම කීවා:

"වඩාත් හොඳයි වම් ඇහැ පොට්ට වුණා නම්, දැන් මම වෙඩි තබන්නේ කොහොමද?"

ඔහු තවමත් යුද පෙරමුණ ගැන හිතයි.

★ ★ ★

රෝහලින් පිට වූ පසු පාවෙල්, තෝන්යා නැවතී සිටි බුරානොව්ස්කිලාගේ ගෙදර නවාතැන් ගත්තේය.

තෝන්යාව පොදු දේශපාලන වැඩවලට ඇද ගැනීමට ඔහු තැත් කළේය. කොමියුනිස්ට් තරුණ සංවිධානයේ පොදු නාගරික සභා රැස්වීමට ඔහු ඇයට ආරාධනා කළේය. තෝන්යා කැමැති වූවාය. එහෙත්, ඇය ඇඳුම් ඇඳගෙන කාමරයෙන් පිට වූ විට, පාවෙල් තොල් විකා ගත්තේය. ඈ ඉතා සිත්කලු ලෙස වුවමනාවෙන්ම මෝස්තර අනුව ඇන්දා ය. ඔහු ඇය රැස්වීමට කැඳවීමට අකැමැති විය.

දෙදෙනා අතර පළමුවැනි ගැටීම ඇති වූයේ එදාය. ඔය විදිහට ඇඳුම් ඇන්දේ මන්දයි ඔහු ඇසූ විට, ඈ අමනාප වූවාය.

"මම කිසිම දවසක සාමාන්‍ය සිරිත් අනුගමනය කරන්නේ නැහැ.නුඹට මා සමඟ යාම අපහසු නම් මම නවතින්නම්."

පරණ සෙබළ කබා හා ස්වීටර් ඇඳගත් තරුණ තරුණියන් අතර, නවීන පන්නයට හැඳ පැලඳ ගත් තෝන්යා, එදා සමාජ ශාලාවේදී දැකීම පාවෙල්ගේ සිත් රිදවීය, තෝන්යා පිටත්තර එකියක සේ තරුණයෝ පිළිගත්හ. ඇයට එය දැනුණෙන් ඈ ඔවුන් දෙස අපවාදාත්මක ලෙසත්, අභියෝගකාරී ලෙසත් බැලූවාය.

ගඟේ බඩු බාන අංශයේ කොම්සොමොල් සංවිධානයේ ලේකම්වර පළල් උරහිස් ඇති තරුණයකු වූද, බඩු පටවන කම්කරුවකු වූද පන්කරාතොව්, පාවෙල්ට පසෙකට අඬ ගැසීය. ඔහු රළු කම්සයක් ඇඳ සිටියේය. නොමිතුරු ලීලාවෙන් ඔහු දෙස බැලූ පන්ක්රාතොව්, තෝන්යා ඇහැකින් පෙන්වමින් මෙසේ කීය.

"අර මොස්තරකාරිව මෙහාට ගෙනාවේ නුඹද?"

"ඔව් මමයි." පාවෙල් ඔහුට රළු ලෙස පිළිතුරු දුන්නේය.

"ආ-ඔව්..." පන්ක්රාතොව් ඇද පැද කියා. "ඇගේ පෙනුම අනුව නම් අපට ගැලපෙන්නේ නැහැ. ධනපති නෝනා කෙනෙකු වගෙයි. මෙතනට එන්ට ඇයට අවසර දුන්නෙ කවුද?"

පාවෙල්ගේ දෙකන්වල සෝෂාවක් ඇති විය.

"ඒ මගේ සහෝදරියක්. මමයි ඇයව මෙහාට ගෙනාවේ.

නුඹට තේරුණාද? ඈ අපට හතුරු කෙනෙක් නොවෙයි. අලුත් මෝස්තර අනුව අඳින්ට නම් ඈ ආසා කරනවා. ඒක ඇත්ත. ඇඳුම් අනුව ලේබල් ගහන්නට ඕන හැමදාම නෙවෙයි. මෙතැනට කාව ගේන්න ඕනද කියන එක ගැන මටත් තේරුමක් තියෙනවා. සහෝදරයා ඇනුම්පද කීමෙන් පලක් නැහැ."

පාවෙල් තවත් කිසියම් රළු දෙයක් කීමට අදහස් කළද, ඔහු එම අදහස මැඩ ගත්තේ එතැනට පැමිණ සිටියවුන්ගේ පොදු අදහස පන්කරාතොව් පැවසූ බැවිනි. ඔහු තෝන්යා කෙරෙහි කෝප විය.

"මම ඈට කීවා! ඔය බොරු මෝස්තර ඕන මොන යකාට ද?" කියලා.

තෝන්යා සහ පාවෙල් අතර පැවැති එම මිත්‍රත්වය බිඳී යාමේ මුල පටන් ගත්තේ එදා සවස සාදයේදීය. එතරම් ශක්තිමත් ලෙස ගොඩ නඟා තිබූ මිත්‍රත්වය බිඳී යන සැටි කනගාටුවෙන් හා මවිතයෙන් යුතුව පාවෙල් බලා සිටියේය.

තවත් දින කීපයක් ගත විය. හැම හමුවකදීමත්, හැම සාකච්ඡාවකදීමත් ඔවුන්ගේ මිත්‍ර සබඳකම් පිළිබඳව වඩාත් කලකිරවීම් හා දැඩි නොබැඳුණු බවක් ඇති විය. තෝන්යාගේ පහත් පෙළේ පුද්ගලාර්ථවාදය විඳ දරා ගැනීමට පාවෙල්ට නොහැකි විය.

වෙන්වී යාමේ අවශ්‍යතාව දෙදෙනාටම පැහැදිලි විය.

මිය ගිය රත් පැහැති කොළවලින් පිරී ගිය ධනවතුන්ගේ මල් වත්තට අද ඔවුන් පැමිණියේ අවසාන වචනවලින් එකිනෙකා අමතා ගැනීමටය. පල්ලමට ඉහළින් වූ ගරාදි වැට අසල ඔවුහු සිට ගත්හ. පහළ ද්නීපරයේ අළු පැහැති ජලය ගලා බැස්සේය. ජල ප්‍රවාහයට එදිරිව, යෝධමය පාලමට එහා දුම් බෝට්ටුවක් යාත්‍රා කළේය. එහි පෙති රෝද ගඟේ ජලයට හැප්පී හඬ නැංගේ විඩාපත් වූ කලෙක මෙනි. දුම්බෝට්ටුව ලොකු පාරු දෙකක් ඇදගෙන ගියේය. බැසයන හිරු රැස් ත්රුහානොව් දූපත මත රන් පැහැති ආලෝකයක් ඇති කළේය. දූපතේ කුඩා ගෙවල්වල වීදුරු හිරු රැස් නිසා දීප්තිමත් ලෙස බැබැළුණි.

රන් පැහැති හිරු රැස් දෙස බැලූ තෝන්යා ඉමහත් දොම්නසකින් කතා කළාය.

"දැන් බැස යන හිරු වගේ අපේ මිත්‍රත්වය ඉවර වේවිද?"

ඔහු ඇය දෙස බලාගත්වනම සිටියේය. බැම සඟළ

හකුළුවාගත් ඔහු පහත් හඬින් මෙසේ පැවසීය:

"තෝන්යා අපි මේ ගැන සාකච්ඡා කළා. සත්තකින්ම නුඹ දන්නවා මම නුඹට ආලය කළ බව. එම ආලය යළි පණ ලබන්නට පුළුවන්. නමුත්, ඒ සඳහා නුඹ අප සමඟ සිටිය යුතුයි. මම ඉස්සර හිටිය පව්ලූෂා නොවෙයි. දැන් ඉස්සෙල්ලා මම නුඹට අයිති වී පසුව පක්ෂයට අයිති විය යුතු යැයි නුඹ හිතනවා නම්, මම නුඹට නරක ස්වාමිපුරුෂයකු වේවි. ප්‍රධාන කොට මම පක්ෂයට අයිති විය යුතුයි. පසුව නුඹටයි. කිට්ටු අයටයි."

තෝන්යා කාන්සියෙන් යුතුව ගඟේ නිල් පැහැති ජලය දෙස බැලීය. ඇගේ දෙනෙත් කඳුළින් පිරිණි.

ඇගේ සුපුරුදු රුව දෙසද, දුඹුරු පැහැති හිසකේ දෙසද පාවෙල් බැලීය. එදා මෙතරම් ආදරවන්ත හා හදවතට ළං වූ තරුණිය නිසා ඔහුගේ සිතෙහි අනුකම්පාවක් හට ගති.

ඔහු ඇගේ උරහිසක් මත ප්‍රවේසමින් අතක් තැබීය.

"නුඹව බැඳ තබන හැම දෙයක්ම විසි කරදාපන්. අප සමඟ වරෙන්. එක්වෙලා ධනපති පන්තිය නැති කරමු. අප සමඟ හොඳ තරුණියෝ බොහෝමයක් ඉන්නවා. මේ රුදුරු සටනේ හැම අමාරුවකටම ඔවුන් අප සමඟ එක්වෙලා මුහුණ දෙනවා. නැති බැරිකම් විඳ දරා ගන්නවා. ඒ තරුණියෝ නුඹ තරම් ඉගෙන ගත්තු අය නොවෙයි. ඇයි නුඹට බැරි, අප සමඟ එක් වීමට, නුඹට බැරි මන්ද? චුෂානින් නුඹට බලහත්කාරකම් කරන්ට හැදුවාය කියලා නුඹ කීවා. චුෂානින් නියම සටන්කාමියෙකු නොවේ. ඌ හෝදා පාළුවෙක්. නුඹ දිහා සතුරු ලීලාවෙන් බැලුව කියල නුඹ කීවා. හරියට ධනපති බාල් නැටුමකට වගේ ඇඳගෙන ගියේ මොකටද? නුඹේ ආඩම්බරය පලුදු වුණා: කිලිටි සෙබළ කබා අස්සේ රිංගන්නට මම ලැස්ති නැහැ. කම්කරුවකුට ආලය කරන්නට තරම් නුඹට දහිරියක් ඇති වුණා. නමුත්, ඔහුගේ අදහස්වලටත් නුඹට ආලය කරන්නට බැහැ. නුඹෙන් වෙන් වී යාම මට දුකක්. නුඹ ගැන සුභද හැඟීම් ඇති කර ගැනීමට මා කැමතියි."

ඔහු නිහඬ විය.

ගුබෙර්නියාවේ චෙකා පරීක්ෂක කමිටුවේ සභාපති ෂුක්රායිගේ අත්සනින් යුත් ප්‍රකාශකයක් පාවෙල් කෝර්චාගින් පසු දින මහමඟදී දිටීය. ඔහුගේ හදවත ගැස්සිණි. ෂුක්රායි හමුවීමට ඔහුට ඉඩ නොදෙන හෙයින්, ඔහු බලය යෙදවීය. කොතරම් ලොකු 'කලබලයක්' ඇති කළේද යත්, මුරකරුවෝ

ඔහු සිරභාරයට ගැනීමට පවා සූදානම් වුහ. කෙසේ හෝ ඔහු ෂුක්රායි හමු විය.

පාවෙල් කොර්චාගින් හා ප්‍රයෝදර් ෂුක්රායි අතර හමුව සුහද විය. ප්‍රයෝදර්ගේ එක් අතක් ෂෙල් වෙඩිල්ලක් නිසා කැඩී තිබිණි. අනාගත වැඩ ගැන ඔවුන්තර කතාබහ ඇති විය.

"නුඹට යුද පෙරමුණට යාමට ශක්තිය ඇති වන තුරු අපි එකතු වෙලා මෙහේ ඉන්න ප්‍රති විප්ලවවාදීන් අල්ලමු හෙටම වැඩට වරෙන්" ෂුක්රායි කීවේය.

★ ★ ★

ප්‍රතිවිප්ලවවාදී සුදු පෝලන්ත හමුදාවලට විරුද්ධව සටන අවසන් විය. චෝසෝ නගරයේ සීමාව දක්වා ගිය රතු හමුදාවලට ද්‍රව්‍යමය හා ශරීරික ශක්තිය සිඳී ගියෙන්, සිය ප්‍රධාන ස්ථානවලින් වෙන් වූයෙන්, එයට අවසාන බළකොටුව අල්ලා ගැනීමට බැරි විය. ඒ නිසා රතු හමුදාව පසු බැස්සේය. රතු හමුදාව චෝසෝ නගරයෙන් පසු බැස යාම, නිසා පෝලන්තයන් කියන පරිදි "විල්ස්හි හාස්කම්'සිදුවිය. ප්‍රතිවිප්ලවවාදී රදල පෝලන්තය විනාශ නොවීය. පෝලන්ත සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුවක් පිළිබඳ සිහිනය සැබෑවක් බවට පත් කිරීම තාවකාලිකව නැවතිණි.

ඇති වූ ලේ වැගිරීම් නිසා රට හුස්ම ගැනීමට ඉඩකඩක් ඉල්ලා සිටියේය.

පාවෙල්ට තම නැදෑ හිත මිතුරන් හමුවීමට නොහැකි වූයේ නැවත ප්‍රතිවිප්ලවවාදී පෝලන්ත හමුදා විසින් අල්ලා ගනු ලැබූ ෂෙපොතෝව්කා නගරය යුද පෙරමුණේ තාවකාලික දේශසීමාව බවට පත් වූ බැවිනි. සාම සාකච්ඡා ඇතිවිය. 'චෙකා' විශේෂ කමිටු කාර්යාලයේ දවල් රෑ නොබලා වැඩ කළ පාවෙල් විවිධ කාර්යයන් සපුරාලීය. ඔහු ප්‍රයෝදර්ගේ කාමරයේ පදිංචි වී සිටියේය.

ෂෙපතෝව්කා නගරය පෝලන්ත හමුදාවන්ට අත් වූ බැව් දැන ගත් පාවෙල් දුක් විය.

"සාම කතාබහ ඔය සීමාව පිළිගත්තොත්, ප්‍රයෝදර් අපේ අම්මා ඉබේටම පිටරට කෙනෙකු වේවි නේද?"

එහෙත්, ප්‍රයෝදර් ඔහු අස්වසාලීය.

මා හිතන්නේ දේශසීමාව ගොරීන් ගඟ හරහා වෙන්නට ඕන. එහෙම වුණොත් ෂෙපොතේව්කාව අපේ රටට අයිති

වේවි. ඉක්මනට දැනගන්නට ලැබේවි."

පෝලන්ත පෙරමුණේ සිට දකුණු දිග දක්වා ඩිවිෂන් හමුදාවෝ ගියහ. සටන් නැවැත්වීම ප්‍රයෝජනයට ගත් ව්‍රාන්ගල් ක්‍රිමියාවේ ඉදිරියට ආවේය. සෝවියට් ජනරජය මුළු ශක්තියම පෝලන්ත පෙරමුණට විරුද්ධව යෙදූ අවස්ථාවේදී ද්නීපර් ගඟ ඔස්සේ ව්‍රාන්ගල් දකුණේ සිට උතුරට විත්, යෙක්කැතරීනෝස්ලාව්ල් ගුබේර්නියාවට පිවිසීය.

ප්‍රතිවිප්ලවවාදීන්ගේ අවසාන මර්මස්ථානය විනාශ කරලනු වස් සෝවියට් ජනරජය සිය හමුදා ක්‍රිමියාව දෙසට මෙහෙයැවූයේ පෝලන්තය සමඟ කළ යුද්ධය අවසන් කිරීම ප්‍රයෝජනයට ගනිමිනි.

කීයෙව් හරහා දකුණුදිග බලා මිනිසුන්, ගැල්, මුළුතැන් ගෙවල්, අවි ආදිය රැගත් දුම්රිය පිටත් විය. ප්‍රවාහන විශේෂ කමිටුවේ වැඩ ඉතා වේගයෙන් කැරිණි. දකුණුදිග බලා ගිය දුම්රිය විශාල සංඛ්‍යාවක් නිසා 'ප්‍රවාහන බාධා' ඇති විය. එවිට දුම්රිය ස්ථාන පිරී ඉතිරී ගිය අතර, ප්‍රවාහන වැඩ පිළිවෙළ ඇන හිටිණි. මෙසේ වූයේ අමතර දුම්රිය එකක්වත් නොතිබුණු බැවිනි, විදුලි පණිවුඩ භාරගන්නා යන්ත්‍ර අවසාන නිවේදන දැක්වෙන පණිවුඩ නිකුත් කළේය. කිසියම් ඩිවිෂන් හමුදාවක් සඳහා මඟ නිදහස් කරන ලෙස එම පණිවුඩවලින් කියැවිණි. විදුලි සංඥා පණිවුඩ දෙන ටෙප් පටි දිගටම පිට කරන්නට විය. "පෝලිම්වල නොතබා වහාම ඉඩ දිය යුතු බව... යුද්ධ නියමයක් අනුව බව... වහාම දුම්රිය මඟ නිදහස් කොට ඉඩදෙනු..." ආදී අණ දීම් ටෙප් පටිවල සටහන් විය. එම නියමය ක්‍රියාවේ නොයෙදවූවොත්, විප්ලවාවදී යුද්ධාධිකරණයට ඉදිරිපත් කරන බව දන්වා තිබිණි.

'ප්‍රවාහන බාධා' ඇති කිරීම් ගැන වගකිව යුත්තේ ප්‍රවාහන 'චෙකා' විශේෂ කමිටුවයි.

නොයෙක් හමුදාංශවල ප්‍රධානියෝ පිස්තෝල වනමින් විත්, ප්‍රධාන අණ දෙන්නා විසින් එවන ලද අසවල් අංකය දරන, අසවල් විදුලි පණිවුඩය අනුව ඔවුන්ගේ දුම්රියට යාමට ඉඩ දෙන ලෙස බල කළහ.

එය නොකළ හැක්කක් බව කී විට, ඔවුහු එය ඇසීමට පවා අකැමැති වූහ. "පණ ගියත්, ඉදිරියට යාමට ඉඩ දීපන්!" අනතුරුව නොසරුප් බසින් බියජනක ලෙස බැණ වදින්නට වූහ. ඉතාමත්ම සංකීර්ණ හා හදිසි අවස්ථාවලදී පමණක් ෂුක්රායි කැඳවීය. එවිට එකිනෙකාට බැණ වදිමින් වෙඩි තබා

ගැනීමට සූදානම් වූ අය පවා සන්සුන් වූහ.

ෂුක්රායිගේ අයෝමය රැව, සිසිල් සන්සුන් බව, විරුද්ධත්වයට ඉඩක් නොතබන දැඩි කටහඬ විසින් කොපුවලින් ඉවත ඇදගන්නා ලද පිස්තෝල නැවත ඒවා තුළට ඔබා ගැනීමට සැලැස්වීණි.

කාමරයේ සිට වේදිකාවට පාවෙල් පැන්නේ හිසෙහි කැක්කුමකුත් සමඟය. විශේෂ කමිටුවේ වැඩ විසින් ඔහුගේ ස්නායු දුර්වල කරන ලදි.

දවසක් දා වෙඩි බෙහෙත් පෙට්ටි ගොඩ ගැසූ දුම්රිය වේදිකාවකදී පාවෙල් කොර්චාගින්ට සිරියෝෂා බ්රුෂ්ෂාක් හමු විය. වේදිකාවේ සිට බ්රුෂ්ෂාක් පාවෙල් වෙත කඩා පැන්නේය. ඔහු පොඩි නොවී බේරුණේ යම්තම්නි. සිරියෝෂා ඔහු දැඩි කොට බදා අල්ලා ගත්තේය.

"පාච්කා! යක් පැටියා. මම නුඹව හඳුනාගත්තා."

ඇසිය යුත්තේ කුමක්ද, කිය යුත්තේ කුමක්ද යන්න දෙදෙනා නොදන සිටියහ. මේ කාලය තුළදී ඔවුන් ලත් අත්දැකීම් බොහෝම විය. පැන අසා පිළිතුරු ලැබෙන්නටත් පෙර තමාම පිළිතුරු දුන්නේය. දුම්රියේ නළා අඬන සැටි පවා ඔවුනට නැසිණි. දුම්රිය, දුම්රියපොළෙන් පිටවීමට පටන් ගත් විට පමණක් ග්‍රහණය මුදා හැරියහ.

"කුමක් කළ යුතුද? හමුවීම ඇත හිටිණි. දුම්රිය වේගය වැඩි කළේය. සිය මිතුරාට කිසිවක් කියා කෑ ගැසූ සිරියෝෂා දුම්රියෙන් ඈත් නොවීම පිණිස දුව ගොස් විවෘතව තිබුණු දොරක එල්ලුණේය. ඔහු අල්ලාගත් අත් කිහිපයක් විසින් දුම්රිය මැදිරිය තුළට ඇදගන්නා ලදි. සිටගෙන ඔහු දෙස බලා සිටි පාවෙල්ට, වාල්යා මරණයට මූණ පෑ සැටි කීමට පවා අමතක වූ බව වැටහිණි. සිරියෝෂා තමා උපන් නගරයට නොගියේය. මිතුරා මුණ ගැසීම නිසා ප්‍රීතියෙන් කුල්මත් වූ පාවෙල් ඒ තොරතුරු කීමට අමතත කළේය.

"සුන්සුන් ලෙස ගියාවේ." නොදන්න එක වඩාත් හොඳයි." පාවෙල් සිතීය. සිරියෝෂා දකින්නේ අවසාන වරට බව පාවෙල් නොදන සිටියේය. දුම්රිය මැදිරියේ වහල උඩ සිටි සිරියෝෂා ශරත් සමයේ සුළංවලට පපුව දෙමින් ගමන් කළ අතර, තමා මරණය කරා යන බව එදා නොදන සිටියේය.

"සිරියෝෂා වාඩිවෙයන්" අව්වට පිලිස්සී ගිය සෙබළ කබායක් හැඳ සිටි, දොරොෂෙන්කෝ ඔහුට පැවසීය."

"කමක් නැහැ. සුළඟ මගේ යාළුවෙක්. සුළං හැමුවාවෙ"

සිරියෝෂා සිනාසෙමින් පැවසීය.

සතියකට පසු ශරත් සමයේ උක්රයීනයේ ස්ටෙප්ස් බිමේ ඇති වූ පළමුවැනි සටනේදී සිරියෝෂා මිය ගියේය.

ඇත සිට අන්ධයකු සේ වෙඩි උණ්ඩයක් පියෑඹීය.

පහර වැදුණු හැටියේම ඔහු තිගැස්සිණි. පපුව කඩා බිඳ දැමූ ඉමහත් වේදනාවක් ඇති විය. ඔහු වැනුණද, කෑ ගැසුවේ නැත. පැනීමට සූදානම් වන්නාක් මෙන්, සුළං බදා අල්ලා ගැනීමට තැත් කරමින් පපුව අල්ලාගත් ඔහු පිලිස්සුණු සිරුර බිම ගැසීය. ඔහුගේ නිල්වන් දෙනෙත් ස්ථාවර ලෙස සීමාරහිත ස්ටෙප්ස් බිමට එල්ල විය.

★ ★ ★

විශේෂ කමිටුවේ වැඩවල ස්නායු කිපෙන ස්වභාවය පාවෙල්ගේ දුර්වල සෞඛ්‍යය කෙරෙහි අහිතකර ලෙස බල පෑවේය. ඔහුට හිසේ කැක්කුම වැඩි වැඩියෙන් හැදෙන්නට විය. දෙදවසක් තිස්සේ රෑ නිදි නැතිව වැඩ කළ නිසා පාවෙල් සිහි නැතිව වැටුණේය.

ඉනික්බිති ඔහු ෂුක්රායිට වාර්තා කළේය.

"ප්යොදර්, නුඹ කොහොමද හිතන්නෙ, මම වෙනින් රැකියාවකට යන එක හරිද? ප්‍රධාන මිකැනික් වැඩපොළට යාමට මගේ ලොකු ආසාවක් තියෙනවා. මගේ චෘත්තිය අනුව වැඩ කිරීමට මෙතැන මගේ වැඩ දුර්වල බව මට තේරෙනවා. යුද්ධ සේවයට මා නුසුදුසු බව කොමිසම මට දැන්නුවා. නමුත්, මෙතැන යුද පෙරමුණට වඩා අන්තයි. සූටීර්ගේ පල්හොරු කණ්ඩායම විනාශ කළ මේ දවස් දෙකේ දී මගේ ශරීර සනීපය වඩාත් නරක අතට හැරුණා. වෙඩි තැබීම්වලින් පොඩ්ඩක් විවේක ගන්නට ඕන. ප්යොදර් මට පය පොළොවේ ගහලා ඉන්නට තරම් හයිය නැතිනම් මම විශේෂ කමිටුවේ වැඩ කරන්නේ කොහොමද? ප්යොදර්, නුඹට තේරුණාද?

ෂුක්රායි සිත් තැවුලෙන් යුතුව පාවෙල් දෙස බැලීය.

"ඔව් නුඹේ පෙනුම හොඳ නැහැ. නුඹව නිදහස් කළ යුතුව තිබුණේ මීට ඉස්සෙල්ලා වැරැදිකරු මමයි. වැඩ ගැන හොයා බැලුවේ නැහැ"

එම සාකච්ඡාවේ ප්‍රතිඵලයක් වශයෙන් පාවෙල් ප්‍රාදේශීය කොම්සොමොල් සංවිධානයේ කමිටුව වෙත යැවිණි. පාවෙල් කොර්චාගින්ගෙන් වැඩ ගැනීමට කමිටුවට පැවරෙන ලියවිල්ලද ඔහු අත විය.

දඟකාරී ලෙස නහය වැසෙන සේ කැප් තොප්පියක් දමාගෙන සිටි වැදගැම්මට නැති කොල්ලෙක් පාවෙල්ගේ ලියවිල්ල බලා ප්‍රීතිමත් ලෙස නෙත් යොමු කොට ඉඟි මරා මෙසේ කීය.

"විශේෂ කොමිටියෙන්ද? වැදගත් සංවිධානය අපි නුඹට එක හුස්මට රස්සාවක් හොයලා දෙන්නම්. තරුණයෝ අප ළඟ නැහැ. නුඹව කොහේ යවන්ටද? ආහාර අංශයට යන්ට කැමතිද? නැත්ද? ඕන නැහැ. උද්ඝෝෂක කණ්ඩායමට යනවද? නැත්ද? එහෙම නොයෑම අපරාධයක්. හොඳ තැන. ලොකු ආහාර සලාකයක් ලැබෙනවා."

පාවෙල් කොල්ලාගේ කතාවට බාධා කළේය.

"මම දුම්රිය මාර්ගයේ ප්‍රධාන වැඩපොළට යන්ට කැමතියි.

කොල්ලා ඔහු දෙස මවිතයෙන් බැලීය.

"ප්‍රධාන වැඩපොළටද? හ්ම්... එතැන ඇබෑර්තු නැහැ. නුඹ උස්තිනොවිච් ළඟට පලයන් ඈ නුඹව කොහේ හරි යවාවි."

තලෙළු පැහැති තරුණිය සමඟ කතා කොට සාකච්ඡාවෙන් පසු තීරණයක් ගන්නා ලදී. ප්‍රධාන වැඩපොළේ තරුණ කොමියුනිස්ට් සංවිධානයේ ලේකම් ලෙස පාවෙල් කටයුතු කරනු ඇත. ඒ සමඟම ඔහු ශිල්පියකු හැටියටද එකවර වැඩ කරනු ඇත.

★ ★ ★

ඒ අතර ක්‍රිමියාවේ දොරටු අසල අර්ධද්වීපයේ පටු මගෙහි, අතීතයේදී ක්‍රිමියානු ටාටාර්වරුන් සපරොෂියාවේ පෙදෙසෙන් වෙන් කළ ඉපැරැණි සීමා සමීපයෙහි අලුත්වැඩියා කළ සහ ඉතා දැඩි ලෙස කොටු බැඳ ශක්තිමත් කළ ප්‍රතිවිප්ලවවාදී සුදු හමුදාවන්ගේ පිරිකොප් නමැති මහා බළකොටුව විය.

පිරිකොප්වලට එහා ක්‍රිමියාවේ, සෝවියට් රටේ හැම මුල්ලකින්ම පන්නා දමා, විනාශයට මුහුණ පා සිටි පිරිමි සහ ගැහැනු අවදානමක කිසිදු සේයාවක් පවා නැතිව වයින් පානය කරමින් වෙරි වී සිටියෝය.

ශරත් සමයේ ශීත දවසෙක වැඩ කරන ජනතාවගේ පුතුන් දස දහස් ගණනක්, මනා සේ හැරූ කපොලුවල සැඟවී සිටි සතුරාට පිටුපසින් පහර දෙනු වස් සිවාෂ් හරහා යනු පිණිස සමුද්‍ර සන්ධියේ ශීත දිය කඳට වැද පීනන්ට වූහ. එසේ පීනූ දහස් ගණනක් අතර සිය මැෂින් තුවක්කුව හිස මත තබා ගත් ෂාර්ක් ඉවාන්ද විය.

අරුණෝදයත් සමඟ පිරාකොප්වල සිටියවුන් උමතු වූවන් සේ හැසිරෙද්දී, බාධක මැඩ සුදු හමුදාවල පිටුපසට කඩා වැදී රතු හමුදා එල්ලය බලා පහර දෙද්දී, සිවාෂ් හරහා පැමිණි පළමුවැනි සේනාංක ලිතොව්ස්ක් අර්ධද්වීපයේ වෙරළ දක්වා පැමිණියහ. ගල් සහිත ඉවුරට ගොඩබට මුල් අයගෙන් කෙනෙක් ෂාර්කි.

මින් පෙර නොවූ විරූ රුදුරු සටනක් ඇති විය. ප්‍රතිවිප්ලවවාදීන්ගේ අසරු හමුදාව දියේ සිට ඉවුරට ගොඩ බසින මිනිසුන් වෙත මෘග ලෙස කඩා වැදුණේය. ෂාර්කිගේ මැෂින් තුවක්කුව සතුරාට මරණය ගෙන දෙමින් වේගයෙන් ක්‍රියාකාරී විය. වෙඩි පහර කෑ සතුරෝද අශ්වයෝද බිම පතිත වූහ. ෂාර්කි ඉතා වේගයෙන් පතොරොම් ඩිස්ක් එක පිට එක මැෂින් තුවක්කුවට සවි කළේය.

පිරිකොප් නමැති බළකොටුවට කාලතුවක්කු සිය ගණනකින් වෙඩි තැබීය. මහ පොළොව පතුලක් නැති අගාධයකට වැටෙන්නාක් මෙන් විය. හෙණ හඬ මෙන් වෙඩි හඬ නගමින් මරණය ළං කළේය. දහස් ගණන් වෙඩි බෝම්බ කුඩා කැබැලිවලට කැඩිණි. හාරනු ලැබූ, කණිනු ලැබූ මහ පොළොවේ පස් පිඬු විසි විණි.

සතුරාගේ බළකොටුව බිඳිණි. ක්‍රිමියාවට රතු හමුදා ජල ප්‍රවාහයක් සේ කඩා වැදුණේය. වඩාත් බියජනක ලෙස අවසාන පහර ගැසීමට රතු අසරු හමුදාවේ පළමුවැනි ඩිවිෂනය ඉදිරිපත් විය. බියෙන් කම්පනය වූ ප්‍රතිවිප්ලවවාදී සුදු හමුදාවෝ වරායෙන් පිට වී යන නැව්වලට පැන ගැනීමට වියරු වුවන් සේ දිවූහ.

ඉරී වියැකී ගිය සෙබළ කබා ඇඳ සිටි, පණුති හදවත් සහිත වීර රතු සෙබළුන්ගේ පපුවල සෝවියට් ජනරජය රතු ධජයේ පදක්කම් එල්ලුවේය. එතරම් උසස් පදක්කම් ලැබූ අය අතර, තරුණ කොමියුනිස්ට් සංවිධානයේ සාමාජිකයකු වූ මැෂින් තුවක්කුව ක්‍රියා කරවන ඉවාන් ෂාර්කිද විය.

★ ★ ★

පෝලන්තය සමඟ සාම ගිවිසුමක් ඇති විය. ෂෙපෙතෝව්කා නගරය ෂුක්රායි බාලාපොරොත්තු වූ පරිදි, සෝවියට් උක්රයීනයට අයත් විය. එම නගරයේ සිට කිලෝමීටර් තිස් පහක් ඈතින් පිහිටි ගඟ දේශ සීමාව බවට පත් විය. 1920 දෙසැම්බර් මාසයේදී පාවෙල් කොර්චාගින්, එක් උදෑසනක

තමාට සුපුරුදු නගරයට පැමිණියේය.

හිමෙන් වැසී ගත් දුම්රියපොළේ වේදිකාවට බට ඔහු 'ෂෙපෙතෝව්කා-1' නාම පුවරුව දැක වමට හැරී ඩිපෝවට ගියේය. අර්ටියෝම් ගැන සෙවූ නමුදු ඔහු එහි නොවීය. සෙබළ කබායේ බොත්තම් පියවාගෙන බැද්ද හරහා ඉක්මන් ගමනින් ඔහු නගරයට ගියේය.

දොරට තට්ටු කළ විට, මාරියා යාකොව්ලෙව්නා දොර හැර අමුත්තාට ගෙතුළට ආරාධනා කළාය. හිම සහිත කබාය හැඳගත් පුද්ගලයා ගෙතුළට වන් විගස මවු සිය පුතා හැඳිනගත්තාය. ඈ තම හදවත දැතින් බදාගත්තී, කිව නොහැකි ප්‍රීතිය නිසා ගොළු වූවාය.

තම සිහින් සිරුරෙන් පුතා තම පපුවට තුරුලු කරගත් අම්මා ඔහුගේ මුහුණ සිප ගනිමින් සතුටු කඳුළු වැගුරුවාය.

පාවෙල් අම්මාගේ වක රැලි ගැසුණු මුහුණ දෙස වේදනා සහගත කාන්සියකින් බලමින්, ඇය සන්සුන් වන තුරු කිසිවක් නොකීවේය.

වධ වේදනා විඳි ගැහැනියගේ දෙනෙත්වල නැවත ප්‍රීතිමත් දීප්තියකි. තමා කිසි දිනෙක දැකීමට නොසිතූ පුතු දෙස බලන අම්මාට කතා කිරීමට පවා නොහැකි විය. තෙදිනකට පසු රැයෙහි ගමන් මල්ලක් කරින් ගෙන අර්ටියොම් කුටියට වැදුණු විට, අම්මාගේ ප්‍රීතිය නිමිහිම් නැති විය.

කොර්චාගින්වරු සිය කුඩා ගෙයි පදිංචියට යළි පැමිණ සිටිති. ඉතාම අසීරු පරීක්ෂණවලට සහ අවදානම්වලට මූණ පා, විනාශයෙන් ගැලවුණු සහෝදරවරු දෙදෙනා නැවත මුණ ගැසුණහ.

"දැන් නුඹලා කරන්ට යන්නෙ මොනවාද?" මාරියා යාකොව්ලෙව්නා පුතුගෙන් විමසුවාය.

"අම්මේ, ආපසු මූරිච්චි ඇණ ගලවමු." අර්ටියොම් පිළිතුරු දුන්නේ ය.

දෙසතියක් ගෙදර නැවතී සිටි පාවෙල් සිය වෘත්තීය කටයුතු සඳහා කීයෙව් නගරයට ගියේය.